ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 DECEMBER 2016 Issue : 86 මාසික සංග්‍රහය. 2016 දෙසැම්බර් 86 කලාපය 50 ¢

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

RE/MAX Diamond Realty Inc., Brokerage
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com




ඈත කඳුකර හිමව් අරණේ - සීත චන්දන ළපලු හෙවණේ
සුළං රැල්ලේ පාව එන්නේ - ඔහුගෙ නාමය වේ..... !

# 2017 දී සංක්‍රමණික සංඛ්‍යාව වැඩි කරයි

සංක්‍රමණික පදනම මත කැනඩාවට පිළිගැනෙන පිරිස වැඩි කිරීමට ලිබරල් රජය පියවර ගෙන ඇති බව කැනඩා පුරවැසිභාව හා සරණාගත කටයුතු පිළිබඳ ඇමති ජෝන් මැකලම් විසින් පසුගියදා නිවේදනය කරනු ලැබුණි. ඒ අනුව 2017 වසර සඳහා සංක්‍රමණිකයන් ලක්ෂ තුනකට (300,000) කැනඩාවට පැමිණීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන බව ඇමතිවරයා පවසා ඇත.

මේ ආකාරයට නව සංක්‍රමණික ආගමන වැඩි කිරීම මගින් රටේ ආර්ථිකයට ආකර්ෂණීය වර්ධනයක් ලබා දීමට හැකි වනු ඇතැයි ලිබරල් රජය අපේක්ෂා කරයි. විශේෂයෙන්ම කැනඩාව තුළ වැඩිවෙමින් පවතින වියපත් ජනගහන සංයුතියේ අතිරික්තය පිරවීම සඳහා මේ ආකාරයට කැනඩාවට පිවිසිය හැකි සංක්‍රමණික සංඛ්‍යාව වැඩි කළ යුතු බව රජය පෙන්වා දේ.

පසුගියදා මේ පිළිබඳව වූ වාර්ෂික වාර්තාව කැනඩා පාර්ලිමේන්තුවට

8 වන පිටුව බලන්න

Field Fresh Supermarket
好世界 大型超市
New Super Market in Scarborough
Now Hiring
Apply Today
All position need, fill soon
For All Departments
(Sea Food, Grocery, Bakery, vegitables, Fruits and Cashiers)
For inquiries, you may call
647 - 618 - 2068
647 -829 - 8788
You may also e-mail your application to
fieldfresh5661@gmail.com

JOBS JOBS JOBS
TEAM LEASE
FULL TIME
ALL shifts available
WE ARE LOOKING FOR
General Helpers, Forklift Operators and many more positions in the Etobicoke, North York, Aurora, Scarborough and Vaughan area.
Please call : 905 266 0973
Or come in Mon - Fri 8.30 am - 5.30 pm
4000 Steeles Ave. W Unit # 27
Woodbridge, L4L 4V9

# 2016 ඔසක වරුණි



## කැනඩා සිංහල සංගමය සංවිධානය කරනු ලබන

# සිංහල සාහිත්‍යය හා සංස්කෘතික උත්සවය

## දිනය - 2016 දෙසැම්බර් 03

## ස්ථානය - දොන් බොස්කෝ ශාලාව

**කැනඩාවේ වෙසෙන සිංහල භාෂක සමාජය වෙනුවෙන් කැනඩා සිංහල සංගමය විසින් සංවිධානය කරනු ලබන සිංහල සාහිත්‍ය හා සංස්කෘතික උත්සවය 2016 දෙසැම්බර් 03 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.**

**එම විචිත්‍රවත් උත්සවයේ එක් ප්‍රධාන අංගයක් ලෙස සිංහල සාහිත්‍යය හා භාෂාව මුල් කොට ගත් තරඟාවලියක් සංවිධානය කෙරෙන අතර සිංහල සාහිත්‍ය නිර්මාණකරණයට උනන්දුවක් දක්වන කැනඩාවේ වෙසෙන ඕනෑම අයෙකුට මෙම තරඟාවලියට ඉදිරිපත් විය හැක.**

## සිංහල සාහිත්‍යය හා භාෂා තරඟාවලිය

### පද්‍ය, ගද්‍ය හා කෙටිකතා තරඟය

පද්‍ය රචනා තරඟය සඳහා තමන් කැමති ආකාරයකින් නිර්මාණය කරනු ලබන සඳැස් හෝ නිසඳැස් නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය. ගද්‍ය රචනා තරඟය සඳහා නිර්මාණ පහත දී ඇති මාතෘකාවලට අනුව ඉදිරිපත් කළ යුතුය. කෙටිකතා තරඟය සඳහා තමන් කැමති ස්වතන්ත්‍ර කෙටිකතා නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය.

### ජන ගායනා හා පද්‍ය ගායනා තරඟය

විරිඳු, පැල් කවි, ගොයම් කවි, කරත්ත කවි, පාරු කවි, නෙලුම් කවි, ජන ගී, ජන කාව්‍ය (යසෝදරාවත, වෙස්සන්තර කාව්‍ය, තුන්සරණ ආදි) පැරණි ප්‍රශස්ති ගී, ජන නාටක ගී ආදි කවර හෝ සිංහල ජන ගායනාවක් විනාඩි 03 කට නොවැඩි වන සේ සංගීත වාදනයෙන් තොරව විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ ගායනා කළ යුතුය. තරඟ කරුවන් **ඔක්තෝබර් 31** දිනට පෙර අයදුම් කළ යුතු අතර **නොවැම්බර්** මස ඇතුළත දැනුම් දෙන ස්ථානයකදී තරඟ පැවැත්වෙනු ඇත.

### කථික තරඟය

තරඟ කරුවන් **ඔක්තෝබර් 31** වෙනි දිනට පෙර අයදුම් කළ යුතු අතර නොවැම්බර් මස ඇතුළත දැනුම් දෙන ස්ථානයකදී තරඟ පැවැත්වෙනු ඇත. විනිශ්චය මණ්ඩලය විසින් ලබාදෙන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන ක්ෂණික කතාවක් ඉදිරිපත් කළ යුතුය. වයස අවුරුදු 20 න් ඉහළ කථික තරඟය සඳහා අදාළ මාතෘකා අයදුම්පත් ලැබුණු පසු තරඟකරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

### තරඟ කොන්දේසි

- එක් අයෙකුට ඉදිරිපත් විය හැක්කේ උපරිම වශයෙන් තරඟ දෙකකට පමණි. එක් තරඟ කාණ්ඩයකට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- එක් එක් තරඟය සඳහා වෙන වෙනම අයදුම්පත් ඒ සමග අමුණා එවිය යුතුයි.
- සියලුම අයදුම්කරුවන් **2016 ඔක්තෝබර් 31** වෙනි දිනට අදාළ වයස් කාණ්ඩයේ වයස සම්පූර්ණ කර තිබිය යුතුය.
- මෙහි දක්වා ඇති වගුවට අනුව ඔබ තෝරාගන්නා තරඟ අංකයට අදාළව අයදුම් පත්‍රය පුරවා ඔබගේ නිර්මාණය සමග **2016 ඔක්තෝබර් මස 31** වෙනි දිනට පෙර සිංහල සංගමය වෙත ලැබෙන්නට සලස්වන්න. කථික තරඟ සහ ජන ගායනා සඳහා ඉදිරිපත් වන්නන් **ඔක්තෝබර් මස 31** වෙනි දිනට පෙර අයදුම් පත්‍ර සිංහල සංගමය වෙත යොමු කරන්න.
- ඔබ සම්බන්ධ වී සිටින සිංහල භාෂා පන්තිය, ප්‍රජා සංවිධානය, දහම් පාසල, ආදි ශිෂ්‍ය සංගමය, ආගමික සිද්ධස්ථානය, ප්‍රජා සංවිධානය මගින් මෙන්ම පෞද්ගලිකවද තරඟ සඳහා ඉදිරිපත් විය හැක.
- ඔබගේ නිර්මාණ තැපැල් මගින් මෙන්ම ඊ-මේල් මගින්ද එවිය හැකි අතර අදාළ ලිපිනයන් පහත දක්වා ඇත. තැපැල් මගින් එවීමේදී ලියුම් කවරයේ වම් උඩු කෙළවරේ අදාළ තරඟයේ නම සහ අංකය සඳහන් කරන්න.
- නිර්මාණ සමග සම්පූර්ණ කර එවිය යුතු අයදුම්පත්‍රය කැනඩා සිංහල සංගමයේ ෆේස්බුක් අඩවියට පිවිස ඔබට ලබාගත හැක.

**www.facebook.com/CanadaSinhalaAssociation**

| තරඟ ඉසව් අංකය | වයස් සීමාව | අදාළ තරඟය | ගද්‍ය රචනා මාතෘකා | ගද්‍ය රචනා වචන ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | අවුරුදු 6 - 8 | පද්‍ය ගායනා තරඟය<br>කථික තරඟය | | |
| 2 | අවුරුදු 9 - 11 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය | මගේ අම්මා | වචන 250 කට නොවැඩි රචනාවක් |
| 3 | අවුරුදු 12 - 15 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය<br>ජන ගායනා තරඟය | මා දුටු කැනඩාව | වචන 500 කට නොවැඩි රචනාවක් |
| 4 | අවුරුදු 16 - 19 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය<br>ජන ගායනා තරඟය | පරිසර සංරක්ෂණය හා මානව ප්‍රගතිය | වචන 750 කට නොවැඩි රචනාවක් |
| 5 | අවුරුදු 20 න් ඉහළ | කථික තරඟය<br>ජන ගායනා තරඟය<br>කෙටිකතා තරඟය | | |

**නිර්මාණ යොමු කළ යුතු තැපැල් ලිපිනය -**
The Secretary, Sinhalese Association of Canada.
102-5 Richgrove Drive, Toronto. On. M9R 0A3
**Email** - sinhala.sangamaya@gmail.com

**විස්තර සඳහා විමසන්න**
**ගාමිණී අබේසිංහ - 416 822 2789**
**යසන්ත නවරත්න - 416 522 5325**
**අනුර රණවීර - 416 720 2386**

**ප්‍රශස්ත මට්ටමේ කෙටිකතා පොතක් ලෙස මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වේ.**

**සිංහල සාහිත්‍ය උළෙල සහ සංස්කෘතික සංදර්ශනය**
**2016 දෙසැම්බර් 03 වන සෙනසුරාදා දොන් බොස්කෝ රඟහලේදී පැවැත්වේ.**

**www.facebook.com/CanadaSinhalaAssociation**

# දේපළ වෙළඳපොළේ වාර්තාගත අලෙවියක් !

පසුගිය ඔක්තෝබර් මාසයේදී කැනඩාව පුරා අලෙවි වී ඇති නිවාස සංඛ්‍යාව වාර්තාගත ලෙස ඉහළ ගිය බව කැනඩා දේපළ වෙළඳාම් සංගමය (Canadian Real Estate Association) පවසයි.

එම සංගමයේ දත්තයන්ට අනුව බහු ලැයිස්තුගත සේවාව (MLS) හි ඇතුළත් කොට තිබූ දේපළ අතරින් නිවාස දේපළ (residential properties) 42,473 ක් ඔක්තෝබර් මාසයේදී අලෙවි වී ඇත. මෙය 2015 ඔක්තෝබර් මාසයේ නිවාස අලෙවිය හා සංසංදනය කිරීමේදී සියයට 60 ක පමණ වැඩිවීමක් බව සංගමය පවසයි.

මෙහිදී GTA හා ආසන්න නගරවල නිවාස අලෙවිය සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබුණු නමුත් බ්‍රිටිෂ්කොළොම්බියාහි නිවාස අලෙවිය යම් තරමකට පහත වැටී තිබුණු ආකාරයක් දක්නට ලැබුණි. මෙම අලෙවියට සාපේක්ෂව ටොරොන්ටෝව ඇතුළු ආසන්න නගරවල නිවාස මිල ගණන්ද ඉතාමත් විශාල ලෙස ඉහළ නැග තිබූ අතර ඔක්තෝබරයේ විකිණුනු නිවාස මිල ගණන් සලකා බැලීමේදී අවම මිල ගණන් සහිත නිවසක සාමාන්‍ය අගය වී ඇත්තේ ඩොලර් 481,994 කි. මෙය පසුගිය වසරෙහි මෙම කාල සීමාව හා සසඳා බැලීමේදී සියයට 5.9 ක ඉහළ යෑමක් බව දේපළ වෙළඳාම් සංගමයේ වාර්තා දක්වා සිටී.

ඔක්තෝබරයේ නිවාස වෙළඳපොළ තුළ මෙතරම් ඉහළ යෑමක් ඇති වීමට පසුගියදා නිවාස ණය සම්බන්ධයෙන් ෆෙඩරල් රජය ගෙන ආ නව වෙනස්කම් ප්‍රධාන ලෙස බලපා ඇතැයි ඒ පිළිබඳව අදහස් දක්වන විශ්ලේෂකයින් පවසා ඇත.

# ආහාර බැංකු භාවිතය ඉහළ යයි

කැනඩාවේ ආහාර බැංකු භාවිත කරන්නන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින බව HungerCount 2016 නවතම වාර්තාව පවසයි.

සිරියානු සරණාගතයින් විශාල වශයෙන් පැමිණීම, ඇල්බර්ටා තෙල් අර්බුදය සහ ලැව්ගින්න නිසා දහස් සංඛ්‍යාත පිරිසක් අවතැන් වීම වැනි කරුණු මේ ආකාරයට ආහාර බැංකු වෙත එන ජන ප්‍රමාණය වැඩි කිරීමට හේතු වී ඇති බව එහි සඳහන් වේ. එයට අනුව 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ මේ කාලය තුළ ආහාර බැංකු භාවිත කර ඇති පිරිස සියයට 1.3 කින් වැඩි වී ඇත. Food bank වෙත ඇදී එන ජන සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව මේ වසරේ මුල සිටම වැඩිවෙමින් පැමිණ ඇති බව ඒ පිළිබඳ වන දත්ත සටහන් පරීක්ෂා කිරීමේදීද පෙනී යයි. 2015 මාර්තු මාසයේදී 852,137 දෙනෙකු වෙත ආහාර සැපයූ ආහාර බැංකුවට, 2016 මාර්තු මාසය වන විට 863,492 කුට ආහාර සැපයීමට සිදුවී ඇත. රටේ සමස්ත පළාත් දහයෙන් අටකම ආහාර බැංකු වෙත පවතින ඉල්ලුම දිනෙන් දිනම ඉහළ යමින් පවතින අතර ඇල්බර්ටා, සස්කැච්චන් සහ නෝවා ස්කෝෂියාහි මෙය සියයට 17 ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

මෙම වාර්තාවට අනුව මැනිටෝබා සහ ඔන්ටාරියෝවේ ආහාර බැංකු භාවිතය යම් තරමක අඩු වීමක් පෙන්නුම් කරයි. එයට අනුව පසුගිය වසරට සාපේක්ෂව මැනිටෝබාහි ආහාර බැංකු වෙත ඇදී ආ පිරිස සියයට 2.9 කින් අඩුවී ඇති අතර ඔන්ටාරියෝවේ එම අගය සියයට 6.4 ක් දක්වා පහත බැස ඇත. පසුගිය කාලයේදී මෙම පළාත්වල ආර්ථික වර්ධන වේගය ක්‍රම ක්‍රමයෙන් ඉහළ යෑමත් සමග ආහාර බැංකු වෙත පැමිණෙන පිරිස අඩු වී ඇති බව එම වාර්තාව පවසා සිටී.

# පැනමා ලේඛන තුළ කැනේඩියානුවන් 85 කගේ නම්

පැනමා රාජ්‍යය තුළ වසර හතළිහක් පුරා ක්‍රියාත්මක වූ මොසැක් ෆොන්සේකා නම් සමාගමට අයත් රහස් ලිපිගොනු මිලියන 11.5 ක අඩංගු තොරතුරු අනාවරණය වීමත් සමග එය ලොව පුරා මහත් ආන්දෝලනයක් ඇති කිරීමට සමත් විය. මෙම ලිපි ගොනුවල ලෝක නායකයන් ඇතුළු සුප්‍රසිද්ධ පුද්ගලයන් රැසකගේ නම් ඇතුළත්ව පවතින බව එම පුවතත් සමග ප්‍රචාරය විය. ජාත්‍යන්තර වත්කම් සීමාවලින් ගැලවී මුදල් සැඟවීමත්, බදු ගෙවීම්වලින් නිදහස් වීමත් සඳහා ලොව ප්‍රකෝටිපතියන් මෙම සමාගම යොදාගෙන තිබුණි.

මෙම හෙළිදරව්ව සිදුවීමත් සමගම ඒ පිළිබඳ තතු විත්ති ලොව පුරා පුවත්පත් මගින් ප්‍රචාරය වූ අතර එහිදී කැනඩාවේ වෙසෙන කෝටිපතියන් රැසක්ද මොසැක් ෆොන්සේකා සමාගම තම බදු සඟවන අභය භූමිය ලෙස යොදාගෙන ඇති බව හෙළි වුණි. මෙහි නවතම තත්ත්වය කැනඩා ආදායම් බදු ඒජන්සිය (CRA) විසින් පසුගියදා එළිදරව් කරනු ලැබූ අතර, එහිදී මේ වන තෙක් ඒජන්සිය විසින් සිදුකළ පරීක්ෂා කිරීම්වලදී කැනඩාවේ පුද්ගලයන් 85 කගේ නම් එහි ඇතුළත්ව ඇති බව සොයාගෙන ඇත. මෙම කැනේඩියානුවන් මෙරටට බදු වංචා කළ පිරිස ලෙස හඳුනා ගැනුණු බව CRA පවසයි.

දැවැන්ත පැනමා පත්‍රිකා හෙළිදරව්ව සිදු වූ සැණින් CRA විසින් මීට සම්බන්ධ කැනේඩියානුවන් පිළිබඳව සොයා බැලීම් අරඹා තිබූ අතර මේ වන විට සොයාගත් තොරතුරුවලට අනුව ඩොලර් මිලියන හාරසියයකට අධික මුදලක් මොවුන් විසින් එම සමාග මේ ආයෝජනය කර ඇත. මෙම තොරතුරු සොයා ගැනීම සඳහා පත්‍රිකා 2,600 කට අධික සංඛ්‍යාවක් අධීක්ෂණයට ලක් කොට ඇති අතර තවත් දහස් ගණනක් අධීක්ෂණය සඳහා භාජන කළ යුතුව ඇතැයි වාර්තා වේ. මේ ආකාරයට කළු සල්ලි සුදු කරමින්, අයථා ලෙස මුදල් පරිහරණය කරමින්, බදු ගෙවීම් පැහැර හරිමින් කටයුතු කරන්නන් නිසා කැනඩාවට වාර්ෂිකව ඩොලර් බිලියන 6 සිට 7.8 දක්වා මුදලක් අහිමි වන බව ආදායම් බදු ඇස්තමේන්තු වාර්තා පෙන්වා දේ. මේ වන විට CRA විසින් බදු වංචා කරන පුද්ගලයන් සඳහා දැඩි ක්‍රියාමාර්ග ගනිමින් පසුවන අතර 2010 වසරේදී එලෙස බදු සැඟවූ පුද්ගලයන් 49 දෙනෙකු වෙත නඩු පවරමින් ඩොලර් මිලියන 13.4 ක් අයකර ගැනීමට සමත් වී ඇත.

# Opioid භාවිතය අවදානම් මට්ටමක

Opioid ගණයේ ප්‍රබල වේදනා නාශක භාවිතය ඔන්ටාරියෝ ප්‍රාන්තය පුරා විස්මයානුකූලව වැඩි වෙමින් පවතින බව ඒ පිළිබඳව කරන ලද සමීක්ෂණයක් හෙළි කොට සිටී. මෙවැනි බලසම්පන්න වේදනා නාශක වෙත ඇබ්බැහි වී සිටින ඇතැමුන් ඒවා අධිමාත්‍රාවලින් ගැනීමට පෙළඹීම නිසා වසරකට මිය යන සංඛ්‍යාවද සිය ගණනක් බව එම වාර්තාව වැඩිදුරටත් පවසයි.

ඔන්ටාරියෝ ඖෂධ ප්‍රතිපත්ති පර්යේෂණ ජාලය (Ontario Drug Policy Research Network) විසින් සිදුකර ඇති මෙම සමීක්ෂණයේදී හෙළි වී ඇති කරුණුවලට අනුව 2013 වසරේදී Opioid ගණයේ ඖෂධ අධිමාත්‍රාවලින් ගැනීමෙන් සහ ඒවා විෂවීමෙන් 638 දෙනෙකු මිය ගොස් ඇත. ඒ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කළහොත්, ඔන්ටාරියෝ පදිංචිකරුවන් අතරින් සෑම 20,000 කටම එක් අයෙකු ලෙස මෙම මරණ අනුපාතය දැක්විය හැක. Opioid අධිමාත්‍රාවලින් ගෙන මරු වැළඳගත් පිරිස අතරින් සියයට 13 ක්ම ඒවා පාවිච්චි කර ඇත්තේ සියදිවි නසා ගැනීමේ අරමුණින්ම වීම මෙහි ඇති තවත් ඛේදවාචකයකි.

Opioid භාවිතය නිසා සිදුවූ මරණ පිළිබඳව මෑත වසරවල නිකුත් වී ඇති වාර්තා සලකා බැලීමේදී 2008 සිට 2013 දක්වා වූ කාලසීමාව තුළ ඔන්ටාරියෝවෙහි මරණ 2,879 ක් සිදුවී ඇති බව වාර්තා වේ. එම මරණ අතරින් බහුතරයක් වයඹදිග ඔන්ටාරියෝවේ තන්ඩර් බේ (Thunder Bay) පළාතින් සහ ඊසානදිග ඔන්ටාරියෝවේ ටිමිස්කේමින් දිස්ත්‍රික්කයෙන් (Timiskaming districts) වාර්තා වී ඇත. සමස්ත ඔන්ටාරියෝව තුළ Opioid සම්බන්ධිතව සිදුවූ මරණ සංඛ්‍යාව දෙස බැලීමේදී මෙම පළාත් දෙක තුළ පමණක් එය හතර ගුණයක පමණ වැඩිවීමක් පෙන්නුම් කරයි. එහෙත් තන්ඩර් බේ සහ ටිමිස්කේමින්හි Opioid සම්බන්ධ මරණ එතරම් සංඛ්‍යාවක් වාර්තා වන්නේ මන්ද යන්න තාමත් විසඳාගත නොහැකි ගැටලුවක්ව පවතින බව සෞඛ්‍ය අංශ පවසයි.

2014 වසරේ ඔන්ටාරියෝවේ රෝහල් දත්තයන් විමසා බැලීමේදී Opioid භාවිතයෙන් ඇතිවූ විවිධ සංකූලතා නිසා හදිසි අනතුරු සේවාවට පැමිණ ඇති සංඛ්‍යාව 3200 කි. මේ අතරින් 1620 නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇත. Opioid භාවිතය නිසා සිදුවන අනතුරු හා මරණ මේ අන්දමට දිගින් දිගටම වර්ධනය වුවහොත් එය ප්‍රබල සෞඛ්‍ය ගැටලු රැසකට මෙන්ම ජන ජීවිත අනතුරේ හෙළීමටත් හේතු විය හැකි බැවින් ඒ පිළිබඳව නිසි පියවර ගැනීම කෙරෙහි මේ වන විට ෆෙඩරල් රජයේ අවධානය යොමු වී ඇත. මේ සඳහා ව්‍යවස්ථාදායක තුළින්ම වෙනස් කම් සිදුකරමින් ඊට පිළියම් යෙදීම කෙරෙහි රජය සලකා බලමින් සිටී. ඒ අනුව මේ වන විටත් ව්‍යවස්ථාව තුළ ඇති Opioid භාවිතය පිළිබඳව වූ රෙගුලාසිය 'ක්‍රියාකාරී සැලැස්මක්' දක්වා යාවත්කාලීන කිරීම 2017 පෙබරවාරි මාසය වන විට සිදුකර එය ක්‍රියාත්මක කිරීමට රජය බලාපොරොත්තු වේ.

# මෝටර් රථ back-up කැමරා අනිවාර්යයි

2018 මැයි මාසයේ සිට සියලුම කාර් සහ කුඩා ට්‍රක් රථ සඳහා පසුපස දිස්වන උපස්ථ කැමරා (back-up cameras) අනිවාර්ය කරන බව කැනඩා ප්‍රවාහන අමාත්‍යාංශය (Transport Canada) පවසා සිටී. මෙම නව රෙගුලාසිය සම්බන්ධයෙන් නිල වශයෙන් අදහස් දැක්වීමට දින 75 ක කාලයක් ලබා දී ඇති අතර එය කැනඩා ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇත.

මෙවැනි වෙනස් කමක් සිදුකිරීම සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රවාහන අමාත්‍යාංශය පවසන්නේ, මහමග අනතුරුවලට ජනතාව ලක්වීම වැළැක්වීමට විශේෂයෙන්ම දරුවන්, ආබාධිත පුද්ගලයන්, වැඩිහිටියන් ආදීන් අවදානමකට ගොදුරු වීම මගහැරවීමට මෙම ආරක්ෂණ පියවර ගැනීමට අදහස් කළ බවයි. 2004 සිට 2009 දක්වා සිදු වූ රථවාහන අනතුරු පිළිබඳව සලකා බැලීමේදී පිටුපස හරිහැටි නොබලා වාහන හැරවීම, පසුපසට ගැනීම ආදිය නිසා සිදුවී ඇති මරණ සංඛ්‍යාව 27 ක් බවත් තුවාල ලැබූ සංඛ්‍යාව 1,500 ක් පමණ වන බවත් වාර්තා වේ. අලුත් නීති රෙගුලාසිය සියලුම සැහැල්ලු වාහන (මගී මෝටර් කාර්, සැහැල්ලු ට්‍රක් රථ, රෝද තුනේ වාහන සහ කුඩා වෑන් රථ සහ බස් රථ) සඳහා ක්‍රියාත්මක කෙරෙන බව ප්‍රවාහන අමාත්‍යාංශය පවසයි.

මෝටර් රථ සඳහා පිටුපස කැමරා අනිවාර්ය කිරීමේ නීතිය ඇමරිකාව තුළ 2014 වසරේ සිට ක්‍රියාත්මක වන අතර එම නීති පද්ධතියද සැලකිල්ලට ගෙන ඊට සමාන ආකාරයට කැනඩාවේ ප්‍රමිතීන්ට අනුකූලව කැමරා නීතිය මෙහි ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය අදහස් කරයි.

# ආහාර අත්පොත වෙනස් වේ

කැනේඩියානුවන් වෙත සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ලබා දීම සඳහා ආහාර නාමකරණයෙන්හි පුළුල් වෙනසක් සඳහා වන සැලසුමක් මේ වන විට ක්‍රියාත්මක කිරීමට සූදානම් කෙරෙමින් පවතින බව සෞඛ්‍ය ඇමතිනී ජේන් පිල්පොට් පවසයි. වඩාත් යහපත් ආකාරයට ආහාර පුරුදු වර්ධනය කර ගැනීම සඳහා සංශෝධනය කෙරෙන අලුත් ආහාර මාර්ගෝපදේශය සැකසීමේදී මහජනතාවගේ ද අදහස් ලබාගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන ඇත. මේ සඳහා මහජන අදහස් දැක්වීමට දෙසැම්බර් 08 වෙනිදා දක්වා කාලය ලබා දී ඇති අතර Health Canada වෙබ් අඩවිය පිවිසීමෙන් ඔබේ අදහස් එහි සටහන් කළ හැක.

මෙම ආහාර මාර්ගෝපදේශය අවසන් වරට 2007 වසරේදී යාවත්කාලීන කර ඇති අතර එම පසුගිය මාර්ගෝපදේශය පිළිබඳව බොහෝ දෙනෙකු පවසා ඇත්තේ එහි අඩංගු නිර්දේශයන් පිළිපැදීම දුෂ්කර කටයුත්තක් වූ බවයි. විද්‍යාත්මක සාධක පදනම් කරගනිමින් ආහාර හා සෞඛ්‍ය යහපත් කර ගැනීමට සැකසෙන මෙම අලුත් ආහාර මාර්ගෝපදේශයේ යාවත්කාලීන කිරීම් 2018 වසර අවසන් වන විට සිදුකර, එය එළිදැක්වීමට ෆෙඩරල් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.














## මිසසාගා බෞද්ධ විහාරස්ථානයේ කඨින පූජෝත්සවය

මිසසාගා බෞද්ධ විහාරස්ථානයේ වාර්ෂික කඨින පූජෝත්සවය විහාරාධිපති පූජ්‍ය කුළුගම්මන ධම්මාවාස ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් නොවැම්බර් 04 සහ 05 යන දෙදින තුළ ඉතාමත් අලංකාර අන්දමින් පවත්වනු ලැබුණි.

**සේයා රූ සටහන් - නිමල් එගොඩගෙදර**












# 2017 අයවැය යෝජනා !

ශ්‍රී ලංකාවේ 2017 වසර සඳහා වූ අයවැය යෝජනා මුදල් ඇමති රවි කරුණානායක විසින් පසුගිය නොවැම්බර් 10 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. අයවැය කතාව ආරම්භ කරමින් ඇමතිවරයා පවසා සිටියේ, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉහළ නංවා දුගී භාවය තුරන් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට මෙවර අයවැය යටතේ පියවර ගනු ලැබූ බවයි.

**2017 අයවැයෙන් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රධාන යෝජනා කීපයක් මෙසේය.**

- පාසල් සිසුන්ට පහසුවෙන් දැනුම ලබාගැනීම සඳහා ස්මාර්ට් පන්ති කාමර ඇති කිරීමට රුපියල් මිලියන 4500 ක්
- මෙම වැඩ පිළිවෙළ වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ලබන වසරේදී උසස්පෙළ හැදෑරීමට ඇතුළුවන සිසුන්ට සහ ගුරුවරුන්ට නොමිලේ ටැබ් පරිගණක ලබාදීමට රුපියල් මිලියන 5000 ක්
- මාලඹේ, මහපොළ විශ්වවිද්‍යාලය නමින් නව විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම (තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර පරිපාලනය, ඉංග්‍රීසි භාෂාව ආදි රැකියා වෙළඳපළ ඉලක්ක කොටගත් පාඨමාලා මෙහි ආරම්භ කිරීමට නියමිත වේ)
- වෛද්‍ය විද්‍යාව හැර සෙසු විෂයයන් සඳහා පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට දිරි දීම
- අවුරුදු 5 සිට 19 දක්වා සෑම පාසල් දරුවෙකුටම රුපියල් ලක්ෂ දෙකක රක්ෂණාවරණයක්
- විශ්වවිද්‍යාල වරම් නොලබන සිසුන්ට පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීම සඳහා රුපියල් ලක්ෂ 8 දක්වා ණය ක්‍රමයක්
- ත්‍රිරෝද රථ භාවිතය වෙනුවට විද්‍යුත් මෝටර් රථ හඳුන්වාදීම දිරිගැන්වීමට පියවර
- පාසල් ළමුන් ප්‍රවාහන වෑන් රථ ආසන 32 බස් රථවලට යොමු කිරීමට දිරි ගැන්වීම්
- මධ්‍යම පන්තික පවුල් සඳහා නිවාස ලක්ෂ 5 වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- විශ්‍රාමිකයන් සඳහා දෙනු ලබන අග්‍රහාර රක්ෂණය ජනවාරියේ සිට අවුරුදු 70 දක්වා ලබාදීම
- වෝටර්ස් එජ්, හිල්ටන්, ග්‍රෑන්ඩ් හයට්, ග්‍රෑන්ඩ් ඔරියන්ටල්, හම්බන්තොට සහ මන්නාරම ලුණු ලේවායන්, කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කිරීම. (මෙමගින් රජය ඇමරිකානු ඩොලර් මිලියන 1000 ක් උපයා ගැනීමට බලාපොරොත්තු වේ)
- සමෘද්ධි ව්‍යාපාරය, ජන ඉසුරු ලෙස නම් කිරීම
- රාත්‍රී 9 සිට උදෑසන 5 දක්වා කාලසීමාවේදී අධිවේගී මාර්ගවල අය කරන ගාස්තු රුපියල් 50 කින් අඩු කිරීම
- පිරිවෙන් අධ්‍යාපනය නැංවීමට පියවර ගැනීම සහ පිරිවෙන්වල අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේලා සඳහා රුපියල් 2500 ක මාසික දීමනාවක් ලබාදීම
- දිවයින පුරා පොලිස් ස්ථාන 428 සිට 600 දක්වා වැඩිකිරීම සහ පොලිස් දෙපාර්තමේන්තුවේ වසර දෙකක වැටුප් විෂමතා ඉවත් කිරීම
- තීරුබදු රහිත වාහන බලපත් නිකුත් කිරීම අහෝසි කිරීම සහ ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටද බලපත් නිකුත් නොකිරීම
- එක් දිනකින් ලබාදෙන විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව රුපියල් 10000 දක්වා ඉහළට
- නල්ලූර්, මහනුවර, මාතර යන නගරවල පිළිකා රෝහල් තුනක් ඉදිකිරීමට රුපියල් මිලියන 3000 ක්
- විදේශිකයන් සඳහා ඉඩම් බදුගැනීමේදී පනවා ඇති තීරුබද්ද ඉවතට
- අන්තර්ජාල සේවා සඳහා වන විදුලි සංදේශ සේවා ගාස්තුව සියයට 25 දක්වා ඉහළට
- ජංගම දුරකථන සඳහා සිම් කාඩ් ක්‍රියාත්මක කිරීමේ ගාස්තුව සඳහා රුපියල් 200 ක්
- රථවාහන වැරදි සඳහා අවම දඩය රුපියල් 2500 දක්වා ඉහළට
- ඉන්ධන මගින් ධාවනය වන සියලුම වාහන සඳහා කාබන් බද්දක්
- මගීන් නැව් නැගීමේදී හා ගුවන් ගතවීමේදී ගෙවන ගාස්තුව ඇමරිකානු ඩොලර් 50 දක්වා ඉහළට

# ත්‍රිරෝද රථ සඳහා නව නියාමනයක්

ශ්‍රී ලංකාව තුළ දිනෙන් දිනම ඉහළ යන රථවාහන අනතුරු අතර අපරීක්ෂාකාරී ත්‍රීවිල් රථ ධාවනය නිසා සිදුවන අනතුරු සංඛ්‍යාව සුලු කොට තැකිය නොහැක. මේ පිළිබඳව අවධානය යොමු කළ රජය, මගී ප්‍රවාහන ත්‍රිරෝද රථ රියදුරන් සඳහා නව නියාමන වැඩ පිළිවෙළක් හඳුන්වා දීමට තීරණය කොට ඇත.

ඒ අනුව මෙහි මූලික පියවරක් ලෙස මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ රියදුරන් සඳහා නව රියදුරු බලපත්‍රයක් ලබා දීමට කටයුතු සකස් කෙරේ.

මේ අතර ත්‍රීරෝද රථ සංගම් කිහිපයක්ම රජයෙන් විශේෂ ඉල්ලීමක් කර ඇති අතර ඔවුන් ඉල්ලා ඇත්තේ, ලාබාල තරුණයින් හට ත්‍රීරෝද රියදුරු බලපත්‍ර ලබා දීම නවතා දමන ලෙසයි. මෙය 2017 අයවැය යෝජනා හරහා ගෙනවිත් ක්‍රියාත්මක කරන ලෙස ඔවුන් පවසා ඇත. එම සංගම් පවසා ඇත්තේ, ලාබාල තරුණයන් ත්‍රීරෝද කර්මාන්තයට පැමිණ, එය හුදෙක් විනෝදය සහ එදිනෙදා වියදම් පියවා ගැනීම අරමුණු කොට සිදුකරන නිසා ත්‍රීවීල් රථ සේවාව බාල්දු වී ඇති බවයි. එසේ ත්‍රීරෝද රථ රියදුරන් ලෙස කටයුතු කරන තරුණ පිරිස අතරින් බොහෝ දෙනෙකු රස්තියාදුකාරයන් මෙන් හැසිරෙන බවටද ඔවුහු චෝදනා නගති. මේ හේතුවෙන් වෘත්තීය ත්‍රීරෝද රථ රියදුරන් දැඩි අපහසුතාවට පත්ව ඇති බව ත්‍රීරෝද රථ රියදුරු සංගමයේ සභාපතිවරයා පවසයි. ඒ නිසා ත්‍රීරෝද රථ බලපත්‍රය අවුරුදු 23 සම්පූර්ණ කළ අයට වසර දෙකක පුහුණු කාලයකින් පසු ලබා දීම සුදුසු බව ඔහු පෙන්වා දී ඇත.

2017 වසර වන විට රට පුරා ඇති සියලුම ත්‍රීරෝද රථ ඇතුළු කුලී රථවලට නිශ්චිත මිල දක්වන මීටර සවිකිරීම අනිවාර්ය කර ඇති බවද පසුගියදා ඒ පිළිබඳව පළවූ වාර්තාවක දැක්වුණි.

රථවාහන දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව ශ්‍රී ලංකාව තුළ දෛනිකව රථවාහන ලක්ෂ 40 ත් 50 ත් අතර සංඛ්‍යාවක් ධාවනයට එක්වන බවත් එයින් සියයට 60 කට අධික ප්‍රමාණයක් ත්‍රීරෝද රථ සහ යතුරු පැදි බවත් සඳහන් වේ.

# මත්තලට යන්න බෑ...!

අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වසා තැබෙන කාල සීමාව තුළදී මත්තල ගුවන් තොටුපොළ ගුවන් ගමන් සඳහා යොදාගන්නා ලෙස රජය සියලුම විදේශීය ගුවන් සමාගම්වලින් ඉල්ලීම් කර ඇත. එහෙත් මෙම ඉල්ලීම ගුවන් සමාගම් 45 ක් විසින් ප්‍රතික්ෂේප කර ඇති බව සිවිල් ගුවන් සේවා සහ ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිවරයා පවසා සිටී.

පක්ෂීන් සංක්‍රමණය වන ප්‍රදේශයක මත්තල ගුවන් තොටුපොළ පිහිටා තිබීම නිසා ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවිය හැකි හෙයින් මත්තලට පැමිණිය නොහැකි බව එම ගුවන් සමාගම් පවසා ඇත. මත්තල ගුවන් තොටුපොළ පිළිබඳව අදහස් දක්වා ඇති නියෝජ්‍ය ඇමතිවරයා පවසා ඇත්තේ දිගින් දිගටම පාඩු ලැබීම නිසා එම ගුවන් තොටුපොළ පවත්වාගෙන යා නොහැකි තත්ත්වයකට පත්ව ඇති බවයි. මත්තල ගුවන් තොටුපොළේ මාසික ආදායම රුපියල් ලක්ෂ 30 ක් බවත් එහි වියදම රුපියල් ලක්ෂ 250 ක් බවත් ඊට අමතරව සෑම මාසයකම රුපියල් කෝටි 30 බැගින් වූ ණයක් අවුරුදු දහයක් පුරා ගෙවීමට ඇති බවත් ඔහු පවසා සිටී.

එමෙන්ම මේ වන විට මත්තලට පැමිණෙන්නේ ගුවන් යානා දෙකක් පමණක් බවත් අනෙකුත් ජාත්‍යන්තර ගුවන් සමාගම් එහි පැමිණීමට අකමැති බවත් නියෝජ්‍ය ඇමතිවරයා පවසයි.

කෙසේ වුවත් කටුනායක ගුවන් තොටුපොළේ ධාවන පථය වසර 20 කින් අලුත්වැඩියා කර නොමැති නිසා එය අලුත්වැඩියා කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වී ඇති හෙයින් ඇමරිකානු ඩොලර් මිලියන 50 ක් වියදම් කරමින් කටුනායක ධාවන පථය සංවර්ධනය කිරීමට රජය මේ වන විට සැලසුම් සකස් කර ඇත. මේ සඳහා 2017 ජනවාරි 05 වනදා සිට අප්‍රේල් 05 වනදා දක්වා දිනකට පැය 8 ක කාලයක් කටුනායක ගුවන් තොටුපොළ වසා තැබීමට නියමිත වේ. මේ වන විටත් සතියකට පැය 4 ක කාලයක් ගුවන් තොටුපොළ නඩත්තු කටයුතු සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වසා දමනු ලැබේ.

# පිරමීඩ ජාවාරම් මඩින්න විශේෂ ඒකකයක්

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පිරමීඩ ජාවාරම් මැඩ පැවැත්වීම සඳහා ඒ පිළිබඳව පුළුල් ලෙස විමර්ශන කටයුතු සිදුකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.

ඒ අනුව මේ සඳහා විශේෂ විමර්ශන ඒකකයක් පිහිටුවීමට මහ බැංකුව කටයුතු යොදා ඇති අතර මෙම ඒකකය පිහිටුවීම සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතියද ලැබී ඇත. පොලිස් දෙපාර්තමේන්තුවේ සහායද මෙම ඒකකය සඳහා ලබා ගන්නා බව මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පවසා ඇත.

# අවම දඩය නිශ්චිත වැරදිවලට පමණක්

මාර්ග නීති කඩ කරන්නන් සඳහා මෙවර අයවැයෙන් යෝජනා වූ රුපියල් 2500 ක අවම දඩ මුදල නිශ්චිත වැරදි කීපයක් සඳහා පමණක් අය කිරීමට කැබිනට් මණ්ඩලයේදී යෝජනා වී ඇත.

ඒ අනුව බීමත්ව රිය පැදවීම, රියදුරු බලපත්‍රයක් නොමැතිව රථ ධාවනය, අධික වේගය වැනි හිතාමතා සිදුකරනු ලබන ප්‍රධාන වරදවල් කීපයක් සඳහා පමණක් මෙම දඩ මුදල අය කිරීමට රජයේ අවධානය යොමු වී ඇත.

මෙම අවම දඩ මුදල ඉවත් කරගන්නා ලෙස ඉල්ලමින් බස් හිමියන්ගේ සංගමය විසින් පසුගියදා බස් වර්ජනයකට සූදානම් වුවත් මුදල් අමාත්‍යවරයා සමග පැවති සාකච්ඡාවකින් පසු එය අත්හිටුවා තිබුණි.

# අලුත් පක්ෂයක් !

හිටපු අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් 'ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ' නමින් නව පක්ෂයක් මැතිවරණ කොමිසමේ ලියාපදිංචි කොට ඇත. 'මල් පොහොට්ටුව' ලාංඡනය කොට ගෙන ඇති මෙම නව පක්ෂයේ මහ ලේකම් ධුරයට නීතිඥ සාගර කාරියවසම් පත්ව ඇත. ඉදිරියේදී පැවැත්වෙන පළාත්පාලන මැතිවරණය ඇතුළු අනෙකුත් මැතිවරණ සඳහා නව පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තරග වැදීමට අපේක්ෂා කෙරේ. නව පක්ෂයේ නායකයා සහ නිලධාරි මඩුල්ල මෙතෙක් හෙළිදරව් කොට නැති අතර එම තොරතුරු දෙසැම්බරයේදී පැවැත්වෙන පක්ෂ මහා සම්මේලනයේදී ප්‍රකාශ කිරීමට නියමිත බව දේශපාලන ආරංචි මාර්ග සඳහන් කරයි.

අලුත් පක්ෂය සඳහා රට පුරා ශාඛා සමිති දොළොස් දහසකුත් සාමාජිකයන් දස ලක්ෂයකුත් බඳවා ගැනීමට කටයුතු යොදා ඇති අතර මෙතෙක් පැවති සාම්ප්‍රදායික දේශපාලනයට වඩා වෙනස් මගක මෙම නව පක්ෂය ගමන් කිරීමට සූදානම්ව ඇති බව පක්ෂ සාමාජිකයකු පවසා ඇත.

මේ අතර නව පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි සභාපති ජී.එල්. පීරිස් මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කර ඇති බව පසුගියදා වාර්තා විය. පක්ෂ ව්‍යවස්ථාවට අනුව සාමාජිකයෙකු වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබා ගන්නේ නම් එම තැනැත්තාගේ සාමාජිකත්වය ඉබේම අහෝසි වන බව මේ පිළිබඳව අදහස් දක්වන ශ්‍රී.ල.නි.ප මහලේකම් දුමින්ද දිසානායක පවසා ඇත. ඒ අනුව ඉදිරියේදීද ශ්‍රී.ල.නි.ප යේ සාමාජිකයෙකු වෙනත් පක්ෂයක සාමාජිකත්වය ලබාගන්නේ නම් ඔවුන්ගේද පක්ෂ සාමාජිකත්වය නිතැතින්ම අහෝසි වන බව ඔහු පෙන්වා දී ඇත.

දසත Dasatha

2016 දෙසැම්බර් December 2016

**Published by Dasatha Publications**
**Publisher** - Gamini Abeysinghe
**Consultant Editors** - Sirisena Vithanage
**Editor in Chief** - Chamari Abeysinghe
**Associate Editors** - Nandana Prasadh
**Graphic Design & Layout** - Sampath Ranaweera
**Creative graphics** - Jagath Hewapanna
**Web Master** - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# නිහඬ වූ අමරසර

රටකට වරට බබුළුවන අසිරිමත් මිනිසුන් බිහිවන්නේ කලාතුරකිනි. ලක් දෙරණ මත උපන් තවත් එවන් විරල අසිරිමත් මිනිසෙක් නොබෝදා ලක් මවගෙන් සමුගත්තේය. ඔහු නම් නමින්ම කියවෙන පරිදි යුග යුග කියවෙන අමරණීය නමක් දිනා අප අතරින් සමුගත් අමරදේව මහා ගාන්ධර්වයාණෝය.

ඔහු ගැන ලියන්නට දසත පිටු ප්‍රමාණවත් නොවේ. එහෙත් කැනඩාවේ වෙසෙන දහස් සංඛ්‍යාත ඔහුට ආදරය කළ දසත පාඨකයින් වෙනුවෙන් මෙබඳු කෙටි සටහනක් හෝ තබන්නට අපි අදහස් කළෙමු.

'නියම කලාකරුවන් උපදිනු මිස තැනිය නොහැක්කේ' යැයි පුරාතන විශ්ව කලා ක්ෂේත්‍රයෙහි මතයක් පැවතුණේය. මෑත යුගයේ මේ මතය සනාථ කළ ශ්‍රී ලාංකේය කලාකරුවා අමරදේවයාණෝය. ඔහු භාරතයට ගොස් විශිෂ්ට සංගීතඥයන් ඇසුරෙන් සංගීතය හැදෑරූ බව සැබෑය. එහෙත් ඔහු පෑ සංගීත ප්‍රාතිහාර්යයෙහි භාරතීය සලකුණ තිබුණේම නැති තරම්ය. ඒ වෙනුවට මතු වූයේම සහජයත් සමග ආ දේශීය සලකුණමය. ඔහුගේ එකදු ගීයක හෝ සංගීත නිර්මාණයක භාරතීය ආභාසය මතු වී යයි කිසිවෙකු කිසි කලක නොකීවේද එහෙයිනි.

අමරදේවයන්ට එම නම ලැබුණු සැටිත් සංගීත ක්ෂේත්‍රයෙහි පෙරට ඇදී යන්නට මග සැලසුණු සැටිත් දෛවයේම හාස්කම් විසින් කළ ඒවා යැයි සිතේ. උපතින් ඔහුට මවු පියන් දුන් නම ඇල්බට් පෙරේරා යන්නයි. ඔහු අතිශයින් ජනප්‍රිය වූ 'ශාන්ත මේ රෑ යාමේ' ගීතය තමන්ම ලියා තමන්ම තනුගත කොට තමන්ම ගායනා කළේත් ගවුස් මාස්ටර්ගේ සංගීත නිර්මාණයන්ගෙන් ඔපවත් වූ ප්‍රේමකුමාර එපිටවෙළ සූරීන්ගේ සැළලිහිණිය මුද්‍රා නාට්‍යයේ සමුද්‍රඝෝෂ විරිතෙහි කවි ගායනා කොට ජනප්‍රිය වූයේත් අශෝකමාලා චිත්‍රපටයේ තමන්ම රඟපාමින් 'ඇයි කළේ යමකු ආලේ' ගීතය ගයා ජනප්‍රිය වූයේත් මේ ඇල්බට් පෙරේරා නමිනි. අදත් එම ග්‍රැමෆෝන් තැටිවල සටහන්ව ඇති ගායකයාගේ නම ඇල්බට් පෙරේරාය. ඉහත කී කාර්යයන් තුළින් ඔහුගේ අනාගතය දිවැසින් මෙන් දුටු මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයෝ යොවුන් වියේදීම ඔහුට 'නොමැරෙන දේවතාවා' යන අරුතැති 'අමරදේව' යන නම ලබාදුන්නේය. එය දෛවයේ හාස්කමක් නොවන්නේද? ඔහු අද ලක් අඹරේ නොමැකෙන දේවතාවෙකු බවට පත්ව නොසිටින්නේද?

දෙවන දෛවයේ හාස්කම නම් ඔහු එතෙක් කළ කී දෑ තුළින් ඔහුගේ අනාගතය ඉවෙන් මෙන් තේරුම් ගත් එවකට ලංකාදීප පුවත්පතෙහි කතුවරයාව සිටි ඩී. බී. ධනපාල සූරීන්ට භාරතයේ සංගීත ඇදුරන් වෙත ඔහු යවා ශිල්ප ලබාදෙන්නට අදහසක් ඇති වීමයි. එකල හැටියට මෙය තරමක දුෂ්කර අදහසක් වූයේ සැලකිය යුතු මුදලක් මේ සඳහා අවශ්‍ය වීමයි. එහෙත් එයින් පසුබට නොවූ ධනපාල සූරීහු ලංකාදීප පුවත්පත මගින් අරමුදලක් අරඹා රසිකයන්ගෙන් මෙම මුදල් සපයා ගන්නට සමත් වූයේය. එකලද ඔහු පිළිබඳව ජනයාගේ ඇල්ම කොතරම් වීද යත් බොහෝ රසිකයෝ ඔහුට ආධාර කළහ. භාරතයේ රත්න ජංකර් වැනි අතිශ්‍රේෂ්ඨ සංගීතඥයන්ගේ ඇසුර ලැබීමේ භාග්‍යය ඔහුට උදාවූයේ එලෙසිනි. එය හාස්කමක් නොවන්නේද? එලෙසින් එදා ධනපාලයන්ගේ මේ අත දීම නොවන්නට අපට අමරදේවයෙකු ශේෂ නොවන්නටද ඉඩ තිබිණි.

මේ සුවිශේෂ මිනිසා මනුලොවේ ගත කළ කෙටි ජීවිත කාලය තුළ පෑ ප්‍රාතිහාර්ය බොහෝය. ගුවන් විදුලිය, රූපවාහිනිය, සිනමාව, නාට්‍යය ආදි සෑම ක්ෂේත්‍රයක්ම ස්වකීය ගායනයෙන් හා සංගීත නිර්මාණයෙන් අතික්‍රමණය කරන්නට ඔහුට හැකි වූවා පමණක් නොව ඒ හැම ගායනයක්ම, හැම සංගීත නිර්මාණයක්ම අද්විතීය වී තිබීමද සුවිශේෂ වේ.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ පබාවතී, වෙස්සන්තර, භවකඩතුරාව, ලෝමහංස ආදි නාටකත් චිත්‍රසේනයන්ගේ කරදිය, නළදමයන්ති හා ප්‍රේමකුමාර එපිටවෙළයන්ගේ මුද්‍රා නාට්‍ය ආදි නාට්‍ය රැසකුත් තම සංගීතයෙන් හා ගායනයෙන් ඔපවත් කරන්නට ඔහු දායක විය.

රන්මුතු දූව, සිකුරු තරුව, අදට වැඩිය හෙට හොඳයි, රන්සළු, ගම්පෙරළිය, දෙලොවක් අතර, ගැටවරයෝ, වෑකන්ද වළව්ව, සාමා, තුංමංහංදිය, ළා දළු, සාගර ජලය, ආදරයයි කරුණාවයි, අක්කර පහ, අහස් මාළිගා, සාරවිට ආදි චිත්‍රපට සිය ගණනකට ඔහු කළ සංගීත රචනාත්, තනුත්, ගායනාත් සැබවින්ම එම චිත්‍රපට ප්‍රේක්ෂක ජනයා අතර ජනප්‍රිය වීමට හේතු වී යැයි කීම ලෙස්ටර් ජේම්ස් පීරිස් ප්‍රමුඛ එම චිත්‍රපටවල අධ්‍යක්ෂකවරුනට කරන නිගරුවක් නම් නොවේ.

නාට්‍යවල හා සිනමාවෙහි මෙන්ම කලක පටන් ගුවන්විදුලි ක්ෂේත්‍රයෙහි සරල ගී වැනි වැඩසටහන්වලදී ඔහු පෑ සංගීතමය හා ගායනමය ප්‍රාතිහාර්යයන් තවත් දිගු කලකට ශ්‍රී ලාංකේය රසික සිත්වලින් මැකී නොයනු නොඅනුමානය. සඳකත් පිණිදිය, ජගන් මෝහිනී, පාරමිතා බල පූරිත පූජිත, කොළොම්තොට නැත මහලු වී, සඳ හොරෙන් හොරෙන්, කරදර පොදි බැඳ ආදි ශ්‍රාවකයන් සුවහසක් ඇසූ ඔහුගේ මුවින් ගැයුණු ගී ඔවුන් යළි යළිත් මෝහනයට පත් කරලනු ඇත.

අවසාන වශයෙන් කිව යුතු තවත් දෙයක් තිබේ. හෙළයේ උපත ලැබ හෙළ කලා කෙත සරු කොට අපෙන් වෙන්ව ගිය ගුරුළු ගෝමීන්, විදුසක්විත්තන්, දෙවන පැරකුම්බාවන්, තොටගමුවේ සිරි රහල් හිමියන් ආදීන්ගේ නම් අදත් ලක් දෙරණතෙහි රැව් පිළිරැව් දෙන්නාක් මෙන් සිරිලක් දෙරණ පවතින තාක් කල් අමරදේව යන නාමයද අමරණීය වනු ඇති බවයි.

සුනිල් ශාන්තයන් මළ මොහොතේ අමරදේවයන් පුවත්පතකට කළ ප්‍රකාශයක් මේ මොහොතේ අපගේ සිහියට නැගේ. 'සුමිතුර, ඔබ මළේ නැත. අප සමග ඔබ මතු මතුත් ජීවත් වනු ඇත' යනු එයයි.

මහා ගාන්ධර්ව අමරදේවයාණනි, සදා අමරණීය ඔබ වෙනුවෙන්ද අපට පැවසීමට හැක්කේ එයමයි.

'සුමිතුර, ඔබ මළේ නැත. අප සමග ඔබ මතු මතුත් ජීවත් වනු ඇත'

# අපාය සහ දේශපාලනඥයෝ

■ දූරදර්ශී විසිනි

'අපාය' යන්න නිර්වචනය වන ආගමික පොත්පත්වල දැක්වෙන ආකාරයට එය අතිබිහිසුණු ස්ථානයකි. ඇඩොල්ෆ් හිට්ලර්ගේ වධකාගාරයටත් වඩා සිය දහස් ගුණයකින් බිහිසුණු වධකාගාරකි. එහි යමරජු නම් පාලකයෙක් සිටී. ඔහුගේ පිරිවර යමපල්ලෝය. මනුලොවදී කරනු ලබන වැරදිවල ලොකු පොඩිකම් අනුව එහි යන අයට දඬුවම් නියම කරන්නේ යමරජු විසිනි. මෙලොවදී මෙන් එලොවදී රජුන්ට අල්ලස් දී දඬුවමෙන් මිදීමට නම් කිසිවෙකුටත් නොහැකි බව කියනු ලබන අතර එහි ක්‍රියාත්මක වන්නේ 'කාටත් එකයි' නියමය බව කියනු ලැබේ. එහි කටුඉඹුලක් ඇති අතර ලේ පෙරී පෙරී කටු ඇනි ඇනී එහි නගින්නට සමහරුන්ට සිදුවන බවත් නොනිවී දැල්වෙන මහා ගිනි වළක් ඇති අතර සමහරුන්ට ඊට පැනීමට නියම වන බවත් දැති මෝර ආදි බිහිසුණු මත්ස්‍ය වර්ගයන්ගෙන් පිරී ගත් මහා ජලාශයක් ඇති අතර සමහරුන්ට එයට පැන උන්ට බිලි වන්නට සිදුවන බවත් සමහරුන් මහා මුවහත් කියත්වලින් ලී ඉරන්නාක් මෙන් දෙකට ඉරා වෙන්කරන බවත් කියති. මියගිය පසු අපායට යාම සාමාන්‍ය සිරිත වුවත් මෙලොවදී වැරදි කර පණ පිටින් අපායට ගිය අය ගැනත් සඳහන් වේ. ඒ දෙව්දත්, චිංචිමානවිකා ආදි අයයි.

අපාය ගැන මෙබඳු විස්තරයක් කරන්නට අපට සිත් වූයේ මන්දැයි දැන් ඔබට සිතෙන්නට පුළුවන. ඒ අන් කිසිවක් නිසා නොව, ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ඊයේ පෙරේදා කර තිබුණු 'අර්ථවත් ප්‍රකාශයක්' සිහිපත් වීම නිසාය. එතුමා විසින් 'දේශපාලනඥයන් අපායට යාම ස්ථිර බවත් දේශපාලනයේ රැඳී සිටි කාලය අනුව දීර්ඝ කාලයක් සිටියවුන්ට දීර්ඝ කාලයකුත් කෙටි කාලයක් සිටියවුන්ට කෙටි කාලයකුත් එහි ගත කරන්නට සිදුවන බවත්' ප්‍රකාශ කොට තිබුණි.

එතුමාගේ මේ ප්‍රකාශය 'වැරදි කොට නිරපරාදේ අපාගත වන දේශපාලනඥයන්' කෙරෙහි අනුකම්පාවෙන් ඔවුන් ඉන් බේරා ගනු පිණිස ඔවුන්ට එය සිහිපත් කර දීම සඳහා කළ පුරෝකථනයක් විය හැකිය.

සැබවින්ම මෙවැනි ප්‍රකාශයකට එතුමාට අවස්ථාව සැලසුණු පසුබිම නම් අනෙකක් නොව, ශ්‍රී ලංකාවේ වර්තමාන දේශපාලනඥයන්ගේ සැබෑ ස්වරූපය හඳුනා ගැනීම විය යුතුය.

ඈත අතීතයේ දේශපාලනඥයෝ සමාජයෙන් ගරුබුහුමන් ලැබුවෝය. සමාජයට අතිමහත් මෙහෙවරක් ඉටු කළ උත්තම පුරුෂයෝ වූහ. ඒ බව කෝට්ටේ යුගයේදී වීදාගම මාහිමියන් ලියූ බුදුගුණාලංකාරයේ පද්‍ය දහයක් පුරා එන මේ කෙටි විස්තරයෙන් දැනගත හැකිය.

"ඔවුන්ගේ සිත් කිසිදා දුසිරිතකින් දූෂ්‍ය නොවීය. ඔවුහු පාලන ව්‍යවස්ථාව, ඒ හා බැඳුණු නීති රීති, අධිකරණ ක්‍රමය, චක්‍රලේඛ ආදි සියලු රාජ නීති මැනවින් දැන අකුරටම පිළිපැද්දාහ. ජාති, කුල, ගෝත්‍ර, වර්ග වශයෙන් හෝ පොහොසත්, දුප්පත් වශයෙන් හෝ ස්වකීය, පිටස්තර වශයෙන් හෝ කිසිදු ආකාර වූ විශේෂත්වයක් නොදක්වමින් රට වැසි සියලු දෙනා එකා මෙන් සලකා කාටත් පොදු මධ්‍යස්ථ පාලනයක් ගෙන ගියහ. දැන උගත්, වැඩිහිටි අයගේ බසට කන් දී ඔවුන් ඉදිරියේ තම තේජස හා අණසක පතුරුවන්නට නොගියහ. වරද දුටු තැන එයට පිටුපෑහ. ඇති හැකි ශක්තිවන්තයන්ගේ බසට අවනත නොවූහ. රටවැසියන් තම දරුවන් සේ සලකමින් ඔවුන්ගේ අඩුපාඩු, දුක්ගැනවිලි ගැන සොයා බැලූහ. පාලකයන් සතු වැදගත් චාරිත්‍ර නොනසා ඒවාට ගරු කරමින් කටයුතු කළහ. අයබදු අය කළේ ජනතාවට කිසිදු පීඩාවක් නොවන ආකාරයටය. මලට හානියක් නොකර මලින් රොන් ගන්නා බඹරුන් මෙන් ජනතාවට හානියක් නොවන සේ අයබදු අය කළහ. ජනතාවට බොරු පොරොන්දු නොදුන්හ. සැබෑවක්ම කීහ. ඔවුහු රළු මගක රෝද පෙරළෙමින් ගමන් ගන්නා විට එහි පැටවූ බඩුවලට හානියක් නොවන ගැලක් සේ ජනතාව ආරක්ෂා කරගනිමින් පාලනය ගෙන ගියහ. ජනතාවට දුක දී තමන් සැප නොවින්දහ. තම ඵල ප්‍රයෝජනය තකා ගසෙහි ඉදිරියෙහි ප්‍රයෝජනයට ගත හැකි ඵල සහිත අතු කඩා ඵල බුදින්නවුන් මෙන් පාලනය නමැති ගසෙහි නීති රීති නමැති අතු විනාශ නොකොට ජනතාවට විනාශය ළඟා කරමින් පාලනය ගෙන යන්නට කිසි සේත් නොපෙළඹුණහ. රාජ්‍ය සේවකයන් විශ්‍රාමික වූ කල දත් මැදලා විසි කරන දඬු මෙන් සලකා නොහඳුනන්නවුන් මෙන් අත්හැර නොදැමූහ. ඔවුන්ගේ සේවා කාලය තුළ රටට කළ මෙහෙය අගය කළහ. මෙබඳු වූ මේ දැහැමි පාලකයන්ට සම්පත්තියෙන් අඩුවක් නොවූ අතර නීරෝගී සුවයෙන්ද රූප සම්පන්න බවින්ද සශ්‍රීක වූහ."

මෙකී ඈත අතීතයේ නොව, මෑත යුගයේදීද එනම් නිදහස ලබා අවුරුදු 25 ක් 30 ක් ගිය යුගය වන විටද ශ්‍රී ලංකාවේ දේශපාලනඥයෝ එතරම්ම පිරිහී නොසිටියහ. ඉහත කී තත්ත්වයට ආසන්නව සිටියහ. ඔවුන්ගෙ න් බහුතරයක් ජනහිතකාමීහු වූහ. ජනතාව ඡන්දයෙන් ලබාදෙන බලපුළුවන්කාර කමින් ජනතාව පෙළා තමන් සුර සැප නොවින්දහ. ආණ්ඩු පක්ෂයේ වුවද විරුද්ධ පක්ෂයේ වුවද බලය ලබාගැනීමේ හා බලය පවත්වා ගැනීමේ චේතනාවෙන් මුසා බස් හා රැවටිලි බස් පවසා

20 වන පිටුව බලන්න




උඳුවප් මාසයේ සිහින් පවන් රැල් ක්‍රම ක්‍රමයෙන් මේ මිහිතලය මත සිසිල් බවේ සලකුණු ගෙන එන්නට පටන් ගෙන ඇති හැඩක් දැනේ. හිම්දිරි උදෑසන නිදිබර කුරුලු කූජන ඇසෙනා තරම් පාන්දරින් පෙනෙන නොපෙනෙන සියුම් සේලයක් සේ මිහිදුම පැතිරී තිබේ. සොයා ගත නොහැකි බොහෝ තැන්වලින් කුරුලු කූජන පමණක් මිහිතලය පුරා විහිදී යයි.

මම එකම යායට, ඒකාකාරී උසකට දිස්වෙන තේ යාය දෙස බලා සිටින්නෙමි. තද කොළ පැහැති කොළ පිරුණු පඳුරේ අවකාශයට විවර වන ඉති සියල්ලේම ළා කොළ පැහැති නව, සියුම් දළු මතු වී තිබේ. ඒ දල්ල මැද තවමත් දිග නොහැරුණු පත්‍රයකි.

උදෑසන හිරු කිරණ මිහිතලය මත වැටී රැස් විහිදන්නට පටන් ගන්නා වේලාව වන විට මේ නොමේරු කොළ දෙක හා තවමත් දිග නොහැරුණු පත්‍රය දළු නෙළන්නියන් විසින් කඩා ගනු ඇත. එවිට නැවතත් එකම උසකින් එකම අයුරකින් ගස දිස්වෙන්නට පටන් ගනී. එහෙත් යළි යළිත් අර ක්‍රියාදාමයම සිදුවෙන බැවින් හැම සතියකම තේ දල්ලට මිය යාමට සිදු වේ. එහෙත් අරුමය වන්නේ තේ දල්ල මිය යාමට සිදුවන බව දැන දැනත් නැවත ඉපදීම නොවේද? උදෑසන මිහිදුම මෙන්ම පිනි පොඳක පහස විඳින්නටද තේ දල්ලට ලැබෙන්නේ දවස් පහක් වැනි කුඩා කාලයක් පමණි. ජීවත් වන්නට වෙර දරන නිමේෂයේම ජීවිතයෙන් සමුගැන්මට සිදුවන තේ දල්ල දෙස මම නිහඬවම බලා සිටියෙමි.

මේ වැනිම නොවේද ජීවිතයත්. ජීවත්වන්නට වෙර දරන නිමේෂයේම මිය යන්නට සිදුවන අවස්ථා කොතෙක්ද? මා මේ සඳහන් කරන්නේ හුදු ශාරීරික මිය යාම ගැන නම් නොවේ. එය සිත, කය අතහැර යාමකි. එහෙත් සිත, කය අතහැර නොගොස් මිය යන්නේ නම්. එය කය මිය යාමට වඩා බෙහෙවින් වේදනාකාරී බව ජීවිතයේ එක් වරක් හෝ ඔබ විඳ ඇති බව මම දනිමි.

මිනිස් සංහතිය මේ ලොව ප්‍රාදුර්භූත වූයේ කෙසේද? එතරම් දුර නොයන්න. ඔබ බිහි වූයේ කෙසේද? පෙනෙන්නට තිබෙන ජීව විද්‍යාත්මක සාධකය ඔබ මට ඉදිරිපත් කරනු ඇත. එහෙත් දිගින් දිගටම සිතා බලන්න. මේ ප්‍රශ්නයට අපට දාර්ශනිකයන්ගෙන් හෝ අප අදහන ආගම්වලින් පිළිතුරක් ලැබෙන්නේ නැත. පිළිතුරු ලබා ගැන්මට උත්සාහ කිරීමද නිෂ්ඵල කටයුත්තකි.

ඔබ කවුද, ඔබ බිහිවූයේ කෙසේද, සත්‍යය හෝ යථාර්ථය යනු මොනවාද? මේ සියල්ලටම පිළිතුරු ඇත්තේ ඔබ ළඟමය. අප සියලුදෙනා මේ උත්සාහ දරනුයේ ඒ පූර්ණ අවබෝධය ලබා ගැන්මටය. එහෙත් එය ලේසි පහසු කටයුත්තක් නොවේ.

ජීවත් වීම යනු කුමක්ද? නිමක් නොපෙනෙන අරගල ලුහුබැඳ යාම නොවේද? බලය, තත්ත්වය, කීර්තිය, ගෞරවය ඈ මේ නන්විධ දෑ අත්පත් කරගැන්මේ අභිලාෂයෙන් අපි නොනවතින අරගලයක නිරතව ඇත්තේ නොවේද? අවසන මහත් අභිමානයෙන් අත්පත් කරගන්නා මේ සියල්ල දෙස නැවත හැරී බලනු මැනවි. ඒ හැම ජයග්‍රහණයක් පිටුපසම ද්වේශය, වෛරය, තළා පෙළා දැමීම් එකකට එකක් නොදෙවෙනිව පවතින බැව් ඔබටම පෙනෙන්නට පටන් ගනු ඇත.

යම් කිසි දිනයෙක අප පසුපසින් එන මේ අතිමහත් සිතිවිලි කන්දරාවට හෘදය සාක්ෂිය ගැළවීමක් ලබා දෙන්නේ නැත. අප දෙවියන් ඉදිරියේ යාඥා කරමින් අපට සැනසීම ලබා දෙන මෙන් ඉල්ලා සිටියද අපට සැනසීම ලබා දෙන්නට හෘදය සාක්ෂිය ඉඩ දෙන්නේ නැත.

අප එකිනෙකා හා තරග කරන්නේ මන්ද? මසිත පැනයක් නඟයි. ඒ අපේ ජීවිත පුරා අවිඥානිකවම ගොඩනැඟෙන දැඩි ආත්මාර්ථකාමී බව හේතුවෙන් නොවේද? අප දෙවියන් යදින්නේ, යාඥා කරන්නේ අපට සැනසීම ලබාදෙන ලෙස පවසමින් නොවේද? සමස්ත මානව වර්ගයා කෙරෙහිම පතළ කරුණාවක් කෙසේ වෙතත් අප අපේ බිරියට, ස්වාමිපුරුෂයාට, යහළු යෙහෙළියන්ට මතු නොව දෙමවුපියන්ටද මෛත්‍රී කරනවාද? යහපත ප්‍රාර්ථනා කරනවාද? ලොව පවතින සියලුම ආගම් මගින් අනෙකා කෙරෙහි දයාවත් වීමට උගැන්වූයේ වී නමුදු ඒ කිසිවක් ග්‍රහණය කර ගැන්මට අපට හැකි වීද? ඒ සියල්ල පසෙකින් තබන්න. ඔබට ස්වාධීන පුද්ගලයකු වශයෙන් තමා අභ්‍යන්තරයේවත් නිදහස් බවත්, ස්වාධීන බවත් ඇති කරගත හැක්කේද?

ඔබට කෙදිනක හෝ 'මා වෙනස් විය යුතු' යැයි සිතී තිබේද? එය ඔබේ ජීවිතය දෙස නැවත හැරී බලන්නට අවකාශ විවර කළාද? ඔබට වෙනස් වීමට අවශ්‍ය නම් ඔබ කළ යුත්තේ කුමක්ද? ඔබේ සිතේ පවතින අතිමහත් වූ සිතිවිලි කන්දරාව එක්තැන් කර ගත යුතු නොවේද?

බාහිරින් ඔබට බලපෑම් කරන සියලු බලවේග, මතිමතාන්තර හා බලය ප්‍රතික්ෂේප කිරීමටත් තමා, තමා පිළිබඳව පූර්ණ විශ්වාසයක් ඇතිකර ගැන්මත් මේ සඳහා ඔබට අවශ්‍යම බව ඔබ දන්නවාද? පූර්ව විශ්වාස, නිගමන හා පූර්ව විනිශ්චය පසෙක ලා ඔබ ඒ ගමන් මාර්ගයට අවතීර්ණ වන්නේ නම් නිදහස්ව ජීවිතයට මුහුණදීමේ අවකාශය ඔබට උදාවෙන බැව් අත්දැකීමෙන්ම පසක් කරගන්නා මෙන් මම ඔබෙන් ඉල්ලා සිටිමි.



# ගුරාගේ කොළම

මට හිතෙන හැටිය...

ශීතල ඇඟට දැනෙන උඳුවප් මාසය හෙවත් දෙසැම්බර් මාසය උදා වී ඇත. කිතනු බැතිමතුන් සමග එක්ව මුළු ලෝකයම ජේසු තුමාගේ උපත සමරන නත්තල මාසය මෙයයි.

අප සැම හොඳින් දන්නා කිතු දහම හා බැඳුණු කියමනක් නැතිනම් පණිවිඩයක් ඇත. 'අසල්වැසියාට ප්‍රේම කරන්න'. මේ කියන්නේ අල්ලපු ගෙදර එකා හෝ එකී සමග නියම හෝ අනියම් ආකාරයේ ප්‍රේම සම්බන්ධයක් පවත්වා ගන්න කියා නොවේ. ඔබ සමග ගැවසෙන ඔබ ඇසුරු කරන සමාජයේ සියලුදෙනා වෙත ආදරයෙන් කරුණාවෙන් දයාවෙන් යුතුව මිත්‍රශීලීව කටයුතු කරන ලෙසය. බුදුදහම අනුවද සියලුදෙනා වෙත මෛත්‍රීය වැඩීමට අප හුරු වී ඇත. අද වන විට සමාජයට මෙම සිතුවිල්ල ඉතාමත් අවශ්‍ය වී ඇතැයි යන්න මගේ හැඟීමයි.

වේගයෙන් ඉදිරියට ඇදෙන එකිනෙකා පරයා ඉහළ නැගීමට වෙර දරන භෞතික දේට වැඩි ඉඩකඩක් වටිනාකමක් ලබා දෙන නූතන සමාජයේ අප අවට වෙසෙන අප ළඟින් ඇසුරු කරන නොකරන සියලුදෙනාට කරුණාවෙන් ලෙන්ගතුව සැලකීම වෙනදාටත් වඩා අද අත්‍යවශ්‍ය වී ඇත. විවිධ වූ ප්‍රශ්න මැද දිවි ගෙවන සමාජයේ ඉක්මන් කේන්තිකාරයන්, යමක් ඉවසා දරාගත නොහැකි විරුද්ධ මතවලට සවන්දිය නොහැකි පුද්ගලයන්, වැඩිවෙමින් පවතිනවා යැයි සිතේ. අපේ විදියට කියනවානම් 'හොස්ස ළඟින් මැස්ස යාම' ඉවසා දරාගත නොහැකි 'කුකුල් කේන්තිකාරයන්' නිසා බොහෝ ව්‍යසන, වියවුල්, සිත් තැවුල්, ගැටලු, හැලහැප්පිලි ඇති වේ.

සමාජයේ සියලු කාරණාවලදී මෙය දක්නට ලැබේ. පාරේ ගියත්, වාහනයක් එලෙව්වත්, කඩයකට ගියත්, දේශපාලන කතාබහවලදීත්, සුහද හමුවලදීත්, පොදු කටයුතුවලදීත් ඉවසීමක් නොමැතිකම පැහැදිලිව දක්නට ලැබේ. අසල්වැසියාට ප්‍රේම කරනවා තබා අනුන්ගේ මතයක් ඉවසා දරාගැනීමට නොහැකි අය අප අතරේ ඇත. සමාජ දේශපාලනික ප්‍රශ්නවලදී සමහරු ඉතාමත් පටු පෞද්ගලික මට්ටමින් සිතා තමන්ගේ ඉතාමත් කිට්ටු හිතවතුන් සමග තරහ වේ. කතානොකර සිටී. හැමදේම තමා දමා ගත් කණ්ණාඩියේ පාටින් බලන්නට පුරුදු වේ. අනෙකාගේ දේ හෙළා දකියි. අවමානයට පත්කරයි. අන් මතය නොඉවසයි. අවසානයේ ලබන දෙයක් නැත. සිදුවනුයේ හිතවතකු අහිමිවීම පමණි. වාදවිවාදවලදී තම මතය කීවද අනුනට රිදවීම අනුවණ කමකි.

සමහරු සෑමවිටම බලනුයේ කා සමග හෝ කොක්කක් දා ගැනීමටය. පැටලීමටය. දෙවැනි වීම මදිකමක් ලෙස සලකයි. සෙකන්ඩ් වෙන්න අකැමතිය. සුළු දේට ගහමරා ගනියි. අද වන විට වාහන පැදවීමේදී මාර්ගවලදී විවිධ පුද්ගල ඝට්ටන ඇති වීමට හේතුව අනෙකාට ආදරය කරුණාව නොමැති වීම සහ අනෙකාට ඉඩ නොදී තමා ගැනම සිතීමයි. රථ ගාල්වලදී වාහනය නවතාගැනීමට ඉඩක් ලබාගැනීම සඳහා තරඟයක යෙදෙයි. රණ්ඩුසරුවල් ඇතිකර ගනියි. ඉවසීමක් නැත. අසල්වැසියාට කරුණාවක් මෛත්‍රීයක් හෝ නොදක්වයි. අවස්ථාවක් නොදෙයි.

සමහරු ගෙවල්වලින් පිටවන්නේ නොයෙකුත් ප්‍රශ්න ගැටලු හිතේ තද කරගෙනය. මේ ගැටලු කැකෑරෙන ප්‍රශ්න  කුණු ගොඩවල් වාගේය. සුළු සිද්ධියකදී පවා තමන්ගේ ගැටලු මුදාහරියි. තමන්ගේ කුණුගොඩවල් අනුන්ගේ ඇඟට දමා ගසයි. අනෙකාට පහරදීමට වුව පසුබට නොවේ. අප එයට කුණුබක්කියක් නොවිය යුතුය. කෙනෙක් රවයි නම් ගොරවයි නම් හොඳම දේ එතනින් මාරු වීමය. එය නිවටකමක් නොව අවස්ථාවට උචිත වැඩක් වේ. අනුන්ගේ ප්‍රශ්න කුණු අපේ ඇඟට හැලීමට ඉඩ නොදිය යුතුය. එසේම අපේ ප්‍රශ්න අනුන්ට කරදරයක් නොවිය යුතුය. නරක දේ පෙන්වා දීමේදි වුව අනෙකාට රිදෙන සේ කිරීමට සුදුසු නොවේ. ප්‍රශ්න ඇති විට මිනිසුන්ගේ හැසිරීම සාමාන්‍ය තත්ත්වයට වඩා බොහෝ වෙනස්ය. සමහර අය නිකරුණේ හේතුවක් නොමැතිව මිනිසුන් සමග ප්‍රශ්න ඇතිකර ගන්නා විට මේ මනුස්සයා අද ඇඳේ වැරදි පැත්තෙන් නැගිටලද කොහෙද කියා සමාජයේ කියන්නේ මේ නිසාය.

තරගකාරී සමාජයේදී මෛත්‍රිය කරුණාව ආදරය අත්‍යාවශ්‍ය වේ. සුළු දේවලට අමනාප වීම අණුවණ කමකි. අප ජීවත් වන්නේ ඉතා සුළු කාලයකි. නත්තල් හැට හැත්තෑවක් සැමරීමට පමණක් වාසනාව තිබිය හැක. ළඟදී මා ඇසූ කතාවකට අනුව මේ සුළු කාලයෙන් වැඩි කොටසක් නිදාගැනීමට සහ අනවශ්‍ය නඩුහබවලට සහ වාදවිවාදවලට ගතවෙයි. ජීවිතය විඳවිය යුතු නැත. එය වින්ද යුතුය. එනිසා ජීවත් වන කාලය තුළ අනුන්ට කරුණාව දයාව මෛත්‍රිය දැක්වීම සුදුසු වේ. එක් හොඳ වචනයකින් ක්‍රියාවකින් මිනිසුන්ගේ හිත් සුව වනු ඇත. 'අසල්වැසියට ප්‍රේමකරන්න', 'මිත්‍රශීලි වන්න', 'උදව් කරන්න'. අනුන්ගේ කුණුවලට කුණුබක්කියක් නොවන්නා සේම අපේ කුණු විසි කිරීමට අසල්වැසියා කුණුබක්කියක් කරනොගන්න.

සැමට සුබ නත්තලක් වේවා !

මේ මට හිතෙන හැටිය.

මේ වගට

ගුරා

පාඨක ප්‍රතිචාර එවීමට : gura.kolama@gmail.com

# ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් !

ලොවම ඇස් අයා බලා සිටි ඇමරිකානු ජනාධිපතිවරණය මේ වන විට නිමා වී සති කීපයක් ඉක්ම ගොස් අවසන්ය. මේ ගෙවී යන්නේ මැතිවරණයෙන් පසු උදා වන සංක්‍රාන්ති සමයයි. පක්ෂයකින් වෙනත් පක්ෂයකට මාරු වන, වසර 8 ක් සිටි ජනපතිවරයෙකුගෙන් අලුත් ජනපතිවරයෙකුට මාරු වන මේ සංක්‍රාන්ති සමය ඇමරිකාවට පමණක් නොව සමස්ත ලෝක දේශපාලනයටම ඉතාමත් වැදගත් කාල පරිච්ඡේදයකි. ඇමරිකාව වැනි බලවත් රටක මුල් පුටුවට ඩොනල්ඩ් ට්‍රම්ප් වැනි ව්‍යාපාරික බලවතෙකු පැමිණීම ලෝක දේශපාලනයේද පෙරළිකාර වෙනස්කම් ඇති කරන සිදුවීමක් විය හැකි බව ඇතැම් දේශපාලන විශේෂඥයින්ගේ මතයයි. එහෙත් දේශපාලනය යනු සූදුවක දාදු කැටයක් මෙන් නිසා අනාගතයේ සිදුවිය හැකැයි පැවසෙන දේශපාලන පෙරළි පිළිබඳව හිතළු මත පළ කිරීම එතරම් සුදුසු නොවේ.

ඩොනල්ඩ් ට්‍රම්ප් හා හිලරි ක්ලින්ටන් අතර පැවති ජනපතිවරණ සටනේදී අනාවැකි පළ කළ බොහෝ දෙනෙකු පවසා තිබුණේ හිලරි දිනන බවයි. එපමණක් නොව, අන්තර්ජාලය ඇතුළු විවිධ මාධ්‍ය ඔස්සේ ඇමරිකාව හා ලොව පුරා පවත්වනු ලැබූ සමීක්ෂණ හා ජන අදහස් විමසුම්වලදීද වැඩි වාසි අත් වී තිබුණේ හිලරි වෙතයි. එහෙත් ඒ සියල්ල බොරු කරමින් ට්‍රම්ප් සිය ජයග්‍රහණය සලකුණු කොට ගති. එහිදී ඇමරිකාවේ ප්‍රාන්ත 50 තුළ පැවති ඡන්ද කොට්ඨාස 538 න් කොට්ඨාස 290 ක්ම ජය ගැනීමට ඩොනල්ඩ් ට්‍රම්ප් සමත් විය. හිලරි ක්ලින්ටන්ට ලබාගත හැකි වූයේ කොට්ඨාස 232 ක් පමණි. ඇමරිකාව වැනි බටහිර රටක කිසිදා දක්නට නොලැබුණු උණුසුමක් මෙවර ජනපතිවරණය පුරාම දක්නට ලැබුණු අතර ඡන්දය ප්‍රකාශ කළ දිනයේදීද එය ඒ අයුරින්ම දක්නට ලැබුණි. සාමාන්‍යයෙන් මින් පෙර පැවති බොහෝ මැතිවරණවලදී ඡන්දය ප්‍රකාශ කිරීමේදී ඇල්මැරුණු ස්වභාවයක් දක්නට ලැබුණත් මෙවර ජනතාව දැඩි උනන්දුවකින් ඡන්ද පොළවල් කරා ඇදී තිබුණි. ජනාධිපතිවරණ ඡන්ද ප්‍රකාශ කිරීම ආරම්භ වී පළමු පැය 2 ක තුළ ඇමරිකානුවන්ගෙන් සියයට 40 ක් ඡන්දය පාවිච්චි කර තිබීමෙන්ම එය තවත් තහවුරු වේ. උදෑසනම ඡන්ද පොළවල් කරා ඇදී ආ ජනතාව නිසා ඇතැම් ඡන්ද මධ්‍යස්ථාන අසල සැතපුමක පමණ පෝලිම්ද දක්නට ලැබුණි.

එසේ ගොස් ඡන්දය භාවිත කළ ජනතාව අතරින් ට්‍රම්ප්ගේ ජයග්‍රහණයට පාර කැපූ බහුතරය එරට වැඩිහිටි පිරිමින් වේ. වයස අවුරුදු 45 ඉක්ම වූ සුදු පිරිමි ඡන්දවලින් සියයට 53 ක් මෙවර ට්‍රම්ප් වෙත ලැබී තිබුණි. තමාගේ ඡන්ද භාවිතය පිළිබඳ මාධ්‍ය වෙත අදහස් දැක්වූ එක් ඡන්දදායකයකු පවසා තිබුණේ, ගිලිහෙමින් පවතින ඇමරිකාවේ අභිමානය යළිත් ලබා දීමට හැකියාව ඇත්තේ ඩොනල්ඩ් ට්‍රම්ප්ට නිසා ඔහුගේ ජයග්‍රහණය වෙනුවෙන් තම ඡන්දය ලබා දුන් බවයි. ට්‍රම්ප්ගේ ජයග්‍රහණය පතා සියයට 8ක කළු ජාතික ඡන්ද ප්‍රතිශතයක් ලැබී තිබුණු අතර ආසියානු සම්භවයක් සහිත පිරිසගෙන් සියයට 29 කගේ ඡන්ද ට්‍රම්ප්ට හිමි වී තිබුණි.

අහසින් පාත් වුණාක් මෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ මේ ව්‍යාපාරිකයාගේ ජයග්‍රහණය විශ්මයජනක වූවක් බව දේශපාලන විශ්ලේෂකයන් පවසා ඇත. සැබවින්ම මේ 70 හැවිරිදි ප්‍රකෝටිපති ව්‍යාපාරිකයා කිසි දිනෙක දේශපාලනය කර නොමැත. කිසිදු දේශපාලන පක්ෂයකට අයත්ව සිටද නොමැත. එහෙත් බහුතරයක් ඇමරිකානුවන් ට්‍රම්ප් වෙත සිය මනාපය පළ කර ඇත. ඒ අන් කිසිවක් නිසා නොව, 'සුද්ද(Pure) ඇමරිකානුවන්' තුළ පවතින ජාතිකත්වය හේතුවෙනි. බොහෝ ඇමරිකානුවන් සංක්‍රමණිකයන් කෙරෙහි දැඩි විරෝධී ප්‍රතිපත්තියක පසුවූවත් ඔවුනට මෙතෙක් එය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ගැනීමට අවස්ථාවක් නොවුණි. එහෙත් ඒ ඇමරිකානුවන්ගේ සිත්වල තිබූ කැකෑරිල්ල ඩොනල්ඩ් ට්‍රම්ප් මොර ගාමින් දේශපාලන වේදිකාවල පැවසූහ. විශේෂයෙන්ම මුස්ලිම් අන්තවාදයට විරුද්ධව ඔහු පැවසූ කතා ජනතාව හිස් මුදුණින් පිළිගෙන ඇති බව මේ ඡන්ද ප්‍රතිඵලයෙන් සනාථ වේ.

වත්මන් ජනාධිපති බරක් ඔබාමාගේ පාලන කාලය අවසන් වන 2017 ජනවාරි 20 වන දිනෙන් පසුව ඇමරිකාවේ 45 වන ජනාධිපති ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප් දිවුරුම් දීමට නියමිත වේ. ඒ අනුව 2009 සිට මේ දක්වා වසර 08 ක කාලයක් ඇමරිකාව පාලනය කළ ඩිමොක්‍රටික් පක්ෂය වෙනුවට ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ පාලනය සහිත රිපබ්ලිකන් පක්ෂයට එම බලය හිමි වේ.

1 වන පිටුවෙන්

## 2017 සංක්‍රමණික...

ඉදිරිපත් කළ මැකලම් අමාත්‍යවරයා මාධ්‍ය වෙත පවසා සිටියේ, 'කැනඩාවේ අනාගත ආර්ථික වර්ධනය සඳහා මෙය අඩිතාලමක් වනු ඇති' බවයි.

පසුගිය වසරවලදී කැනඩාවට පිළිගත් සංක්‍රමණික සංඛ්‍යාව පිළිබඳ දත්තයන්හි දැක්වෙන්නේ, 2011 සිට 2015 දක්වා 260,000 කට පමණක් අවස්ථාව සලසා දී තිබුණු බවයි. නමුත් 2016 වසරේදී මෙම සංඛ්‍යාව ඉහළ යෑම සිදු වූ අතර 'විශේෂ තත්ත්වයක්' ලෙස සලකා සිරියානු සරණාගතයින් 25,000 කට කැනඩාවේ දොරටු විවර කිරීම නිසා ලක්ෂ 300,000 ක පිරිසක් සංක්‍රමණිකයන් ලෙස කැනඩාවට පැමිණ තිබුණි. මේ වසරේදී පැමිණුනු එම සංඛ්‍යාව පිළිබඳවද අවධානය යොමු කළ කැනඩා රජය ස්ථිර පදනමක් මත පිහිටා 2017 වසර සඳහා සංක්‍රමණික සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගෙන ඇත.

රජයේ නිර්දේශයන්ට අනුව කැනඩාවේ ආර්ථික වර්ධනය සඳහා ඉදිරි පස් වසර තුළ මෙහි ගෙන ආ යුතු සංක්‍රමණිකයන් සංඛ්‍යාව 450,000 කි. එහෙත් මැකලම් අමාත්‍යවරයා රජය විසින් ඉදිරිපත් කළ එම ඉලක්කය ප්‍රතික්ෂේප කර ඇති අතර එහිදී ඔහු පවසා ඇත්තේ, එම අංකය පිළිබඳව අනාගතයේ යම් දිනක සිතා බැලිය හැකි නමුත් 2017 වසර සඳහා එතරම් ලොකු ඉලක්කයකට යාම සුභදායක නොවන බවයි. ලිබරල් රජය විසින් ගනු ලැබූ මෙම පියවර සම්බන්ධයෙන් මේ වන විට විවිධ තර්ක විතර්ක මතු වෙමින් පවතින අතර කැනඩාව තුළ විරැකියාව විශාල අරගලයක්ව පවතින මෙවැනි කාලයක ඉලක්කගත ආගමන සංඛ්‍යාව මෙතරම් වැඩිකිරීම සම්බන්ධයෙන් බොහෝ දෙනා අප්‍රසාදය පළ කොට ඇත.

2017 සඳහා ඉලක්කගත කොට ඇති සංක්‍රමණිකයන් වැඩිකර ඇති ආකාරය මෙසේය. ආර්ථික වර්ගීකරණය යටතේ - නිපුණතා සහිත (skilled workers) , ව්‍යාපාරික ජනතාව සහ Caregivers සංඛ්‍යාව 160,600 සිට 172,500 දක්වා ඉහළ දමා ඇත. පවුල් වර්ගීකරණය යටතේ - කලත්‍රයන්, දරුවන්, දෙමව්පියන් ඇතුළු ආසන්න වැඩිහිටියන් (grandparents) සංඛ්‍යාව 80,000 සිට 84,000 දක්වා ඉහළ දමා ඇත.

වාර්ෂිකව කැනඩාවට ගෙන්වා ගන්නා සංක්‍රමණික පිරිස මේ ආකාරයට වැඩිකිරීම සම්බන්ධයෙන් කැනඩා ආණ්ඩු පක්ෂ නායක හා පාර්ලිමේන්තු ලේකම් කෙවින් ලැමොරොක්ස් අදහස් දක්වමින් පවසා ඇත්තේ, මෙය රටට පමණක් නොව සංක්‍රමණිකයන්ටද වාසිදායක තත්ත්වයක් බවයි. එහිදී මෙරට පවතින රැකියා පුරප්පාඩු පුරවා පළාත්බදවත්, පොදුවේ රටෙහිත් ආර්ථිකය වර්ධනය කරගන්නා ගමන්ම එසේ පැමිණෙන සංක්‍රමණික ජනතාවටද තම ජන ස්වභාවයන් හැඩ ගස්වාගෙන, ඒවා වැඩිදියුණු කරගෙන, යහපත් ආකාරයෙන් කැනඩාව තුළ පවතින සමාජ වියමනට දායක වීමට අවස්ථාව ලැබෙන බව ඔහු පවසා සිටී.

# ඉන්දියාවේ මුදල් තහනම....!

ඉන්දියාව පුරා පැතිරී ඇති කළු සල්ලි ජාවාරම මැඩ පැවැත්වීම සඳහා දැනට භාවිතයේ පවතින මුදල් නෝට්ටු දෙකක් වහාම තහනම් කිරීමට ඉන්දීය රජය පියවර ගෙන ඇත. ඒ අනුව පසුගිය නොවැම්බර් 8 වනදා මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදී ඉන්දීය රුපියල් 500 සහ 1000 නෝට්ටු දෙක අවලංගු කරනු ලැබුණි.

එරට රූපවාහිනිය ඔස්සේ විශේෂ ප්‍රකාශයක් කරමින් ඉන්දීය අගමැතිවරයා මේ පිළිබඳව ජනතාවට දැනුම් දී තිබේ. මෙම නිවේදනයෙන් පසු දින ඉන්දියාව තුළ ඇති සියලුම ATM යන්ත්‍ර සම්පූර්ණයෙන් වසා දැමීමට පියවර ගැනුණු අතර නොවැම්බර් 10 දා සිට දෙසැම්බර් 30 වනදා දක්වා කාලය තුළ තමන් සතුව ඇති අවලංගු කරන ලද රුපියල් 500 සහ 1000 නෝට්ටු, බැංකුවලට හෝ තැපැල් කන්තෝරුවලට භාර දී නව නෝට්ටු ලබා ගන්නා ලෙස ජනතාව දැනුවත් කර තිබුණි.

ඉන්දියාව තුළ කළු සල්ලි භාවිතය දැඩි අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇති අතර තමන් සතු මුදල් සංචිත නීතිවිරෝධී ලෙස සඟවා තබාගනිමින් රජයට අය විය යුතු බදු වංචා කරන පිරිස දිනෙන් දිනම ඉහළ යමින් ඇත. මෙවැනි පුද්ගලයින් බදු දැලට හසුකර ගැනීමටත් නීති විරෝධීව මුද්‍රණය කෙරෙන හොර සල්ලි ජාවාරම මැඩ පැවැත්වීමටත් මෙම තීරණය ගැනීමට සිදුවූ බව ඉන්දීය රජය පවසා සිටී. ඉන්දියාවේ ලොකු මුදල් නෝට්ටු හොරට මුද්‍රණය කිරීමෙන් එම නෝට්ටුවල තත්ත්වය විශාල ලෙස බාල්දු වී ඇති අතර යාබද රටවල් වන නේපාලය, බංග්ලාදේශය හා පාකිස්තානය වැනි රටවල මෙම මුදල් නෝට්ටු මාරු කිරීම ප්‍රතික්ෂේප කරන තත්ත්වයකට පත්වී ඇත.

එහෙත් අතිවිශාල ජනගහනයක් සහිත ඉන්දියාව හිටි හැටියේ මුදල් නෝට්ටු අවලංගු කිරීම නිසා මේ වන විට අර්බුද රැසක් මතු වී ඇත. මේ පිළිබඳව ලෝක බැංකුවේ හිටපු ප්‍රධාන ආර්ථික විශේෂඥයකු වන කෞෂික් බාසු පවසා ඇත්තේ, ඉන්දීය රජය විසින් රුපියල් 500 සහ 1000 නෝට්ටු ඉවත් කර ගැනීමට ගනු ලැබූ තීරණය 'දුර්වල ආර්ථික විද්‍යාත්මක පියවරක්' බවයි.

මෝදි රජය විසින් නෝට්ටු ඉවත් කර ගැනීමට ගත් පියවර එරට දුගී දුප්පත් ජනතාවට විශාල බලපෑමක් එල්ල කර ඇති අතර තමන් සතු අවංලගු නෝට්ටු වලංගු මුදල් බවට පත් කර ගැනීම සඳහා බැංකු සහ තැපැල් කාර්යාල අසල දිවා රාත්‍රී මිනිසුන් පොදි ගැසී සිටින ආකාරයක් දක්නට ලැබේ.

අවලංගු කරනු ලැබූ රුපියල් 500 සහ 1000 නෝට්ටු වෙනුවට රජය විසින් රුපියල් 2000 අලුත් නෝට්ටුවක් හඳුන්වා දී ඇති නමුත් එම නෝට්ටු ප්‍රමාණවත් ලෙසින් බැංකු සහ තැපැල් කාර්යාල වෙත ලබා දී නොමැති බව පැවසේ. මේ අතර අවලංගු කරනු ලැබූ මුදල් නෝට්ටු වෙනුවට නව මුදල් නෝට්ටු ලබා ගැනීමේදී සීමාවන්ට යටත්ව එම හුවමාරුව කර ගැනීමට ජනතාවට සිදුවී තිබේ. ආරම්භයේදී එක් පුද්ගලයෙකුට දිනකට රුපියල් 4000 දක්වා මුදල් නෝට්ටු මාරු කර ගැනීමට අවස්ථාව සලසා තිබුණත් මේ වන විට එය දිනකට රුපියල් 2000 දක්වා සීමා කොට ඇත. මුදල් මාරු කර ගැනීමට එන ජනතාව රජයේ සීමාවන් ඉක්මවා යාම වැළැක්වීම සඳහා නව මුදල් නෝට්ටු ලබාගන්නා සියලුම පුද්ගලයන්ගේ ඇඟිල්ලක මැකිය නොහැකි තීන්ත වර්ගයක් ආලේප කරනු ලැබේ.

කෙසේ වුවත් ශීත සෘතුවේ ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවීන් සඳහා රජයේ සීමාව ඉක්මවා මුදල් නෝට්ටු ලබා දීමටත් විවාහ උත්සව සඳහා සූදානම් වන පවුල්වලට ඉන්දීය රුපියල් දෙලක්ෂ පනස් දහස දක්වා මුදල් නෝට්ටු හුවමාරු කර ගැනීමටත් අවස්ථාව සලසා දීමටත් රජය අදහස් කර ඇත.

මුදල් නෝට්ටු අවලංගු කිරීමට රජය විසින් ගත් ක්ෂණික තීරණය නිසා බැංකු විසින් සිදුකරමින් තිබූ මහා පරිමාණ (මිලියන, බිලියන ගණන්) ගනුදෙනු සඳහා කුඩා නෝට්ටු භාවිත කිරීමට සිදුවී තිබුණි. මේ හේතුවෙන් බැංකු සතුව තිබූ වලංගු මුදල් නෝට්ටු ඉක්මනින් අවසන් වීමෙන් එරට බැංකු පද්ධතියේ මෙහෙයුම් කටයුතුද අක්‍රිය වී තිබුණි.

මෙලෙස මුදල් නෝට්ටු තහනම් කිරීම නිසා ඉන්දියාවේ සංචාරයේ නිරතව සිටි ලොව නන් දෙසින් පැමිණි සංචාරකයින්ද දැඩි අපහසුතාවන්ට පත් වී ඇත. රජයේ මේ තීරණයත් සමගම බොහෝ දෙනෙකු තම රටවල් කරා යාමට හෝ තමන් අදහස් කළ සංචාරක කටයුතු සිදුකර ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව අත්‍යවශ්‍ය වුවමනාවන් පවා ඉටුකර ගැනීමට නොහැකිව එරට තුළ සිර වී සිටින බව පැවසේ. විශේෂයෙන්ම කුලී රථ හෝ පොදු ප්‍රවාහන සේවා හෝ භාවිත කිරීම සඳහා ඇතැමුන් සතුව වලංගු මුදල් නෝට්ටු නොමැති වීම දැඩි ගැටලුවක් වී ඇත. මෙම සංචාරකයින් අතර ශ්‍රී ලංකාවේ සිට වන්දනා කටයුතු සහ වෙනත් වෙළඳ කටයුතු සඳහා ගිය බොහෝ පිරිසක්ද ඉතාමත් අසීරු තත්ත්වයන්ට මුහුණ පා ඇති බව බී.බී.සී සේවය වාර්තා කර තිබුණි. ඉන්දියානු රජය මෙසේ මුදල් නෝට්ටු අවලංගු කිරීමේදී එරටට පැමිණ සිටින විදේශිකයන් පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොකිරීම නිසා මේ අය සතුව තිබූ විශාල මුදලක් අහිමි වී යනු ඇතැයි බියද මතු වී තිබේ.

මෙම ක්ෂණික මුදල් තහනමත් සමගම පෙර දැනුම් දීමකින් තොරව හිටි හැටියේ මුදල් නෝට්ටු තහනම් කළ දෙවැනි ඉන්දියානු අගමැති ලෙසත් රුපියල් 2000 නෝට්ටුව ඉන්දියාවට හඳුන්වා දෙන පළමු අගමැති ලෙසත් නරේන්ද්‍ර මෝදි ඉතිහාස ගත වේ. මින් පෙරද මේ ආකාරයටම පෙර දැනුම් දීමකින් තොරව ඉන්දීය රුපියල් 100 ට වැඩි සියලුම මුදල් නෝට්ටු තහනම් කිරීමට ඉන්දියානු අගමැතිවරයකු පියවර ගෙන තිබුණු අතර එය සිදුවී ඇත්තේ 1978 වසරේදීය. එවකට ඉන්දීය අගමැති ධුරය දැරුවේ මොර්රාජී දේසායි විසිනි.


SRI LANKA'S NO.1
TRICO
Trico te
TRICO MARITIME
(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal
Effects and gift items clearance in Sri Lanka
Serving People Worldwide Reliably for 35 Years
SRI LANKA'S BEST AND
LARGEST CLEARING
FACILITIES IN THREE
MAJOR CITIES SINCE 1980
COLOMBO
GALLE
KURUNEGALLA
DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka
special service to
Colombo, Jaffna,
Kilinochchi, Batticaloa,
Trincomalee, Vavuniya
& Mannar
Merry Christmas
TRICO
SINCE 1976
TRICO MARITIME FREIGHT FORWARDING CANADA INC.
CONTACT : DERRICK ANTON
647.833.3020 | 416.335.8800
Our Canadian Agents
OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL)
CALGARY: 403 971 6721 (SAMAN) • ALBERTA : 587 708 5665 (TONY) • WINNIPEG: 204 800 2364 (MANGALIKA)
Trico Maritime Customer Services & Warehouses in Sri Lanka
HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000
COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000
KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967
GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841
Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Tel: 413 335 8800
email: info@tricomaritime.ca



# අවුරුදු දෙදහසක් තිස්සේ සැමරෙන නත්තලේ කතාව

■ තරංග රත්නවීර

නත්තල උපන්නේ ජෙරුසලමේය. ඒ නත්තල ලංකාවේදී 'සිංහල නත්තල' යි. සිංහල නත්තල සමරන්නට කේක්, වයින්වලට අමතරව කැවුම් හැදෙන්නේය. කොකිස් හැදෙන්නේය. කිරිබත් උයන්නේය. නෑගම් යන්නේය. පල්ලියේත් දන්සල් දෙන්නේය. හරියට සිංහල බෞද්ධයින් සිංහල අලුත් අවුරුද්ද සමරනවා වාගේය. අප මේ කතා කරන්නේ ඒ නත්තල උපන් හැටි ගැනය.

1505 වර්ෂයේ මෙරටට පැමිණි පෘතුගීසි ජාතිකයන් මෙරට පළමු නත්තල සමරන ලදී. 1522 වර්ෂයේදී මෙරටට පැමිණි පෘතුගීසි පූජකයන් නත්තලට ආගමික ස්වරූපයක් එක්කර ඇත. එමෙන්ම පෘතුගීසීහු පළමුව අල්ලා ගත් කොළඹද පසුව යටත් කර ගත් යාපනය, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශයන්වලටද නත්තල ව්‍යාප්ත කළහ.

1640 මෙරටට පැමිණි ඕලන්ද ජාතිකයන්ද නත්තල උත්සවශ්‍රීයෙන් සමරා ඇත. ඕලන්ද ජාතිකයන් නත්තල සමරන විට නත්තලේ වූ ආගමික වටිනාකම නිසාම දේවස්ථානයන් කෙන්ද්‍ර කරගෙන දේව මෙහෙයන් පවත්වා ඇත. පළමුව පෘතුගීසීහු ගාල්ල ඕලන්ද රෙපරමාදු දේවස්ථානය තුළ නත්තල් දේව මෙහෙය පැවැත්වූ අතර පසුකාලීනව මඩකලපුව, කොළඹ සහ පුත්තලම වැනි ප්‍රදේශයන්ටද නත්තල් දේවමෙහෙයවන් ව්‍යාප්ත කළහ. එකල පෘතුගීසීන්ගේ මූලස්ථාන දේවස්ථානය මෙන්ම ආණ්ඩුකාරතුමා දේව මෙහෙයයන් පැවත්වීම සඳහා පැමිණි දේවස්ථානය වූයේ ආදුරුප්පුවීදියේ රෙපරමාදු දේවස්ථානයයි. එදා සිටම අද දක්වා එම දේවාස්ථානයේදීද නත්තල උත්සවශ්‍රීයෙන් සමරයි.

එහෙත් මෙරට ඕලන්ද යටත් විජිත යුගය රෙපරමාදු ප්‍රගමනයේ ප්‍රාථමික අවධිය වූ බැවින් රෙපරමාදු භක්තිකයන් සංගීතය වැනි දේ භාවිත කරනවාට වඩා අර්ථාන්විතව එය සමරන්නට උත්සාහ දරා ඇත. මන්ද රෙපරමාදු ප්‍රගමනයේ දේවධර්මය ගොඩනැගූ ජෝන් කැල්වින් පවසා සිටියේ නත්තලට වැඩි සැලකිල්ලක් දීම නොව, කිතුණු මංගල්‍යයන් පහක් ඇති බව සිහි කර එනම් පාස්කුව, මහා සිකුරාදා, ස්වර්ගාරෝහණ දිනය හා පෙන්තකොස්තය ආදී සියල්ල එක ලෙස සැමරිය යුතු බවය. නත්තල යනු ක්‍රිස්තු උපත සැමරීම බැවින් එය වැදගත් ආගමික උත්සවයක් ලෙස ඉතා ප්‍රීතියෙන් අදටත් රෙපරමාදුවන් සමරන අතර එහි අර්ථයට මුල් තැන දෙමින් සැරසිලි නොව තවත් කෙනෙකුට එය ආශිර්වාදයක් වන ලෙස සැමරීමට එදා සිටම උත්සාහ දරයි. එය මෙම නිකායේ බැතිමතුන් හා දේවගැතිවරුන් අවබෝධ කර ගෙන ඇති අතර ඉතා සුළු සැරසිලි කිහිපයක් පමණක් භාවිත කර දුගී අසරණ අය උදෙසා වැඩි යමක් කිරීමට අතීතයේ පටන් අද දක්වා වැඩි අවධානයක් දෙයි. සෑම වසරකම නත්තල් දිනට පෙර ඇති ආසන්නතම ඉරු දිනයේ ආර්ථික වශයෙන් අසරණ බැතිමතුන් උදෙසා සභාවේ අන් බැතිමතුන්ගේ දායකත්වය ඇතිව උපකාර කිරීමක් සිදු කරයි.

පසුව 1806 මෙරටට පැමිණි ඉංග්‍රීසි ජාතිකයෝද නත්තල ඉතා උද්‍යෝගයෙන් සැමරූහ. 1815 න් පසු මුළු ලක් දෙරණ තුළම නත්තල සැමරීම සිදු කෙරිණි. වර්තමානය වන විට මෙම නත්තල් උත්සවය සකල ලෝවාසීන් සේම සියලුම ශ්‍රී ලාංකිකයන්ද සමරන උත්සවයක් බවට පත්ව ඇත. එහෙත් බොහෝ දෙනා නත්තල සැමරුවද, එහි බොහෝ අංගයන්ට දායකත්වය දුන්නද එම අංගයන්ගේ සැබෑ අර්ථය අවබෝධ කරගෙන නැත.

Christmas හෙවත් නත්තල යනු කුමක්ද යන්න ගැන සැළකීමේදී එම වචනයෙන් අර්ථවත් වන්නේ Christmas එනම් 'ක්‍රිස්තුස් වහන්සේගේ පූජා වීම' යන අදහසය. එම අදහසට හේතු වූ කිතුනු ආගමික සංකල්පය වන්නේ මනුෂ්‍යයාගේ පාපයට හෙවත් අකුසල නිසා මිනිසාට අහිමි වී ඇති සැනසීම ලබාදීම පිණිස ස්වකැමැත්තේන්ම තම ජීවිතය කුරුසිය මත පූජා කර පව් බරින් මිනිසා මුදා සදාකාලික සැනසීමක් දීම සඳහා වූ ලෝක පාලක මැවුම්කාර වූ දෙවියන් වහන්සේ දේවත්වයේ බලතල අත් හැර ක්‍රිස්තුස් වහන්සේ ලෙස පූජාවක් වන පිණිස මෙලොවට පැමිණීමය. එබැවින් ක්‍රිස්ට්මස් යනු ක්‍රිස්තුස් වහන්සේගේ පූජා වීම යන අදහස වේ. එය වර්තමානයේ x-mas ලෙස කෙටි කර දැක්වීම තුළින් එහි සැබෑ අර්ථයට හානි කර ඇත.

ක්‍රිස්තුවරයාණෝ මෙලොව පහළ වීම දෙසැම්බර් මස 25 වන දින සැමරුවද ක්‍රිස්තුස් වහන්සේ සැබැවින්ම උපන්න දවස දෙසැම්බර් මස 25 යැයි කීමට සාධකයක් නොමැත. එසේ නම් මෙය මෙදිනට සමරන්නට හේතුව කුමක්ද යන්න ගැන විමසීමේදී දත යුතු දෙයක් වේ. රෝම මිත්‍යාදෘෂ්ටිකයින් හිරු දෙවි වන්දනාව සඳහා දෙසැම්බර් මස 17 සිට 25 දක්වා නිවාඩු දිනයන් බවට පත් කරන ලදී. එම කාලය තුළ රෝම අධිකරණය වසා දමා ඇති අතර කිසිවකුට දඬුවම් නොකරන ලදී. එහි අවසන් දිනය වන 25 වන දින අන්ධකාරය පාරාජය කිරීම සංකේතවත් කරමින් අහිංසක මනුෂ්‍යයෙකු ඝාතනය කරයි. පසුව තුන් වන ශත වර්ශයේ රෝම අධිරාජ්‍යයාව සිටි කොන්ස්ටන්ටයින් කිතු දහම වැළඳගෙන රාජ්‍ය ආගම ක්‍රි.ව 325 දී කිතුණු දහම බවට ප්‍රකාශ කිරීමත් සමග හිරු දෙව් වන්දනාව සඳහා වූ දිනයන් කිතුණු උපත සිහි කිරීමට යොදා ගත්තේය. එකල පාප් පදවිය දැරූ ලිබෝරියස් පාප්තුමන් දෙසැම්බර් 25 වන දින කිස්තු උපන් දිනය ලෙස ප්‍රකාශයට පත් කළේය.

## නත්තල් සීයා

නත්තල් සීයා පිළිබඳ වූ සංකල්පයටද මෙම රෙපරමාදු නිකායේ දැඩි සම්බන්ධයක් ඇත. නත්තල් සීයා පිළිබඳ සංකල්පය ක්‍රි.ව 270 පමණ තුර්කියේ උපන් ශාන්ත නිකොලොස් තුමා වෙත දිව යයි. වරක් තරුණ දූවරුන් තිදෙනෙකු සිටි පියෙකු තම දූවරුන් විවාහ කර දීමට අවශ්‍ය දෑවැද්ද ලබාදීමට නොහැකිව තම දූවරුන්ව ගණිකා වෘත්තියේ යෙදවීමට තීරණය කළේය. ඒ ගැන දැනගත් ශාන්ත නිකොලොස්තුමා එය වළකමින් ඔහු සතු පුද්ගලික ධනයෙන් ඔවුන්ගේ අවශ්‍යතාවය සපයා අතර එතුමා නත්තලේ සැබෑ අර්ථය ලොවට පසක් කළේය. එනම් යේසු තුමන් තමා සතු සියල්ල අත් හැර අන් අය උදෙසා මෙලොව වැඩියා සේ නිකොලස් තුමාද තමා සතු සියල්ල අන් අය උදෙසා පරිත්‍යාග කළේය. එමෙන්ම ඔහු වීදිවල සිටි අසරණ දුගී දරුවන් සොයා ගොස් නත්තලට තෑගි දුන්නේය. ශාන්ත නිකොලොස්තුමා ක්‍රි.ව 345 දෙසැම්බර් 06 වන දින මිය ගියේය. මිය යන විට ඕලන්දයන් විසින් නිකොලොස්තුමාව ඔවුන්ගේ බසින් සෙන්ට් ක්ලාස් ලෙස හැඳින්වූවේය. එය පසු කාලීනව සැන්ටා ක්ලෝස් විය. 1931 ස්වීඩනයේ විසූ වණිජමය චිත්‍ර ශිල්පියකු වූ හැඩොන් සන්බොලොම් විසින් කළ නිර්මාණයක් තුළින් නත්තල් සීයාට රතු වර්ණය හිමි විය.

## නත්තල් ගස

ලොව පළමු නත්තල් ගස අලෝකයෙන් සැරසුවේ රෙපරමාදු ප්‍රගමනයේ පියා වන මාටින් ලුතර් විසිනි. ඔහු නත්තල් දිනයක ජර්මනියේ ගස් හිමෙන් වැසී තිබෙන අවස්ථාවක හරිත වර්ණයෙන් පිරි ගසක් තම නිවසට රැගෙන විත් අපේ ජීවිතවල සියලු නපුර ඉවත් කර ආලෝකමත් විය යුතුය යන සිතුවිල්ල පෙරදැරි කරගෙන එම ගස ආලෝකවත් කළේය.

## කැරොල් ගායනය

කැරොල් යන වචනයෙන් අර්ථවත් වන්නේ 'ප්‍රීතියේ ගීතයන්' යන්න වේ. පළමු කැරොල් ගායනය ජේසු බිළිඳු උපන් රාත්‍රියේ දේව දූතයන් විසින් ගැයූ බව බයිබලයේ කියැවේ. 15 වන ශතවර්ෂය වන විට එය ඉතා ජනප්‍රිය නත්තල් අංගයක් විය. මෙම අංගයද අප රටට පෘතුගීසීන්ගෙන් ලැබුණු දායාදයකි.

## තෑගි දීම

තෑගි දීම එදා පළමු නත්තලේ යේසු තුමන් බැහැ දැකීමට පැමිණි ශාස්තෘවරුන් රන්, කට්ටකුමන්ජල්, සුවඳ ලාටු තෑගි ලෙස ගෙන එම සංකේතවත් කරයි.

## නත්තල් පත් යැවීම

පළමු නත්තල් පත 1843 ලන්ඩනයේ ජෙන් කැල්කොට් හොස්ලි විසින් යැවීමෙන් පසු ප්‍රසිද්ධියට පත් විය. ඔහු නත්තලට හමු වී සුබපැතීමට නොහැකි තම මිතුරන්ට සුබපැතීම සඳහා මෙම ක්‍රමය උපයෝගී කරගෙන තිබිණි.

## නත්තල් සීනුව

ඇන්ග්ලිකානු හා රෝමානු කාතෝලික නිකාය තම දේව මෙහෙයන්ට ප්‍රථම විශාල සීනුවක් නාද කරති. ඔවුන් නත්තල උදාවට ප්‍රථම තුන් වරක් මෙම විශාල සීනුව නාද කරන අතර මධ්‍යම රාත්‍රියේ සිව් වන වරට නාද කිරීම තුළින් නත්තල උදා වූ බව සංකේතවත් කරයි. එම අර්ථයෙන්ම නත්තල උදාවූ බව ප්‍රකාශ කිරීමක් ලෙස නත්තල් සීනු භාවිත කරයි. බ්‍රිතාන්‍යයේ කැරොල් කණ්ඩායම් අතීතයේ පුංචි මිටක් සහිත සීනුවක් නාද කරමින් ගයනා කිරීමත් සමගින් සීනුව නත්තලේ මෙවලකමක් විය.

මධ්‍යතන යුගයේ නත්තල් ගස් ආලෝකවත් කිරීමට ඉටි පන්දම් භාවිත කළේය. ක්‍රිස්තුස් වහන්සේ 'ලෝකයේ ආලෝකය විය' යන පණිවුඩය දීමට ප්‍රතිසංස්කරණවාදීන් මෙය භාවිත කර ඇත. එදා බිළිඳු ක්‍රිස්තුස් වහන්සේ දැක ගැනීමට ගවලෙනෙහි වූ පහන් ආලෝකය උදව් වූ සේම මනුෂ්‍යයන් ආලෝකයක්ව ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කළ යුතුයි යන්න මාටින් ලුතර් තුමාගේ අදහස විය.

පළමු නත්තල යනු ක්‍රිස්තුස් වහන්සේගේ උපත වේ. ක්‍රිස්තුස් වහන්සේ අන් අය උදෙසා කැපවිය. නත්තල යනු කැප වීමකි. එම කැප වීම අන් අයට ප්‍රීතියක් විය යුතුයි. පළමු නත්තලේ දේව දූතයන් කැරොල් ගායනා කර ලොවට පසක් කළේ සකළ ලෝකයට ප්‍රීතිය ගෙනා බවය. එබැවින් නත්තලේ සෑම අංගයකටම හරවත් යහ පණිවුඩයක් ඇත. නමුත් එම යහ පණිවුඩය විනාශ කරමින් වර්තමානයේ නත්තල වාණිජමය අංගයක් බවට පත්ව ඇත. සියල්ල වාණිජ්‍යකරණය වන යුගයක නත්තලටද එම අභාග්‍ය උදාවීම කණගාටුවට කරුණකි. නත්තල යනු උත්සවාකාරයෙන් සැමරීට වඩා අන් අය ගැන සිතන්නාවූ අංගයක් විය යුතුය.

නත්තල බොහෝ දේ ලබන්නක් නොව දීමක් බව සිහි කරමින් අන් අය වෙනුවෙන් කැපවන්නට උත්සාහ දරමු.


ANTON
DHARMASEELAN
MORTGAGE AGENT
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS-BEST RATES
MORTGAGE ALLIANCE
BROKER #10530



# කළුවා

ඒ ගම හරිම ලස්සණයි. ඇළ දොළ ගංගාවල්, කුඹුරු යායවල්, කඳුගැට.... මේ හැම දෙයක්ම ගමේ තිබුණා. ගමේ මිනිස්සු ජීවත් වුණේ ගොවිතැන් කරල. ගමේ නායකයා ආරච්චි රාළයි. ආරච්චි රාළ හිටියේ වලව්වක. මේ වලව්වේ ආරච්චි හාමිනේ ඇරුණම සිටියේ වැඩ කරන්න සිටි පිරිස පමණයි. මේ අයගේ එකම දුව අසල්වැසි ගමකට කරකාර බැඳලා ගිහින්.

ආරච්චි වලව්වේ හිටිය සේවක සේවිකාවන් අතරින් කළුවට හිමි වුණේ විශේෂ තැනක්. වලව්වෙ හැමෝම කළුවට කැමතියි. පුංචිම කාලෙදි වලව්වට ආව කළුවා දැන් ගජ ඉලන්දාරියෙක්. හොඳ හයිය හත්තිය ඇතිව සිටියත් කළුවා උප්පත්තියෙන්ම ගෙනාපු මෝඩ කම නිසා වලව්වේ ඇති කරපු අලකලංචි නිමක් නෑ. හැබැයි කළුවා ආරච්චි රාළට හරිම ළෙංගතුයි. කියන ඕනෑම දෙයක් කරල දෙනවා. යකෙකුටවත් බය නැති නිසා ගෙදර මුරකාරයා විදියට හිටියෙත් කළුවාමයි.

අද අපි කියන්න යන්නෙ කළුවා මගුල් ගෙදරකට දැකුම් කදක් අරගෙන ගිය හැටි ගැනයි.

ඉස්සර මගුල් ගෙවල්වල යද්දි කැවුම්, කෙසෙල්, හාල්, තුනපහ වගේ තෑගි බෝග පොදි බැඳගෙන අරන් ගියේ කද බැඳගෙනයි. මෙහෙම ගෙනියනවට කියන්නෙ දැකුම් කද බැඳන් යනව කියලයි.

ඔන්න ඉතිං ආරච්චි වලව්වේ කට්ටියටම නෑදෑයෙක්ගෙ මගුල් ගෙදරකට සහභාගි වෙන්න ආරාධනාවක් ලැබුණා. මේ මගුල් ගෙදර පිට කෙනෙක්ගෙ නෙවෙයි. ආරච්චි හාමිනේගෙම අක්කගේ දුවෙක්ගෙ විවාහ උත්සවයට තමයි ඒ ආරාධනාව ලැබිල තිබුණේ. ළඟම ඥාතීන්. ඒ නිසා ලොකුවට තෑගි බෝග එහෙම ගෙනියන්න ඕන.

මගුල් ගෙදර තිබුණේ ටිකක් දුර බැහැරක. කඳු හෙල් පල්ලම් නැගගෙන බැසගෙන මහා දුරක් යන්න තිබුණා. ඒ වුණත් ගෙනියන දැකුම් කදවල් ඩිංගක් වත් අඩු කරන්න ආරච්චි හාමිනේ කැමති වුණේ නෑ. කල් තියාම දැකුම් කදවල් ගෙනියන්න කත් කාරයෝ පිරිසකුත් සූදානම් කර ගත්තා. මේ කත්කාරයන් අතර කළුවාත් කෙනෙක්.

ඉතිං ඔන්න මගුල් ගෙදර හෙටයි කියලා තියෙද්දි ආරච්චි හාමිනේ කළුවාට කතා කළා.

"කළුවෝ.... මේ මං කියන දේවල් හොඳට හිතට ගනිං...."

"හොඳමයි හාමිනේ....."

"අපි හෙට මගුල් ගෙදර යද්දි කද බැඳගෙන යන බඩු ටික දැන් අහුරගන්න ඕන...."

"කත් කීයක් බඳිනවද හාමිනේ..."

"හතරක්වත් ඕනෑ වෙයිනෙ කළුවො... පිට කෙනෙක්යෑ... මගේ අක්කගේ දෝණියන්දෑ නොවෑ...."

"හොඳයි හාමිනේ මං බඳින්නම් ...." යි කියූ කළුවා වහා එය කිරීමට දිවයන්නට සූදානම් විය.

"හා... හා... හා... කළුවෝ.... ආතක් පාතක් නැතිව දුවන්න තියාගන්නෙ නැතිව ඉස්සෙල්ලා මම කියන දේ අහල හිටපන්...."

එකපාරටම නැවතුණු කළුවා "හොඳමයි හාමිනේ..." යි කීය.

"කළුවෝ... කත් හතරින් දෙකක්ම කැවුම් කෙසෙල් ගෙඩි මුං කැවුම් අතිරහ වගේ කැවිලි පෙවිලිවලින් පුරවාපන්. අනික් දෙකට කිරි හාල් දමාපන්..."

"කිරිහාල්....? ඒ මොනවද හාමිනේ...."

"මොනව මොනවා කළුවෝ... උඹ කිරිහාල් දන්නෙ නැද්ද....? කිරිහාල් කියන්නෙ අපි ගෙනියන හාල්, පොල්, තුනපහ, මිරිස්, කරෝල වගේ දේවල්වලට...."

"ඇයි හාමිනේ අපි ඒවා ගෙනියන්නෙ... ඒ හාමිනේලට ඒවා හිඟද...?"

"හිඟයකට ගෙනියනවා නෙවෙයි බං... ඒක තමයි චාරිත්තරේ... අපි මේ මහ සෙනඟක් එහෙට ගිහිං දවස් ගාණක් කකා බිබී ඉන්නකොට ස්වල්ප අඩුවැඩියක්ද ඕනෑ වෙන්නෙ. ඉතිං අපේ යුතුකමනෙ ඒ අඩුවැඩිය ඒ උදවියට අරන් යන එක...."

"හරි හරි හාමිනේ මට දැන් තේරුණා. මම කිරිහාල් කත් දෙකක් බඳින්නම්..."

"ඔව්... උඹ ඒ කත් හතරම සූදානම් කරලා ඒවා ඇතුළෙ තියෙන දේවල් නොපෙනෙන්න සුදු රෙදිවලිනුත් වැහුම් දමාපන්...."

"හොඳමයි හාමිනේ..." මෙසේ කියූ කළුවා වලව්ව පසුපසට දිව ගියා.

කළුවා වැඩට දස්සයා නිසා අනික් හැමෝම කළුවා කියන දේ අහනවා. අනිත් කත් කාරයොත් එක්ක එකතු වෙලා කළුවා ගෙනියන්න ලෑස්ති කරපු හැම දෙයක්ම කත්වල ගැටගහලා සුදු රෙදිවලින් එතුවා.

දැන් මගුල් ගෙදර යාමට හැම දෙයක්ම ලෑස්තියි. පහුවදා හිමිදිරි පාන්දරින්ම වලව්වෙ හැමෝම අවදි වුණා. ලස්සණට ලක ලෑස්ති වුණා. වලව්වේ වැඩ කරන අයගෙනුත් සෑහෙන පිරිසක් මේ ගමනට එකතු වෙන්න සූදානම් වෙලා හිටියේ. ආරච්චි රාළ, ආරච්චි හාමිනේ පෙරටු කරගෙන කත් කාරයන් පෙළ ගස්සවාගෙන ඒ හැමෝම පා ගමනින් ඈත ගමක තිබුණු මගුල් ගෙදරට යන්න පිටත් වුණා. කළුවාගේ කරෙත් ලොකු දැකුම් කදක් තිබුණා. හැමෝගෙම බලාපොරොත්තුව දවල් බතට මගුල් ගෙදරට යාමයි.

දැන් පිරිස ගමනෙන් බාගයක් විතර ඇවිත්. ඒත් සන්සුන්ව ආපු ගමන එකපාරටම නතර කරන්න සිද්ධ වුණා. ඒ කළුවා නිසා. කරේ තිබුණු කද බිම තියලා පාර මැද බිම ඉඳගත්ත කළුවා මහ හඬින් කෑ ගහන්න පටන් ගත්තා.

"මට නම් තව අඩියක්වත් මින් එහාට යන්නට බෑ.... මේ කද උස්සාගෙන ඇවිත් මගේ කර පුපුරු ගහනවා...."

දැන් මොකද කරන්නෙ. කළුවාගේ හැටි ආරච්චි රාළ, හාමිනේ වගේම එතන හිටිය හැමෝම දන්නවා. කිව්වොත් කිව්වාමයි. කිසිම විදියකින් වෙනස් කරන්න බෑ. සැර වැර කළොත් නම් කළුවා කළුගලක් වගේ වෙනවා. කළුවා නැගිට්ටවාගෙන ගමන එක්ක යාමට ක්‍රමයක් සිතමින් හාමිනේ වටපිට බැලුවා. පාර මැද්දෙ තියල තිබුණු කද ළඟට හාමිනේ ගියා.

"අපොයි දෙයියනේ... කවුද මේ කද බැන්දේ... මෙහෙම කදක් උස්සාගෙන යා හැකිද බොලව් මනුස්සයෙකුට.... මෙහෙට එනවලා... මෙහෙට එනවලා... මේ කද ලිහලා මේ පැති දෙක මාරු කරනවලා..." ඇය එතන සිටි කත් කාරයින්ට අණ කළා.

කත් කාරයින්ට කාරණාව තේරුණා. ඒ අය ඇවිත් කදේ පැති දෙක මාරු කරලා අයෙමත් ගැට ගැහුවා.

"ඇත්ත නේන්නම්... කළුවා නිසාම මෙපමණ දුරක් මේක ගෙනාව... මේ බැඳලා තියෙන විදියට මේ කත උස්සන් යතහැකියෑ..." කියා ආරච්චි රාළත් කිව්වා.

"හා කළුවෝ... දැන් උස්සලා බලාපන්කෝ... උඹට පහසුවෙන්ම මේක කර තියන් යතෑකි..." හාමිනේ කළුවාට කිව්වා.

හුන් තැනින් නැගී සිට කද ළඟට ආ කළුවා කද උස්සා කරට ගත්තා....

"ඒක නොවැන්නම් හාමිනේ.... දැන් නම් කද උහාගෙන ඕනෑ තරම් දුරක් යන්න පුළුවනි...."

කද කරට ගත් කළුවා හැමෝටම ඉස්සර වුණා. ඉන්පස්සෙ කිසිම කරදරයක් නැතිව හැමෝම දවල් බතට මගුල් ගෙදරට ගියා.

## ළමා කවි

### ලෝ වැඩ සඟරාව

| | |
|---|---|
| සිටින ඇවිණ ගෙන මෙසසර | බිළියේ |
| විඳින මෙසැප ජරයෙන් තැළි | තැළියේ |
| දකින නැටුම් වැනි විදුලිය | එළියේ |
| මෙදැන නොකර කුසලට කම් | මැළියේ |
| | |
| දැන් පින් බැරි දේකැයි නො | සිතන්නේ |
| අන් කළ පින් අනුමෝදන් | වන්නේ |
| උන් ලද පින් සරි පින් ලැබ | ගන්නේ |
| ඉන් වද සඟමොක් සැප | සාදන්නේ |
| | |
| සයට වේද රසමුසු බත් | කන්නේ |
| ගඳට වේද ඇඟ සුවඳ | කරන්නේ |
| ලෙඩට බේත් මේ මෙලොව | සතුන්නේ |
| කුමට මීට සැපයෙකැයි | කියන්නේ |
| | |
| මානෙන් ඉඳිතත් මේ සැප | පෙරුමය |
| සීනෙන් ගෑ සුවඳක් සේ | බොරුමය |
| දානෙන් සීලෙන් නොකළොත් | දරුමය |
| පානෙන් අඳුරට ගෙනයයි | කරුමය |
| | |
| දර රැස ගිනි ඇවිළුණු කල | නිබඳේ |
| ගිනි මිස දර යයි යන බස | නොයෙදේ |
| එම ලෙස එක්කොට වදහළ | මුනිඳේ |
| දුක මිස කයකැයි යන බස | නොයෙදේ |
| | |
| ඉඳිතොත් බෝ කල් ජරයෙන් | විසිරේ |
| නැතහොත් වැද යයි මරුමුව | කුහරේ |
| මෙමහත් ජරමර දෙදෙනා | අතරේ |
| මෙසැපත් සැප යයි ගනිදෝ | කවරේ |

**වීදාගම මෛත්‍රිය හිමියන් විසින් රචනා කරන ලද 'ලෝවැඩ සඟරාව' කෝට්ටේ යුගයේදී ලියවුණු වටිනා ග්‍රන්ථයකි. ජීවිතය යහපත්ව පවත්වා ගැනීමට වුවමනා දහම් කරුණු රැසක් මනරම් ලෙස කාව්‍යාකාරයෙන් මෙහි ඉදිරිපත් කර ඇත.**

## ළමා ගී

### සිරිපා පියුමේ

**සිරිපා පියුමේ
රොන් සුනු තැවරී
ගිමන් නිවන පවන් හමා ඒ
නිවී පහන් වී ළය සැනැහේ**

**නිවන් දොරට මඟ පානා
සමණොළ රන් කොත මුදුනේ
බැන්ද වියන් සේ
අරුණු වලා රන් සළු පැටලේ
සිත කිම්දේ ලොවිතුරු සුවඳේ**

**කෙලෙස් මලින් මිදී
සිත සුවපත් වී
පාවී යයි නිසංසලේ
මහ රහතුන් වැඩි මඟ ඔස්සේ
වලා අතුළ කඳු වැටි අතරේ**

**සිරිපා පියුමේ
රොන් සුනු තැවරී
ගිමන් නිවන පවන් හමා ඒ
නිවී පහන් වී ළය සැනැහේ**

ගායනය - පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව
තනුව - පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව
පද රචනය - මහගම සේකර

# අමරණීය අමරදේව






## මහා ගාන්ධර්ව ආචාර්ය පණ්ඩිත් අමරදේව උපහාර කලාපය






## පණ්ඩිත් අමරදේවයන්ට

ගිරිකුල මුදුනටම නැග කළ වෙණ නදට
අනුවම සුගීතය ගයමින් වියැසියට
ශිථිල ගුණය මුසකර සුකොමල බසට
අප ගෙන ගියේ උස් වින්දන තලයකට

ලිහිරු මඬල දිස්විණ මැඩ ගත ඇඳුරු
ගිරිකුළ මුදුන හිඳ දුටුවෙමි ලොව සොඳුරු
සංගීතයෙන් බැස යති දිය ඇලි කඳුරු
අනන්තයට විහිදෙයි ඔබ හඬ මියුරු

ඔබ වෙන වයන විට තත් සිඳ අඹව තබා
සුරරද සුර අඟන මත් විණි සුදම් සබා
බෙලුව පඬුව පන්සිළු වෙණ පසෙක තබා
දුටුවෙද අමර කන්කළු ගී අසන සොබා

පලුපත් අතු රිකිලි මඳ සුලගේ නැටුම
වන්නම ලෙසට තැනුණේ මහ බෝ වැනුම
ජීවන කතර සැපදුක සමබර දැකුම
හෙළ ගී චමත්කාරය පොබ කළ ගැයුම

සිලිලාරයේ හෙල් මැලි පෙති අතර සැලී
කණට නොඑන ඉසියුම් සිලි සිලියෙ ගැලී
ඔබ ගී මධුර සර වෙණසර සමග වෙලී
හෙමිහිට බැසගියා හිමකඳු පෙදෙස හැලී

ගමේ කොමලියකගේ රූසිරි වරුණේ
නිල් මහනෙල් මලක නිල් නුවනග පිපුණේ
ඒ මල වුවද පරවන බව පළ කෙරුණේ
එතිර දහම වියොවග ගීයට ගැයුණේ

සුනිල් සරත් පෙරේරා




## ලත් විගසින් ඇවිත් යන්න

නික්ම ගිය පසු සැවොම
දවාලන්නට නොහැකි
මතක බර ගෙදර ගෙන ගොස්
ආදරේ වැඩියෙන්ම තිබූ තැන් වල
ජීවිතේ දිග පළල අහුලාවි විමලා

ඇසට ඇස පළමුවෙන් ගැටුණ හැටි
තතට තත පළමුවෙන් බැඳුණ හැටි
අතට අත පළමුවෙන් දැනුණ හැටි
පෙළින් පෙළ සිහිවේවි එතකොට

එක එක තරු ආපු ගියපු
හැන්දෑ වරු පහු කරගෙන
'ඇයට හිටපු එකම තරුව'
දිලිසෙන හැටි රෑට රෑට
දකිනු රිසින් වැසි අහසේ
නිදි නොමැතිව හිඳීවි ඇය
කිත් පැසසුම් මොනවද මේ
'හිත් සැනසුම් ඕනි අමරෙ'
ලත් විගසින් ඇවිත් යන්න
'එහෙ නිදහස් නේද අමරෙ !'

කසුන් මහේන්ද්‍ර හීනටිගල

















# අමරදේවයන් පිළිබඳ මගේ මතක සටහන්.....!

■ ප්‍රවීණ මාධ්‍යවේදී කරුණාරත්න අමරසිංහ

ඒ පනහ දශකයේ අග භාගයේ දිනකි. ගුවන් විදුලි මාධ්‍යයට තිලකායමාන මාධ්‍ය විශාරදයෙකු මෙන්ම ලේඛකයකු හා ගේය කාව්‍ය රචකයකු වූ තිලක සුධර්මන් ද සිල්වාණන් සහ මා එදින පාදුක්කට ගියේ මෙරට සුප්‍රකට සංගීතවේදියෙකු හා ගායකයෙකු වූ පියසිරි විජේරත්නයන්ගේ ආරාධනයෙනි. එකල ඔහු සංගීත ගුරුවරයෙකු ලෙස සේවය කළ පාසලේ විවිධප්‍රසංග යකට සහභාගී වීම නිමිත්තෙනි. පියසිරි විජේරත්නයන්ගේ ආරාධනය ලැබූ ඩබ්ලිව්. ඩී. අමරදේවයෝද ඒ පාසල් විවිධ ප්‍රසංගයට සහභාගී වීමට පැමිණ සිටියහ. එහිදී මට පළමු වරට පියසිරි විජේරත්නයන් මෙන්ම අමරදේවයන්ද හඳුන්වා දෙන ලද්දේ මගේ කටහඬද පළමුවරට ගුවන් විදුලි ළමා පිටිය ඔස්සේ අසන්නන්ට ඇස්සවූ තිලක සුධර්මන් අයියා විසිනි. එය සිදුවූයේ අමරදේවයන්ට 'පද්ම ශ්‍රී, පණ්ඩිත් සහ ආචාර්ය' යන ගෞරව උපාධි මෙන්ම ඔහුගේ ජීවිතයේ පරම ආරක්ෂිකාව වූ විමලාවන්ද හිමිවීමට බොහෝ කලකට පෙරය. එදා එකී පාසල් විවිධප්‍රසංගයේදී අමරදේවයන් සහ ඔහු ගැයූ මහ බෝ වන්නම ගීතය සභාවට හඳුන්වා දෙමින් මා ඉදිරිපත් කළ පූර්ව කථනයේදී මවිසින් භාවිතයට ගත් වදන් හා යෙදුම් ගැන අමරදේවයෝ ප්‍රශංසා මුඛයෙන් නිර්ලෝභීව කතා කරනු ඇසූ මගේ සිත දිරියෙන් ඔද වැඩී ගිය අයුරු දැනුදු සිහි වේ. ඉන්පසු දිනෙන් දින වැඩී ගිය අප දෙදෙනාගේ ඇසුර ඔහු මිය යන තෙක්ම නොවෙනස්ව පැවතුණි.

වරක් මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් සමග අමරදේවයන් හමුවීමට ඔහුගේ නිවසට ගිය අවස්ථාවක් මෙවේලේ මගේ සිහියට නැගේ. ඒ ඔහු විවාහ වී නොබෝ දිනකින්ය. එකල නව යුවල පදිංචිව සිටියේ බත්තරමුල්ලේ සුභූතිපුර නිවසකය. අප දෙදෙනා පිළිගත්තේ අභිනව මනාලිය විමලාවන්ය. ඕ රූපත. පැහැපත. යහපත. අප සාලයේ වාඩි වුණු පසු ගෙතුළ සිට අමරදේවයන් අප ඉදිරියට පැමිණියේ "තොප දැකුමෙන් අප පින් කළ බව දැනුණි..." යයි මියුරු ගැඹුරු සරින් කියමිනි. "වෙන සැප කුමට තොප දකිනා එම පමණ" යැයි අපිදු කීවෙමු. ඒ දිනවල ඔහු 'මධුවන්ති' ගුවන්විදුලි සංගීත වැඩසටහන සඳහා ගී තනු සාදමින් සිටියේය. ඔහු ඒ ගැන සඳහන් කරමින් සිට එක් වරම යමක් මතක්ව මෙසේ පැවසිය. "ඊයෙ රෑ විමලයි මායි ඇහැව්වා කරුගේ ස්ජේස් ඔඩිසි ගුවන් විදුලි නාටකයක්. සුගත් (සුගතපාල ද සිල්වා) එක්ක කළ ඒක අපි ආශාවෙන් ඇහැව්වා" ඔහු මතක් කළේ පෙර දා රෑ ගුවනින් ප්‍රචාරය වූ ගුවන්විදුලි රඟමඩල නාට්‍යයක් ගැනය. එය අභ්‍යවකාශ තරණය පාදක කරගෙන රචනය කළ විද්‍යා නාටකයකි. අප මෙසේ අල්ලාප සල්ලාපයේ යෙදී සිටින අතරතුර සංගීත භාණ්ඩයක් මිහිරි ලෙස වැයෙන නාදයක් ගෙතුළින් ඇසුණි. සංගීතඥයා අප සමගය. විමලාවෝද මෙතැනමය. "කවුද ඒ සංගීත භාණ්ඩයක් වයන්නේ". සුනන්ද ඇසූ ප්‍රශ්නයට අමරදේවයන් පිළිතුරු දුන්නේ ඉංග්‍රීසියෙනි. "He is my elder brother. He's also musician" (ඒ මගේ අයියා. එයාටත් හොඳට සංගීතය පුළුවන්) ටික වේලාවකින් ගෙතුළට ගිය අමරදේවයන් යළි අප වෙතට පැමිණියේ කුඩා බීම ට්‍රොලියක් තල්ලු කරගෙනය. ඉන්පසු ඔහු මැන්ඩලීනය තුරුළු කරගෙන වයන්න පටන් ගත්තේ අලුත බිහි කළ මධුවන්ති ගී තනුවකි. පොද පොද මී විතෙන් මඳ මඳ පිබිදුණු අමරදේවයන් ඒ ගීය තම මධුර ස්වරයෙන් ගායනය කිරීමට පටන් ගත්තේ මත කොවුලෙකු විලසිනි. අප දෙදෙනා එය රස වින්දේ මඳ මත් බඹරු මෙනි. අමරදේවයන් සංගීත සමාධියට සම වැදුණු කල ඔහුගේ ශ්‍රවන රමණීය ස්වරය මුවින් ගලා එන්නා සේය. නැතහොත් පාවී එන්නා සේය. භාරතයේ විශිෂ්ට ගායිකාවක වුත් රබීන්ද්‍ර සංගීතය පිළිබඳ විශේෂඥවරියක වුත් සුචිත්‍රා මිත්‍රාවන් කළ ප්‍රකාශයක් මෙහිදී මගේ සිහියට නැගේ. "Amaradeva just on singing in perfect SUR and TAT and music gushes out from his throat like water from a fountain." (නියම ස්වර හා තත් අනුව අමරදේවයන් ඉබේම වාගේ ගායනය කරගෙන යන විට ඔහුගේ මුවින් සංගීතය වෑහෙන්නේ දිය උල්පතකින් දිය වෑහෙන්නා සේය).

2003 වර්ෂයේ වෙසක් පසළොස්වක පෝය දිනයේ පෙන්වීම සඳහා යොදාගෙන සිටි 'සද්ධාංජලී' නමැති ජාතික රූපවාහිනී බෞද්ධ භක්ති ගීත වැඩසටහනට මමද සහභාගී වීමි. රූපවාහිනියේ සිසිර කොතලාවලයන් විසින් නිෂ්පාදනය කෙරුණු ඒ වැඩසටහන අමරදේවයන් අතීතයේ ගැයූ අද අපට නෑසෙන නොව පැරණිය වන රමණීය කර්ණ රසායන බුදුගුණ වර්ණිත ගීතයන්ගෙන් සුසජ්ජිත විය.

අනන්ත අප්‍රමාණ බුදුගුණ කෙරෙහි දනන් සිත්හි සැදැහැ වඩන සද්ධාංජලී (සැදැ දෝත) ගීතාවලියේ සාහිත්‍ය රස විවරණය රඹුකන සිද්ධාර්ථ හිමියන්ට සහ මට පැවරුණු කාර්යය විය. එකී වැඩසටහන පටිගත කිරීමට පෙරාතුව අමරදේවයන් සමග සාහිත්‍ය සංගීත සමවාය ගැන රසාලිප්ත පිළිසඳරක යෙදෙන්නට ලැබුණු අවස්ථාව ප්‍රසන්න, භාවික අත්දැකීමක් වුණි.

ඔහු සමග කළ ඒ රසාලිප්ත පිළිසඳරට නිමිත්ත වූයේ අපගේ පැරණි කවියන්ගේ හා නූතන කවියන්ගේ බුදුගුණ වැණුම්ය. එහිදී අමරදේවයන්ගේ මතකයෙන් මතුව මුවින් ගලා ගිය 'සියබස් ලකර ගී දහර' අසා සිටි මට, ඔහු 'සරසවි නොයා සරසවි සොයා' ගොස් ඇති සැටි සක්සුදක් සේ පසක් වුණි. පැරණි කවියන් තෙරුවන් නමැද තම කවි අරඹා ඇති අයුරු සනාථ කරන්නට අමරදේවයෝ ඒ එක් එක් කවෙන් ගත් නිදසුන් පැදි මතකයට නගා ගෙන නොනැවතා මධුර ස්වරයෙන් ගැයූහ. නව අරහාදී බුදුගුණ වනන 'බුදුගුණාලංකාර' කාව්‍යයෙහි එන පැදි ඔහු තම හද සැදැ දෝතක් බවට පත්කර ගනිමින් මියුරු සරින් ගයද්දී මම එහි රස සවන් දෝතින් බිබී තුටු වූවෙමි.

'පෙදෙහි රස හවි' යන නමින් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සංගීත අංශය මගින් ඉදිරිපත් කරන ලද ශ්‍රවන රමණීය වැඩසටහනකට සහභාගී වීමේ අවස්ථාවක් වරක් මට ලැබුණේ අමරදේවයන්ගේ ආරාධනයෙනි. ශිෂ්ඨ සංගීත රුචිය නැංවීමේ අරමුණින් ඇරඹූ ඒ වැඩසටහන සඳහා 'පෙදෙහි රස හවි' යන අරුත් සරු නම යෝජනා කර ඇත්තේද අමරදේවයන්ය. එනමින් ඉදිරිපත් කළ එකී අභිනව වැඩසටහන අභිරමණීය වූයේ අමරදේවයන් විසින් කලකට පෙර ගයන ලද මුත් මෙකල සවනට නොවැටෙන රස භාවපූර්ණ ගීතාවලියකිනි. පොදුවේ වත්මන් ගීත සාහිත්‍යයත් වෙසෙසින් ඒ වැඩසටහනට ඇතුළත් තම නිර්මාණ අතළොස්සත් අරබයා මා ලවා විචාර විවරණයක් ඉදිරිපත් කරවීම අමරදේවයන්ගේ අභිලාසය විය. ප්‍රසස්ථ ගීත රචක උදයසිරි පතිරණත්, උසස් කලා රුචියක් ඇති සුනිලා අබේසේකර රසිකාවියත් මා සමග පෙදෙහි රස හවි නෑඹුල් වැඩසටහනට සහභාගී වූහ. උසස් රසඥතාවක් ශ්‍රාවක ජනයා තුළ පහළ කරවීමේ අරමුණ කුළුගැන්වීමේ අනුසස් අමරදේවයන්ගේ මුවින් ජාතික රූපවාහිනී සංගීත අංශයේ සම්පාදකයන් හට සන්නිවේදනය වන්නට ඇතුවා නිසැකය. පෙදෙහි රස හවි ආරම්භක වැඩසටහන එහි ඉෂ්ට ප්‍රතිඵලයක් වැනිය.






අමරදේවයන් මුවින් පවසන බසද ගයන ගීයක් මෙන්ම කර්ණ රසායනය. එය ඉතා ධ්වනි පූර්ණය. අර්ථාලංකාරයෙන් මෙන්ම ශබ්දාලංකාරයෙන්ද විභූෂිතය. හෙළ, පෙළ, සකු යන තෙබසටම අයත් පොතපතින් උකහා ගත් සාහිත්‍ය රසය ඔහු සියොලඟම වෙළී සිටී. ඉංග්‍රීසිය ඔස්සේ ඔහු වෙත ඇදී ආ නැණ දහරද ඔහු ඇසූ පිරූ ඇත්තෙකු බවට පත් කොට ඇත. මේ සියල්ලෙහි මහිමය මූර්තිමත් වූ ආශ්චර්යය හා අලංකාරය එදා මම පෙදෙහි රස හවි අභිනව වැඩසටහනේදීද ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවෙමි. එය සත්‍ය වශයෙන්ම මෙකල දුර්ලභ අත්දැකීමකි.

අමරදේවයන් තම අතට පත්වෙන ගේය කාව්‍ය සංගීත නිර්මාණයකට හරවන්නේ එහි ගැබ් වුණු වචනද සංගීතාත්මක කිරීමෙන් අනතුරුවය. ඔහුට ඒ හාස්කම කළ හැකි වූයේ ඔහු සංගීතවේදියෙකු මෙන්ම සාහිත්‍යවේදියකුද වූ හෙයිනි. ඔහු හමු වී අල්ලාප සල්ලාපයේ යෙදුණු ඇතැම් අවස්ථාවකදී හෙළිකළ කරුණුවලින් එය මනාව සනාථ වෙයි. මුලින් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් තම සරස්වතී අභිනන්දන ගේය කාව්‍යය සඳහා යොදා ඇත්තේ 'සරස්වතී දේවී නමස්තේ සරස්වතී දේවී' යන යෙදුමයි. අමරදේවයන් ඒ වෙනුවට 'සරස්වතී දේවී වන්දේ සරස්වතී දේවී' යනුවෙන් යෙදුවේ වචන සංගීතාත්මක කරමිනි. 'මින්දද හී සර වැදී සැලෙන හද - නංවන දුක් ගී ඔබට ඇසෙනවද' යන ගීතය සඳහා එහි ගේය කාව්‍ය රචක මඩවල ඇස්. රත්නායකයන් යොදා තිබුණේ 'කන්ද කපා පායාපන් පුන්සඳ' යන යෙදුමයි. එහෙත් අමරදේවයන් ඒ වදන් පෙළ සංගීතාත්මක කළේ 'කන්ද කපා පායන් රන් පුන්සඳ' ලෙසින් වෙනස් කරමිනි. අමරදේවයන් ස්වරයට මෙන්ම වචනයටද එක සේ සංවේදී බව මේ නිදසුන් අපට පසක් කර දෙයි.

වරක් ඔහු සමග නාවින්න නිවසේ කතාබහ කරමින් සිටියදී ඔහු මට මෙසේ කරුණක් හෙළිකළේ ඔහුටම ආවේණික ප්‍රසන්න විලාශයෙනි.

"කරු අහල ඇති, 'පුර සොඳිනා මඩකලපුව සම්පය' කියන ජනකවිය. දවසක් මම අහගෙන විමලගේ අම්ම බොහෝම මිහිරි තාලෙට ඔය ජනකවිය කිය කිය අපේ දුව නළවනවා. ඒකෙන් ආභාසයයි ආවේසයයි ලබල තමයි 'මුනි සිරිපා සිඹිමින්නේ' ගීයෙ තනුව හැදුවෙ"

ඔහු ඒ බව සනාථ කොට පෙන්වූයේ අපූරු ලෙස ගයා වයමිනි. ඒ සමගම ඔහු හෙළි කළ තව පුවතක්ද මගේ මතකයට එයි.

"'පිපී පිපී රේණු නටන' සිංදුව අපේ ගමේ උරුමයෙන් පහළ වුණු එකක්. 'පුන්සඳ පායා මොරටුව දිලෙන්නා' ඒ කාලෙ ප්‍රසිද්ධ බයිලා එකක්. ඒ බයිලා එක ආශ්‍රයෙන් තමයි 'පිපී පිපී රේණු නටන' සිංදුව මම හැදුවෙ"

අමරදේවයන් මොරටු බයිලාව ගයා වයා පෙන්වූයේ පොඩි එකෙකු සේ විනෝදයෙනි. අමරදේවයන් බයිලාවක් ගයනු ඇසූ පළමුවෙනි රසිකයාත් අවසන් රසිකයාත් මම්දැයි නොදනිමි.



# ගී පද රචනයෙහෙළි අමරදේව

**■ ප්‍රවීණ ගීත රචක**
**ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ**

ශාන්ත මේ රෑ යාමේ
දේ කුමුදු මලේ සිරියා
සඳ කාන්තියෙනී සෞම්‍යා

එයි නැගී හද ප්‍රේම තරංගා
ඒ අමා දහරේ
නෙක තුරුලිය නැළැවෙන්නේ
මේ සීතල මඳ පවනේ

හා ඇසේ වන කෝකිල ගීත
සෝක යාවී සිඳීලා
වෙසගෙ මේ පුන් පෝදා
මා හිමි දිනු ත්‍රෛලෝනා

පණ්ඩිත් අමරදේවගේ ස්වර්ණ ස්වරයෙන් ගැයෙන සුවහසක් ගී පද අතර ඉහත දැක්වුණු වදන් මාලාවෙහි විශේෂත්වයක් ඇත. අන් කරුණක් නිසා නොව, ඒ ගී පද අමරදේවයන්ගේම වන නිසාය. එය නම් පද රචකයාද, තනු රචකයාද, ගායකයාද එක් තැන් වන ඒකාත්මික වන දුර්ලභ මොහොතකි.

පණ්ඩිත් අමරදේව විසින්ද ගීත කිහිපයක්ම රචනා කර ඇති බැව් එල බර තරුවර පඬිතීන්ගෙන් මෙන්ම කටු කොහොළින්ද පිරි අධ්‍යතන සිංහල සංගීත වනාන්තරයෙහි මංමුළාව සිටින අපගේ වර්තමාන ශ්‍රාවක ගණයාගෙන් බොහෝ දෙනෙක් නොදනිති.

ඉකුත් සියවසේ මුල් භාගයේදී එනම්, 40 දශකයේදී ඔහු විසින් පබඳන ලද ගීත කිහිපයක් වෙයි. සීගිරියේ සිතුවම් රමණී, වඳිමු සුගත සාක්‍යසිංහ, පීනමුකෝ කළු ගඟේ, ශාන්ත මේ රෑ යාමේ ඇතුළු ගීත සංඛ්‍යාවක් අමරදේවයන්ගේ පන්හිඳෙන් ලියවී ඇති වග සිහිපත් කිරීම අපගේ යුතුකමකි. ඒ ගීත සියල්ලම ප්‍රතිභාමත් ගේය පද හැටියට විමසා බලන්නට වටින නිර්මාණයන්ය. මෙතැන්හිදී විශේෂයෙන්ම මගේ සිහියට නැගෙනුයේ ඔහු විසින් පබඳන ලද 'ශාන්ත මේ රෑ යාමේ' නමැති ගීතයයි. ඒ ගීතයේ උප්පත්ති කතාව කියන්නට අමරදේවටම ඉඩ දීම මැනවි.

'මේ ගීතයේ වචන ලියුවේ මම. එයින් විස්තර වන්නේ, වෙසක් පුර පසළොස්වක සන්ධ්‍යාවක්. ඒ දවස්වල කොළඹ විශ්ව විද්‍යාලය සංවිධානය කළ සරසවි මේලාවේ ඩබ්ලියු. ඒ. සිල්වාගේ 'සුනේත්‍රා නොහොත් අවිචාර සමය' නවකතාව පදනම් කරගෙන නාට්‍යයක් නිර්මාණය කෙරුණා. ගීතය නිර්මාණය වුණේ, ඒ නාට්‍යයේ සමූහ ගායනයක් සඳහා. මෙම ගීතයේ තනුවට බලපෑවේ පංකාජ් මලික් ගායනා කරන හින්දි ගීතයක්. 'පියා මිලානකේ ජානා - මම ප්‍රියාව හමු වන්ට යමි'. ගීතය නිර්මාණය කිරීම නිසා ඒ දවස්වල විශ්වවිද්‍යාලයේ පිරිස ඇසුරු කරන්නට මට අවස්ථාව ලැබුණා. පේරාදෙණි විශ්වවිද්‍යාලය හදමින් තිබුණේ ඒ කාලයේ. අපි සරසවි මේලා කරන අතර, බස් එකක් අරගෙන පේරාදෙණියේ අලුත් විශ්වවිද්‍යාලය බලන්ට ගියා. අප එක්ක ගියේ මලලසේකර සහ ධීරසේකර. ජෝතිය ධීරසේකර තමයි ඒ වෙලාවෙ සරසවි මේලාවෙ සභාපති වෙලා හිටියෙ. මේ ගමන්වලදී අප නොවරදවාම ගායනා කරන ගීතයක් තමයි, 'ශාන්ත මේ රෑ යාමේ' ගීතය. ශාන්ත මේ රෑ යාමේ ගීතය බිහි වුණු අවධිය ගැන විශේෂ යමක් කියන්ට ඕනෑ. මේ අවධියේදී තමයි සිංහල ගීතය ස්වාධීන මාර්ගයකට අවතීර්ණ වන්නෙ. අපේම කලා රීතියක් හැටියට හැඩ ගැසෙන්ට පටන්ගන්නෙ. එහි ගෞරවය, ආනන්ද සමරකෝන් සහ සුනිල් ශාන්ත යන පුරෝගාමී සංගීතඥයන්ට ලැබිය යුතු බව නොමසුරුව පැවසිය යුතු කාරණයක්. සීගිරියේ සිතුවම් රමණී, ශාන්ත මේ රෑ යාමේ සහ පීනමුකෝ කළු ගඟේ වැනි ගීත නිර්මාණයේදීද මා ආනන්ද සමරකෝන්ගේ සහ සුනිල් ශාන්තගේ නොමඳව ආභාසය ලැබුවා. හැබැයි, මම මගේ සංගීත චාරිකාවේ නිවැරදිවම පිය සටහන් තැබුවේ, ඔවුන් දෙදෙනාගේම රීතිය අතික්‍රමණය කිරීමෙනුයි. ඔවුන්ගේ 'දේශීය සංගීත සංකල්පය' මා ඒ හැටියෙන්ම බාරගත්තෙ නැහැ. භාරතීය මහා සම්ප්‍රදාය ඇසුරින් අපගේ ජන සංගීතය නමැති චූල සම්ප්‍රදාය පෝෂණය කිරීමේ වගකීම, මා පසුකාලීනව වටහාගත්තා'

පණ්ඩිත් අමරදේව ඒ අදහස් ප්‍රකාශ කළේ මීට වසර නවයකට පෙර 2007 දී ඔහු සමග කතාබස් කොට මවිසින් සම්පාදනය කරන ලද 'ගී සර මුවරද' කෘතිය උදෙසායි.

ශාන්ත මේ රෑ යාමේ ගීතය එකල්හිම, බී. ඇස්. පෙරේරාගේ සංගීතයෙන්ද අමරදේව සහ මල්ලිකා නමැති ගායිකාවකගේ ගායනයෙන් ද, එච්. ඇම්. වී. ග්‍රැමෆෝන් තැටියකටද නැගුණි.

ශාන්ත මේ රෑ යාමේ ගීතය මෙදවසද සහෘද ජන අමන්දානන්දයට පත් කරන්නේ වෙයි.

ගීතයකය උපයුක්ත වන භාෂාව පිළිබඳව අමරදේව දක්වන්නේ පුළුල් අදහසකි.

'සංගීතයේ උත්තරීතර හරය හෘදය සංවාදී භාව ප්‍රකාශනයයි. ස්වකීය මාධ්‍යගත සීමා තුළ මුළු මහත් මානව වර්ගයා හා භාවමය භාෂණයෙහි යෙදෙන්නේ පරිණත සංගීත චින්තකයායි. මෙහිදී භාෂණය යනුවෙන් අදහස් කෙරෙන්නේ, හුදෙක් භාෂා මාධ්‍යයෙන් කෙරෙන සංවාදයට වඩා පෘථුල වූත්, වියුක්ත වූත් භාවමය සංවේදී විශේෂයක් බව කිව මනායි. ස්වර වර්ණ විභූෂිත ධ්වනි විෂයයෙහි හසළ සෞන්දර්යවේදියා, වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම සංගීතවේදියෙක් වෙයි. සංගීතය වූකලී, සෞන්දර්ය පූර්ණ ආකෘතීන්ගෙන් සැදුම්ලත්, භාව ප්‍රකාශනයෙහි සමත්, සුසංගත නාද සංයෝජනයයි. 'වචනයට යා හැකි දුර ගෙවා නවතින්නේ කොතැනද, එතැන සංගීතයේ උපතයි' යනුවෙන් ඩේවිඩ් රැන්ඩොල්ෆ් නමැති සුප්‍රකට සංගීත ශාස්ත්‍රවේදියා පවසා ඇත්තේද මේ න්‍යාය මත පිහිටාය'

'දේශීය සංගීතය පෝෂණය කිරීමේදී වුව, පරිණත සංගීතවේදියා ස්වකීය නිර්මාණකරණයෙහි යෙදිය යුත්තේ, මෙවන් පුළුල් දෘෂ්ටියක් මත පිහිටා බව මෙහිදී විශේෂයෙන් කිව යුතු වෙයි. ශ්‍රී ලංකාවේ ජාතික සංගීතයක් හැඩ ගැසෙන්නේ, හුදෙක් සජීවී සංගීත නිර්මාණ තුළින්ම බව මගේ විශ්වාසයයි. අපටම ආවේණික වූ සංගීත සම්ප්‍රදායක් නැතැයි කියමින්, ජන සංගීත ප්‍රකාර පමණක් හුවා දැක්වීම ප්‍රමාණවත් නොවන බවද මම කියමි'

'මේ සියල්ලටම වඩා, රසපූර්ණ වූත්, ශ්‍රවණ රමණීය වූත්, සංගීත කෘතියක ස්වභාවය කුමක්ද? යන කාරණා ගැන සංගීතවේදීන්, විචාරකයින් හා රසිකයින්ද යථා අවබෝධයක් ලබාගත යුතුව ඇත. ප්‍රතිභා ශක්තියෙන් හා නිර්මාණ කුසලතාවෙන් පරිපූර්ණ සංගීතවේදියෙකුට කවර සංගීත සම්ප්‍රදායක් ඇසුරු කළද, ස්වකීය සංස්කෘතික ස්වතන්ත්‍රතා රැකගැනීම කිසිසේත්ම දුෂ්කර නොවන්නේය'

'සංගීතයේ විභූතිය වනාහී, තත්කලා මාධ්‍යගත මූලාශ්‍රය වන ස්වර සංකලනයද, එම ස්වර සංගති ඇසුරින් නිමැවෙන මියුරු නාද ද වන්නේය. එවන් නිමැවුම් අතිදුෂ්කර කාර්යයකි. ඒ වනාහී, හුදෙක් සාහිත්‍ය සංගීත ආදි ලලිත සුලලිත කලා විෂයයෙහි ජන්මාන්තර වාසනා ලද්දවුන් විසින් පමණක්ම කළ හැකි දුලබ කාර්යයකි'

අපේ යුගයේ ජීවත් වූ එවන් 'ජන්මාන්තර වාසනා ලද්දවුන්' අතර සිටින අග්‍රතමයා, දැන් අප හැර ගොසිනි.

# අමරදේව නැතිනම් නන්දා මාලනී කෙනෙක් නෑ ...!

## - නන්දා මාලනී

**Q 'අමරදේව ලකුණ' යනුවෙන් හඳුනාගත හැකි ලක්ෂණයක් සිංහල සංගීතයෙහි පවතීද?**

අනිවාර්යයෙන්ම තියෙනවා. ඒක ගැන කතාකරන්න දෙයක් නැහැ. ඒක ඉර හඳ වගේ පවතින දෙයක්. එතුමා උත්තර භාරතීය රාගධාරී සංගීතය ප්‍රගුණ කරල ඉතා විශාල සංගීත ඥානයක් සමග අපට අවශ්‍ය දේ නිර්මාණය කරපු ප්‍රධානම නිර්මාණවේදියා. අපේ රටේ විවිධ නිර්මාණකරුවන් විවිධාකාරයේ නිර්මාණ බිහිකරත් අපේ හදවත ගැහෙන රාවය මුලින්ම හඳුනගත්තෙ අමරදේවයන්. එතැන් පටන් ඔහු සංගීත ක්ෂේත්‍රයට කරපු මෙහෙය ඉතා විශාලයි. විවිධ සංගීත ශිල්පීය ක්‍රම, ජන ගායනා වැනි හැමදේකින්ම එතුමා ප්‍රයෝජන ගත්ත. මධුවන්ති වැනි වැඩසටහන් හරහා එතුමා තබපු සලකුණ මත තමයි තාම සිංහල ගීතය නිර්මාණය වෙන්නෙ. සුභාවිත ගීතයේ පදනම දැමුවේ අමරදේවයන්.

**Q අමරදේව යුගයක නිර්මාපකයෙක්ද?**

අනිවාර්යයෙන්ම. යුගයක නිර්මාණකරුවෙක් පමණක් නොවේ යුග යුග ගණනකින් බිහි නොවන අපූරු නිර්මාණකරුවෙක්. මම සැබැවින්ම වාසනාවන්තයි. එතුමා සමග මගේ ගායන ජීවිතයේ මුල් අඩිතාලම දමා ගත්තට. ඒ තරම් වාසනාවක් මට මේ ජීවිතේ ලැබිල නැහැ. අමරදේවයන් සමග මම දශක ගණනාවක් වැඩ කරල තියෙන නිසා දන්නව එතුමාගේ සුවිශේෂීත්වය, ඔහුගේ තනුවල ඇති නිර්මාණාත්මක ගුණය, එහි සාහිත්‍යමය අගය, වචන උච්චාරණය, භාවාත්මක ගායනය මේ හැම දෙයක්ම ඉතා විශිෂ්ටයි. ඔහුගේ ගීතයක් ඇසෙන ඕනෑම මොහොතක එයට සවන් නොදී සිටීමේ හැකියාවක් නැහැ. කුමන රාජකාරියක් තිබුණත් අමරදේවයන්ගේ මිහිරි ගීතයක් වාදනය වන ඕනෑම මොහොතක එය රස විඳීමට අපව පොලඹවනවා. එය එතුමාගේ හඬ සතු විශේෂ ගුණයක්. එවැනි ගුණයක් තියෙන්නෙ එතුමාට විතරයි. එතුමාගේ නිර්මාණ යුග යුග ගණන් පවතිනවා.

**Q අමරදේවයන් පසු පරම්පරාවට බලපෑවේ කෙසේද?**

කොටින්ම කියනවා නම් අමරදේවයන් නොමැති නම් නන්දා මාලිනි කියල කෙනෙක් බිහිනොවන්න තිබුණා. එතුමා එතරම් දුරට පසු පරම්පරාවට බලපෑව. ඔහු නිර්මාණ ශිල්පීන්, ශිල්පිණියන් බිහිකරා. ඔහුගේ පසු පරම්පරාවට අවශ්‍ය ආදර්ශ ලබාදුන්න. ගීතයක නිර්මාණ පක්ෂය පිළිබඳ පසු පරම්පරාවට අවශ්‍ය නිදර්ශන සිය ගීත මගින් පෙන්වා දුන්නා. විවිධ සංගීත ක්‍රම, පර්යේෂණ හරහා අපේ හදවතට ගැළපෙන ගීත නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම සකසා දුන්න. සරල ගීතය, චිත්‍රපට ගීතය, මුද්‍රා නාටක ගීතය, ගුවන්විදුලි ගීත නාටකය, වේදිකා නාට්‍ය සංගීතය මේ හැම දෙයක් පිළිබඳව පසු පරම්පරාවට ආදර්ශයක් ලබාදුන්නෙ අමරදේවයන්. මෙහිදී අමරදේව-මහගමසේකර සුසංයෝගය වටිනා සම්පතක් වුණා.

**Q අමරදේවයන්ගේ සිනමා සංගීතය පිළිබඳව ඔබේ අදහස කුමක්ද?**

ඔහුගේ චිත්‍රපට සංගීතය ඔහුගේ නිර්මාණ කාර්ය තුළ වෙනම ලකුණක් සටහන් කරනව. ඉතා ඈත අතීතයේ පවා ඔහුගේ පළවන චිත්‍රපට සංගීතය රැගත් 'රන්මුතුදූව' චිත්‍රපටයේ තේමා සංගීතය, එහි ගීත, තුං මං හන්දිය, ගැටවරයෝ, රන්සළු ඇතුළු අනිත් චිත්‍රපට සඳහා ඔහු නිර්මාණය කළ සංගීතයද ඒ වෙනුවෙන් නිර්මාණය කරන ලද ගීත ඉතා රසවත් චිත්‍රපට ගීත බවට පත්වුණා. ඒ වගේම සාරවිට චිත්‍රපටයත් එසේමයි. මේ චිත්‍රපට සඳහා ඔහු බිහිකළ මධුර තනු රාගධාරී සංගීතය ඇතුළු අනෙක් සෑම සංගීත සම්ප්‍රදායකම ආභාෂය ලබමින් අපටම ගැළපෙන විදියට නිර්මාණය කරා.

**Q අමරදේව නම් ගායකයා ඔබ රස විඳින්නේ කෙසේද?**

අමරදේවයන්ට උපමාව අමරදේවයන්මයි. වෙනත් කිසිදු කෙනෙක් ඔහුට උපමා කිරීමට නොහැකියි. ඔහුගේ භාවාත්මක මධුර හඬ තරම් මම රස විඳින වෙනත් හඬක් නැහැ. එය මගේ ජීවිතය හා නිරතුරුවම බැඳී තිබෙන මධුර කටහඬක්. සන්නාලියනේ, කන්ද උඩින් එන ගෝමරියේ වැනි ගීත එවැනි භාවාත්මක ලෙස ගැයීමට කිසිවෙකුට පුළුවන්කමක් නැහැ. ඒ වගේම එතුමා මා වෙනුවෙන් නිර්මාණය කරන ලද උඩඟුලියන් වැනි ගීත එතුමා අතින් මිස වෙන කිසි කෙනකු අතින් බිහිවෙන්නෙ නැහැ. එතුමාගේ ගීත හරහා උපදින රසභාව ඉමක් කොණක් නැහැ. මගේ ගීත හරහා උපදින රසය හඳුනාගන්න ඕනෑම මොහෙතක ඒ පිටුපස්සෙ සිටින ප්‍රධාන පුද්ගලයා අමරදේවයන්. මොකද මම භාවාත්මක ගායනය ඉගෙනගත්තෙ රසිකයකු ලෙස ඔහුගේ ගීත රස විඳල.



**සැකසුම - සුලෝචන වික්‍රමසිංහ**

# මට හැමවිටම මගේ පියා ප්‍රදුමයට කරුණක්...



■ රන්ජන අමරදේව

උද්ධෘතයේ දැක්වෙනුයේ අන්තර්ජාතික කීර්තියට පත් උස්තාද් අල්ලා රක්ඛා පිළිබඳව ජාත්‍යන්තර කීර්තියට පත් එතුමාගේ පුත් උස්තාද් සකීර් හුසේන් පළ කළ අදහසකි. මම එය උස්තාද් අල්ලා රක්ඛා පිළිබඳ කෙරුණු වැඩසටහනකින් උපුටා ගත්තෙමි. මෙහි සැලකිය යුතු කරුණු දෙකක් ඇත. එකක් නම් මෙය පියෙකු පිළිබඳ පුතකු කියූ අදහසක් වුවත් මගේ අදහසක් නොවීමයි. දෙවැන්න මා අන්තර්ජාතික කීර්තියට පත් නොවීමයි.

කෙසේ වුවත් සකීර් හුසේන් ලියූ මේ වදන් පෙළ මගේ පියා පිළිබඳ මා සිත්හි අනන්ත වාරයක් නැඟුණු සිතිවිල්ලක දෝංකාරයක් බව කිව යුතුය. මේ ලිපිය ලිවීමට මා හට බල කරන ලද්දේ ඒ අදහාගත නොහැකි සමානතාව විසිනි. සකීර් හුසේන් තම පියා පිළිබඳව පැවසූ මේ කරුණු මගේ පියා පිළිබඳ ඒ ලෙසින්ම අදාළ වේ.

තාත්තා වයලීනය වාදනය කරන විට ඔහු වෙනම මානයකට අවතීර්ණ වන්නේය. ඔහුගේ මුහුණේ සිහින් සිනාවක් නැඟෙයි. වේදනාවක් සටහන් වෙයි. තොල් තාලයකට හැඩ වේ. තවත් විටක ඈත ලක්ෂ්‍යයක් වෙත දෙනෙත නාභිගත වේ. අප විනිවිද ගොස් කොහේදෝ ඇති වස්තුවක් දෙස ඔහුගේ දෙනෙත රැඳේ. මේ සංසිද්ධිය පිළිබඳ අම්මා පවසන්නේ මෙලෙස ය. "තාත්තා වාදනය කරන කොට සමහර විට හිනා වෙනවා... ඒ දවස්වල මායි මගේ මිතුරියනුයි හිතන්නේ අපිත් එක්ක හිනාවෙනවා කියලා... බලනකොට එහෙම නෙමෙයි...." ඔහු ධ්‍යානයකට සම වැදෙනවා දෝ සැකයක් මා තුළ හටගනී. 'සුපිපුණු මලක් සේ බබළන තම මුහුණේ දීප්තිය...' යනුවෙන් සකීර් හුසේන් විස්තර කරන්නේ මෙයම බව මට සිතේ.

තාත්තා මේ තාක් දුර ජීවිතයේ පැමිණියේ කෙසේදැයි විටෙක මට සිතේ. ඔහු ඒ තරමටම අහිංසකය. නිහතමානීය. එය බොහෝ දෙනා දන්නා දෙයකි. ඔබ නොදන්නා දෙයකුත් ඇත. ඒ විටෙක ඔහු මුරණ්ඩු බවයි. දැඩි බවයි.

තාත්තාගේ අහිංසක බව කිසි විටෙකත් නිවට බවක් ලෙස වටහා ගත යුතු නොවේ. ඔහු බියගුල්ලෙක්ද නොවේ. ඔහුගේ අහිංසක බව නිසා ඔහුගේ අතේ ඇති ඔරලෝසුව ගලවාගෙන යා හැකි නමුත් සංගීතය පිළිබඳ තමා සාක්ෂාත් කරගත් සත්‍යය බිඳකුදු සොරකම් කිරීමට හෝ දූෂණය කිරීමට ඔහු ඉඩ නොදෙනු ඇත. විෂය සම්බන්ධයෙන් නම් ඔහු අභීතව සටන් වදිනු මා දැක ඇත. යම්කිසි සම්මන්ත්‍රණයකදී තමාට පෙර සභාව ඇමතූ කථිකයාට පිළිතුරු දෙමින් තාත්තා සිදුකළ කතාවක් මට මතකය. ඔහු එදා තදින් කතා කළේය. එවන් අවස්ථාවලදී ආවේගය නිසා දෑස් යන්තම් අඩවන් වේ. වේගවත්ව, ඉතාම උපහාසාත්මකව තම ප්‍රතිවාදියා මෙල්ල කරන්නට තමාගේ භාෂාවම අවියක් කොට ගනු ඇත. ඔහු ආවේගශීලී වන තරමට ඔහුගේ භාෂාව තියුණු වේ. සංගීතය පිළිබඳව හෝ සාහිත්‍යය පිළිබඳව එකදු ස්වරයක් හෝ වචනයක් අනිසි ලෙස යෙදීමට ඔහුගේ අවසරය හිමි නොවේ. එවිට ඔහු එතරම්ම මුරණ්ඩුය.

සමහර විට ගී පද රචනාවක් පිළිබඳ ඔහුගේ විවේචනය අසන මා තුළද කැලඹීමක් ඇති වේ. ඔහු ඒ තරම් දැඩි ලෙස විවේචනය කරනු මා අසා ඇත. නමුත් කල් ගතවන විට මා වටහා ගත්තේ ඔහු විවේචනය කරන්නේ රචනාව විනා රචකයා නොවන බවයි. ඇත්තෙන්ම ඒ රචනාව ලියූ පුද්ගලයා ඔහුට වැදගත් නොවේ. රචනාව කාගේ වුවත් ඔහුගේ ප්‍රහාරය එලෙසමයි. ඔහු දැඩි මතධාරියකු යැයි සිතුණු වාරද එකක් දෙකක් නොවේ. ඔහුගේ අහිංසකත්වය වරදවා වටහා ගත යුතු නොවන්නේ එහෙයිනි. අංකුර ගී පද රචකයන් හා සංගීතඥයන් අමනාප නොවිය යුත්තේ එබැවිනි. එසේම හොඳ දේ හොඳයි කීමටද ඔහු මැළි නොවේ. දක්ෂයින් අගය කිරීමට පසුබට නොවේ. දක්ෂයාගේ පසුබිම දකින්නට පෙර තාත්තා දකින්නේ ඔහුගේ දක්ෂතාවයි.

තාත්තා තුළ මා දුටු සුවිශේෂ ගති ලක්ෂණ කිහිපයක් ඇත. තාත්තා භාණ්ඩවල අගය තීරණය කරන්නේ ඔහුටම ආවේණික ශෛලියකිනි. ඒ පිළිබඳව කතා කරන විට ඔහුගේ ප්‍රථම කාර් එක රෙනෝල්ට් ඩොල්ෆින් රථය අමතක කළ නොහැකියි. මට මතක ඇති කාලයේ පටන් 90 දශකය පමණ වන තෙක් එනම් වසර විස්සක පමණ කාලයක් තාත්තා පැදවූයේ එකම රථයකි. "රංජන, තාත්තට කියන්නකෝ අලුත් කාර් එකක් ගන්න කියලා...." සමහරු මා කේන්ති ගැස්සීමට එසේ කියති. ඒත් තාත්තා ඩොල්ෆින් එක වික්කේ නැත. අවසානයේ එය දිරා යන තෙක් වත්තේ කෙළවරක නවතා තිබිණි. ඉන්පසු වෙනත් වාහන කිහිපයක් තාත්තා සතු වූ නමුත් ඩොල්ෆින් රථය තරම් ඒවා පිළිබඳ තාත්තා කතා කළේ නැත.

ඩොල්ෆින් එකේ අපි නොගිය තැනක් නැත. බණ්ඩාරවෙල, මාතර, කතරගම, නුවරඑළිය, මහනුවර ගමන් ඒ අතරින් මගේ මතකයට නැඟේ. මාතර පොල්හේන, පාසල් නිවාඩුවට අනිවාර්යයෙන් යන ගමනකි. හැතැප්ම 100ක් දුර ගෙවාගෙන ගොස් (මේ සඳහා පැය 6 ක් හෝ 7 ක් ගත වන්නට ඇත. තාත්තාගේ රිද්මය අනුව ඔහු වාහනය එළවන්නේද විලම්භ හෝ මධ්‍ය ලයෙනි.) හැතැප්ම 100 ක් ගෙවා මාතර යන අප කරන්නේ උදේ හිටන් රෑ වනතුරු හැකි සෑම විටම පොල්හේන මුහුදට බැස නෑමයි. උදේ ආහාර ගැනීමට පෙර, පසු, දවල් ආහාරයෙන් පසු, රාත්‍රී ආහාරයට පෙර සහ පසු යනුවෙන් අපි කිහිප වරක් පොල්හේන මුහුද වැළඳ ගන්නෙමු. දවස් 2 ක් හෝ 3 ක් මෙසේ ගතකරන අපි නැවත කොළඹ බලා එන්නේ ඊළඟ නිවාඩුව ගැන සිතමිනි. ඊළඟට මට සිහිවන්නේ නුවර ගමනයි. පසුපස එන්ජිම

20 වන පිටුව බලන්න

# අමරදේව නමැති ගාන්ධර්වයා

■ ප්‍රවීණ සංගීතවේදී ජයන්ත අරවින්ද විසිනි

අමරදේව නමැති දිව්‍ය ගාන්ධර්වයා වියෝ වූ මොහොතේ පටන් එතුමා මහා පරිමාණ වශයෙන් වර්ණනාවට හා ගුණ කථනයට පාත්‍ර වුවද එතුමා තුළ පැවති අසහාය ප්‍රවීණත්වය හා කුසලතා සමතුලිත විෂය බද්ධ හා පිරිපුන් ඇගයීමකට ලක් වූයේද යන්න සැක සහිතය. අග්‍රගණ්‍ය වයලීන වාදකයෙකු හා සංගීත නිර්මාතෘවරයෙකු වශයෙන් එතුමාගේ ප්‍රාමාණිකත්වය බොහෝ දෙනාගේ ඇගයීම් තුළින් ගිලිහී එතුමා ප්‍රවීණ ගායකයෙකුය යන අදහස පුන පුනා ඉස්මතු කරනු ලැබිණ.

1947 නිෂ්පාදිත අසෝකමාලා චිත්‍රපටයේ සුළු චරිතයක්ද රඟපාමින් ගීතයක්ද ගයා තිබුණු නමුත් අමරදේවයින්ගේ ආරම්භක භූමිකාව වයලීන වාදකයෙකු වශයෙනි. එතුමා තරම් මධුර මනෝහර ලෙස වයලීනයේ තත් හැඬවීමට සමත් ශිල්පියෙකු මා පෙරදිග හෝ අපරදිග හෝ දැක නැත. එතුමාගේ සහජ වාසනා ගුණය, අඛණ්ඩව ස්වර අභ්‍යාසකරණය, මොහොමඩ් ගවුස් වැනි අග්‍රගණ්‍ය සංගීත නිර්මාතෘවරුන්ගෙන් ලැබුණු ආභාසය හා ආදර්ශය, මුද්‍රා නාට්‍ය වැනි ව්‍යවහාරික ක්ෂේත්‍රවල භාවික හා ප්‍රකාශනීය අවස්ථා නිරූපණයෙන් ලත් පරිචය මීට හේතු වන්නට ඇත.

වයලීනයේ සිවු තතින් මධුර ලෙස උපදවනු ලබන ආන්දෝලන, මීන්ඩ්, බන්, ගමක වැනි ස්වරාලංකාර අමරදේවයන්ගේ වාදනය තුළ සුලභ විය. තත මත දීර්ඝ ලෙස හා ලයාන්විතව මුදු මොළොක් ගමනින් ගෙන යන බෝ පහරින් (bow stroke) නිකුත් වූයේ සුසංගත කර්ණරසායන ස්වර මාලාවන්ය.

- - ධ I ස ස රි I ග ස - I ධ නි -
ප ධ නි I ධ ප ම I ග - - I - - -I

අමරදේවයන් වයස 18 දී පමණ තම යෞවන වියේදී මෙරට විසූ මොහමඩ් ගවුස් නමැති සංගීතඥයාගේ සංගීත නිර්මාණයෙන් රසාලිප්ත වූ 'අසෝකමාලා' චිත්‍රපටයේ ගීත සඳහා සුම්හිරි ලෙස වයලිනය වයා ඇති අයුරු එම ගීත වාදිත තැටිවල සංගීතමය පසුබිමට සූක්ෂම ලෙස කන් දීමේදී වටහා ගත හැකිය. සුනිල් ශාන්තයින් ගායනා කළ පැරණි ගීත කීපයකම වුවද අමරදේවයින් ඉදිරිපත් කරන සහාය වාදනය තුළින් එම මනහර වාද්‍ය ස්වර සවන් ගත කළ හැකිය.

මා අමරදේවයන්ගේ වාදන කුසලතා මෙලෙස අනුස්මරණීය ලෙස අගය කරන්නේ එතුමාගේ ගුවන් විදුලි වැඩ සටහන්, විශ්වවිද්‍යාලයීය සංගීත ප්‍රසංග, මුද්‍රා නාට්‍ය ආදියේදී ළමා වයලීන වාදකයෙකු වශයෙන් සහාය වූ මා එතුමා සමග සංගීත පුහුණුවීම්වලදී පවා එක්ව අභ්‍යාස කරමින් සමීප ඇසුරේ ගත කළ බැවිනි. එතුමාගේ වයලීන වාදන ශෛලියෙන් අල්ප මාත්‍රයක් පමණ හෝ අදත් මගේ වාදන ශෛලිය තුළ සෙවණැල්ලක් ලෙසින් හෝ අසන්ට දකින්ට පුළුවන් බව මා කියන්නේ එය මගේ භාග්‍යයක් ලෙස සලකමිනි.

1953 දී ප්‍රේමකුමාර එපිටවල නිෂ්පාදනය කළ 'තිත්ත බත' මුද්‍රා නාට්‍යය (ballet) සඳහා මොහොමඩ් ගවුස් සංගීතඥයා නිර්මාණය කළ සංගීතය රසභාවයෙන් පොහොසත් කළේ තිත්ත බතෙහි යම් 'තිත්ත' බවක් තිබුණි නම් එය සපුරා 'පැණි' රසක් බවට පරිවර්තනය කරමිනි. එම මුද්‍රා නාට්‍යයට අමරදේවයින්ගේ ගායනාවලින් ලැබුණු රස පෝෂණය මීටත් අධිකය.

වැහි පිට මහ වැහි වැහැලා ගංහෝ
උතුරාගෙන මෙහි එනවෝ....

නවසිය පනහෙ දශකය තුළ විශේෂයෙන්ම වයලීන වාදන ශිල්පියෙකු ලෙස එවක 'ගාන්ධර්ව විභාග' නමින් යුත් සංගීත විභාගවලට ඉදිරිපත් වීමේදී රාග තාල පිළිබඳ උපදෙස් ලබා ගැනීම සඳහා හෝ රාගධාරි තනුවක් නිර්මාණය කරවා ගැනීම සඳහා හෝ පැමිණියේ පිළියන්දල විසූ මගේ පියා, වින්සන්ට් සෝමපාලයින් වෙතය. නවසිය හතළිහේ දශකයේ මුල පටන් අමරදේවයින් කුමාරතුංග මුනිදාසයන්ගේ හා මගේ පියාගේ ඇසුර ලබා තිබිණ. එවක කුමාරතුංගයින් දේශීය 'හෙළ' සංගීතයක් ගොඩ නැගීමේ අරමුණින් 'වැයළුව' නොහොත් වයලීනය 'හෙළ' වාද්‍යයක් සේ සලකා එය වයමින් ගැයීම පිණිස 'හෙළ' ගී ද එම තනුද ඇතුළත් 'හෙළ මියැසිය' ග්‍රන්ථය මගේ පියා සමග එකතු වී පළ කරද්දී එම ගීත හා වාදිත අමරදේවයින් කෙරේ බෙහෙවින් බලපාන්නට ඇත.

සුකොමළ අකුරින් - බඳ ලොළ මිහිරින්
නො පහළ බැහැරින් - හෙළ බස' පේ

ළමා අවධියේ පටන් අමරදේවයින් වයලීන වාදනය තම ජීවිතයේ පරම අභිලාසය කරගත් නමුත් සමගාමී ලෙස තමා තුළම ගොඩ නැගුණු ගායන හා නිර්මාණ හැකියාව හඳුනා ගන්නා අමරදේවයෝ ගීත ගායනයේද ගී තනු නිර්මාණයේද යෙදෙමින් තම සෞන්දර්ය යාත්‍රාව තවත් කිහිප ගුණයකින් ව්‍යාප්ත කර ගත්තේය. මුල් අවධියේම එතුමා ගායනා කළ 'ශාන්ත මේ රෑ යාමේ' ගීතය අතිවිශිෂ්ට නිර්මාණයකි. 'සොම්බර කැලුම් සඳුගේ වැදී' ගීය උත්තර භාරතීය සංගීතයේ 'බිහාග්' රාගය ඇසුරු කොට ගත්තකි. 'වඳිමු සුගත ශාක්‍ය සිංහ' ගීය 'යමන් කල්‍යාණ' රාගය මත පදනම් වූවකි. 'සීගිරියේ සිතුවම් රමණී' ගීය 'භීම්පලාසි' රාගයට අනුව පබැඳුණකි. 'දේ සත පිනන ගී රාවේ' ගීය රාග ඡායාවක් නොදක්වන ස්වතන්ත්‍ර ගී තනුවකි. 'කුසුම් පිපේ අතු පතරේ සතර දිගන්තේ' ගීයද 'භීම්පලාසි' රාග ස්වර ඇසුරු කරයි. 'උදයේ උපුල් විලේ' හා 'ලෙල දේය බඳේ සුදු සේලේ' ගීත වංග තනු පදනම් කොට ගත් ගීත ද්වයකි. මින් බොහෝ ගීත අමරදේවයින් වැඩිදුර ඉගෙනීම සඳහා භාරතයට යාමට ප්‍රථම ගැයූ හෝ නිර්මාණය කළ ගීත වීම එතුමාගේ සම්මානයට හේතු වේ.

1950 දශකයේ මුල් භාගයේ අමරදේවයෝ වයලීන වාදනය වැඩිදුර ඉගෙනීම සඳහා භාරතයේ ලක්නව්හි පිහිටි 'භාත්ඛණ්ඩේ' ආයතනයට ඇතුළු වෙයි. එහිදී එතුමා වයලීන වාදනය ප්‍රගුණ කරන්නේ භාරතයේ ප්‍රකට වයලීන වාදකයෙකු වූ මහාචාර්ය වී. ජී. ජෝග් යටතේය. සත්‍ය වශයෙන් භාරතයේදී අමරදේවයින්ට ලබා ගැනීමට තිබුණේ රාග තාල පිළිබඳ පෘථුල වූ ශාස්ත්‍රීය අධ්‍යාපනයක් පමණි.

කෙසේ වුවද ශිල්පීය ක්‍රම (techniques) අතින් තම ආචාර්යවරයා අනුකරණය කිරීමට යාමේ හේතුවෙන් අමරදේවයින්ගේ වාදන ශිල්පීය කුසලතා වර්ධනය වූ නමුත් පෙර පැවති ස්වර මාධූර්යය ගුණය තරමක් දුරට හෝ පිරිහී ගිය බවක් පෙනිණ. එතුමාගේ වාදනය තුළ භාරතයට යාමට පෙරාතුව

20 වන පිටුව බලන්න

AirCare Plus

ONE CALL WILL FIX IT ALL

Sales | Service | Repair | Installation

**Line:** 416.605.8300

**Email:** ashokdon@live.ca

**Heating & Air Conditioning**

*FAST, AFFORDABLE SERVICE*

**Ashok Hettege**

Licensed H.V.A.C Technician



- Furnace
- Gas Piping
- Hot Water Tank
- Tankless Water Heater
- Humidifier
- Air Cleaner
- Air Conditioning

Dishwasher & Fridge Water Line Installation

Gas Stove and Gas Dryer Installation

ග්‍රීෂ්ම සමය නිමා විය.
ඔබේ නිවසේ තාපන යන්ත්‍රයේ (furnace)
නිසි ක්‍රියාකාරිත්වය පිළිබඳ
සැලකිලිමත් වන්න.
එහි අත්‍යවශ්‍ය නඩත්තු කඩයුතු අලුත්වැඩියා
කටයුතු හා අලුතින් සවිකිරීම් සඳහා විමසන්න.

A MEMBER OF CanLanka BUSINESS ASSOCIATION

2004-2014 10 CELEBRATING 10 YEARS IN BUSINESS

SATISFACTION 100% GUARANTEE



**SILVY FERNANDO, LL.B.**

BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

LAWYER FOR;

- HOME REFINANCE, PURCHASE AND SALE
- PERSONAL INJURY (NO LEGAL FEE UNTIL SETTLEMENT)
- DEBT RECOVERY/DEBT SETTLEMENT
- SEPARATION AGREEMENTS, AND DIVORCE (ACCEPT LEGAL AID CERTIFICATES)
- POWER OF ATTORNEY, AFFIDAVITS, AND WILLS
- ALL IMMIGRATION MATTERS
- LAND LORD-TENANT DISPUTES
- NOTARIZING AND COMMISSIONING

UNIT 111 – 7800 WOODBINE AVENUE, MARKHAM, ON L3R 2N7

TEL: 416-272-6587/905-604-7771, FAX: 905-604-5529

EMAIL: SILVY@SFLEGALSERVICE.COM

# නත්තල් අසිරිය මැදින්



## දෙවියන් වහන්සේ කියූ මග දකිමු

■ පී. සී. හෙට්ටිආරච්චි විසිනි

තම ශාස්තෲන්වහන්සේගේ උපන්දින සැමරුම සඳහා මෙවරත් කෝටි ප්‍රකෝටි ධනස්කන්ධයක් වියපැහැදම් කරමින් ඉතා උත්කෘෂ්ට විශ්ව සාදයක් බවට පත්කරගෙන ප්‍රීති ප්‍රමෝදයට පත්වීමට සමහර කිතුනුවන් යුහුසුලුව සිටින මොහොතක, ලෝකාන්තිමය පිළිබඳ යේසුස් වහන්සේ කර තිබෙන ප්‍රකාශ පිළිබඳව සිහිපත් කිරීම උචිත වන්නේ මෙවන් සමයක උන්වහන්සේට දක්වන ගෞරවයට අමතරව ඉන් ලබාදෙන යහපත් පණිවුඩය මිථ්‍යා අන්ධකාරයෙන් ගිලී මුලාව සිටින ජන සමාජයට යහමග තෝරා බේරා ගැනීමට ආලෝකයක් බවට පත්කර ගත හැකි හෙයිනි.

යේසුස් වහන්සේ ලෝකාන්තිමය ප්‍රධාන මාතෘකාවක් කොට සලකා ඒ සම්බන්ධව සෘජුවම කතා කර ඇත්තේ කල්පාවසානයෙන් පසු එළඹෙන අලුත් පොළොවට උචිත පරිදි මනුෂ්‍යයා සූදානම් කිරීම උන්වහන්සේගේ පොළොවේ මෙහෙය වූ නිසාවෙනි.

■ 'අහසත් පොළොවත් පහව් යන්නේය.' (මතෙව් 24/35)

■ 'එහෙත් ඒ දිනය හෝ පැය පිළිබඳ කිසිවෙක් නොදනිති. ස්වර්ගයෙහි දූතයෝවත් පුත්‍රයාණෝවත් නොදනිති. එය දන්නේ පියාණන්වහන්සේ පමණක්මය.' (මතෙව් 24/36)

■ 'නියමිත මොහොත කවරදාදැයි ඔබ නොදන්නා බැවින් ප්‍රවේසම් වන්න. අවදිව ඉන්න.' (මතෙව් 25/13)

■ 'එවිට ශ්‍රාවකයෝ පුද්ගලික ලෙස කතාකරමින් කල්පාන්තය පිළිබඳ පෙර ලකුණු මොනවාද කියා අපට දන්වා වදාළ මැනවැයි ආයාචනා කළහ.' (මතෙව් 24/3)

■ 'ඉර සඳ හා තාරකාවල ලකුණු පහළ වන්නේය. මුහුදේ හා රළපතරෙහි ඝෝෂාවෙන් වන වියවුලින් ජාතීන් හට සිත් වේදනා වන්නේය.

■ අහසේ බලවේගයෙන් සොලවනු ලබන බැවින් ලෝකයට සිදුවන්නට යන ආපදා ගැන බලා සිටීමෙන් මිනිසුන්ගේ සිත් බියෙන් ක්ලාන්ත වන්නේය' (ලූක් 21/25-26)

■ 'නොයෙක් තන්හි සාගතද භූමිකම්පාද සිදුවනු ඇත' (මතෙව් 24/7)

■ යුද්ධ හා යුද්ධ පිළිබඳ කටකතා ඔබට ඇසෙනු ඇත. (මතෙව් 24/6)

■ ජාතියක් ජාතියකට විරුද්ධවද රාජ්‍යයක් රාජ්‍යයකට විරුද්ධවද නැගී සිටිනු ඇත. (මතෙව් 27/7)

■ අධර්මය වැඩෙන්න බොහෝ දෙනාගේ ප්‍රේමය පිරිහෙන්නේය. (මතෙව් 24/12)

■ බොහෝ දෙනෙකුගේ ශ්‍රද්ධාව බිඳ වැටෙනු ඇත. ඔවුහු ඔවුනොවුන් පාවා දෙන්නාහ. ඔවුනොවුන් කෙරෙහි වෛර බැඳගන්නාහ. (මතෙව් 24/10)

■ සහෝදරයා සහෝදරයාවද පියා දරුවාවද මරණයට පාවා දෙනු ඇත. දරුවෝ මව්පියන්ට විරුද්ධව නැඟී සිට ඔවුන් මරණයට පත් කරන්නෝය. (මාක් 13/12)

■ බොහෝ බොරු දිවැසිවරු නැගිට බොහෝ දෙනා මුළා කරන්නාහ. (මතෙව් 24/11)

■ එහෙත් කිසිවකුට බිය නොවන්න. අවසානය තවම පැමිණ නැත. සියල්ල නව යුගය බිහිකරවන ප්‍රසව වේදනාවේ පටන් ගැන්මය. නමුත් සියල්ල සිදුවනු නියතය. (මතෙව් 24/6-8)

මහමග සතුන් ලගින ස්ථානයක වඩු කාර්මිකයකුගේ දරුවකු ලෙසින් ලොව පහළව, ඉහළ අධ්‍යාපනයකට උරුම හිමිකම් නොකියමින්, ධීවරයන්, කම්කරුවන් අයකැමියන් වැනි සාමාන්‍ය ජනතාව ඇසුරු කරමින්, අවුරුදු 03 ක් වැනි ඉතා කෙටි කලක් නන්නත්තාරේ ඇවිදිමින් දේශනාකාරයෙක් ලෙස ජීවත් වී සමාජ සම්මතයට එරෙහි අදහස් ප්‍රකාශ කිරීම හේතුවෙන් අපරාධකරුවකු ලෙස නින්දිත ප්‍රසිද්ධ මරණයකට එදා ගොදුරු වූ යේසුස් වහන්සේ, වසර 2000 කට පෙර කළා වූ ප්‍රකාශයන්හි සත්‍යාසත්‍යතාව මේ දිනවල නිතර නිතර අසන්නට දකින්නට ලැබෙන ගංවතුර, භූමිකම්පා, සුළිසුළං, දරුණු අපරාධ යනාදී ප්‍රවෘත්ති තුළින් මනාව අත්දැකිය නොහැකිද?

කාර්මික මිනිසකු ලෙස යාන්ත්‍රීකරණය වීමේ හේතුවෙන් මේ වන විට මානුෂීය පදනමින් දවසින් දවස ඈත්වෙමින් සිටින මනුෂ්‍යයා ආත්මාර්ථකාමියකු බවට පත්ව නොසිටීද?

ගැඹුරු මුහුදේ තෙල් කැනීම්, න්‍යෂ්ටික බලාගාර මගින් සිදුකෙරෙන බලශක්ති උත්පාදනය, රථවාහන මගින් සිදුකෙරෙන ඉන්ධන දහනය, කර්මාන්ත තුළින් පරිසරයට එකතු කරන දූෂ්‍යකාරකාදියෙන් සිදුවන පරිසර විනාශය නිසා පෘථිවි ගෝලය උණුවීමෙන් සිදුවන කාලගුණ විපර්යාසය, මැද පෙරදිග මුල්කර ගනිමින් සිදුකෙරන නොනවතින සිවිල් යුද්ධ, ආහාර අර්බුදය, අධික ජනගහනය, මන්දපෝෂණය, විරැකියාව වැනි කරුණු කාරණා කල්ප විනාශයට පෙරම එකිනෙකාගේ විනාශය නොහොත් මරණය ඉක්මන් කරවීමට හේතු වී නොමැතිද?

සෑම මනුෂ්‍යකුටම තමාගේම ලෝකයක් ඇත. මරණයෙන් සිදුවන්නේ එම ලෝකය විනාශ වීමයි. තමන්ගේ ලෝකය විනාශයෙන් වළකා ගැනීමට සෑම මනුෂ්‍යයකුම වග බලාගතහොත් ලෝකාන්තිමය පිළිබඳ කණස්සලු වීමට හේතුවක් නැත. එහෙත් සිදුව ඇත්තේ තම ලෝකය නොහොත් ජීවිතය රැක ගැනීමේ අපේක්ෂාවෙන් අන්‍යයන්ගේ ලෝක නොහොත් ජීවිත විනාශයට මනුෂ්‍යයා පෙළඹී සිටීමයි. ධර්මය අවශ්‍යව ඇත්තේ මෙම ආත්මාර්ථකාමී ස්වරූපයෙන් මිදීම පිණිසය.

මළවුන්ට දෙවියන් වහන්සේ අවශ්‍ය නැත. දේවත්වය නොහොත් ධර්මය අවශ්‍ය ජීවත් වන්නවුන්ටය. ඒ ඔවුන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීම පිණිසය.

'උන්වහන්සේ මළවුන්ගේ දෙවියන් වහන්සේ නොව, ජීවතුන්ගේ දෙවියන් වහන්සේය.' (මාක් 12/27)

ක්‍රි.ව. 01 සිට 1899 දක්වා ලොව පුරා ඇතිවූ යුද්ධවලින් මිය ගිය සංඛ්‍යාවට වඩා තුන් ගුණයක ජනතාවක් 1900-1999 දක්වා වූ කාලය තුළදී යුද්ධවලින් මිය ගොස් ඇත. 1945-1992 අතර විශාල යුද්ධ 149 ක් තිබී ඇත. න්‍යෂ්ටික අවි 8400 ක් ලෝකයේ ඇති අතර ඉන් 2000 ක් ඕනෑම මොහොතක ක්‍රියාත්මක කළ හැක.

සෑම තත්පර 05 කට වරක් දරුවෙක් මන්දපෝෂණයෙන් මිය යන අතර සෑම වසරකම මිලියන 05 කට වැඩි දරුවන් සංඛ්‍යාවක් මන්දපෝෂණයෙන් මිය යති. 2005 දී ක්ෂය රෝගයෙන් මිය ගිය සංඛ්‍යාව මිලියන 1.6 කි. මැලේරියාවෙන් මිලියන 500 ක් සහ ඒඩ්ස්වලින් මිලියන 40 ක් ලොව පුරා පීඩා විඳිති. 2004 දී මිලියන 836 ක් සාගතයට බිලිව සිටියහ. ලොව වෙසෙන බිලියනයක ජනතාවට නිවාස පහසුකම් නැත. ලෝක ජනගහනයෙන් සියයට 45 ක් දුප්පතුන්ය. ලෝකයේ සෑම මිනිසුන් 115 කගෙන් එක් අයෙකු සරණාගතයෙකි.

මෙම සංඛ්‍යාලේඛන පවා ක්ෂණයකින් වෙනස් වෙමින් ඉහළ අගයක් ගනිමින් පවතී.

තාක්ෂණික ආහාර, ලෙඩරෝග, රසායනික අවි, යුද කළකෝලාහල, පරිසර විනාශය වැනි කාරණා නිසා ලෝකාන්තිමයට පෙරම මිනිස් ජීවිත විනාශයට යන මග පාදාගෙන තිබේ.

මින් පෙනී යන්නේ කල්පාවසාන දිනය අපහැදිලි වුවත් එවැනි අවාසනාවන්ත ඉරණමක් වෙත පොළොව වේගයෙන් ගමන් කරමින් සිටින බව නොවන්නේද? වර්තමානය අවසාන කාලය ලෙස කිතුනුවන් හඳුනාගෙන ඇත්තේ එබැවිනි.

අවසාන දවස ගතවන්නේ කෙසේදැයි යන පැනයට යේසුස් වහන්සේ පිළිතුරු දී ඇත්තේ මෙලෙසිනි.

■ එකල මනුෂ්‍යයන් දෙදෙනෙක් කෙතේ සිටිති. එක් තැනැත්තෙක් ගනු ලබන්නේය. අනිත් තැනැත්තා හැර දමනු ලබන්නේය. (මතෙව් 24/40)

■ ස්ත්‍රීහු දෙදෙනෙක් ඇඹරුම්ගලේ ඇඹරමින් සිටිති. එක් තැනැත්තියක් ගනු ලබන්නීය. අනෙක් තැනැත්තිය හැර දමනු ලබන්නීය. (මතෙව් 24/41)

■ එකල පියස්ස මත සිටින්නා තම ගෙයි තිබෙන තමා සතු කිසිවක් ගන්නා පිණිස නොබසීවා. (මතෙව් 24/17)

■ කෙතෙහි සිටින්නාද තමාගේ ඇඳුම ගැනීමට පෙරළා නියරට නොඑව්වා. (මතෙව් 24/18)

■ ඒ දවස්වලදී ගර්භණීන්ටද කිරි මව්වරුන්ටද ඇතිවන දුකක මහත. (මතෙව් 24/19)

■ ලෝකයේ පටන් ගැන්මේ සිට මේ දක්වා නොවූ විරූ මතුද නොවන පරිදි කරුණු පීඩාවන් එකල්හි සිදුවන්නේය. (මතෙව් 24/21)

■ ඒ කාලය කෙටි නොකරන ලද්දේ නම් කිසිවෙක්වත් නොගැලවෙන්නේය. එහෙත් තෝරා ගත්තවුන් උදෙසා ඒ කාලය කෙටි කරනු ලබන්නේය. (මතෙව් 24/22)

■ හේමන්තයේදීවත් සබත් දිනයේදීවත් මෙය සිදුනොවන ලෙස යාඥා කරන්න. (මතෙව් 24/20)

යේසුස් වහන්සේගේ අනාවැකියෙහි සත්‍යතාව අවබෝධයට ශ්‍රී ලංකාවේ සුනාමි ඛේදවාචකය වුවත් ප්‍රමාණවත්ය. එදා සුනාමිය ලෝකාන්තිමයේ පෙරහුරුවක් ලෙස උපකල්පනය කිරීම යෝග්‍ය නොවන්නේද?

සැබෑ කිතුණුවා කල්පාවසානයට බිය විය යුතු නැත. අද මනුෂ්‍යයන් කතා කරන ලෝකාවසානය සමස්ත විශ්වයේ විනාශය ලෙස යේසුස් වහන්සේ ප්‍රකාශ කර නැත. පිරිසක් ඉතිරි වීමේ අරුත සම්පූර්ණ විනාශයක් සිදුනොවන බවය. නව ලොව ලෙස දැක්වෙන්නේ විශ්ව නීතිය කඩ කරමින් තහනම් ගහේ ගෙඩි කෑමේ හේතුවෙන් හීන කරගත් විශ්වාසය කරණ කොටගෙන විකෘති වූ ලොව යළි ප්‍රකෘති තත්ත්වයට පත් වීමයි. නොහොත් වෙනස් වීමයි. ඒ අනුව ලෝක විනාශයෙන් බේරෙන්නේ නව ලොවට උචිත වුවන් පමණි. නෝවාගේ කාලයේ මෙනි.

'අහස දුම මෙන් පහව් යන්නේය. පොළොව පරණ වස්ත්‍රයක් මෙන් දිරාපත් වන්නේය.' (යෙසා 51/6)

'මම අලුත් අහසක්ද අලුත් පොළොවක්ද මවමි. පසුගිය දේ මතක් කරන්නේවත් සිහිකරනු ලබන්නේවත් නැත.' (යෙසා 65/17)

ගැලවීම සහ අවසන් දිනය පිළිබඳ ඉඟි කිහිපයක් යේසුස් වහන්සේ පෙන්වා දී ඇත්තේ මෙලෙසිනි.

'මා නිසා සියලු ජාතීහු ඔබට වෛර කරන්නෝය. ඔවුහු ඔබ වධ බන්ධනවලට පාවා දී මරන්නෝය. එහෙත් අවසානය දක්වා ස්ථිරව සිටින්නා ගැළවෙන්නේය.' (මතෙව් 24/9, 24/13)

'රාජ්‍ය පිළිබඳ සුභ අස්න සියලු ජාතීන් හට සාක්ෂියක් වන පිණිස ලොව පුරා ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අවසානය පැමිණෙන්නේය.' (මතෙව් 24/14)

වසර දෙදහස් ගණනකට පෙර ශීත ඍතුවේ දිනයක යේසුස් වහන්සේ පොළොවට පහළව ඇත්තේ පෘථග්ජන මනුෂ්‍යයා අවසන් දිනයට ගලවා ගැනීම පිණිස පුරුදු පුහුණු විය යුතු ආකාරය අනාවරණය කරදෙනු සඳහාය. ඒ නිසා උන්වහන්සේගේ නාමයෙන් කා බී, ජෝගි නැටීම අනුමත කළ හැක්කක් නොවේ. නත්තලෙහි සැබෑ අරුත සැබෑ ලෙස වටහා ගැනීම ගැලවීමට ඇති එකම මගයි. උන්වහන්සේ ගව මඩුවක ඉපදුණේ ඒ බව පෙන්වා දීමටය.

ඔබ සැමට සාමය, සතුට, සමාදානය පිරි සුභ නත්තලක් වේවා.!




■ සිරිසේන විතානගේ

# විභක්ති විවරණය

විභක්ති යන්නෙහි අදහස 'බෙදීම' යනුයි. නාම ප්‍රකෘතියක් විවිධ අරුත් ගැන්වීම සඳහා අදාළ විභක්ති ප්‍රත්‍ය එක් කිරීම මගින් කර්ම, කර්තෘ ආදි අවස්ථාවනට බෙදීම විභක්ති නම් වෙයි. 'මිනිස්' යනු නාම ප්‍රකෘතියකි. එයට 'ආ' යන විභක්ති ප්‍රත්‍යය එක් කිරීමෙන් 'මිනිසා' යන ප්‍රථමා විභක්ති ඒකවචන නාමපදය සෑදෙයි. 'මිනිස්' යන නාම ප්‍රකෘතියටම 'ආගේ' යන විභක්ති ප්‍රත්‍යය එක් කිරීමෙන් 'මිනිසාගේ' යන සම්බන්ධ විභක්ති ඒකවචන නාමපදය සෑදෙයි. මෙසේ එකම මිනිස් ශබ්ද විභක්ති ප්‍රත්‍ය ගැන්වීම මගින් විවිධ අරුත්වලට බෙදෙන බැවින් 'විභක්ති' නම් වෙයි.

සිංහලයෙහි මෙබඳු විභක්ති නවයක් දක්නට ලැබේ.

1. ප්‍රථමා විභක්තිය
2. කර්ම විභක්තිය
3. කර්තෘ විභක්තිය
4. කරණ විභක්තිය
5. සම්ප්‍රදාන විභක්තිය
6. අවධි විභක්තිය
7. සම්බන්ධ විභක්තිය
8. ආධාර විභක්තිය
9. ආලපන විභක්තිය යනුවෙනි.

## 1. ප්‍රථමා විභක්තිය

උක්තය හෙවත් වාක්‍යයක ආඛ්‍යාතයෙන් කියැවෙන කර්තෘ ප්‍රථමා විභක්තියෙන් සිටී. කර්තෘකාරක වාක්‍යයක නම් එහි කර්තෘත් කර්මකාරක වාක්‍යයක නම් එහි උක්ත වූ කර්මයත් ප්‍රථමා විභක්ති ගනී. කර්තෘකාරක වාක්‍යයක - 'බළලා' මීයන් අල්ලයි. කර්මකාරක වාක්‍යයක - බළලා විසින් 'මීයෝ' අල්ලනු ලබති. ප්‍රථමා විභක්තියෙහි යෙදෙන විභක්ති ප්‍රත්‍යත් ඒ සඳහා උදාහරණත් පහත දැක්වේ.

| වචන | ප්‍රත්‍ය | ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය | වාක්‍යයක යෙදෙන අයුරු |
|---|---|---|---|
| ඒක වචන | අ | ගත් + අ = ගත | ගත පුෂ්ටිමත් ය. |
| | ආ | මිනිස් + ආ = මිනිසා | මිනිසා සඳ බලයි. |
| | උ | කුමර + උ = කුමරු | කුමරු සිප් උගනී. |
| | ඒ | කලේ + ඒ = කලේ | කලේ බිඳුණේය. |
| | අක් | අඟන + අක් = අඟනක් | අඟනක් මල් නෙළන්නිය. |
| | එක් | කුරුලු+එක් = කුරුල්ලෙක් | කුරුල්ලෙක් ඉගිලී ගියේය. |
| බහු වචන | උ | ඇත් + උ = ඇත්තු | ඇත්තු බර අදිති. |
| | ඕ | ගොවි + ඕ = ගොවියෝ | ගොවියෝ කුඹුරු වපුරති. |
| | හු | භික්ෂු + හු = භික්ෂූහු | භික්ෂූහු දනට වඩිති. |
| | වල් | ගෙ + වල් = ගෙවල් | ගෙවල් කඩා වැටිණි. |

## 2. කර්ම විභක්තිය

කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය කර්ම විභක්තිය ගනී. 'ලේඛකයෝ පොත් ලියති'. යන වාක්‍යයෙහි ලේඛකයෝ නමැති කර්තෘගේ ලියති යන ක්‍රියාවට යටත් වනුයේ පොත්ය. කර්ම විභක්තියෙහි යෙදෙන විභක්ති ප්‍රත්‍යත් ඒ සඳහා උදාහරණත් මෙසේය.

| වචන | ප්‍රත්‍ය | ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය | වාක්‍යයක යෙදෙන අයුරු |
|---|---|---|---|
| ඒක වචන | අ | පොත් + අ = පොත | ළමයා පොත කියවයි. |
| | ආ | මැඩි + ආ = මැඩියා | නයා මැඩියා ගිලී. |
| ඒක වචන | උ | අස් + උ = අසු | අශ්වාරෝහකයා අසු මෙහෙයවයි. |
| | ට | ගේ + ට = ගෙට | දැරිය ගෙට ගියාය. |
| | අට | ගම් + අට = ගමට | මම ගමට යමි. |
| | අකු | මිනිස් + අකු = මිනිසකු | කොටියා මිනිසකු මැරීය. |
| බහු වචන | අන් | ගොවි + අන් = ගොවියන් | නිලධාරියා ගොවියන් අමතයි. |
| | උන් | පුත් + උන් = පුතුන් | මව්වරු පුතුන් නළවති. |
| | න් | ඉතිරි + න් = ඉතිරින් | සුදනෝ ඉතිරින් නොපෙළති. |
| | වල් | ඇළවල් + ඇළවල් | කම්කරුවෝ ඇළ-වල් කැපූහ. |

## 2. කර්තෘ විභක්තිය

කර්මකාරක වාක්‍යයන්හි අනුක්ත (උක්ත නොවන) කර්තෘ නිතරම සිටින්නේ කර්තෘ විභක්තියෙනි. 'ගුරුවරයා විසින් ළමයි හික්මවනු ලබති' යන වාක්‍යයෙහි 'ගුරුවරයා විසින්' යන්න අනුක්ත කර්තෘයි. එය සිටින්නේ කර්තෘ විභක්තියෙනි. ඉහත වාක්‍යයෙහි 'විසින්' යන්න නොමැතිව ලියූවද වරදක් නැත. එහෙත් වර්තමානයෙහි බහුලව එය යොදාම ලියන බැවින් ඔබද එසේ ලිවීම සුදුසුය. කර්තෘ විභක්තියෙහි යෙදෙන විභක්ති ප්‍රත්‍යත් ඒ සඳහා උදාහරණත් මෙසේය.

| වචන | ප්‍රත්‍ය | ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය | වාක්‍යයක යෙදෙන අයුරු |
|---|---|---|---|
| ඒක වචන | අ | සිටුදූ + අ = සිටුදුව | සිටුදූව විසින් ගවයෝ නිදහස් කරනු ලැබූහ. |
| | ආ | ගොපලු+ආ = ගොපල්ලා | ගොපල්ලා විසින් ගවරැළ පාලනය කරනු ලැබූහ. |
| | උ | පුත් + උ = පුතු | පුතු විසින් පියා රැක බලා ගැනිණි. |
| | අක | උපාසිකා+අක = උපාසිකාවක | උපාසිකාවක විසින් වෙහෙර කරවන ලදි. |
| බහු වචන | අන් | දෙව් + අන් = දෙවියන් | දෙවියන් විසින් සැදැවත්හු ආරක්ෂා කෙරෙති. |
| | උන් | සොර + උන් = සොරුන් | සොරුන් විසින් ගෙය බිඳින ලදි. |
| | න් | ඉතිරින් + න් = ඉතිරින් | ලොව නිමවනු ලබනුයේ ඉතිරින් විසිනි. |

සැ.යු. ඉහත සටහන බලන ඔබට කර්තෘ විභක්තියෙහි යෙදුණ විභක්ති ප්‍රත්‍යම මෙහිදී යෙදී ඇති සැටි පෙනෙනු ඇත. ඒකවචනයෙහි 'ට, අට' යන ප්‍රත්‍යද බහුවචනයෙහි 'වල්' ප්‍රත්‍යද හැර සෙසු ප්‍රත්‍ය කර්ම විභක්තියේ ආ ඒවාම වෙයි. 'විසින්' යන්න යොදා ගැනීමෙන් කර්ම විභක්තියට වඩා එහි ඇති කර්තෘ විභක්ති අරුත ප්‍රකාශ වෙයි. විශේෂත්වය හැඟවෙයි.

## 4. කරණ විභක්තිය

යම් ක්‍රියාවක් සිදු කිරීම සඳහා උක්ත කර්තෘට උපකාරී වන පද කරණ විභක්ති ගනී. 'ළමයා පෑනෙන් ලියයි' යන වාක්‍යයෙහි 'ළමයා' යන උක්ත කර්තෘට 'ලියයි' යන ක්‍රියාව කිරීමට උපකාරී වන පදය පෑනයි. එබැවින් පෑනෙන් යනුවෙන් කරණ විභක්තියෙන් සිටී. කරණ විභක්තියෙහි යෙදෙන විභක්ති ප්‍රත්‍යත් ඒ සඳහා උදාහරණත් පහත දැක්වේ.

| වචන | ප්‍රත්‍ය | ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය | වාක්‍යයක යෙදෙන අයුරු |
|---|---|---|---|
| ඒක වචන | ඉන් | අත් + ඉන් = අතින් | මම එය අතින් අල්ලමි |
| | එන් | ගුණ + එන් = ගුණෙන් | ඔහු ගුණෙන් උසස් අයෙකි. |
| | එනි | පස + එනි = පසෙනි | භික්ෂුව යැපෙනුයේ සිව් පසෙනි. |
| බහු වචන | 'වලින්. යන ප්‍රත්‍යය අචේතනික ශබ්දවලදී ලැබේ. 'පුටුවලින්' ආදි වශයෙනි. එහෙත් බහුලව බහුවචනයෙහි ද යෙදෙනුයේ ඒකවචන ප්‍රත්‍ය ම ය. මෙහි අතින් ආදියෙහි අත කරණ කොට ගෙන අරුත ලැබේ. | | |

සැ.යු. නෙන් (නැත්නෙන්), නෙනි (මෙත්නෙනි), නි (සහතොස්නි) යන ප්‍රත්‍යද අතීතයේ භාවිත වුවද වර්තමානයෙහි භාවිත නොවේ.

## 5. සම්ප්‍රදාන විභක්තිය

හොඳ හෝ නරක යමක් ලබන්නා හෝ පිළිගන්නා ප්‍රකාශ වන්නේ සම්ප්‍රදාන විභක්තියෙනි. 'ළමයා බල්ලාට කෑම දෙයි' නොහොත් 'ළමයා බල්ලාට පහර දෙයි' යන දෙතැන්හිම බල්ලා කෑම හෝ පහර ලබන්නා බැවින් එය සම්ප්‍රදාන විභක්තියට අයත් වේ. මෙම විභක්තියෙහි යෙදෙන විභක්ති ප්‍රත්‍යත් ඒ සඳහා උදාහරණත් බලන්න.

| වචන | ප්‍රත්‍ය | ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය | වාක්‍යයක යෙදෙන අයුරු |
|---|---|---|---|
| ඒක වචන | අට | එළදෙන්+අට = එළදෙනට | මම එළදෙනට තණකොළ දුනිමි. |
| | ආට | උගත් + ආට = උගතාට | සමාජය උගතාට සලකයි. |
| | උට | රජ +උට = රජුට | ඇමතියෝ රජුට බුහුමන් දක්වති. |
| | ට | ජගත් + ට = ජගත්ට | මෙවර ජයග්‍රහණය ජගත්ට ය. |
| | හට | ස්වාමියා හට, ස්වාමියාහට | බිරිඳ ස්වාමියා හට ආදරය කරයි. |
| බහු වචන | අන්ට | දෙවි + අන්ට = දෙවියන්ට | බමුණෝ දෙවියන්ට බලිබිලි දුන්හ. |
| | අනට | සිසු + අනට = සිසුනට | ගුරුහු සිසුනට උපදෙස් දෙති. |
| | අන්හට | සුදන+අන්හට = සුදනන්හට | කවුරුත් සුදනන් හට සලකති. |
| | උන්ට | මහණ+උන්ට = මහණුන්ට | අපි සිල්වත් මහණුන්ට ගරු කරමු. |
| | උන් හට | මිනිස්+උන්හට = මිනිසුන්ට | නිවාස බෙදා දුන්නේ දිළිඳු මිනිසුන්ට ය. |
| | න්ට | ඉතිරි + න්ට = ඉතිරින්ට | ඉතිරින්ට කරුණාව දක්වමු. |
| | නට | රුපු + නට = රුපුනට | අපට වින කරන රුපුනට පාඩම් උගන්වමු. |
| | වලට | මල් + වලට = මල්වලට | අපි මල්වලට පැන් ඉසිමු. |

## 6. අවධි විභක්තිය

වාක්‍යන්හි සීමාවක්, පහවීමක්, වෙන්වීමක් හැඟවෙන පද අවධි විභක්තියෙන් සිටී. 'මගේ ඇස්වලින් කඳුළු ගලයි' යන වාක්‍යයෙහි 'ඇස්වලින්' යන්න කඳුළු ගැලීමේ සීමාව වෙයි. එමෙන්ම කඳුළු පහවීමද වෙන්වීමද කෙරෙනුයේ ඇස්වලිනි. එබැවින් එය අවධි විභක්ති පදයකි. අවධි විභක්ති ප්‍රත්‍ය සහ ඒ සඳහා උදාහරණ මෙසේය.

| වචන | ප්‍රත්‍ය | ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය | වාක්‍යයක යෙදෙන අයුරු |
|---|---|---|---|
| ඒක වචන | ඉන් | මග + ඉන් = මගින් | මම බාධක සහිත මගින් ඉවත් වීමි. |
| | එන් | ගස + එන් = ගසෙන් | ඉදුණු ගෙඩිය ගසෙන් වැටිණි. |
| | අගෙන් | දාසි+අගෙන් = දාසියගෙන් | අම්මා දාසියගෙන් කළය ගත්තාය. |
| | ආගෙන් | හොර+ආගෙන් = හොරාගෙන් | ආරක්ෂක භටයෝ හොරාගෙන්ආයුධය උදුරා ගත්හ. |
| | උගෙන් | සඳ + ගෙන් = සඳුගෙන් | සඳුගෙන් රැස් විහිදෙයි. |
| බහු වචන | වලින් | නගර+වලින් = නගරවලින් | වැසියෝ නගරවලින් බැහැර වූහ. |
| | අන්ගෙන් | මී + අන්ගෙන් = මීයන්ගෙන් | මිනිස්සු මීයන්ගෙන් කරදර විඳිති. |
| | න්ගෙන් | සෘෂි+න්ගෙන් = සෘෂීන්ගෙන් | රජවරු සෘෂීන්ගෙන් උපදෙස් ලැබූහ. |
| | උන්ගෙන් | ගොන්+උන්ගෙන් = ගොන්නුන්ගෙන් | ගොවියෝ ගොන්නුන්ගෙන් වැඩ ගත්හ. |

**ලබන කලාපයෙන් සිංහල පාඩම තවදුරටත් හදාරමු**

# අපාය සහ...

6 වන පිටුවෙන්

ජනතාව මුළා නොකළහ. තමන් සතු දේ නැතිකර ගෙන දේශපාලනය කළ අය ගැනද අසන්නට ලැබුණි. භාර්යාවට, දරුමල්ලන්ට, ඥාතීන්ට, ස්වකීයයන්ට තමන් ලද මන්ත්‍රීකම පරම්පරාගත බූදලයක් කොට දෙන්නට උත්සාහ නොගත්හ.

එසේ වුවත් වර්තමානය වන විට තත්ත්වය කෙබඳුද? විශේෂයෙන්ම ගත වූ වසර 20 ක 25 ක පමණ කාලය තුළ දේශපාලනඥයන් ගැන අසන්නට දකින්නට ලැබුණේ කුමක්ද? ඇතැම්හු තම වාසිය තකා ඇමති මැතිකම් පතා පක්ෂ මාරු කරමින් ප්‍රතිපත්ති පාවා දුන්හ. සමහරු මුදලට විකුණනහ. වන්දනීය ගුරු භවතුන් ලවා තමන්ට වන්දවා ගත්හ. සියවැනි ස්ත්‍රී දූෂණය ආඩම්බරයක් කොට සලකා සාද පැවැත්වූහ. තමන්ට එරෙහි වන්නන් පරලොව යැවූහ. තමන්ට අවශ්‍ය පාතාලයන් ආරක්ෂා කළහ. පාර්ලිමේන්තුවට යාමට ඡන්දය ඉල්ලන අවස්ථාවේදී සතේ අතේ නැතිව සිටි දස අතට ණය වී පාර්ලිමේන්තු ගිය අය කළ හැකි සියලුම මගඩි කරමින් මහජන දේපළ ගසා කමින් මහා මන්දිර තැනූහ. මහා වාහන මිල දී ගත්හ. ඉඩම් කඩම් ආදි දේපළින් ආඪ්‍ය අය බවට පත් වූහ. ඡන්දය ගන්නා තුරු ජනයා ළඟ 'වැඳ වැටී', ඡන්දය ගත් පසු 'ගෙදර නැතැයි' කියන තැනට පත් වූහ.

මෙසේ බලත්ම ඔවුන් නොකළ වරදක් නම් නැති තරම්ය. බලය අයථා ලෙස භාවිත කිරීමත් විවිධ ආකාරයේ වංචා දූෂණ කිරීමත් මනුෂ්‍ය ඝාතනයත් ආදි නොයෙකුත් චෝදනා ලැබ දැනට අධිකරණය හමුවේ නඩු පවරා විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව දෙස බලන විට ශ්‍රී ලංකාවේ දේශපාලනඥයන් දූෂණය වී ඇති තරම සිතාගැනීම දුෂ්කර නොවේ. ජනාධිපති තුමාගේ කතාවේ පසුබිම එයයි.

මේ අනුව ජනාධිපති තුමාගේ කතාව ඉහතින් කීවා සේම අර්ථවත් වූවක්ම වේ. පක්ෂ විපක්ෂ සියලු දේශපාලනඥයන්ට ඇත්තේ එම අර්ථවත් කතාව කල්පනාවට ගෙන අපාගත නොවීමට වගබලා ගැනීමයි.

# මට තවමත්...

16 වන පිටුවෙන්

සහිත ඩොල්ෆින් රථය කඩුගන්නාවේදී අනිවාර්යයෙන් නැවැත්විය යුතුයි. රේඩියේටරයේ වතුර බොයිල් කිරීම ඊට හේතුවයි. කොතරම් පැරැණි වුණත් කොතරම් සිනහවට ලක් වුණත් 4 ශ්‍රී 2943 අංක දරන රෙනෝල්ඩ් ඩොල්ෆින් රථය තාත්තාට අනර්ඝ වස්තුවක් විය. එය විකිණීම ගැන කිසි දිනෙක ඔහු සිතුවේවත් නැති බව මට හොඳටම විශ්වාසය.

තවද ඔහු ඉතා ඉහළින් අගය කරන විශේෂ වස්තු කිහිපයක් වෙයි. සුවඳ සබන්, ඕඩිකොලෝන් සහ සුවඳ පුයර මේ අතරින් කිහිපයකි. මා ඉතා පුංචි කාලයේ මාව ජලයෙන් නාවා ඉන්පසු පුයරද නෑවීමට ඔහු අමතක නොකරයි. ඔහුට ඉඳහිට උසස් වර්ගයේ පුයර ටින් එකක් තෑගි ලැබුණු විට ඒ පිළිබඳව බෙහෙවින් සතුටට පත් වෙයි. ජෝතිපාල මහතා දිනක් විදේශ සංචාරයකින් පසු තාත්තාට රැගෙන ආවේ ඉතා උසස් වර්ගයේ පුයර ටින් එකකි. කොළ පැහැති ඇසුරුමක් සහිත ඒ පුයර ටින් එක තාත්තා අතට දුන්නේ "සර් කැමැතිනෙ මේවට...." කියමිනි.

තාත්තා මෑතක් වනතුරුම මැන්ඩො-හාප් එක සමග තනි වී තනු නිර්මාණය කරනු අපි දැක ඇත්තෙමු. ඔහු ඉතාම උද්යෝගයෙන් වැඩ කළ අවස්ථාවක් ලෙස මගේ මතකයේ ඇත්තේ මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ලෝමහංස නාඩගමට තනු නිර්මාණය කිරීමයි. එවිට පාසල් වයසේ පසු වූ මා තබ්ලාවට තට්ටු කරමින් තාත්තාට උදවු වීමට උත්සාහ කළෙමි. 'සතුරු සෙන් මැද යුද වැදී තදේ.....' නම් ගීතයට තනුව නිර්මාණය කළ අවස්ථාවේ මම එයින් මත් වූයෙමි. සර්පිනාව වාදනය කරමින් ගීතයේ පද මත ස්වර රටා සටහන් කළ තාත්තා දෙතුන් වතාවක් එය සංස්කරණය කර එක්වරම ගායනා කළේ මා මවිතයට පත් කරමිනි. එදා ඒ බිහිවුණේ කොතරම් අගනා වස්තුවක්ද කියා හරියටම මට වැටහුණේ කල් ගත වූ පසුයි. තාත්තාගේ විශිෂ්ටතම නිර්මාණ බිහි වූයේ මා ඉපදෙන්නට පෙරය. නැත්නම් මා බාල බොලඳ වියේ පසු වෙද්දීය. මෙය මට මහත් කණගාටුවකි. තාත්තා අද සිටින තත්ත්වයට ළඟා වීමට විශේෂ උත්සාහයක් දැරූ බවක් මට මතක නැත. එය ඉබේ සිදුවුණා යැයි සිතෙන තරම්ය. ඔහු කළේ සැම විටම තමා කරන දෙය රස විඳිමින් එය කිරීමයි.

මා දෑසින් නොදුටුවත් තාත්තා ඉන්දියාවේ ඉගෙන ගන්නා කාලයේදී මහත් කැපවීමකින් එය කළ බව ඔහුගේ කතා අසන මට වැටහේ. නමුත් ඔහු වෙහෙස වූයේ සංගීතයට ඇති ඇල්ම නිසා මිස යම් තැනකට ළඟා වීමට නොවේ. විශාරද උපාධිය පිළිබඳව ඔහු කිසි විටෙකත් මහත් ආඩම්බරයෙන් කතා කරනු මා අසා නැත. උත්තර භාරතීය සම්භාව්‍ය සංගීතය අති දුෂ්කර දුර ගමනක් නම් ඒ ගමනේ ආරම්භය මෙම උපාධිය බව ඔහුගේ මතයයි. ඔහු මහත් ආසාවෙන් කතා කළේ ඉන්දියාවේදී ඔහුට මුණ ගැසුණු මහා සංගීතඥයින් පිළිබඳවයි.

ඔහුගේ ජීවන ගමන අතරතුර පිළිගැනීම් මෙන්ම ප්‍රතික්ෂේප කිරීම්ද තිබුණි. තාත්තාට දෙවරක් රැකියාව අහිමි විය. නැත්නම් අහිමි කළේය. මේ සතුරුකම් මැද වුව යම්කිසි බලවේගයක් තාත්තා ආරක්ෂා කරන බව මගේ විශ්වාසයයි. එය ඔහුගේ සත්ක්‍රියාවට ස්වභාවයෙන් ලැබෙන රැකවරණයක් මෙනි. ඔහු සතුන්ට ගස්වැල්වලට ආදරය කරයි. ගසක් කැපීම කිසිසේත් අනුමත නොකරයි. මැස්සෙක් මැරීමටවත් අනුබල නොදෙයි. කිසිවකුගේ අයථා ක්‍රියාවක් මෙනෙහි කරමින් වෛර කිරීම ඔහුගේ සිරිත නොවේ. මෙය මට ඉවසුම් නොදෙන්නකි. තාත්තාට අකටයුතුකම් කළ අය පිළිබඳව යහපත් ආකල්පයක් දරන්නේ ඇයිදැයි මා අසා තිබේ. "ඒ මෝඩකමට කරන වැඩනෙ පුතේ....." කියා තාත්තා කතාව අවසන් කරයි. සියලුදෙනා වැරැදි කරන්නේ මෝහය නිසාය. ඒ තාත්තාගේ මතයයි.

මා මේ ලිපිය ලියන්නේ තාත්තා මහා සංගීතවේදියකු යැයි කීමට නොවේ. මා එය කීමට අවශ්‍ය නැත. එය විද්වත් මතයකි. මට කියන්නට ඇත්තේ අපව ආදරයෙන් රැක බලාගත් තාත්තා පිළිබඳවයි. ඔහු ආදරණීය තාත්තා කෙනෙකි. ඔහුගේ ආදරය අප නරක් කරන තරම්ය. කෙසේ වුවත් සියලු වැඩ අතරතුර තාත්තා අප සමග සැම විටම සිටියේය. ඔහු එතෙර ගමන් ගිය සැම විටම සෑම නගරයකම සිට අපට කාඩ්පත් එවීමට අමතක නොකළේය. සිඩ්නි, මැනිලා, බර්ලින්... තවත් නගරයක සිට ඊළඟ කාඩ්පත් එනතුරු අපි බලා සිටියෙමු. ඒ කාඩ්පත් පන්තියේ මිතුරන්ට පෙන්වූයේ ආඩම්බරයෙනි. එසේ එවූ කාඩ්පත් මිටියක් මා සතුව ඇත. ලස්සන අත් අකුරෙන් ලියූ කවි පදයකින් ඒ කාඩ්පත් සරසන්නටද ඔහු අමතක නොකළේය. මේ ලිපිය ලිවීම ආරම්භ කළ මොහොතේ මට එය අභියෝගයක් විය. දැන් නම් මට එය සතුටකි. තවත් ලියන්නට ඇත්නම් කියා සිතේ. තාත්තා ගැන මෙන්ම අම්මා ගැනද ලිවීමට බොහෝ දේ ඇත. ඔවුන් පිළිබඳව පොත් දෙකක් ලිවිය යුතුය. ඊට පෙර මේ ලිපිය අවසන් කර සිළුමිණට යැවිය යුතුය.

ඔහුගේ ආදරය අප තිදෙනා අතර සමසේ බෙදා දීමට ඔහු උත්සාහ කළේය. මා ඉතා කුඩා අවදියේ පොඩි අක්කා සහ මා නින්දට යන අවස්ථාවේ තාත්තාගේ ආදරය බෙදාගැනීමට පොරකෑ සැටි මට මතක් වේ. නිදාගන්න ගිය විට අප දෙදෙනා මැදින් සිටින තාත්තා හරියටම තමාගේ සෙනෙහස සමව බෙදා අක්කාටත් මටත් ලබා දුන්නේ ය. එක් අතක් සහ කකුලක් මගේ පැත්තටත් අනෙක් කකුල සහ අත අක්කාගේ පැත්තටත් දමා තාත්තා ඇඳන් දෙකේ හරි මැදින් සිටියේය. (ලොකු අක්කා අපට වඩා දැනුම් තේරුම් ඇති නිසා ඒ තරගයට ඇතුළු නොවීය.) අදටත් තාත්තා අපට එක සේ ආදරය කරයි. අප යන එන තැන් සොයයි. අපේ දුක සැප අසයි. ඔහුට ලැබෙන වටිනා තෑගි අපට දෙයි. (පුයර ටින් හැර)

මෙරටින් සහ ජාත්‍යන්තරයෙන් ලැබුණු අති මහත් සම්මාන හමුවේ බිඳක් වත් වෙනස් නොවුණු තාත්තාගේ සෙනෙහස අම්මාටත් අපටත් එදාටත් වඩා අද දැනෙයි. අප ඉතා නොවැදගත් යැයි සිතන දේ තාත්තාට ඉතා වැදගත් වන අවස්ථා ඇත. සමහර කරුණු ඉතා ඉක්මනින් අමතක වන නමුත් අපගේ උපන් දින සියල්ල ඔහුට හොඳින් මතක ඇත. සෑම උපන් දිනයකටම අපූරු කවියක් සමග කාඩ්පතක් තාත්තාගෙන් ලැබේ. එසේ ලැබුණු කාඩ්පත් අප එකතු කළේ සතුටිනි. උපන් දිනයක් නිසා වසර කිහිපයකට පෙර සිදු වුණු මේ සිද්ධිය මගේ මතකයේ තදින්ම රැඳී තිබිණි. තාත්තා සමග පවුලේ අප සියලුදෙනාත් තවත් හිතවතුන් කිහිප දෙනකුත් දිනක් රාත්‍රී ආහාර ගැනීමට වැල්ලවත්තේ බීච් වාඩියට ගොස් සිටියෙමු. තාත්තා කෑම ඇණවුම් කිරීමට හදිසියක් නොපෙන්වීම අපට ගැටලුවක් විය. මේ ගැන සිතමින් ඉන්නා විට එක්වරම අවන්හලේ විදුලි පහන් නිවී ගොස් හාත්පස අඳුරු විය. ඒ සමගම සේවකයකු නිලා කූරක් දැල්වූ කෑම දීසියක් රැගෙන අපගේ මේසය දෙසට එනු පෙනිණි. මේ සිද්ධ වන්නේ කුමක්ද කියා මට තේරුම් ගියේ එතැන සිටි සියලුම අමුත්තන් අත්පොළසන් දීමට පටන් ගැනීමත් සමගය. මගේ උපන් දිනය වෙනුවෙන් තාත්තා සූදානම් කළ අපූරු තෑග්ග එයයි. අනපේක්ෂිත නමුත් සොඳුරු අරුමයක් වූ ඒ සිදුවීම සමග මා සිත පිරී ගියේ තාත්තා කෙරේ අප්‍රමාණ භක්තිය මුසු සෙනෙහසකිනි. එදා ඒ සිද්ධිය වෙනුවෙන් තාත්තා කොපමණ පෙර සූදානමක් කර තිබුණාද යැයි සිතන විට මට පුදුම නොවී සිටිය නොහැකිය. තාත්තාගේ වැඩ අධික බව සමග අපගේ උපන් දින මතකයේ තිබීමත් ලොකු දෙයක් යැයි සිතෙන විට මෙවැනි උපන් දින තිළිණයක් සූදානම් කිරීම කොතරම් පුදුමයක්ද?

ඔහු වෙනුවෙන් අපට කළ හැක්කේ රැකබලා ගැනීම පමණි. ඔහු රැකබලා ගැනීම වගකීමක් නොවේ. මේ රටේ දස දහස් ගණන් ජනතාව ඔහු රැකබලා ගන්නට එක පයින් සූදානම් බව මම දනිමි. ඒ නිසා එය අපට මහත් ගෞරවයකි. අපට ලැබුණු මහඟු අවස්ථාවකි. නොයෙක් බලවේග අදටත් තාත්තා වටා හොල්මන් කරයි. ඒ ඔහුගේ රැස් වළල්ලෙන් ආලෝකය ලබා ගැනීමටයි. ඔහුට ආදරය නිසා නොවේ. අප සැම විටම කල්පනාවෙන් සිටිය යුත්තේ එබැවිනි.

**මහා ගුරුදේව අමරදේවයාණන්ගේ 88 වැනි ජන්ම දිනය නිමිත්තෙන් ඔහුගේ පුත් රන්ජන අමරදේව විසින් සිළුමිණ පුවත්පතට සැපයූ ලිපියකි.**

# අමරදේව නමැති...

16 වන පිටුවෙන්

පැවති ආන්දෝලන, මීන්ඩ්, ඛන්, ගමකාලංකාර සමග ලයාන්විතව ඇදී යන 'බෝ' පහර වෙනුවට වේගයෙන් සලිත වන කෙටි බෝ පහර ආදේශ විය. පූර්ව අවධියේ මුලින් අල්ලාගත් වයලීන බෝව එතුමා විසින් පසුව අල්ලා ගනු ලැබුවේද මැදිනි. එහෙත් පෙර පැවති ගායනයට සහාය වන 'සහාය වාදන' භූමිකාවෙන් එතුමා ශාස්ත්‍රීය ශෛලිගතව රාග තාල ඉදිරිපත් කරන 'ඒකල' (solo) වාදකයෙකුගේ ප්‍රාසාංගික භූමිකාවට පරිවර්තනය වී සිටියේය.

තවද අතිදක්ෂ වයලීන වාදක ශිල්පියෙකු ලෙස මධුර මනෝහර ස්වරයෙන් හා ශාස්ත්‍රීය ඥානයෙන් භාරතයේ රැඳී සිටියේ නම් රවිශංකර්, බිස්මිල්ලා ඛාන් වැනි ජාත්‍යන්තර වාද්‍ය ශිල්පීන්ගේ මට්ටමට පත් වන්නට තිබුණු අමරදේවයින්ට තම වාදනයට අවධානයෙන් සවන් දීමට තරම් සහෘද රසික සමාජයක් ශ්‍රී ලංකාව තුළ ගොඩ නැගී නොතිබුණේය. ගායන ශිල්පියෙකුට මෙන් නොව, විශේෂයෙන් ශාස්ත්‍රීය වාදන ශිල්පියෙකු හට අඛණ්ඩ ලෙස වාදන පුහුණුවීම්වල නිරත වීම අවශ්‍ය නමුත් ආර්ථික හේතූන් නිසාද ඊට අවශ්‍ය තරම් කාල වේලා මිඩංගු කිරීමට අපහසු වූ අමරදේවයෝ නැවතත් කලකට පෙර ඇබ්බැහි වූ කීර්තිය දිනාගෙන සිටි ගීත ගායනට හා ගීත නිර්මාණයට යොමු වූහ.

අමරදේවයින්ගේ සංගීත නිර්මාණ ශක්තීන් වඩාත් තීව්‍ර ලෙස දකින පද රචකයෝ එතුමා වෙත තම පද රචනා එවන්නට පටන් ගත්හ. ක්‍රමයෙන් පද රචකයින්ගේ සංඛ්‍යාවද වැඩි වන්නට විය. චන්ද්‍රරත්න මානවසිංහ, මහගමසේකර, සුනිල් සරත් පෙරේරා, ඩෝල්ටන් අල්විස් වැනි ප්‍රවීණ පද රචකයින්ගේ පද රචනා අමරදේවයෝ අතිශයින් ප්‍රිය කළහ. මුනිදාස කුමාරතුංග, මානවසිංහ, වින්සන්ට් සෝමපාල, සරච්චන්ද්‍ර යනාදීන් ඇසුරින් කාව්‍යමය භාෂා විලාසයන් හඳුනා ගන්නා අමරදේවයෝ ඒවායේ අර්ථ, ධ්වනි, අලංකාරොක්තීන් හඳුනා ගෙන ගේය පද රචනාවන් සංගීතවත් කරමින් ගී තනු, පූර්ව වාදන (introduction) අන්තර්වාදන (interludes) නිර්මාණය කරමින් මෙරට සරල සංගීත හා නාට්‍ය හා චිත්‍රපට සංගීත ක්ෂේත්‍රයන්ද අතිශයින් සරු කළෝය.

මෙසේ වයලීනය අමරදේවයින්ගේ දෑතින් ක්‍රමයෙන් ඈත් වුවද එතුමාගේ ගී තනු, ගී පද රස විඳින අගයන සමාජයක් මෙරට ශීඝ්‍රයෙන් ගොඩ නැගිණ. දේශීය සංගීත ක්ෂේත්‍රය රසභාව පරිපූර්ණ විචිත්‍ර ගීත සම්භාරයකින් පොහොසත් විය. අපූරු ස්වර සංගති අනපේක්ෂිත විවාදි ස්වර ප්‍රයෝග, සමබර තනු ආකෘති, පාදාන්තර ස්වර රිද්ම සංඝටන වැනි චමත්කාර ලක්ෂණවලින් සුපිරි ගීත කාව්‍ය සාහිත්‍යයක් වර්ධනය විය. ශාස්ත්‍රීය වාද්‍ය සංගීතය ශ්‍රවණයෙහි උත්සුක වන දේශීය සහෘද රසික සමාජයක් වර්ධනය නොවීම නිසා රවිශංකර් වැනි විශ්ව තරාතිරමේ වාද්‍ය ශිල්පියෙකු බිහිවීමේ ඉඩකඩ ඇහිරුණු නමුත් සරල ශාස්ත්‍රීය ගීත ක්ෂේත්‍රය තුළ අමරදේවයින්ගෙන් ලැබුණු ප්‍රශස්ත දායකත්වය සලකන විට අමරදේවයින් වාදනය හැර දා ගායන හා සංගීත ක්ෂේත්‍රයට පිවිසීම හා එහි ස්ථාවරත්වය ලැබීම ඉෂ්ට ඵලයක් ලෙස සැලකිය හැකිය.

LESSON 33

Hello readers of Dasatha French lesson! Hope all of you are having a wonderful time enjoying the winter weather with your families and studying French at the same time. Christmas is just around the corner. We hope you would have a great festive season. If you have any problems regarding the lessons and if something is not clear, you can always drop an email to kumudu4444@gmail.com. We will try our level best to answer your questions about the problematic areas in a more helpful way. Hope the vocabulary list provided in the last issue was helpful in getting to know the bakery items that French people use. As practice makes you perfect, you are expected to keep on studying and revising. If you are as dedicated and enthusiastic as we are, learning French will not be hard anymore.




This month's Dasatha issue presents you again with a very relevant vocabulary list that will help you enrich your French vocabulary and improve your French reading and pronunciation apart from improving your conversing skills. Moreover, it will help you get an idea about sentence structures and how to use these words in sentences. As usual, the grammar lesson aims to improve your grammar knowledge and to help you construct sentences using correct grammar. Exercises will help you put what you learnt so far in to practice. Enjoy learning! Thank you!



## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary

The words presented in the last issue were related to bakery products that French people use. Knowing these terms in French would be very useful as we all are living in a bilingual country. When you go to a store in a French speaking province or a country, you should now easily be able to pick your product well. Hope you have memorized these terms. It is very important to learn and review all the words in the vocabulary lists regularly. It will help you in enriching your vocabulary and remembering all the words without any difficulty. It is also very important to learn all the words in each lesson before the issue of the next. In order to converse well in a foreign language, it is necessary to have a rich vocabulary. Since Christmas is just around the corner, this month's Dasatha issue will present you with a vocabulary that deals with most of the terms related to Christmas.

| French Term | Meaning |
|---|---|
| Noël | Christmas |
| La fête des Rois | Twelfth Night |
| Joyeux Noël | Merry Christmas! |
| Le vingt-cinq décembre | 25th of December |
| Un jouet de Noël | Christmas toy |
| Une carte de vœux | A greeting card |
| Un soulier de Noël | Christmas stocking |
| Le repas de Noël | Christmas dinner |
| Une décoration de Noël | Christmas decoration |
| Le jour de Noël | Christmas day |
| La nourriture de Noël | Christmas food |

| | |
|---|---|
| Une chanson de Noël | Christmas song |
| Saint-Nicolas | Saint Nicolas |
| La messe de nuit | Midnight mass |
| Meilleurs vœux | Seasons Greetings! |
| La veille de Noël | Christmas eve |
| L'Avent | Advent (four Sundays before Christmas) |
| La fête de Noël | Christmas holiday |
| Une crèche | Christmas nativity scene |
| Un cadeau de Noël | Christmas gift |
| Une carte de Noël | Christmas card |

| | |
|---|---|
| Une bûche de Noël | Yule log |
| Un sapin de Noël | Christmas tree |
| Le réveillon | Christmas feast |
| Offrir un cadeau | To give a gift |
| Papa Noël | Santa Claus |
| Le Marché de Noël | Christmas market |
| La musique de Noël | Christmas music |
| Père Noël | Father of Christmas/ Santa Claus |
| La nativité de Jésus | The birth of Jesus |
| Le jour de l'an | New Years Day |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



In the last issue, we learnt the tense, *Near Future*. Now, without any difficulty, you should be able to express an action that would happen in the very close future. As French grammar is a little complicated with many exceptions and grammar rules, you have to study and make use of what you have learnt regularly to practice. In this month's issue, we are going to learn certain expressions that are used along with the verb 'Faire' in French. This verb has the meanings *to do* and *to make* in English.

**The verb Faire**

The verb **faire** is used in many impersonal weather expressions.

**Quel temps fait-il?** (What's the weather like?)
**Il fait beau**. (It's beautiful)
**Il fait chaud.** (It's hot)
**Il fait du brouillard**. (It's foggy)
**Il fait du soleil.** (It's sunny)
**Il fait du vent.** (It's windy)
**Il fait frais**. (It's cool)
**Il fait froid.** (It's cold)
**Il fait mauvais.** (It's bad)

Other weather expressions which do not use **faire** include:

**Il y a des nuages.** (It's cloudy)
**Il y a des orages.** (There are storms)
**Il y a de l'orage.** (It's stormy)
**Il pleut.** (It's raining)
**Il neige.** (It's snowing)

**Faire** is also used to talk about sports and leisure activities. Here is a list of common expressions.

**faire de la bicyclette** (to go bicycle riding)
**faire du bateau (**to go boating)
**faire de la lecture** (to read)
**faire de la planche à voile** (to go windsurfing)
**faire des randonnées** (to go hiking)
**faire du ski** (to go skiing)
**faire du vélo** (to go bicycle riding, cycling)
**faire de la voile** (to go sailing)
**faire une promenade** (to take a walk)

**Faire** is also used in many expressions dealing with household chores.

**faire des achats** (du shopping) (to go shopping)
**faire la cuisine** (to do the cooking)
**faire des courses** (to run errands)
**faire la lessive** (to do the laundry)
**faire le lit** (to make the bed)
**faire le marché** (to do the grocery shopping)
**faire le ménage** (to do the housework)
**faire la vaisselle** (to do the dishes)

Exemple

| | | |
|---|---|---|
| Quand il **fait** beau, les enfants **font** une promenade dans la plage. | | When it's fine weather, the children take a walk in the beach. |
| Quand il **fait** du vent, le garçon ne **fait rien.** | | When it's windy, the boy doesn't do anything. |

## Exercices – (එක්සැර්සිස් ) – Exercises

You will come across new French words in these exercises. You can simply refer to a dictionary for all the words that you do not know the meaning. This is also a good way to enrich your vocabulary. Note down the new words you come across along with their genders and the meanings in a separate book and study them. If you have any questions please direct them to the above mentioned email address.

Translate the sentences in to French

1) It is windy outside. It is going to rain soon.
2) We are going to go for a walk.
3) Why are you going to the store?
4) My mother is going to do the laundry.
5) I am going shopping with my friends tomorrow.
6) What is the weather like?
7) My parents are going cycling early today.
8) I am going to read today during my leisure time.
9) It is sunny today. We are going to go to the beach.
10) It is cloudy. It is going to rain.
11) It is foggy. We cannot see the road clearly.
12) You should always make your bed when you wake up in the morning.
13) She is going to do the cooking today.
14) These girls are going skiing with their friends.
15) The flowers are going to be withered. It is too cold outside.
16) We are going boating next week.
17) It is stormy. Do not go out today.
18) We are going hiking. It is so much fun.
19) They are going to go bicycle riding soon.
20) Roger is going to do the cooking as Helene is hungry.

**Kumudu Abeywardena**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

# කෝකිල සන්දේශය

# සන්දේශ සාහිත්‍යය



## 3 - කොටස

■ සිරිසේන විතානගේ

## සපුමල් කුමරු

සපුමල් කුමර වැනුම එන්නේ අනතුරුවය. මෙහිදී 'සූර්ය වංශයෙහි උපන් පැරකුම්බාවන්ගේ කුමරිඳු' ලෙස සපුමල් කුමරු හඳුන්වා ඇත. එහෙත් පැරකුම්බාවන් විසින් පුත් තනතුරෙහි ලා හැදූ වැඩූ අයකු ලෙස ඉතිහාසයෙහි මොහු හැඳින්වේ. මෙම වර්ණනයෙහිදී වැඩි වශයෙන් උත්සාහ ගෙන ඇත්තේ මොහුගේ යුද්ධ වීරත්වය වර්ණනය සඳහායි. හැම පද්‍යයකම වාගේ ඒ පිළිබඳව කියවේ.

දැකලා වත තරුණ රුපු ඔහුගෙ විකුමැ  ති
එකලා වම ගජ දළ යාන සැතපෙ  ති

(මොහුගේ වික්‍රමාන්විත මුහුණ දැක තරුණ සතුරු ජනයා ඔවුන්ගේ අඹුවන්ගෙන් ඈත්ව ඇත් දළින් කළ යහන්හි තනිවම නිදති)

සතඟ පිහිටි මිහි මතඟුන් තුරඟ  රුදු
නිසග නැඟී පවනෙව් විහිදුවා  උදු

(මිහිතලයෙහි පිහිටියා වූ සප්තාංග සහිත මත්ත හස්තීන් හා රෞද්‍ර අශ්වයින් පිට නිරුත්සාහයෙන්ම නැග මාරුතය මෙන් සෑජුව විහිදුවා)

ලතර විරිඳු නිරිඳුන් රැඳි මුළු  දෙරණ
නිතර නැමුම් කරවා සිය සිරි  සරණ

(මුළු දෙරණෙහිම සිටින එඩිතර විරුද්ධ රජවරුන් තම පා ළඟ නිරතුරුවම නම්මවා)

බමන තෙදග මොහු රුපි වනපෙති  පැතිර
දමන සඳෙහි වෙසෙසින් මදකුත්  නොහැර

(මොහුගේ භ්‍රමණය වන තේජස් ගින්න සතුරු වනාන්තරය මඳකුදු ඉතිරි නොකොට දවන කල්හි)

කාරිය සිතට නොම ගෙන ගෙන දුක්  පතර
ආරිය සක්විතිහු ගිය රට ඇර  එතර

(මොහුගේ තේජස නිසා තමන්ගේ කාර්යය (යුද්ධය) සිතට නොගෙන මහත් දුක් ගෙන ආර්යචක්‍රවර්තීහු රට හැර එතර ගියහ)

### තාලය හා නැටුම

සපුමල් කුමර වැනුමෙන් පසු යාපා පටුනෙහි ඔහුගේ මැදුරත පැවති 'නළඟන රැඟුම' කවියාගේ වැනුමට හසුවෙයි. මෙය විචිත්‍ර වූ වර්ණනයකි. පෙර කවීන් රඟ වැනුම් සඳහා යොදාගත් අදහස් මෙහි බහුලව තිබුණද කවියා එහි ලා විරිත් කිහිපයක්ම උපයෝගී කොට ගැන්ම නිසා වර්ණනය වඩාත් අලංකාර වී ඇත. වර්ණනය ඇරඹෙන පද්‍යය මෙසේය.

අඳිමින් සුදු පටසළු හෙළ සඳුනෙන් තුනු තව  රා
සරමින් උර මුතුහර සිර මලිගිය මල් සපු  රා
සොබමන් යුග සරණත නූපුර රැව් සී ඉඳු  රා
බසිමින් සබ මැද රඟ දෙති කියමින් ගී මියු  රා

කමලා නම් විරිතෙන් බැඳි මේ පද්‍යය නැටුමට සැරසුණු අයුරු, වේෂ නිරූපණය කළ අයුරු කියාපාන්නක් බඳුය. සුදු පට සළු ඇඳ, සුදු සඳුන් ශරීරයෙහි ගල්වා, උරෙහි මුතුහර පැළඳ, හිසෙහි මාලතී මල් ගවසා, පා දෙක්හි නූපුර රාව යොදා සබා මැදට පිවිස මිහිරි ගී කියමින් රඟ දෙන ආකාරය මෙහි නිරූපිතය. මාත්‍රා සයෙන් සය යතිය ඇති වන සේ රචිත පද්‍යයේ රිද්මයම නැටවෙන සුළු වූවකි. වේගවත් නැටුම් ආරම්භයක ලකුණකි.

මීළඟ පද්‍යයෙහි එම රිද්මයම යොදා ගනිමින් කියන,

අඟරන් තන තනමින් ලෙළ දී ඉන මිණි  මෙවුලේ
අඟනන් දෙන රඟ රඟ දුට කා නම් සිතු  නොඇලේ

යනු ඇසෙත්ම 'රඟ දුට නොව රඟ අසත කා නම් සිතු නොඇලේ' යි අසන්නට සිත් දෙයි. මෙහි මුල් පාදයේ 'අඟරන් තන තනමින්' යන්නත් දෙවන පාදයේ 'අඟනන් දෙන රඟ රඟ දුට' යන්නත් කොතරම් ප්‍රබල ශබ්ද රසයක් පද්‍යයට එක් කෙරේද? එපමණක් නොව, මෙහි අර්ථ රසයද උසස්ය. ශෘඞ්ගාරාත්මකය. අඞ්ගරාංග කල්කය තැවරූ පියොවුරු නැටුමේදී කම්පනය වන බවත් මිණි මෙවුල බැඳි ඉන ලෙළ දෙන බවත් කවියා කියද්දී එම දසුන සිතෙහි නොඇඳේද?

වේගයෙන් නටා කෙමෙන් වේගය බාල කිරීම රංගනයේ මූලධර්මයකි. කවියා මධ්‍ය ලයකින් යුත් පෙද විරිතට බසින්නේ ඒ අනුව විය යුතුය.

හෙළ දිගු නිල් මානෙල් පෙති  කැල්මා
කෙළවා දිගු නුවනත ලා  බැල්මා
ලෙළ දෙන පුළුලුකුලේ නරු  සැල්මා
නළඟන දෙන රඟ කෙළෙ සත  ඇල්මා

මාත්‍රා සතරින් සතර යති සතරකින් යුත් මේ පද්‍යය නැටුමෙහි වේගය කෙමෙන් බාල වූ අයුරු මැනවින් දක්වයි. නිළියන් සුදු හා නිල් දිගු මානෙල් පෙතිවල කාන්තිය විහිදුවමින් දිගු ඇස් නැටවූ අයුරුත් පුළුලුකුල් සෙලවීමෙන් නරු සැලුන අයුරුත් දකින නරඹන්නන්ගේ සිත් ඒ කෙරේ බැඳුන බව කවියා කියයි. මෙබඳු පද්‍ය සතරකින් පසු යළි කවියා රැඟුමෙහි වේගය තවත් බාල කරයි. විරිතද වෙනස් කරයි.

ලෙළ දළ කියඹු වැල සැ  දී
වෙළ ව රඟන ලිය වැළ  ඳී
දළ මුතුහර මලෙහි බැ  ඳී
දොළ කර සත සිටිති ළ  ඳී

මාත්‍රා සයෙන් සයට යතිය සහිත එක් පාදයක මාත්‍රා දොළොසක් වන වසත් විරිත මෙහි ලා කවියා යොදා ගනී. කෝමල පද සහිත වසත් විරිත නැටුම සඳහා උචිත වූවකි. සිංහලයේ රඟ වැනුම්හිදී නිරතුරුවම යොදාගත් විරිතකි. ගුත්තිල කාව්‍යයේ සැණකෙළි වැනුමෙහි රඟ ගැනුණු ළඳුන් ගැන කියන්නේද මේ විරිතිනි.

පසු කර රුසිරෙන් සුර  ඹා
ගොස කර රන් මිණි සල  ඹා
එනුවර කෙළි රඟ පුර  ඹා
බඹසර සිත වත් කල  ඹා

- ගුත්තිල කාව්‍යය

### මුල හා අග

මෙම වැනුමෙහි අරඹුම වේගවත් වූ බව අපි දුටුවෙමු. දැන් රැඟුමෙහි නිමාවට පැමිණ සිටී. හොඳ රැඟුමක විශේෂත්වය නම් නිමාවද ඇරඹුම තරම්ම වේගවත් වීමය. වෙන ලෙසකින් කිවහොත් ඇරඹුම හා නිමාව සම වීමය. ප්‍රේක්ෂකයාට රැඟුම නිමා වන බව වත් නොදැනෙන්නේ එවිටය. එබැවින් කවියා යළි වැනුම ඇරඹූ කමලා නම් විරිතට බසී. මේ නිමා පද්‍යය කොතරම් අලංකාර වූවක්දැයි බලන්න.

බඳිමින් නිල් වරලස ලා කුසුමන් සෙව්වන්  දී
කියමින් මියුරස ගී නොවරදවා පද සන්  දී
නඟමින් අත එළමින් සුබ රඟ රඟ බැලුමන්  දී
රඟමින් සිටි නළඹුන් බල ලෙලදෙන රන් බන්  දී

(සෙව්වන්දි මල් නිල් වරලස ගසා බැඳ පදයන්ගේ සන්ධීන් (වෙනස් වෙන තැන්) නොවරදවා මිහිරි රසවත් ගී ගයමින් අත ඔසවමින් හා පහත දමමින් ප්‍රේක්ෂකයන් දෙස බලමින් රඟන රන් වළලු සහිත නිළියන් බලන්න)

වයන පදට තබමින් පා  කමල්ලා

- සැළලිහිණිය

ළකල රුවන් රන්  බන්දි

- මයුර

වැනි පෙර සඳෙස් යෙදුම් මෙහිදී අපගේ සිහියට නැඟෙයි.

කෙසේ වෙතත් මෙම රඟ වැනුම කෝකිලය තුළ දක්නට ලැබෙන කාව්‍ය රසයෙන් අනූන වර්ණනයක් ලෙස හැඳින්වීම උචිතය.

මෙහි කිසිදු තැනෙක දියකෙළි වැණුමක් දක්නට නොලැබීමද විශේෂ ලක්ෂණයකි. ඒ සඳහා කවියාට අවස්ථා කිහිපයක්ම උදා වුවත් අන් කවීන් මෙන් එය තම කවිත්වය පිළිබඳ පෙළහර පෑමට අවස්ථාවක් ලෙස ඔහු නොසැලකූ සේය.

සුබා සිලිල් කෙළිනා ලිය නෙතිඳු ව  ර
පබා සුනිල් රැඳුනෙව් රුදු දිය දහ  ර
සබා පහන් කළුගඟ ලෙළ රළ පත  ර
සොබා සෙමෙන් එතෙරව පලයන් මිතු  ර

(දිය කෙළියෙහි යෙදෙන්නා වූ කාන්තාවන්ගේ නෙත් නමැති නිල් මහනෙල් මල්හි නීලප්‍රභාව මහත් වූ ජල ධාරාවෙහි රැඳුනාක් වැනි ස්වභාවයෙන් ප්‍රසන්න වූ කළු ගඟෙහි සැලෙන රළ පතර දැක නොබියව යන්න)

කුල්මත් ළඳුන් පිහිනන උඩුකුරුව සෙ  ද
දුල් උවනන් පියවුරු කැකුළු මන න  ද
පුල් පියුමෙනි කැකුළෙනි සුසැදුණු නොම  ද
ගල් පොකුණේ දිය නා ගිම් නිවා ත  ද

(රාගයෙන් කුල්මත් වූ කාන්තාවන් උඩුකුරුව පිහිනන කල්හි බබළන්නා වූ ඔවුන්ගේ මුහුණු හා සිත් බඳනා වූ පියොවුරු හා කැකුළු පියොවුරු නමැති පිපුණු නෙළුම්න් හා කැකුළු නෙළුම්න් ශෝභමාන වූ ගල් පොකුණෙන් දිය නා ගිම් නිවා ගන්න) වැනි අවස්ථා ඊට නිදසුන් වේ.

කෝකිලයෙහි ස්වභාව සෞන්දර්ය වර්ණනා ගැනද යමක් සඳහන් කළ යුතුමය. ස්වභාව සෞන්දර්ය වර්ණනය සන්දේශ කවියකුට තම කවිත්වය මතු කර ලීමේ හොඳම කෙම්බිම වුවත් මේ කවියා ඉන් එතරම් ප්‍රයෝජන ගත් බවක් නොපෙනේ. කෝකිලයාගේ ගමනෙහිදී දින දහතුනක් රෑ දවල් ගෙවුනද අන් කවීන් මෙන් එකදු 'උදා, සැඳෑ, නිසා' වැනුමක් කරන්නට මේ කවියා නොපෙළඹුණේය. ඒ සෑම විටෙකම ඉඟි පමණක් කොට නැවතුණේය.

සඳ දළ දළසින විසුරුණු සමා  නේ
සඳ දෙව් දල පැළඹර දිසි මඟා  නේ

(සඳුගේ ජටාවෙන් නික්මුණු ගින්න හා සමාන වූ පැළඹර අහසේ පෙනුණු නොයෙකුත් සන්ධ්‍යා වළාහකයන් බලා)

නිසා ලිය වියොව හැර තුරු පිරිවර  ද
නිසා කර සොවින් එකකිවම ගිය ස  ඳ

(රාත්‍රි නමැති අඞ්ගනාවගෙන් වෙන් වී සඳ තම තරු පිරිවරද හැර ශෝකයෙන් යුතුව තනිවම ගිය කල්හි)

අඹර මිණි රැසින් ගනඳුර යත බැ  හැර
තඹර පුබුදු වත පෙති එකිනෙකින්  හැර

(හිරු රැසින් ගනඳුර බැහැර යන කල්හි පෙත්තෙන් පෙත්ත එකින් එක දිග හැරී නෙළුම් පුබුදු වන කල්හි)

ආදිය උදාහරණයි. ඇතැම් විට කවියා දියකෙළි වැනුම්, නිසා, සැඳෑ, උදා වැනුම් ආදියෙන් වැළකුණේ තව තවත් කාව්‍යය දීර්ඝ වීමේ භීතිය නිසාදැයි අනුමාන කළ හැකිය. අනවශ්‍ය තැන් අඩුකර හෝ කෙටිකර මෙවැනි වැනුම්හි යෙදෙන්නට කවියා වෑයම් කළේ නම් කෝකිලය උසස් කවි ලකුණින් හෙබි කෘතියක් වන්නට ඉඩ තිබුණු බව රඟ වැනුමින් සිතාගත හැකිය.

### ස්ථාන වර්ණනා

ගමන් මගෙහි ස්ථාන වර්ණනයෙහිදී කෝකිල කවියාගේ ස්වභාව සෞන්දර්ය වර්ණනය පිළිබඳ චතුරතාව දක්වන අවස්ථා රැසකි.

යන බිඟු දැල් ඉඳු සැව් ළපලු විදු ලෙ  ළ
පිපි මන කල් පියගඳ කුමුදු කොක වැ  ළ
රුදු ගන කල් ගණසා තුඟු වන ගහ  ළ
දැක හැම කල් රඟ දෙති මියුරු ගිරු කු  ළ

මෙයින් වර්ණනය වන්නේ වන රොදකි. එහි එහා මෙහා යනෙන මී මැසි සමූහයා පෙනෙන්නේ දේදුන්නක හැඩයෙනි. ගස්වල සැලෙන ළා දළු පෙනෙන්නේ ළෙල දෙන විදුලිය පරිද්දෙනි. මනාව පිපුණු සුගන්ධවත් කුමුදු මල් පෙනෙන්නේ කොකුන් සමූහයක් මෙනි. උස් වූ ගසින් යුත් වන ගහනය පෙනෙන්නේ වලාකුල් සමූහයක් මෙනි. මේ වලාකුල් දැක මොණරු ගිරිකුලෙහි හැමකල්හිම නටති. කවියා දෙවන අහසක් චිත්‍රණය කළ අයුරු කොතරම් අගනේද? දේදුනු, විදුලිය, කොකුන්, වැහි වලාකුළු අහස අලංකාර කරන වස්තූහුය. මේ සැමට

44 වන පිටුව බලන්න


JAY PLUMBING
WHY SPEND TWICE
WHEN YOU CAN DO IT RIGHT....
AT FIRST TIME !
YOU DESERVED TO GET YOUR WORK DONE BY
LICENSED PLUMBER
LICENSED GAS TECHNICIAN
LICENSED ELECTRICIAN
PLEASE CALL
JAYANTHA @ 905 450 9005
416 882 8591
Web : www.jayplumbing.ca
PROBLEM IN YOUR
★ WATER TANK ★ FIRE PLACE
★ BBQ, DISH WASHER ★ FURNACE
★ WASH ROOMS
Electrical Contractor Registration Agency
of the Electrical Safety Authority
Licence No 7011266
WWW.esaecra.info
T S S A # 000261790


TB
TISSA BOYAGODA, LLM
KNOW YOUR RIGHTS
TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka
Areas of Practice
Criminal Law
Family Law
Real Estate
Immigration Matters
Civil Litigation
Small Claim Court Matters
Power of Attorneys
Last Wills
Notarizations
GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED
1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4
100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3
TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com
www.tissaboyagodalaw.com

බෙල්ට හලෝ කියා

සංචාරක සටහන්

# කැබොට් පාරෙන් ගල් අඟුරු පතලකට...!

සටහන සහ ඡායා රූ
■ අනුරුද්ධ වැලිගමගේ

ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් කැනේඩියානුවන් ලෙස අපට ආඩම්බර විය හැකි ලෝකයම ළං කරන දුරකථනය හඳුන්වා දුන් නිර්මපකයාය. නව ස්කොට්ලන්තය යන අරුත ඇති නෝවා ස්කොෂියා පළාතේ බෙඩෙක් නගරයේ පිහිටි මනරම් බිම් කඩක ඇති බෙල්ගේ කැනේඩියානු නිවහන ආශ්‍රිතව ඔහු සමරමින් ජාතික ඓතිහාසික පරිශ්‍රය පිහිටුවා තිබේ.

ටොරොන්ටෝවේ සිට සැතපුම් දහස් ගණනක රථ ධාවනයකින් පසු අප මේ පැමිණ සිටින්නේ කැනඩාවේ නැගෙනහිර වෙරළටයි. නාවික ක්ෂේත්‍රයේදී ඉතාමත් වැදගත්කමක් ඇති හැලිෆැක්ස් නගරය මෙහි අගනුවරයි. බෙල් පවුලෙන් ලැබුණු පරිත්‍යාග මත 1955 දී පිහිට වූ මේ කෞතුකාගාරය ඉංජිනේරු අංශයෙන් උනන්දුවක් දක්වන කාහට වුවද දැනුම් සම්භාරයක් ලැබිය හැකි තැනකි. සිය මවත් බිරිඳත් දෙදෙනාම බිහිරි වූ බැවින් බිහිරි පුද්ගලයන් සඳහා සිය පර්යේෂණ මෙහෙය වූ බෙල් අතින් 'ටෙලිෆෝනය' බිහිවී ඇත්තේ අහම්බයකිනි. ආරක්ෂක කටයුතුවලදී මහත් මෙහෙයක් කරන ලෝහ අනාවරකය (Metal Detector) ඇතුළු නිමැවුම් රැසක් කළ බෙල් 1906 දී බෙඩෙක්වලදී නිම වූ ප්‍රති සබ්මැරීන හයිඩ්රො ෆොයිල් යාත්‍රාවත් 1909 දී කළ ගුවන් යානා පර්යේෂණත් ඔබට මෙහිදී දැකගත හැකිය.





## කැබොට් මංපෙත (Cabot Trail)

ලෝකයේ ජනප්‍රිය දර්ශනීය මාවත් අතරින් එකක් ලෙස සැලකෙන කැබොට් මංපෙතේ දිග කිලෝමීටර 298 කි. බෙඩෙක්වලින් ඇරඹී කේප් බ්‍රිටන් දූපත වටා ගොස් ආපසු බෙඩෙක්වලින් අවසන් වන මෙය වටරවුම් මාර්ගයකි. කඳු නිම්න, වන වදුලින් පිරි ජෛව විවිධත්වයකින් හෙබි මේ මාවත ගමන් කරන්නේ කිලෝමීටර 948 ක් වසා සිටින කේප් බ්‍රිටන් උස්බිම් රක්ෂිතය වටාය. ඒ සඳහා නිකුත් කරන ප්‍රවේශ පත්‍රය දින දෙකකට වලංගු වන්නේ ඔබ පරිසර ලෝලියෙකු නම් කඳුවුරු බිමක රැය පහන් කරන්නටත්,බයිසිකල් හෝ ඇවිදින මංපෙත්වල යන්නෙක් නම් ඒ සඳහා ඉඩ සලසන්නටත්ය. වාහනයෙන් යන විටදී ඔබ දකින අතිශය සුන්දර රූප පෙළ අඩුවක් නැතුව කැටි කරගන්නට නම් ඩෑෂ් බෝඩ් කැමරාවක් ප්‍රයෝජනවත් වනු නියතය. ඉතා විශාල වංගු ගණනාවක් ඇති බැවින් ඔරලෝසුවේ කටු කැරකෙන අතට වටරවුම් මාර්ගය ධාවනය කරන විට දසුන් වඩාත් සුන්දරව දිස්වන බවත් රිය පැදවීම වඩාත් ප්‍රවේශම් වන බවත් සංචාරක වෙබ් අඩවියක සඳහන් වූ බැවින් අපිද එය අනුගමනය කළෙමු.









ඒ මාර්ගය මුදුනේ ඇති ගම් කිහිපය කේන්ද්‍ර කර ගනිමින් සංචාරකයින් සඳහා අත්ලාන්තික් සාගරයේ තල්මසුන් නැරඹුම් චාරිකා සේවාවන්ද ක්‍රියාත්මක වේ. රිය නවතා අත්ලාන්තික් සයුරේ රළ පාගන්නට ඉඩ සලසා ඇති තැන් රැසක් වූ බැවින් අපට ගිමන් හරින්නට අසීරු වුයේ නැත.

කැබොට් මංපෙත තුළ තැනින් තැන වාහන නවතා බයිසිකල්වල නැගී වනපෙත ගවේෂණය කරන්නටත්, ඇවිද්ද පයට දහස් ගණනින් වටිනාකමක් දෙමින් වනය නිරීක්ෂණය කරන්නටත්, කෑම ගැනීමට මෙන්ම වැසිකිලි පහසුකම් පිරි විවේක ස්ථානත් බොහොමයක් වේ. ගස්වල කොළ රතු, කහ, තැඹිලි පැහැයන්ගෙන් වර්ණ ගැන්වෙන සමයට කේප් බ්‍රිටන් දිවයිනත් කැබොට් මන් පෙතත් මවන විසිතුර බලන්නට ලොව නන් දෙසින් දහස් ගණනින් සංචාරකයින් පැමිණෙන වග සඳහන්ය.

## ස්ප්‍රින්හිල් ගල් අඟුරු පතල

අඩි 14,200 ක් දිගට විහිදුණු අංක 2 දරණ පතල 1956 සහ 1958 දී සිදුවූ ඛේදවාචකයෙන් පසුව වසා දැමූනද සංචාරකයින් සදහා කුඩා කොටසක් වඩා ආරක්ෂිතව පන ගන්වා තිබේ. එම දුක්බර සිද්ධියෙන් දිවි ගලවාගත් පතල් කම්කරුවෙකු විසින්ම පවත්වන කණ්ඩායම් සංචාරයකට අපට මෙහිදී ඉඩ ලැබිණි. පතල් කම්කරු ඇඳුම් ආයිත්තම්වලින් සැරසී අංකය සහිත බෙලෙක් තහඩුවක්ද සහිතව දෝනාවට බට පැය භාගයක පමණ කාලයේදී කට්ට කළුවර වැසිකිළියක්වත් නැති ගුහාවක දවස පුරා ගල් අඟුරුවලින් ඩක්කු පිරවූ කම්කරුවන් ගැන නෙතට කඳුළක් ඉනූ බව කිව යුතුය. මේ වනවිට පාළුවට ගොස් තිබෙන එම ප්‍රදේශය ගල් අඟුරුවලට හොඳ කලක් පැවති එදවස කෙතරම් ජනාකීර්ණ වන්නට ඇත්දැයි අපට සිතිණි. එම පරිශ්‍රයේ ඇති කෞතුකාගාරයේ දකින්නට ලැබෙන දෑ සහ වීඩියෝ චිත්‍රපට සුවිශේෂය.

## ජෝගින්ස් පොසිල මධ්‍යස්ථානය

ලෝකයේ වැඩිම වඩදිය බාදිය වෙනස දකින්නට ලැබෙන ෆන්ඩි බොක්කේ, නෝවා ස්කොෂියා මායිමේ වසර මිලියන 300 ක ඉතිහාසයක් ඇති මේ පොසිල පරිශ්‍රය කිලෝමීටර 15 ක් දිගට විහිදී තිබේ. යුනෙස්කෝව මගින් ප්‍රකාශයට පත් කළ ලෝක උරුමයන් අතුරින් එකක් වන මෙහි මුහුදු වෙරළේ අදද පොසිලයන් දකින්නට ලැබේ. සැමදා වතුරේ යට වෙමින් නැවත පැද්දෙමින් තිබෙන මෙහි කල්පනාකාරී විය යුත්තේ වතුර පිරෙන පැය කිහිපයේදීය. ඔබ ඇවිද ගිය වෙරළ තීරය ඔබ බලා සිටියදීම වතුරින් යටවන්නේ ඔබ මවිත කරවමිනි. ඒ බව දැක්වෙන පුවරු සේම නිලධාරීන්ද සිටිනා බැවින් ඔබ කිසිසේත්ම මේ සංචාරයට බිය විය යුතු නැත. එහි පිහිටා ඇති අධ්‍යාපන මධ්‍යස්ථානය පහසුකම් සපිරි දැනුම් ගබඩාවකි. බොහෝ දෘශ්‍ය ආකෘති පිරි මෙහිදී පොසිල, ගල් අඟුරු පතල් පමණක් නොව මේ ප්‍රදේශයේ ඉතිහාසය පවා මැනවින් නිරූපණය කර ඇති වග පෙනේ.

## අත් නොහැරිය යුතු තවත් තැන්,

### බිලූ නොස් II (Bluenose II)

කැනේඩියානු සත දහයේ කාසියෙහි (Dime) කොටා ඇති නිල්නැහැය - Bluenose II රුවල් නැවේ ප්‍රතිනිර්මාණය බිලූනෝස් 2 සිඩ්නි වරාය බලා යන ගමනක මැද සමුද්‍රයේ වූ බැවින් අපට අතහැරුණද එය වරායක නැංගුරම් ලා ඇත්නම් අත් නොහැරිය යුත්තකි. එහි නැගී සංචාරයක යෙදෙන්නත් සේවය සදහා බැදෙන්නත් ඉඩ ප්‍රස්ථා ඇති බැවින් ඒ ගැන උනන්දු නම් අන්තර්ජාලය බලන්න.

### පෙගීගේ ගුහාව (Peggy's Cove)

හැලි ෆැක්ස් නගරයේ සිට කිලෝමීටර් 43 දුරින් පිහිටි කුඩා ධීවර ගම්මානයක් 'පෙගීගේ ගුහාව' ලෙසින් නම් ලබා තිබේ. මෙහි තුඩුවේ 1868 ඉදිකර තිබෙන ප්‍රදීපාගාරය අත්ලාන්තික් සාගර මායිමේ පිහිටි ජනප්‍රිය සංචාරක ආකර්ෂණ අතුරින් එකකි.



### ලුනෙන්බර්ග් (Lunenberg)

කැනඩාවේ මුල් උරුමකරුවන්ගේ වරායක් ලෙස ලුනෙන්බර්ග් හදුන්වා දිය හැකිය. ආකේඩියන්වරුන්ගේ ප්‍රකට රතු සහ නිල් පැහැ ගැන්වූ නිවෙස් සහ ගොඩනැගිලි අතරේ සයුරට විවර වූ මේ පෙදෙස සිතුවමක ලෙසින් යළි ළිත් සිහිපත් කළ හැකිය.

### ලුවිස්බර්ග් බලකොටුව (Louisberg)

1700 ගණන්වල බලකොටුවක සොල්දාදුවන් ආචාර පෙළපාලියක් සහ ආචාර වෙඩිමුර දක්වන අතරේ ඒ කාලයේ ජන ජීවිතය සහ ක්‍රීඩාවල අත්දැකීම් ලබන්නට කදිම තැනක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය.





# ඔන්ටාරියෝවේ ඉඩම් පැවරුම් බදුවල වෙනසක්

ඔන්ටාරියෝ නිවාස හා දේපළ වෙළඳාම් සංගමයෙහි බලයලත් දේපළ හා නිවාස වෙළඳාම් අලෙවි නියෝජිත

■ **ගාමිණී අබේසිංහ** ABR. CNE.

ෆෙඩරල් රජය සහ පළාත්බද රජයයන් විසින් දිනෙන් දිනම විවිධ නීති රෙගුලාසි සහ අණ පනත් එක් කරමින් දේපළ වෙළඳාම් ක්ෂේත්‍රය තුළ සිදුකරන වෙනස් කම් නිසා මේ දිනවල දේපළ වෙළඳපළෙහි දක්නට ඇත්තේ දැඩි වික්ෂිප්ත බවකි.

ඒ අන්දමට සිදුකරන ලද අලුත්ම වෙනස් කම් කිහිපයක් පිළිබඳ නිවේදනය පසුගිය නොවැම්බර් 14 වෙනිදා ඔන්ටාරියෝ රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ අතර එහිදී ප්‍රාදේශීය ඉඩම් පැවරීමේ බද්ද සම්බන්ධ (Provincial Land Transfer Tax - PLTT) වෙනස් කිරීම් කිහිපයක් සිදු කොට ඇත.

ප්‍රාදේශීය ඉඩම් පැවරීමේ බද්ද තුළ ඇති කරන මෙම වෙනස් කිරීම්වලදී ප්‍රධාන වශයෙන් ඉලක්ක කොට ඇත්තේ ඔන්ටාරියෝව තුළ 'පළමු නිවස' මිල දී ගන්නා (first-time home buyers) තැනැත්තන් වීම මෙහි ඇති විශේෂත්වයයි. එහිදී පළමු නිවස මිල දී ගැනීමට සූදානම් වන පුද්ගලයින් හට වාසි සහගත වන අන්දමින් මෙම බද්ද ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

වර්තමානයේදී ඔන්ටාරියෝව තුළින් සිය පළමු නිවස මිල දී ගන්නෙකුට ප්‍රාදේශීය ඉඩම් පැවරීමේ බද්දෙන් ඩොලර් 2000 ක වට්ටමක් :rebate) හිමි වනු ලබයි. ජනවාරි 01 දා සිට එම වට්ටම දෙගුණ කිරීමට ඔන්ටාරියෝ රජය පියවර ගෙන ඇති අතර ඒ අනුව මෙතෙක් ගෙවූ ඩොලර් 2000 වෙනුවට ඩොලර් 4000 ක වට්ටමක් සෑම පළමු නිවාස ගැනුම් කරුවකුටම හිමි වේ. මේ වන විට ටොරොන්ටෝ නගරයෙන් නිවසක් මිල දී ගැනීමේදී සෑම ගැනුම් කරුවකුම ප්‍රාදේශීය ඉඩම් පැවරීමේ බද්දට අමතරව ටොරොන්ටෝ ඉඩම් පැවරීමේ බද්දක්ද (Toronto Land Transfer Tax) ගෙවනු ලැබේ. මෙම අලුත් බදු වට්ටමත් සමගම ඔන්ටාරියෝ සහ ටොරොන්ටෝ ඉඩම් පැවරීමේ බදු ගාස්තු සමගාමී අගයක් ගනු ලබයි.

මෙම නව ප්‍රාදේශීය බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් පළමු වරට නිවසක් මිල දී ගැනීමට සූදානම් වන බොහෝ දෙනෙකුට පවතින මූල්‍යමය අපහසුතා මගහරවා තමාගේම කියා නිවසක් මිල දී ගැනීමට හැකි වන බව ඔන්ටාරියෝ රජය පවසයි. සමස්ත ඔන්ටාරියෝවෙහිත් විශේෂයෙන්ම GTA පළාතෙත් නිවාස මිල ගණන් අධිකව ඉහළ යන මෙවැනි අවධියක ඔන්ටාරියෝ රජය විසින් පළමු නිවස මිල දී ගැනීමට සූදානම් වන්නන් දිරි ගැන්වීම සඳහා ගෙන ආ මෙම විශේෂ සහනය පිළිබඳව දේපළ වෙළඳාම් කටයුතු හා සම්බන්ධ පිරිස මෙන්ම නිවාස මිල දී ගැනීමට සූදානම්ව සිටින පිරිසද සිය ප්‍රසාදය පළ කොට ඇත.

මෙම අලුත් බදු වට්ටම 2017 ජනවාරි 01 වනදා සිට බලාත්මක වීමට නියමිත බව රජය විසින් කළ නිවේදනයේ සඳහන් වේ.

## මිලියන 2 ට වැඩි නම් පැවරුම් බදු වැඩි වේ

ප්‍රාදේශීය ඉඩම් පැවරීමේ බද්ද සම්බන්ධයෙන් රජය විසින් සිදුකරන ලද මෙම ප්‍රධාන වෙනස්කමට අමතරව ඩොලර් මිලියන 2 ට අධික නිවාස මිල දී ගැනීම් සම්බන්ධයෙන් අයකර ගනු ලබන බද්දෙහිද වෙනසක් සිදුකොට ඇත.

එහිදී ඩොලර් මිලියන 2 ට වැඩි නිවාස මිල දී ගැනීම් සඳහා මෙතෙක් අයකර ගනු ලැබූ ප්‍රාදේශීය ඉඩම් පැවරීමේ බද්ද සියයට 2 සිට සියයට 2.5 දක්වා ඉහළ දමා ඇත. එහෙත් ඒ සියලුම නිවාස මිල දී ගැනීම් (අගය ඩොලර් මිලියන 2 ට වැඩි වුවත්, පළමු වරට නිවසක් මිල දී ගන්නේ නම් පමණක්, ජනවාරි 01 දා සිට) සඳහා ඉහත සඳහන් ඩොලර් 4000 බදු වට්ටම හිමි වේ.

මෙය ඔබට තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා මෙසේ සඳහන් කළ හැක.

**පෙර අයකරනු ලැබූ ඔන්ටාරියෝ ඉඩම් පැවරීම බදු අගයයන්**

| මිල දී ගන්නා නිවසේ වටිනාකම (Home Purchase Price) | බදු අගය (Tax Rate) |
|---|---|
| Up to $55,000 | 0.5% |
| $55,000 to $250,000 | 1.0% |
| $250,000 to $400,000 | 1.5% |
| Above $400,000 | 2.0% |

**නවීකරණය කරනු ලැබූ ඔන්ටාරියෝ ඉඩම් පැවරීමේ බදු අගයයන්**

| මිල දී ගන්නා නිවසේ වටිනාකම (Home Purchase Price) | බදු අගය (Tax Rate) |
|---|---|
| Up to $55,000 | 0.5% |
| $55,000 to $250,000 | 1.0% |
| $250,000 to $400,000 | 1.5% |
| $400,000 to $2-million | 2.0% |
| $2-million and over | 2.5% |

මෙම වැඩි කිරීම 2016 නොවැම්බර් 14 දා හෝ ඊට පෙර කරන ලද නිවාස මිල දී ගැනීමේ ගිවිසුම්වලට යටත් නොවන අතර ඉන්පසුව සිදුකරන සියලුම විකුණුම් සඳහා ඉහත නවීකරණය කළ ඉඩම් පැවරීමේ බදු අයකිරීම් අදාළ වේ.

## ලක්ෂ 4 ට වැඩි නේවාසික නොවන (Non-residential) දේපළ

ඔන්ටාරියෝ රජය විසින් නිවේදනය කරනු ලැබූ නවීකරණය කළ බදු ක්‍රමය තුළ 'නේවාසික නොවන (non-residential) දේපළ' වෙනුවෙන් අයකර ගනු ලබන දේපළ පැවරීමේ බද්දෙහි සිදුකර ඇති වෙනස පිළිබඳවද විශේෂයෙන් සඳහන් කළ හැක.

මෙහිදී ව්‍යාපාරික, කර්මාන්ත, කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන්ද බහු-පදිංචි නිවාස (එපාර්ට්මන්ට් වැනි) සම්බන්ධයෙන්ද මෙතෙක් අයකර ගනු ලැබූ පැවරුම් බද්ද වැඩි කිරීමට රජය පියවර ගෙන ඇත. මෙම වැඩිකිරීම ඩොලර් ලක්ෂ 4 ට වැඩි අගයෙන් යුත් දේපළ සඳහා බලපානු ලබන අතර එහිදී මෙතෙක් සියයට 1.5 ක්ව තිබූ දේපළ පැවරුම් බද්ද සියයට 2 ක් ලෙස ඉහළ නංවා ඇත.

මෙම නව බදු අයකිරීමද 2016 නොවැම්බර් 14 දා හෝ ඊට පෙර කරන ලද දේපළ මිල දී ගැනීමේ ගිවිසුම්වලට යටත් නොවන අතර ඉන්පසුව සිදුකරන සියලුම දේපළ ගනුදෙනු සඳහා ඉහත නවීකරණය කළ දේපළ පැවරීමේ බද්ද ක්‍රියාත්මක වේ.

## කැනේඩියානුවක වීම අනිවාර්යයි

මෙම නව බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී, කැනේඩියානු පුරවැසියන් සහ ස්ථිර පදිංචිකරුවන් පිළිබඳව විශේෂ සැලකිල්ල යොමු කිරීමට රජය කටයුතු කොට ඇත.

ඒ අනුව පළමු නිවස මිල දී ගන්නා පුද්ගලයන්ට ලබාදෙන ඩොලර් 4000 බදු සහනය ලබා ගැනීමට නම් එම තැනැත්තා කැනේඩියානු පුරවැසියකු (Canadian citizens) හෝ කැනඩාවේ ස්ථිර පදිංචිකරුවකු (Permanent residents) වී සිටීම අනිවාර්ය කොට ඇත. මෙම නව නීතිය ජනවාරි 01 දා සිට ක්‍රියාත්මක වීමට නියමිත වේ.

එහෙත් 2016 නොවැම්බර් 14 දා ට පෙර මිල දී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට ඇත්නම් ඔවුන් කැනේඩියානු පුරවැසියකු හෝ ස්ථිර පදිංචිකරුවකු නොවූවද ඉහත වට්ටම හිමි වේ.




NOVA Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM

100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES

416 298 0990
shani.hanwella@novaim.ca

SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka

1585 Markham Road, Suite 407, Scarborough, ON M1B 2W1
www.novaim.ca

# ANOMA PERERA

**Barrister, Solicitor & Notary Public**
**(Attorney-at-Law, Sri Lanka)**

- **REAL ESTATE - Residential & Commercial**
- **WILLS & POWERS OF ATTORNEY**

**EVENING & WEEK END CONSULTATIONS AVAILABLE BY APPOINTMENT**



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

## Abby Sri Haran

**Senior Mortgage Specialist**

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

# නිව් වන්නි මාර්කට් ඉන්ක්.

## NEW VANNI MARKET INC.

40 Bristol Rd E. Unit 7. Mississauga, ON. L4Z 3K8

Tel: 905 566 5550



BECOME A MEMBER AT NEW VANNI MARKET AND RECEIVE POINTS FOR EVERY PURCHASE AND REDEEM THEM FOR FREE ITEMS.

අලුත්ම අලුත් මාලු, නැවුම් එළවළු පළතුරු, කුළුබඩු සහල්
ඇතුළු ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සියලුම ආහාර වර්ග වඩාත්
පහසුවෙන් ඔබේ සිතැඟි පරිදි තෝරා ගැනීමට
**නිව් වන්නි මාර්කට් ඉන්ක්** වෙත එන්න.

වියළි හාල්මැස්සන්
සියලුම කරවල වර්ග
උම්බලකඩ

පොල්, රතුළූණු, කෙසෙල් කොළ, බුලත්
ගොටුකොළ, මුකුණුවැන්න, කතුරුමුරුංගා
අලුත් එළවළු සහ පළතුරු වර්ග රැසක්

SEND MONEY TO SRI LANKA, INDIA OR OTHER COUNTRIES

* all prices are subject to change without prior notice

ගෙදර යන ගමන් අතේ ඇති මුදලට හිතේ හැටියට ඔබට අවශ්‍ය සියලුම ශ්‍රී ලාංකේය නිෂ්පාදන එකම තැනකින් ලබාගන්න NEW VANNI MARKET INC.වෙත පැමිණෙන්න.

Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

# වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

## Gamini - 416 822 2789

All Ads & Classified Ads are also Published in the ONLINE Edition at

**WWW.DASATHA.COM**

**For NO ADDITIONAL CHARGE**

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

# පපුවේ කැක්කුම

## දැනෙන්නේ මෙහෙම නම්

# ඒ හෘදයාබාධයක් නොවේ



■ වෛද්‍ය රුවන් ඒකනායක
හෘද රෝග පිළිබඳ විශේෂඥ

වර්තමාන ලෝකයේ බෝවන රෝගවලට වඩා වැඩි වේගයකින් බෝ නොවන රෝග ඇතිවීමේ ප්‍රවණතාවක් පවතින බව ඔබ දන්නා කරුණක්. දියවැඩියාව, අධික රුධිර පීඩනය, හෘදයාබාධ, පිළිකා මෙන්ම ස්ථූලතාවද ප්‍රධාන බෝ නොවන රෝග අතරින් කිහිපයක්. වර්තමානයේ ලොව පුරා හෘදයාබාධවලට ගොදුරුවන්නන් ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතිනවා. හෘදයාබාධ යනු යහපත් සෞඛ්‍ය හුරු පුරුදු මෙන්ම නිවැරැදි ජීවන රටාවක් පවත්වා ගැනීමෙන් වළක්වා ගත හැකි රෝගයක්.

හදවතට රුධිරය සපයන ධමනි නාළ හෙවත් කිරීටක ධමනි තුළ මේදය (තෙල්) තැන්පත් වීමෙන් එම ධමනි නළ ඇතුළත රුධිරය ගලා යාමට ඇති ඉඩකඩ ඇහිරෙයි. එසේ තෙල් තැන්පත් වීමෙන් ධමනි බිත්ති පටු වීමෙන් පසු කලෙක ඒ නාළ තුළ රුධිරය කැටි ගැසීමක් ඇතිවේ. එසේ කිරීටක ධමනියක් තුළ රුධිර කැටියක් ඇති වූ විට හෘදය වස්තුව වෙත රුධිරය සැපයුම අඩාළ වෙයි. එහෙයින් එම රුධිර කැටියෙන් උවදුරට පත් හෘදය ප්‍රදේශය මිය යයි. ඒ තත්ත්වය හැඳින්වෙනුයේ හෘදයාබාධයක් ලෙසයි.

රුධිර නාළ තුළ ඇති වූ තෙල් තැන්පතු හදිසියේම පිපිරීමට ලක් වෙයි. පිපිරුණු තෙල් තැන්පතුවක් මත රුධිරය වහාම කැටි ගැසෙයි. ඒ සඳහා තත්පර කිහිපයකට වඩා ගත නොවේ. ක්ෂණික හෘදයාබාධයක් යනුවෙන් හැඳින්වෙනුයේ එම තත්ත්වයයි. බොහෝ විට එවැනි ක්ෂණික හෘදයාබාධයක් හටගන්නා රෝගීන්ගෙන් 60% ක් පමණ ඊට පෙර පපුවේ වේදනාවක් හෝ හෘදයාබාධයක පෙර ලකුණු පහළ නොකරති.

හෘදයාබාධයක ප්‍රධාන ලක්ෂණ දැන සිටීම වැදගත්ය. පපුවේ ඇතිවන සෑම වේදනාවක්ම හෘදයෙන් ඇතිවන වේදනා නොවේ. පපුව මතු පිට ඇති සමෙන්, මස් පිඬුවෙන්, ඉළ ඇටවලින්, ප්ලූරාවෙන් හා පෙණහැල්ලෙන් ඇතිවන වේදනාවන්ද අපට දැනෙන්නේ පපුවේ වේදනාවක් ලෙසිනි.

### හෘදයාබාධයක වේදනා ලක්ෂණ වන්නේ

- පපුවේ මැද ඇරැඹේ.
- එය පපුව තෙරපන්නා බඳුය.
- මහ බරක් තැබුවා වැනිය.
- ඉතා දැඩිය.
- වම් අත හෝ හක්ක දෙසට හෝ විහිදී යා හැකිය.
- පිට පැත්තේ උරපතු ඇට දෙක අතරටද දිව යා හැකිය.
- බඩේ දැවිල්ලක් ලෙස ඇති විය හැකිය.
- ඒ හා සමග අතුරු රෝග ලක්ෂණ කිහිපයක් ඇතිවිය හැකිය.
- ඒවා නම්
- අධිකව දහදිය දැමීම
- වමනය හා ඔක්කාරය
- පපුවේ ගැස්ම
- හිස කරකැවිල්ල
- හුස්ම ගැනීමේ අපහසුව

### හෘදයාබාධ ඇති වීමට බලපාන අවදානම් සාධක කිහිපයකි. ඒවා අතරින් ප්‍රධාන වන්නේ,

- දුම් බීම
- රුධිරයේ කොලෙස්ටරෝල් අධික වීම
- ස්ථූලතාව
- අධික රුධිර පීඩනය
- දියවැඩියාව
- කායික ව්‍යායාම අඩු වීම
- මානසික අසහනය
- ජන්ම ප්‍රවේණිය

**අප්‍රධාන සාධක වන්නේ**

- උපත් පාලන පෙති භාවිතය
- අධික කෝපි පානය
- උපත් බර අඩු වීම

මෙම අනතුරුදායක අවදානම් සාධකවලින් බැහැර වීමෙන් හෘදයාබාධ වළක්වාගත හැකිය. ඒ සඳහා මිනිසාගේ ආහාර පාන සහ ජීවන චර්යාවන් වෙනස් කර ගැනීම වැදගත් වේ. හෘදයාබාධයක් හටගැනීමට එක් අවදානම් සාධකයක් නොව අවාදානම් සාධක කිහිපයක් එක් විය යුතුය. එහෙයින් යම් පුද්ගලයකු තුළ ඉහත දැක්වූ අවදානම් සාධක කිහිපයක්ම වේ නම් ඒ පුද්ගලයාට හෘදයාබාධ හට ගැනීමේ අවදානම ඉහළය.

දුම්වැටි ඉරීම හෘදයාබාධයකට සෘජුවම බලපාන හේතුවයි. දුම්වැටි උරන්නන් හදවත් රෝගවලින් මිය යෑමේ ප්‍රවණතාව එසේ නොවන්නන් මෙන් දෙතුන් ගුණයකින් ඉහළය. සිගරට්වල ඇති නිකොටින් හේතුවෙන්,

- හෘද ස්පන්දනය වැඩි වෙයි.
- රුධිර පීඩනය ඉහළ යයි.
- ලේ කැටි ගැසීම් වැඩි වෙයි.
- රුධිරයේ කොලෙස්ටරෝල් මට්ටම ඉහළ යයි.
- රුධිරයේ හිතකර එච්.ඩී.එල් අංශු අඩු වෙයි.
- රුධිර කැටි ගැසීමේ සාධකය වැඩි වෙයි.
- හදවතට ලේ සැපයුම අඩු වෙයි.
- අංශභාගය වැලැඳීමට ඉඩ ඇත.
- ගාත්‍රාවල රුධිර නාළ සිහින් වී රුධිර හීනතාව හේතුවෙන් කකුල්වල තුවාල ඇති වේ.
- හෘද රෝග සඳහා දෙනු ලබන ඖෂධවල බලය අඩුවේ.

ඉහත කරුණු අනුව දුම් ඉරීම හෘද රෝගයක් සඳහා කොපමණ බලපෑමක් කරන්නේදැයි සිතා ගත හැකිය. එහෙයින් දුම් බීමෙන් වැළැකීම හෘදයාබාධ වළක්වා ගැනීමට ඇති හොඳම පිළියමකි.

සාමාන්‍යයෙන් කාන්තාවන්ට වඩා පුරුෂ පක්ෂයට හදවත් රෝග ඇතිවීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. කාන්තාවන්ගේ සිරුරෙහි නිපදවෙන ඊස්ට්‍රජන් හෝර්මෝනය නිසාත් ආර්ථව චක්‍රය නිසාත් හදවත් රෝග අවදානම ස්වභාවිකවම බොහෝ දුරට පාලනය වේ.

මත්පැන් බීමද හෘදයාබාධවලට හේතු වේ. අධික මත්පැන් භාවිතය ශරීරයේ බොහෝ ඉන්ද්‍රියයනට හානිදායක වේ. හෘදයේ වම් කෝෂිකාව ඉදිමීමෙන් හෘදයේ ක්‍රියාකාරීත්වය අක්‍රමවත් වීම මෙන්ම ක්ෂණික හෘදයාබාධ ඇති වීමටද මත්පැන් භාවිතය හේතු වේ.

රුධිරයෙහි කොලෙස්ටරෝල් මට්ටම ඉහළ යාම හෘදයාබාධ හට ගැනීමට හේතු වේ. රුධිර කොලෙස්ටරෝල් මට්ටම පහළ දමා ගැනීම සඳහා විශේෂයෙන්ම කොලෙස්ටරෝල් සහිත තෙල් සහිත ආහාර ගැනීම සීමා කළ යුතුය. වර්තමානයේ කුඩා දරුවන්ගේ සිට තරුණ පිරිස අතරද රුධිරයේ කොලෙස්ටරෝල් මට්ටම අධික තත්ත්වයක් දැකිය හැකිය.

පැරැණි සුපුරුදු ආහාර වේල් වෙනුවට ක්ෂණික කෑම වර්ග තෙල් හා සීනි අධික පිෂ්ටය සහිත ආහාර පරිභෝජනයට හුරු වීම මේ තත්ත්වයට හේතු වේ. ආසියාතික රටවල ජනතාව හුරු පුරුදු වී සිටින්නේ වැඩිපුර පිෂ්ටය සහිත බත්, පාන්, රොටී, පිට්ටු සහ අල වර්ග වැනි ආහාර ප්‍රධාන ආහාර ලෙස ලබා ගැනීමටය. ඒ ආහාර වර්ගවල ඇති පිෂ්ටය තුළ දැවී සීනි බවටත් මේදය බවටත් පත්වේ. විශේෂයෙන්ම අප ප්‍රධාන ආහාරය ලෙස ලබාගන්නා 'බත්' අද මාරකයක් බවට පත් වෙමින් ඇතැයි කිව හැකිය.

තුන් වේලටම බත් කෑමත් හැම විටම බත් වැඩි ප්‍රමාණයක් ආහාරයට ගැනීමත් රුධිරයෙහි සංතෘප්ත මේද වැඩි වීමට හේතු වෙයි. එහෙයින් දිනකට එක් වේලක් පමණක් බත් ආහාරයට ගැනීම වඩා සුදුසුය. බත් කෑමට ගන්නා විට බත් කුඩා ප්‍රමාණයක් සහ එළවළු පලා වර්ග වැඩිපුර ආහාරයට ගැනීම වඩා සුදුසුය.

මේද සහිත බටර් වෙනුවට මාගරීන් වර්ග භාවිතා කිරීම සුදුසු යැයි බොහෝ දෙනා සිතති. එහෙත් සත්‍ය නම් සියලු මාගරීන් වර්ගවලද සංතෘප්ත මේද අඩංගු වන බවය. එහෙයින් මාගරීන් වර්ග වුවද ලබාගත යුත්තේ මධ්‍යස්ථ ප්‍රමාණයන් ගෙනි. ගිතෙල්, නම් නොකරන ලද එළවළු තෙල්, සත්ව තෙල් මෙන්ම පොල් තෙල්වලද සංතෘප්ත මේදය බහුලය. පොල්තෙල් හානිකර නොවුණද එමගින් හෘද රෝග ඇතිවීම වැළැක්වීමේ හැකියාවක් නැත.

හානිකර රුධිර මේදය (එල්.ඩී.එල්) ඉවත් කරමින් ආහාරයට රසය හා පෝෂ්‍ය ගුණය එක් කිරීම සඳහා බහු අසංතෘප්ත මේද සහිත තල තෙල්, ඔලිව් තෙල්, බඩඉරිඟු තෙල්, සෝයා තෙල් හා සූරියකාන්ත තෙල් වර්ග සුදුසුය. බහු අසංතෘප්ත තෙල් වර්ග ශීත උෂ්ණත්වයේදී සාමාන්‍යයෙන් නොමිදෙයි. එහෙත් මේ තෙල් වර්ග වරක් භාවිතා කළ පසු නැවත නැවත භාවිතා කිරීම නුසුදුසුය. බහු අසංතෘප්ත මාගරීන්වල බහු අසංතෘප්ත තෙල් ඉතා ඉහළ මට්ටමක පවතින හෙයින් ඒවා භාවිතා කළ යුත්තේ ඉතා සීමාසහිතවය. දිනකට මෙවැනි මේද වර්ග තේ හැඳි එකකට වඩා භාවිත කිරීම හානිදායකය.

■ සියලු වර්ගයේ ඇට වර්ග මධ්‍යස්ථ ප්‍රමාණවලින් ගැනීම හිතකර වේ. කජු, රටකජු, කොට්ටම්බා වැනි ඇට වර්ගවල ඇති මේදය හෘදය හිතකරය. එහෙත් දිනපතා මේවා පමණට වඩා ආහාරයට ගැනීම සුදුසු නැත.

■ බිත්තර සතියකට වරක් හෝ දෙකක් ගත්තාට වරදක් නැත. එහෙත් කහමදය ඉවත් කොට ගැනීම වඩා සුදුසුය.

■ කිරි භාවිතයේදී මේද රහිත කිරි වඩා සුදුසුය.

■ තේ කොපමන බීවත් කම් නැත. එහෙත් දිනකට කෝපි කෝප්ප තුනකට වඩා බීම සුදුසු නැත. කවර පානයක් වුවද සීනි භාවිතා නොකිරීම වඩා සුදුසුය.

■ මාළු වඩාත් සුදුසුය. මාළුවල ඇති ඕමේගා-3 මේද අම්ලය හෘදයට වඩාත් හිතකරය. රුධිර කොලොස්ටරෝල් අඩු කර හෘදයාබාධයකින් ආරක්ෂා වීමට ඕමේගා-3 සංඝටකය උපකාරී වේ. සැමන්, හුරුල්ලා, සාලයා වැනි කුඩා මාළුවල මේද වර්ගය බහුලව තිබේ.

■ සම ඉවත් කරන ලද කුකුළු මස් එතරම් හානිකර නොවේ. එහෙත් නිතර ගැනීම සුදුසු නැත.

■ කෙඳි සහිත එළවළුද පලතුරුද වැඩිපුර ආහාරයට එකතු කර ගන්න. පලා වර්ග මෙන්ම රනිල ඇට වර්ගද වඩාත් සුදුසුය.

■ සුදුලූනු, රතු පැහැ ලූනු හෘදයට හිතකර වේ. ඒවායෙහි රුධිරය කැටි ගැසීමේ හැකියාව අඩු කිරීමේ ගුණයක්ද පවතී. සුදුලූනු අමුවෙන් කෑම සුදුසු නැත. බඩේ දැවිල්ල ඇති විය හැකි බැවිනි. දිනකට සුදුලූනු ග්‍රෑම් 50 ක් පමණ ව්‍යංජනයක් ලෙස පිස කෑමෙන් රුධිරගත කොලොස්ටරෝල් ප්‍රමාණය අඩු වෙයි.

■ ලුණු භාවිතයද අඩු කළ යුතුය. පමණට වඩා ලුණු දැමූ කටගැසුම්, බැදුම්, සහ කෙටි කෑම වර්ග ගැනීම හැකිතාක් අඩු කළ යුතුය.

■ පිපාසයට සුදුසුම පානය පිරිසුදු ජලයයි. උණුකර නිවාගත් ජලය නැති නම් ඇල්වතුර දිනකට බෝතල

**39 වන පිටුව බලන්න**


MATTRESS !!!
MATTRESS !!!
MATTRESS !!!
Huge Manufacturer's Sale
Factory Direct Mattresses
Visit Our Factory Showroom Today
RayZzz
Personalize Your Mattress
RayZzz Custom Mattresses
31 Progress Ave. Unit 24
Scarborough Ont. M1P 4S6
(Kennedy Rd & Hwy 401)
Tel : 647 786 0865
Email : rayzzzcustommattresses@gmail.com


Century 21
Leading Edge Realty Inc. Brokerage
invis
Canada's Mortgage Experts™
THUSITH WEERASURIYA
REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT
416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM
"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"
T
Bus: 905-405-8484 Fax : 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.
Markham
165 Main St N.
Scarborough
1825 Markham Rd.
Ajax
527 Kingston Rd. W
Toronto North
1053 McNicoll Ave.
Yorkville
1300 Bay St.
Stouffville
6393 Main St.
Whitby
408 Dundas St. W
Don Mills
801 York Mills Rd.
Designed@niukraids.ca


"Committed To Turning Your Dream Home Into Reality"
Dissa
Dissanayake Danapala Mudiyanselage
B.A., PGDIP in Urban Development
Sales Representative
Committed to meeting your real estate services.
Let us discuss your requirements.
Contact me @ 416- 697 9925, no obligation
dissahomes@gmail.com
Century 21
Percy Fulton Ltd.
Brokerage* Office:416-289-8200
2911 Kennedy Rd, Toronto, M1V 1S8
MLS
MULTIPLE LISTING SERVICE
REALTOR


HEATING
COOLING
RUUD
TRANE
Amana
HEIL
• Install Repair Service
• Furnace and Air condition
• Roof top Units Heating / Cooling
• Water Heaters
• Humidifiers
• Electronic Air cleaners
• Ultraviolet Air Treatment
• Gas stove and Gas Dryer
• Gas piping
Rheem
Carrier
Goodman
YORK
LENNOX
Coleman
Day & Night
bryant
Comfortmaker
TEMPSTAR
Climax Comfort Air
Your Comfort is our Satisfaction
Contact: Kithsiri Mallawaarachchi
Certified Gas Technician TSSA Authorize Contractor
Call 416-889-5796
www.climaxcomfortair.com
7/24 Emergency service
REPAIRS ON ALL MAKES AND MODELS WARRANTY ON REPAIRS


LAL LAW OFFICE
❖ Real Estate
❖ Mortgages
❖ Immigration Law
❖ Family Law
❖ Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com



10 කොටස

පියදාස වැලිකන්නගේ

# එයා හරි අපූරු ළමයෙක්

තෙමසකට පමණ පසු වත්තේ වැඩ කරමින් සිටි එක් දිනෙක මා ඉදිරියෙන් සෙවණැල්ලක් වැටෙනු මට පෙනිණ. මම වහා කර ඔසවා බැලීමි. වතු අධිකාරි සුදු මහතා මා දෙස බලාගෙන සිටී. මම බියපත්ව "අම්මේ...." යි හඬ නැගීමි. සෙවණැති ගල්පොත්තක් මත ඉඳගෙන බුලත් විටක් සපමින් මට පිටු පා සිටි අම්මා හැරී බැලුවාය. වතු අධිකාරිවරා දුටු කෙණෙහි මටත් වඩා බියපත් වූ ඇය හුන් තැනින් නැඟී වහා ඔහු වෙත ආවාය.

"මේ කවුද...?" මා වෙත අත දිගු කරමින් ඔහු අම්මාගෙන් ඇසීය. වචන උච්චාරණය කළ විදියත්, අම්මා දෙස බැලූ විදියත් අනුව ඔහු කෝපයට පත්ව ඇතැයි මට සිතිණ.

"මයෙ පුතා හාන්දුරුවනේ..." ඇය උත්තර දුන්නේ පපුව මත දෑත් තබා වැඳගෙනය.

"ඉස්කෝලෙ යනවද...?"

"එහෙමයි අර තියෙන්නෙ පොත් ටික...." ගසක් යට තබා තිබුණ මගේ පොත් වෙත අතක් දිගු කරමින් අම්මා කීවාය.

"කොයි ඉස්කෝලෙටද යන්නෙ?"

"මැදවෙලගම ඉස්කෝලෙට"

"කීවෙනි කැලෑසියෙද?" අම්මා මා දෙස බැලුවාය.

"හතරවෙනි පන්තියේ" මම කීවෙමි.

"වත්තෙන් පඩි ගෙවනවද?"

"නෑ මයෙ පුතා තේ වත්තෙ වැඩ කරනවට මලරම්බන් කන්කානි ගානේ සුමාන දෙකකට රුපියලක් දෙනවා හාන්දුරුවනේ..."

"කීයටද වැඩට එන්නේ....?"

"ඉස්කෝලෙ ඇරිලා දෙක වෙන්ට ඉස්සෙල්ලා එනවා...."

"කොහොමද හරියටම දෙක වෙන්න ඉස්සෙල්ලා එනවයි කියල කියන්නෙ....?"

"හාන්දුරුවනේ ආං අර කළුගල් පර්වතයට ඉර මුදුන් වෙන්නෙ දෙකට විතරය කියලයි කියන්නෙ...." උතුරු දෙසින් පිහිටි දැවැන්ත කළුගල් පර්වතයට සිය දකුණතේ දබරැගිල්ල දිගු කරමින් අම්මා කීවාය. ඒ කතාව ඇසූ වතු අධිකාරී මහතා වහාම තම අත බැඳි ඔරලෝසුව දෙසත් කළුගල් පර්වතය දෙසත් බලා ඉර දෙසද බැලීය. ඔහුගේ කට කොනට සීන් සිනාවක් නැගෙනු මගේ නෙත ගැටිණ.

"දවල්ට කන්නෙ...?"

"මං උදේ එනකොට ගේනවා... පුතා එන්නෙ මයෙ උදව්වට හාන්දුරුවනේ...." ඔහු මා දෙසත් අම්මා දෙසත් යටිතොල හපාගෙන මඳ වේලාවක් බලාගෙන සිට අඩි පාර දිගේ බිමට නැඹුරු කොට ගත් හිසින් යුතුව ගමන් කරන්නට විය. නොපෙනී යන තෙක්ම අම්මාත් මමත් ඔහු දෙස බලාගෙන සිටියෙමු.

"උඹ හෙට ඉඳල මගේ උදව්වට එන්ට එපා පුතේ...." අම්මා දිග සුසුමක් ඉහළට ඇද දුකින් මෙන් කීවාය.

"ඇයි...? සුපිරින්ටැන් මහත්තයා වත්තේ වැඩ කරන්නට එපාය කියල මට කිව්වෙ නෑනෙ...."

"ඒ වුණාට උඹ වැඩ කරනවාට කැමති නැතිවා වගෙයි. මයෙ හිතේ ලොකු බණ්ඩා මොකක් හරි අංචියක් අදින්ට ඇති..."

එදා හවස අම්මාගෙන් ඒ පුවත දැනගත් පොඩිමැණිකේ නැන්දා, "උඹට පිස්සුද බං ඕකාට සුපිරින්ටැන් මහත්තයා ළඟටවත් යන්ට පුළුවන්දැ" යි ප්‍රශ්න කළාය.

"ඒකත් ඇත්ත...." අම්මා නැන්දාගේ කතාව අනුමත කරමින් යන්තමට හිස වනනු මට පෙනිණ.

"ඔය ඉතින් අපි ලබා උපන් හැටි තමයි අක්කෙ.... ගෙදර මිනිහා ළඟ නැති අනුකම්පාවක් ඒ මිනිස්සු ළඟ තියේවියැ...." මඳ වේලාවකට පසු අම්මා කීවේ ලුණුගල කන්ද මතින් පෙනෙන හිස් අහස දෙස බලාගෙනය.

"දවස් තුන හතරක් යනකන් උඹ ඔහොම හිටපන්කො. මං මලරම්බන් කන්කානිගෙන් අහල බලන්නම්. ඒ මනුස්සයත් මේ දවස්වල යාපනේ ගිහිල්ලලු..." අම්මා දිග සුසුමක් ඉහළට ඇද ළය සැහැල්ලු කරගන්නට උත්සාහ කරන සැටියක් පෙනිණ.

එතැන් සිට අම්මා වත්තේ වැඩට ගිය සෑම දිනකම මා සවස් වරුව ගත කළේ බඩවැටි ගානෙත්, කනතු ගානෙත් ඇවිදිමිනි. ලේනුන් දත ගැසූ ඉදී වැටුණ පුවක් එකතු කරමිනි. දහවල් කාලයේ ගස් යට වැටුණ පුවක් එකතු කරන කීප දෙනෙකු සිටි නිසා දවසකට පුවක් ගෙඩි විසිපහකට තිහකට වඩා මට අහුලාගත නොහැකි විය.

මම ගමේ ළමයි සමග 'මිරියරොඳ' කැළයට යමි. ගස් නැග අඹ කඩාගෙන එමි. නොඑසේ නම් කොස් ගසකට හෝ දෙල් ගසකට නැග කොස් ගෙඩියක් හෝ දෙල් ගෙඩි දෙක තුනක් කඩමි. ඒ කිසිවකට සිත නොදුන් විට කරන්නේ වත්ත පහළ වළවල් හාරා මඤ්ඤොක්කා දඬු සිටවීමය. නැතහොත් බතල පාත්තියක් හෝ එළවළු පාත්තියක් සකස් කිරීමය. එවන් අවස්ථාවල අක්කාද මට උදව් කළාය.

"උඹත් හරියට අම්මා වගේ තමයි. වැඩක් නැත්තම් වැඩක් හදාගෙන හරි කරනවා..." මට උදව් කරන අක්කා සිනාසෙමින් කී අවස්ථාද ඇත.

දෙසතියකට පමණ පසු වත්තේ සිට පැමිණි අම්මා කී කතාව මටත් අක්කාටත් අදහගන්නට බැරි තරම් විය.

"ඕං මෙදා පාර නම් මදියි නොකියන්නට දෙයියො අපේ මූණ බලලා තියනවා...." යි කියමින් මහත් උද්යෝග යෙන් කතාව පටන් ගත් ඇය කීවේ අනියම් පදනම මත සතියේ දවස් හයම තේ වත්තේ වැඩ කරන්නට තමාට අවසර දුන් බවත්, හවස් වරුවේ මගේ වැඩ කුලිය වශයෙන් දවසකට සත විසිපහ බැගින් ගෙවන්නට වතු අධිකාරි මහතා තීන්දු කර ඇති බවත්ය.

"කවුද අම්මට ඕවා කිව්වෙ...? මලරම්බන් කන්කානිද?" මම මහත් සතුටින් යුතුව හඬ නගා ඇසීමි. අක්කා සිටියේ අම්මා කුමක් කීවේදැයි සිතාගත නොහැකිව අන්ද මන්ද තත්ත්වයට පත් එකියක් මෙනි.



"මලරම්බන් කන්කානි යාපනේ ගිය ගමන් ලෙඩ වෙලා තාම ඇවිල්ල නෑ. මට කන්තෝරුවට එන්ට කියල ඔය කතාව කිව්වෙ දෙවෙනි සුපිරින්ටැන් මහත්තයා. ඔය කතාව අහලා පොඩිමැණිකේ අක්කා පුදුම වුණා. ලොකු මහත්තුරු දන්නේ නෑ උඹ වැඩට එනවද නැද්ද කියන එකවත්. සුපිරින්ටැන් මහත්තයා ඇවිත් ගියාට පස්සෙ තමයි මං ගැනයි උඹ ගැනයි කතා වෙලා තියෙන්නෙ...."

"ලොකු සුපිරින්ටැන් මහත්තයද ඔය විදියට අම්මටයි, මල්ලිටයි වැඩ දෙන්ට කියල තියෙන්නෙ...." අක්කා ඇසුවාය.

"ඔව්..."

"ඉතින් අම්මට ඒ ලොකු සුපිරින්ටැන් මහත්තයා හම්බවුණේ නැද්ද...?" මම ඇසීමි.

"නෑ...."

"කොහේද ඔය කන්තෝරුව තියෙන්නෙ අම්මේ....?"

"තේ පැට්ටේරිය ළඟ...."

"අපේ අප්පෝ හරි දුරයිනෙ...." අක්කා විමතිය පළ කරමින් කීවාය.

"ඔව් මං වැඩ කරන තැන ඉඳලා හැතැම්ම තුනක් විතර යන්ට ඕනෑ...."

"ඉතින් අම්මා තනියෙන්ද ගියේ...?"

"නෑ.... මට එන්ටය කියලා පණිවිඩේ ගෙනාපු දෙමළ මිනිහත් එක්ක. ඒ මිනිහා කන්තෝරුවේ පියුම්ද මොකක්ද එකක් කරනවයි කිව්වා..."

"ඒක නම් දෙයියො අපේ මූණ බලලා මදියි නොකියන්ට කරපු වැඩක් තමයි අම්මේ...."

කිසිසේත් බලාපොරොත්තු නොවූ මොහොතක කිසිසේත් බලාපොරොත්තු නොවූ පුවතකින් අපේ සිත් තුළ තෙරපෙමින් නැගෙන්නට පටන් ගත් සතුට බැලූ බැලූ අත විසිරී පැතිරී යන්නා සේ මට පෙනිණ. සියලු දුක් කම්කටොලු හෙමින් අවසන් වෙනු ඇතැයිද හැඟිණ.

"දවසකට සත විසිපහ ගානේ සුමානෙකට කීයද මල්ලියේ...?"

"එකයි පනහයි..."

"සුමාන දෙකට...?"

"රුපියල් තුනයි. මාසෙකට රුපියල් හයයි...."

"අපෙ අප්පෝ..." යි කියමින් අක්කා මහත් සතුටින් කෑ ගැසුවාය.

පාසල් යන සහ නොයන ගමේ බොහෝ ළමයි මිරියරොඳ කැළයට වැදී ගස් බඩගාමින්, ගඩාගෙඩි කඩාගෙන කමින්, ඇළේ දොළේ පැන නාමින්, සෙල්ලම් කරමින් සිය විවේක කාලය ගත කළහ. අම්මාගෙන් හෝ අප්පච්චිගෙන් පැනවුණ කිසි තහංචියක් නොතිබුණද මා ඔවුන් සමග එක්වූයේ කලාතුරකිනි. අම්මා තනිව ඔසවාගෙන යන අපේ ජීවිතවල බර කිසියම් පමණකින් නමුත් අඩුකරන්නට මම මගේ ළමා කාලය කැප කළෙමි. ගමේ ළමයින් අර විදියට කාලය ගත කරද්දී මම වැඩ කිරීමෙනුත්, ඉගෙනීමෙනුත් සතුටක් ලැබීමි. බොහෝ දෙනෙකුට මා අමුතු ජාතියේ ළමයෙකු ලෙස පෙනෙන්ට ඇත්තේ මතක තබා ගැනීමේ ශක්තියත් අර විදියට වැඩ කිරීමත් නිසා විය හැකිය. එහෙත් මට ළමා කාලයක් නොතිබුණ බව වැටහුණේ බොහෝ කලකට පසුය.

නංගී පහළ බාලාංශයට බාර දෙන ලද්දේ ඒ වසරේ මැද බාගයේදීය. මා සතරවෙනි පන්තියේ ඉගෙන ගනිමින් සිටි කාලයේය. අම්මත් නංගීත් පාසලට පැමිණියහ. මම ඔවුන් ලොකු මහත්තයාගේ කාමරය වෙත කැඳවාගෙන ගියෙමි. එදා එතැනදී පැන නැගුණේ ඉතා බරපතල ප්‍රශ්නයකි.

"මේ අප්පුහාමිගෙ නංගිද?" ලොකු මහත්තයා අම්මාගෙන් ඇසීය.

"එහෙමයි... ගුරුන්නාන්සේ මහත්තයා..." ලොකු මහත්තයා ලොකු පොතක් පෙරළා ගත්තේය.

"මොකක්ද නම...?"

"ඩී. ඇම්. බණ්ඩාර මැණිකේ"

"ඩී. ඇම් කියන්නෙ...?"

"දිසානායක මුදියන්සේලාගේ" ලොකු මහත්තයා මා දෙසත් නංගී දෙසත් මහත් ඕනෑකමින් බැලීය. අනතුරුව ඔහු ලොකු පොතේ පිටු කීපයක් පෙරළා බලා "මේ ළමයින් දෙන්නා අප්පච්චිලා දෙන්නෙකුගේදැ..." යි අම්මාගෙන් ඇසීය. ඇය නොඉවසිලිමත් ගතියෙන් වටපිට බැලුවාය.

"අප්පුහාමිගෙ වාසගම දීල තියෙන්නෙ රත්නායක මුදියන්සෙලාගේ කියලනෙ..." ලොකු මහත්තයා එසේ කියත්ම අම්මා මගේ මූණ දෙස බැලුවාය. එහෙත් කුමක් කිව යුතුදැයි මට සිතාගත නොහැකි විය.

"අප්පුහාමි ඉස්කෝලෙට බාර දෙන්න ආපු රත්නායක මුදියන්සේලාගේ රතුරාල තමන්ගේ කවුද...?"

"අප්පච්චි..." ලොකු මහත්තයා හිස වනමින් හඬ නොනගා සිනාසුණේය.

"එහෙනම් අප්පච්චි වාසගම වරද්දලයි කියල තියෙන්නෙ. උන්දෑ කියල තියෙන්නෙ උන්දැගේ වාසගම...."

"එහෙමයි..."

"එහෙනම් ඒ වැරැද්ද හරිගස්සන්න අප්පුහාමිගේ උප්පැන්නය ගේන්න ඕනෑ. මේ ළමයගෙ උප්පැන්නය ගෙනාවද? "

"නෑ ගුරුන්නාන්සේ මහත්තයා..."

"එහෙනම් ඒකත් ගේන්න ඕනෑ... තේරුණාද? මං ළමයව බාරගන්නම්..."

32 වන පිටුව බලන්න

# ඒයා හරි...

31 වන පිටුවෙන්

"එහෙමයි"

ඒ ගැන අම්මා අප්පච්චි සමග කී විට ඔහු කීවේ "ඕවා කොහෙන් හොයන්නද බං..." යි කියාය.

★ ★ ★ ★ ★

ඊළඟ වසරේ පාසල පටන් ගත්තේ ජනවාරි හත් වෙනිදාය. මා අත වූයේ කලින් වසරේ පස්වෙනි පන්තියේ ඉගෙන ගත් කළුබණ්ඩාගේ පොත්ය. ඔහුගේ පියා ඒ පොත් වෙනුවෙන් මගෙන් සතයක්වත් ගත්තේ නැත.

"කළුබණ්ඩට පොත් ගන්නෙ නෑනෙ. උඹ ඔය පොත් අරගෙන ගිහින් ඉගෙන ගනින්"

කළුබණ්ඩාගේ අප්පච්චි පොත් ටික මා අතට දෙමින් කීවේය. අලුත් අවුරුද්දේ පස්වෙනි පන්තියට ඇතුළු වෙද්දී ඔහුගේ ඒ කතාව මට සිහිපත් වූයේ මන්දැයි මට සිතාගත නොහැක.

කළුබණ්ඩා ගෙදර නැවතුණේ යන්නට පාසලක් නැති කමටය. පහෙන් පසු මගෙත් ඉරණම ඒකද? මැදවෙලගම පාසලේ අවසාන පන්තිය තෙක් ඉගෙන ගන්නට ලැබීමේ සතුටත් ඉන්පසු යන්නට තැනක් නැති කමේ දුකත් දෙපැත්තකින් මගේ හදවත තෙරපන ගතියක් මට දැනිණ.

හැම ළමයෙකුගේම මුහුණුවල ඇත්තේ සතුටකි. සිනාවකි. ඇතැමෙක් අතුපතු ගාති. ඇතැමෙක් සෙල්ලම් කරති. මුතු බණ්ඩාත් මමත් ඩෙස්ක් පුටු පිළිවෙළට තබා ලී රාමුව මත කළුලෑල්ලද තැබීමු. ඉන්පසු ඩෙස්ක් මත පොත් තබා පුටුවල වාඩිවීමු. මට දැනුණේ පන්තියෙන් පමණක් නොව, ඉඳගන්නා තැනින්ද ඉහළට ගොස් ඇති සැටියකි.

"අප්පුහාමි කළුබණ්ඩගේ පොත් නේද ගත්තෙ...?" මුතුබණ්ඩා මගේ පොතක පිටුවක් පෙරළා ඇසීය.

"ඔව් උඹ ගත්තෙ කාගෙ පොත්ද?"

"මල් එතනගෙ පොත්..."

"උන්ට යන්ට ඉස්කෝලයක් නෑ..."

"පහෙන් පස්සෙ අපටත් එහෙම තමයි"

"උඩගම ඉස්කෝලෙ නම් අටට යනකන් පන්ති තියෙනවලු"

"කවුද කිව්වෙ...?"

"කළුබණ්ඩා"

"කළුබණ්ඩා උඩගම ඉස්කෝලෙට යනවයි කිව්වද?"

"නෑ... දුර වැඩියිලු...."

එදින උදේ රැස්වීම පැවැත්වුණේ පාසල් මිදුලේය. ඒ ඒ පන්තිවල ළමයි පෙළින් පෙළට සිටගෙන සිටියහ. ළහිරු කිරණ දෝරේ ගලා යමින් තිබිණ. ලුණුගල කඳුවැටිය දෙසින් හමා එන මුදු මද පවනේ සිසිල් ගතියත්, ළහිරු කිරණේ ළා උණුසුම් ගතියත් එකට එකතු වී, අපේ ඇඟපත පමණක් නොව සිතද සනහාලන්නා සේ මට දැනිණ. ලොකු මහත්තයා සුපුරුදු පරිදී පන්සිල් දීමෙන් පසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් අමතන්නට විය. ඔහුගේ මූණ සතුටින් පිරී ඇතිවා සේ මට පෙනිණ.

"යුද්ධය අවසන් වෙච්ච හින්දා රටේත්, මහජනයාගේත් දියුණුවට හුඟක් වැඩ කරන්නට පටන් ගෙන තියෙනවා. තව මාසයකින් හමාරකින් අපේ ඉස්කෝලෙට අවශ්‍ය තරම් ඩෙස්ක්, පුටු, කළුලෑලි ලැබේවි. අලුතෙන් ඉස්කෝල ගොඩනැගිල්ලකුත් හදන්න තීරණය කරලා තියෙනවා කියලත් මට දැනගන්නට ලැබුණා. ඒ එක්කම වැසිකිළි, කැසිකිළිත් හැදේවි. එහෙම වුණහම මැදවෙල ගමේත්, අවට ගම්වලත් ඉන්න ළමයින්ට වැහිදාට තෙමී තෙමී ඉගෙන ගන්න සිද්ධ වෙන්නෙ නෑ. ඒ එක්කම තවත් වැදගත් කාරණයක් කියන්න තියෙනවා. පසුගිය අවුරුද්ද වෙනකම්ම මේ ඉස්කෝලෙ ළමයින්ට පස්වෙනි පන්තියෙන් පස්සෙ ඉගෙන ගන්නට යන්න තැනක් තිබුණේ නෑ. පහෙන් පස්සෙ කවුරුත් ගෙවල්වල නැවතුණා. මේ අවුරුද්දෙ ඉඳලා දක්ෂ ළමයින්ට ඒ විදිහට ගෙදර නවතින්න වෙන්නෙ නෑ..." ලොකු මහත්තයා එසේ කියත්ම මගේ සිරුර පුරා අමුතු උණුසුම් ගතියක් පැතිරීගෙන යන්නා සේ මට දැනිණ. මම වඩාත් ඕනෑකමින් ඔහුගේ කතාවට කන් දීගෙන සිටියෙමි.

"අගෝස්තු මාසේ පහේ ශිෂ්‍යත්ව විභාගය කියල ආණ්ඩුවෙන් විභාග යක් පවත්වනවා. ඒ විභාගෙන් පාස් වෙන පහේ ළමයින්ට පස්සර මධ්‍ය විද්‍යාලයට යන්න පුළුවන්. ඒ ළමයින්ට උගන්වන්නෙ ආණ්ඩුවේ වියදමින්. කෑම බීම ඔක්කෝම ආණ්ඩුවෙන් දෙනවා. ඒ ඉස්කෝලෙම නැවතිලා ඉගෙන ගන්න පහසුකමුත් තියෙනවා. හැබැයි උගන්වන්නෙ ඉංග්‍රීසියෙන්. ඒක එච්චර අමාරු වැඩක් නෙවි. ඉංග්‍රීසි උගන්වන නෝනලා, මහත්වරු පස්සර ඉස්කෝලෙ ඉන්නවා. ඒ හින්දා හැම ළමයෙක්ම බොහොම ඕනෑකමින් ඉගෙන ගන්න ඕනෑ. පහළ පන්තිවල ඉඳලම හොඳින් ඉගෙන ගත්තොත් ශිෂ්‍යත්ව විභාගය පාස් කරන්න එච්චර අමාරු වෙන්නෙ නෑ. ළමයි ඒ තොරතුරු ගෙවල්වලට ගිහින් කියන්න ඕනෑ. ඒ වගේම දිනපතා ඉස්කෝලෙට ඇවිත් ඉගෙන ගන්නත් ඕනෑ. තේරුණාද?"

ළමයි කවුරුත් "එහෙමයි..." කීහ. ඒ හඬ ලුණුගල කන්දේ හැපී දෝංකාර දෙන්නා සේ මට ඇසිණ.

ලබන කලාපයෙන් තවත් කොටසක්









# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2016 දෙසැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### මේෂ ලග්නය

මාසය මුල් දින කීපයේදී ලග්නාධිපති කුජ 10 වැන්නේ ගමන් කරන අතර දෙසැම්බර් 11 වැනි දින සිට 11 වැන්නේ ගමන් කරයි. දියුණුව සැලසෙන ශුභ කාලයකි. රැකියා දියුණුව, තනතුරු උසස්වීම් ලැබීමට භාග්‍යය ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ආදායම් මාර්ග සරු වේ. සඳු ලග්නයේ හෝ 8 වැන්නේ ගමන් කරනවා නම් ප්‍රවේසම් විය යුතු බව සිහි තබාගන්න.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 9 වැන්නේ ගමන් කිරීම ශුභයි. රැකියා තනතුරු ලැබෙන කාලයකි. රැකියා අපේක්ෂිත අයට ඒ සඳහා කැඳවීම් ලැබිය හැකියි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. පදිංචිය වෙනස් වීමට ඉඩ ඇත. ආදායම් මාර්ග සරු වේ.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 7 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. රැකියා, ව්‍යාපාර කටයුතු සාර්ථක වේ. ගේ දොර දේපළ ලබා ගැනීමට අවස්ථාව සැලසෙන භාග්‍යය සහිතයි. සතුරු කරදර පීඩා අඩු වේ. ධන ලාභ ඇත. දියුණුව සැලසේ.

### කටක ලග්නය

මේ මාසය ඇරඹෙන්නේ ලග්නාධිපති සඳු 6 වැන්නේ ගමන් කරමිනි. හවුල් ව්‍යාපාර කටයුතුවලින් ලාභ ලැබේ. රැකියාව, පදිංචිය ආදියෙහි වෙනසක් ඇති විය හැක. වියදම් අධික වන මාසයකි. අධ්‍යාපනයට ශුභයි. මිතුරු මිතුරියන්ගේ ඇසුර යහමින් ලැබේ. මහජන සේවා කටයුතුවල බහුලව යෙදේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 4 වැන්නේ ගමන් කරයි. මේ මස 16 වැනි දින සිට 5 වැන්නේ ගමන් කිරීම අරඹයි. අධ්‍යාපන කටයුතුවල යෙදෙන්නන්ට ශුභ කාලයකි. විභාග ජය ලැබේ. රැකියා දියුණුව ඇති කෙරේ. අලුතෙන් ආරම්භ කරන කටයුතුවල දියුණුව සැලසේ. ගමන් බිමන්, වැඩකටයුතු අධිකව යෙදෙන කාලයකි.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 4 වැන්නේ ගමන් කරයි. බුද්ධිමත්ව තම කාර්යයන් කර ගැනීමට පුළුවන. සතුරු කරදර අඩුය. ප්‍රේම සබඳතා ඇති වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. කලා අංශයට වඩාත් ලැදියා-වක් දක්වයි. රැකියා දියුණුව, තනතුරු ලැබීම ආදියට වාසනාව ඇත. ස්ථාන මාරු සිදුවිය හැකි කාලයකි.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 4 වැන්නේ ගමන් කරයි. තම වැඩ කටයුතු සාර්ථකව කර ගැනීමේ භාග්‍යය ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. රැකියා, ව්‍යාපාර ආදි අංශවලින් දියුණුව සැලසේ. ආගමික කටයුතුවලට යොමු වේ. ගේ දොර මිල දී ගැනීමට අවස්ථාව සැලසේ. වියදම අධික කාලයකි.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 3 වැන්නේ ගමන් කරන අතර මේ මස 11 වැනි දින 4 වැන්නට පැමිණේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. රැකියා දියුණුව ඇති කෙරේ. බාධක මැඩ ඉදිරිපත් වීමේ හැකියාව ඇති වේ. වචනය බලවත් වේ. අලුත් අලුත් දේ ඉගෙනුමට සිත් දේ. හදිසි තීරණ ගැනීමට සිදුවිය හැක. ධන ලාභ සහිත කාලයකි.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 10 වැන්නේ ගමන් කරයි. රැකියා කටයුතුවලින්, වෙළඳ ව්‍යාපාරවලින් දියුණුව සැලසේ. තනතුරු උසස්වීම් ලැබීමටත් ඉඩකඩම් මිල දී ගැනීමටත් භාග්‍යය ඇත. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. කරන වැඩකටයුතු සාර්ථක වේ. ධන ලාභ ඇත.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. ආදායම් මාර්ග සරු වේ. බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාව, තම වැඩකටයුතු හොඳින් කර ගැනීමේ භාග්‍යය ඇත. රැකිරක්ෂා කටයුතු සාර්ථක වේ. පිනට දහමට වඩාත් යොමු වන කාලයකි.

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 10 වැන්නේ ගමන් කරයි. රැකියා, තනතුරු ලැබීමෙන් දියුණුව සැලසෙන ශුභ කාලයකි. රැකියාවේ සහ පදිංචියේ වෙනසක් සිදුවිය හැක. තම මතයට වැඩ කිරීමට සිත් දේ. වැඩ කටයුතු අධිකව යෙදෙන කාලයකි.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 7 වැන්නේ ගමන් කරයි. රැකියාව, පදිංචිය ආදියෙහි වෙනසක් ඇතිවිය හැක. අලුත් රැකියා ලැබීමට හා ව්‍යාපාර කටයුතුවලින් ලාභ ලැබීමට වාසනාව ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. සිතිවිලි අධික වේ. සංචාරක ගමන් බිමන් ඇති වේ.



එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca



# වැස්ස ගැන නුවරකලාවියේ නිර්මාණාත්මක ජනවහර

■ ඩබ්. එම්. ඩී. වන්නිනායක

'වැස්ස' යන වචනය අප රටේ එක් එක් පළාත්වල ජීවත්වන ජනතාවට ඔවුන් මුහුණ දෙන දේශගුණික ගැටලු ආශ්‍රිතව විවිධ හැඟීම් ජනිත කරවන පදයකි. වැස්ස පිළිබඳව වියළි කලාපයේ ජනතාව තුළ පවතින ආකල්පය, තෙත් කලාපයේ ජනතාවට වඩා හාත්පසින්ම වෙනස් වේ. වසරේ මාස අටක් හෝ නමයක් නියග යෙන් බැට කන නුවරකලාවියේ ජනතාවට නම් වැස්ස යනු සොබාදහමේ ආශිර්වාදයකි. එම නිසා 'වැස්ස' යන පදයට සාපේක්ෂව නුවරකලාවියේ බස්වහර තුළ රසවත් මෙන්ම නිර්මාණාත්මක යෙදුම් ගණනාවක් දක්නට ලැබේ.

## දුරුතු වැරහැල්ල

සාමාන්‍යයෙන් අප දන්නා පරිදි නව වසරක් ඇරඹෙන්නේ ජනවාරි මාසයෙනි. ජනවාරි මාසයෙන් පටන්ගෙන දෙසැම්බර් මාසය දක්වා නුවරකලාවියට විවිධ අවස්ථාවලදී ලැබෙන වැස්ස හැඳින්වීමට ඔවුන් විවිධ නම් හා යෙදුම් යොදාගෙන තිබේ. ජනවාරි මාසයේ හෙවත් 'ජනේරුවට වැහි ඇල්ලක් දෙකක් වැටීම සාමාන්‍ය දෙයක් බව නුවරකලාවියේ ගැමියා අත්දැකීමෙන්ම දන්නා කරුණකි. ඔවුන් මෙය හඳුන්වන්නේ 'දුරුතු වැරහැල්ල' නමිනි. දුරුතු වැරහැල්ල යනු උඳුවප් මාසයේ එක දිගට වහින වැසි අවසන් වූ පසු ඉඳහිට වහින වැස්සක් වුවද මෙම වැහි එතරම් තදින් වැටෙන වැහි නොවේ.

## ගමං වැහි

නුවරකලාවියට අධික වැස්සක් ලැබෙන්නේ ඊශාන දිග මෝසම් සුළඟින් වන අතර පෙබරවාරි මාසය අවසන් වන විට 'හුළං හැරවීම' සඳහාද වැසි ඇද හැළෙති. හදිසියේම මෙන් නිරිත දිගින් පාවී එන වැහි කළුවක් දෙකක් නිසා එක්වරම වැහි ඇද වැටේ. එහෙත් මෙම වැසි 'අල්ලා හිටින වැහි' නොවේ. ඒවා හඳුන්වන්නේ 'ගමං වැහි' ලෙසටයි. ගමං වැහි යනු එක්වරම කඩා වැටී විනාඩි දෙක තුනකින් අවසන් වන වර්ෂා විශේෂයකි.

## තල වැහි

සාමාන්‍යයෙන් 'යල් කන්නයට' හේන් කෙටීම ආරම්භ කෙරෙන්නේ පෙබරවාරි මාසයේ මුල පටන්ය. යල් කන්නෙට එතරම් තදින් වර්ෂාව නුවර කලාවියට නොවැටෙන නමුත් හේන් පිටිවල ගොඩ බෝග වැපිරීමට සෑහෙන පරිදි වැසි ලැබේ. විශේෂයෙන්ම මාර්තු මාසයේ මාසේ පෝය ගෙවුන පසු ලැබෙන වැසි දෙක තුන ගැමියෝ හඳුන්වන්නේ 'තල වැහි' යන නමිනි. හේන් සකස් කර ගැනීමේදී කැළය කපා දමා ඒවා ගිනි තැබීමෙන් පසු 'අළු හුළඟේ ගසාගෙන යෑමට' ඉඩ නොදී තල වැපිරීම සඳහා වැටෙන වැස්ස 'තල වැහි' වේ. මෙහිදී ගොවියෝ තල වැහි අල්ලා හේන්වල තල වපුරති. තල වැපිරීමට වහින වැස්ස 'තල වැස්ස' නම් වේ. මෙම තල වැහි දෙක තුන හැරෙන්නට මාර්තු මාසයේදී සැලකිය යුතු තරම් වැස්සක් නුවරකලාවියට නොලැබේ.

## බක්මහ අකුණු

අප්‍රේල් හෙවත් බක් මාසය යනු නුවරකලාවියට මහවැසි වැටෙන සමයකි. 'බක්මහට අකුණු ගහන්නැහේ', 'බක් මහේ අකුණු, 'බක් මහට අකුණු හැටයි-වැහි හැටයි' වැනි යෙදුම් ගැමි වහරේ ඇතුළත් වීම තුළ මෙම මාසයේදී අධික වැස්සක් ලැබෙන බව ඇඟවේ. වපුරන ලද තල මේ වනවිට ඉතා හොඳින් පැළවී තිබෙන අතර බක් මහේ වැසිත් සමග 'පැළපත' හොඳින් වැඩී ඇතැම් විට තල ගස් අඩි හතරක් හෝ පහක් දක්වා වැඩී යයි. හොඳින් තල වැවුණු හේනකට ඇතුළු වන විට 'එක හීරුවට' විහිද ඇති ලා දම් පැහැති තලමල් යාය ඉතාමත් සුන්දර දසුනකි. සාමාන්‍යයෙන් තල මල් පිපෙන්නේ වෙසක් කාලයට වන අතර ගැමි කාන්තාවෝ වෙසක් පෝයට පන්සල් යන විට තල මල් පූජා කිරීම සඳහා ගෙන යනු මම බොහෝවිට දැක ඇත්තෙමි. වන්නියේ වනාන්තරවල වැඩිපුර මී වද බඳින්නේ තලමල් පිපෙන කාලයට වන අතර තලමලේ මී පැණි ඉතාමත් මිහිරි බවද අසා ඇත්තෙමි.

## වෙසක් හුළඟ

නුවරකලාවියට උදාවන තද නියං සමයේ ආරම්භය සිදුවන්නේ වෙසක් මාසය අවසන් වන විටයි. මෙම මාසය තුළ වැසි වසින්නේම නැත. නිරිත දිගින් හමන වේගවත් සුළඟ උතුරුමැද තැනිතලාව ඔස්සේ වේගයෙන් හමා යන්නේ වැව්වල ඇති සියලුම ජලය වාෂ්ප කරවමිනි. නිරිත දෙසින් රටට ඇතුළු වන ජලවාෂ්ප සහිත තෙත් වළාකුළු බස්නාහිර හා වයඹ ප්‍රදේශවලට වැසි වස්වා අනතුරුව නුවරකලාවිය හරහා වේගයෙන් හමා යයි. 'වෙසක් හුළඟ' ලෙස ගැමියන් හඳුන්වන මෙම සුළඟ වියළි කර්කශ දේශගුණික තත්ත්වයක් අඟවයි. එසේ වුවද ගහ කොළ මල් ඵලවලින් පිරී ඇති මෙම කාලය මැයි මාසයේ සිට අගෝස්තු මාසය අවසානය දක්වා පවතී.

## මළුව හෝදන වැස්ස

ඊළඟට පැමිණෙන පොසොන් පෝයට අටමස්ථානය වන්දනා කිරීම සඳහා අනුරාධපුරයේ උඩමළුවට පැමිණෙන දහස් ගණන් ජනතාව නිසා අනුරාධපුර මුළු පූජා භූමියම දූවිල්ලෙන් හා ඔවුන් රැගෙන එන දෑවලින්ද හදිසියේම බිහිවන කඩපිල් නිසාද අපවිත්‍ර වේ. මේ නිසා පොසොන් පෝයට පසු වැටෙන තද වැස්ස නුවරකලාවියේ ගැමියන්ට අනුව 'මළුව හෝදන වැස්ස' යන නමින් හැඳින්වේ. එම වැස්සට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටින උඩමළුව මෙන්ම රුවන්මැලි සෑ මළුවේ දූවිලිද සෝදාගෙන ගොස් මළුව පිරිසිදු වේ යැයි අහිංසක ගැමියෝ සිතති. මහා මළු දෙක පිරිසිදු කිරීම සඳහා වසින වැස්ස 'මළුව හෝදන වැස්ස' වේ.

## ඇහැළ හුළං

නුවරකලාවියේ ප්‍රධාන වගා කන්නය වන මහ කන්නය හෙවත් මාස් කන්නය සඳහා හේන් කෙටීම ඇරඹෙන්නේ ඇසළ මාසය අවසානයේයි. මෙම මාසය තුළද තද සුළං සහිත වියළි දේශගුණයක් නුවරකලාවිය පුරාම දක්නට ලැබෙන අතර 'වැව් පිටි පැළිවලං පැළී' වැව් සියල්ලම වියළී යෑමට පටන් ගනී. ඇහැළ හුළඟ කෙතරම් වේගයෙන් හමන්නේද යත් 'ඇහැළ හුළං අඹ හොල්ලං - නැටි මිරිකා බිමට දමං' යැයි කාව්‍යානුරූපී යෙදුමක් මෙහි ගැමියෝ වහරන්නේ සුළඟේ වේගවත් බව හැඟවීම සඳහාය.

## බටු පුපුරණ අව්ව

අගෝස්තු හෙවත් නිකිණි මාසයේ වැටෙන 'පෙතං පුපුරණ අව්ව' නැතහොත් 'බටු පුපුරණ අව්ව' යන නම්වලින් හැඳින්වෙන ගිනි කාෂ්ඨක අව්ව නිසා කෙටූ වල් හොඳින් වියළී යයි. විශාල වනාන්තරවල 'අන්දර හැමර' කපා පාගා ලවල් මිටි කරල එක්තරා රටාවකට ගොවීන්ගේ පාමුල තැලී පොඩිවී යයි. 'වාංහාං' හෙවත් 'වාම්පතුල්' දමා දෙපයෙන් තලා වල් මිටි කිරීම එක්තරා අන්දමකට රටාවකට කළ යුතුය. 'වාම්පතුල්' යනු අන්දර, කිහිරිය, එරමිණිය හා කරඹ වැනි කටු සහිත පඳුරුවලින් තම දෙපතුල් ආරක්ෂා කර ගැනීම සඳහා ගෝන, මුව, හෝ මී හරක් සම්වලින් තනා ගන්නා පාවහන් විශේෂයකි.

## වල් යටින් වතුර යන වැස්ස

අගෝස්තු මාසයේ 'ගිනි පුටක අව්වේල නියගෙන් කරවී යන ලවල් කෙටූ හේන' යටින් වතුර යෑම සඳහාද අගෝස්තුවේ හෝ සැප්තැම්බරයේ මාසයේ වැසි වසති. මෙම වැස්ස 'වල් යටින් වතුර යන වැස්ස' ලෙස හඳුන්වන අතර කුට්ටි කර කැපූ කැලය වැස්ස නිසා පිළිස්සීම සඳහා හොඳින් තදවී යයි. ඉන්පසු මාස් වැස්ස ඇරඹීමට ඔන්න මෙන්න කියා තිබියදී හේනට ගිනි තැබීම කරන අතර දැවී ගිය හේනේ අළු සුළඟේ ගසාගෙන යන නිසා වැසි ආසන්න වන තුරු සිටීම ගැමියන්ගේ සිරිතය.

වැස්ස වැටෙන්න ආසන්න වන විට පරිසරයේ සිදුවන යම් යම් වෙනස්කම් වැස්ස ආසන්න වන බවට සාක්ෂි ලෙස ගැමියෝ දකිති. වැවේ වතුර රත්වීම, තද හිරු රශ්මිය, සිරුර දෙකොංශයෙන් දහඩිය දැමීම, වැහිළිහිණියන් පහතින් පියෑඹීම, මාරලුන් හා උකුස්සන් අහස අහසේ හඬ නගමින් පියෑඹීම, මෙන්ම කටුස්සන් කෑගැසීමද, ගහක් කොළක් නොසෙල්වෙන තරමට පරිසරයේ නිහැඬියාව හා වැවේ ජලතලය තෙල් බේරුවක් මෙන් නොසෙල්වී තිබීමද 'වැහි ළකුණු' ලෙස ගැමියෝ සලකති. මෙවැනි වැහි ළකුණු එක දිගටම දින දෙක තුනක් පවතින විට එය මහ වර්ෂාවක් ඇද හැළීමේ ලකුණුය. එවිට 'අද නම් ගල් ළිඳේ මාළු ගොඩ යන්න වහියි' යැයිද 'අද නම් හිටගෙන පස්ස හෝදන්ඩ වහිනවා' යනුවෙන්ද නුවරකලාවියේ ගැමියෝ පවසන්නේ අත්දැකීමෙන් මෙන්ම කවදාවත් දැක නැති නමුත් පාරම්පරිකව කටවහරේ එන ගල් ළිඳක් ගැන සිහිපත් කරමිනි.

## එල්ලැට පැළවෙන වැස්ස

නිකිණි මාසය හෙවත් අගෝස්තු මාසය අවසන් වූ පසුව බිනර මාසය එළඹේ. බිනර මාසයේදී මාස් මෝසම සඳහා නැවත හුළං හැරවීම සිදුවන අතර මේ හුළං හැරවීමේ ක්‍රියාවලිය නිසා හිටි හැටියේ 'වැහි ඇල්ලක් දෙකක්' ඇද වැටේ. ගිනි තැබූ හේන්වල දැවී ගිය පස් තට්ටුව මත ඉතිරිව ඇති පැළවීමට තරම් මුහුකුරා ගිය වල් පැළවල බීජ පැළවෙන්නේ මෙම වැස්සටයි. එම නිසා මෙම වැස්ස හඳුන්වන්නේ 'එල්ලැට පැළවෙන වැස්ස' යනුවෙනි. 'එල්ලැට' යනු පැළවීමට තරම් මුහුකුරා ගිය බීජයි. මෙසේ පැළවෙන බීජ අතර ලෑටිය, තෝර, පිළ ආදිය වේ. එක පොකුරට හිස් මුදුනින් පස් තට්ටුවක් රැගෙන පැළවෙන මෙම වල් පැළෑටි පැළවෙන්නේ 'බලු අඩියට හත පෑගෙන' අන්දමටය. එනම් එක බලු අඩියට පැළෑටි හතක් පෑගෙන තරම් ඝන සැරේට මෙම පැළෑටි පැළවෙන බව ගැමියෝ පවසති.

## මිත්මල් මන්දාරාම

මාස් කන්නයේ ඇරඹුම සනිටුහන් කරමින් නිරිත දිග සිට ඊසාන දෙසට පාවී යන වැහි වලා නුවරකලාවියේ ගැමියා හඳුන්වන්නේ 'බිනර කළු' යනුවෙනි. නුවරකලාවිය පුරා ඇති මී ගස්වල මල් පිපෙන්නේ මෙම කාලයටම වන බැවින් පරිසරයේ 'බිනර කළු' නිසා ඇති වන 'මන්දාරම' හෙවත් පරිසරයේ අඳුරු සහගත තත්ත්වය 'මී මල් මන්දාරම' ලෙස සැලකේ. ගැමියෝ තමන්ගේ උච්චාරණ පහසුව තකා මෙය 'මිත්මල් මන්දාරාම' ලෙසද උසුරවති.

## තැල්කොළ මුල්ල

බිනර මාසය අවසන් වී වප් මාසය ඇරඹෙන විට මුළු නුවරකලාවියම 'දෙහෙදු' කරමින් මහවැසි ඇද හැළෙන්නට පටන්ගනී. 'හැමදා නියං එකදා වැහි වළාවේ' කිව්වාක් මෙන් මෙම වැසි මෙතෙක් මරු කතරක්ව පැවැති නුවරකලාවියට මහත් ආශිර්වාදයකි. එහෙත් මෙම ආශිර්වාදය වැඩි කලක් නොගොස් කරදරයක් බවට පත්වේ. බොහෝ විට 'තැල්කොළ මුල්ල' ලෙස හැඳින්වෙන ඊසාන දිගින් මධ්‍යහ්නයේ සිට මුදුන් වෙන වැහි කළු නිසා හවස් වරුවේ ඇරඹෙන නා කපන වැස්ස නැතහොත් දොඹ සුරන වැස්ස සති දෙක තුනක් යනවිට උදෑසන සිටම දවස මුලුක්කාදියේම ඇද හැළෙන වුරු වුරු වැස්සක් බවට පත් වේ. එනිසාම 'පාන්දර එන වැස්සටත්, හවහ එන හොරාටත් බිය විය යුතු නැත' යි ගැමියන් කියන්නේ ඊට මුහුණ දීම සඳහා අවශ්‍ය තරම් වේලාව තිබෙන හෙයිනි. දවස පුරාම ඇද හැළෙන වර්ෂාව නිසා දවසම අඳුරු සහගත බවක් උසුලයි. අන්ද බිහේ, බකුරං බානවා යනුවෙන් ඔවුහු මෙම අඳුරු ස්වභාවය නැතහොත් වැහි කළුවර හඳුන්වති.

## 'පට්ටි ගොහොරුව'

දෙසැම්බර් මාසය හෙවත් උඳුවප් මාසය ආරම්භ වන විට උදේ සිට හවස් වනතුරු 'එක සීරුවට වහින්න' පටන් ගනී. ගැමියෝ 'බැඳගෙන වහිනවා' යැයි කියන්නේ මේ වර්ෂා කාලයටය. 'මේක මුරුගසං වරුසාවද දන්නෑ', 'මේක උඩ බැලුවොත් ආයි හත් අවුරුද්දකට

44 වන පිටුව බලන්න

# AJITH BERAGAMA LL.B, LL.M

BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC



experienced, quality, knowledgeable and affordable service

AB Ajith Law Office

Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law
Wills & Estates Law
Immigration Law
Family Law

**24/7 Hotline - 647 328 6623**

10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6

OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM



# Ceylon Herbal Tea




Benefits of cinnamon tea..

- Positive effect on blood sugar.
- Aid weight loss and belly fat reduction.
- Helps to reduce menstrual discomfort and cramps.




A cup of tea 21 green tea and a life long benefits…

- Helps to reduce cholesterol levels.
- Helps to loose weight.
- Prevent hair loss.
- Contains most amount of anti oxidant polyphenols.
- Skin care and many more...




Benefits of drinking tea 21 hibiscus tea…

- Can prevent pre-cancerous cells from growing by inducing apoptosis.
- Good for heart diseases and diabetes.
- Protects liver
- Relief from cramps and menstrual pain and many more...




Benefits of drinking a cup of black cumin tea…

- Stimulates the energy of the body.
- Decrease fatigue and dispiritedness.
- Anti-hypertensive, carminative and anti-parasitic and many more...




Benefits of tea 21 bitter gourd tea …

- Very low in calories.
- Helps to reduce blood glucose level.




Ginger tea has a lot of benefits such as…

- relieve stress.
- Fight against respiratory problems.
- Reduce inflammations and many more….

Imports by

S. N. S ENTERPRISES

Telphone : 416 890 9521



# Attrell TOYOTA Brampton Auto Mall

Christmas Sale



X'mas Sale on All NEW + USED Vehicles

ඉක්මන් කරන්න ඉක්මන් කරන්න මේ අවස්ථාව ඔබටයි

ඔබ කැමති වාහනය ඉතා විශ්වාසවන්තව, හොඳ වට්ටම් සහිතව
ලබා ගැනීමට සිංහල භාෂාවෙන් කතා කරන ජේ (JAY) හමුවන්න.
ඔබට විශේෂ ත්‍යාගද හිමිකර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.



**Call Jay : 647 - 893 - 9661**

110 Canam Crescent Brampton ON L7A 1A9

**හෙළයේ මහා ගාන්ධර්ව පණ්ඩිත් අමරදේවයන් විසින් ගායනා කරන ලද දස දහස් සංඛ්‍යාත ගීත අතරින් ගී කිහිපයක් ගෙන ඒමට අද 'දසත කවි අරණ' වෙන් කෙරේ.**

## ආදර හැඟුම්

ආදර හැඟුම් ආදර හැඟුම්
නුපුරුදුයි මට නුපුරුදුයි ඒ හැඟුම්
ආදර හැඟුම් ආදර හැඟුම්
කිතිකවයි හද කිතිකවයි ඒ හැඟුම්
ආදර හැඟුම් ආදර හැඟුම්
ආදර හැඟුම්

සැඳෑ අඳුරේ සැළෙන තරු එළි
මගේ හද තුළ කරයි විමසිලි
නැගෙන ගනඳුර වඩයි සිතුවිලි
මේ මගුල් රෑ බිඳෙයි ඉවසිලි

ආදර හැඟුම් ආදර හැඟුම් ආදර හැඟුම්

කිමද ඔබ මල් කුමරියන්නේ
පෙති විදා සතුටින් නොඉන්නේ
රහස නැතිවද මං නොදන්නේ
තුරුලෙ බමරුන් නොවෙද ඉන්නේ

ආදර හැඟුම් ආදර හැඟුම් ආදර හැඟුම්

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - දයානන්ද ගුණවර්ධන**
**සංගීතය - සෝමදාස ඇල්විටිගල**

## ඔබේ දෑසයි

ඔබේ දෑසයි ඔබේ දෑසයි
නීල උත්පල දිගටි දෑසයි
මීන චංචල කිඳුරු දෑසයි
කිඳුරු දෑසයි

ඈත අහසේ තාරකා සේ
වශී කර මා සිත සිනාසේ
දුරක සිටියත් ළඟක සිටියත්
ඔබේ ඇස මට නිබඳ සිහිවේ

ඔබේ අඩවන් නුවන් දුටු සඳ
රාග ගින්නෙන් දවෙයි මා හද
එවන් දෑසින් සිහිල් දිය ඉස
නිවන් ගිනිගෙන දැවෙන මා හද

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - මහගම සේකර**
**සංගීතය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**

## බොල් වී අහුරු

බොල් වී අහුරු වෙල් හුලගේ ගිය සේම
දීගෙක ගිහින් නුඹ මටවත් නොකියාම

දම් පැහැ කහට කජු පුහුලන් පිපි කාලේ
රංචුව ගැහුණු හැටි මතකද අපි බාලේ
මල්වර වියේ නුඹ ඉද හිට දුටු වේලේ
බැරිවුනි කියාගන්නට හිත බැදි ආලේ

බොල් වී අහුරු....

නෑ තුන් හිතකවත් අමනාපයක් නගේ
මේ අපි පෙරත් ජාතියෙ පැතු ලෙසයි නගේ
පිටගම් ගොහින් මා අමතක වුනත් නගේ
අතමිට සරුව නුඹ යහතින් ඉදින් නගේ

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - ආචාර්ය අජන්තා රණසිංහ**
**සංගීතය - සරත් දසනායක**

## මහ බෝ වන්නම

වැලි තල අතරේ හෙමිහිට බසිනා
නේරංජන නදියේ
ගයා හිස වැඩ සිට බුදු වුණු දා
තිලෝ හිමි මොක් සුව ලද මොහොතේ
සමාධි භාවනා

හිම කඳු වැටියේ සීතල සෙවණේ
චන්දන තුරු පීරා
ඇදී එන මල් මුවරද රසිනේ
සමග මුසු කෝමල මඳ පවනේ
ගැටීලා පාවෙනා

සත්සර නගලා ටික ටික සෙලවී
සිරි මා බෝ හිමිගේ
මනෝහර පලුපත් අතු රිකිලි
නටා ගිය තාලෙහි රස නැගුණා
සරාගී ජීවනා

සඟමිත් මෙහෙණි දකුණේ සාකා
සිරිලක ගෙන ආ දා
සිටම තව මහමෙව්නා උයනේ
නටයි කොළ වන්නම ලෙස මහ බෝ
සුමිහිරි නාදෙනා

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ**
**සංගීතය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**

## තරු අරුන්දතී

තරු අරුන්දතී නෙතු පහන් නිවා
දුර නිසොල්මනේ හිඳිනා
මහ වනස්පති ලිය ළදල්ලකින්
පිණි පොදක් සෙමෙන් සලනා

ඔබ සැමරුම් රැළි කවුළුව මානේ
කඳුලක පැල්ලම් ඉරි ඇඳුනා
අළුත් මලින් පිරි වනෝද්‍යානේ
සැඳෑ බොල් හුළඟේ
මට තනියක් දැනුණා

තරු අරුන්දතී .....

වැළපෙන මා හද කැටපත් පවුරේ
හංස ගීතය ලියැවෙන දා
පළමු අරුණු රන් රේඛාවක් සේ
ප්‍රාර්ථනා සුවඳේ ඔබ එතැයි සිතුණා

පිපි මලින් මලේ රොන් සුණු විසිරී
හද දිදී සුසුම් රඟනා
ඔබ කවුළු පියන් හැර පාන්දරින්
කොහි ගියේද මට සිතුණා

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - ආචාර්ය අජන්තා රණසිංහ**
**සංගීතය - ස්ටැන්ලි පීරිස්**

## සඳකත් පිණි දිය

සඳකත් පිණි දිය දියවී ගලනා
සීතල කඳු අතරේ
හද ගොළුවී ඉකිබිඳ
ඔබ හඬනා හඬ
මා සවණේ පෑරේ

නිසංසලේ රෑ අහසේ
නිසංසලේ රෑ ඝන බොල් අහසේ
මිලාන වූ තරු එළියේ
ඔබේ නුවන් මිණිපහන් නැගී
ඇවිළේ මා දෑසේ

සුසුම් හෙළන තුරු ලතා ළපල්ලේ
සිහිල් සුළඟ හා වෙළී
මගේ කවුළු දොර තුළින් එබී
ඔබ සොයා ඇදේ..........

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - මහගම සේකර**
**සංගීතය - ලයනල් අල්ගම**

## පාලු අඳුරු නිල් අහස මමයි

පාලු අඳුරු නිල් අහස මමයි
ඈත දිලෙන තනි තරුව ඇයයි
යුගයෙන් යුගයට හදවත් ඉල්ලන
බලාපොරොත්තුව පැතුම ඇයයි

අසාර වූ මහ පොළොව මමයි
ගලා බසින දිය දහර ඇයයි
යුගයෙන් යුගයට හදවත් නළවන
සදාකාලික වු සැපත ඇයයි

පාලු අඳුරු....

කැළෑව මැද කටු පඳුර මමයි
පිපී වැනෙන මල් පොකුර ඇයයි
යුගයෙන් යුගයට හදවත් පුරවන
අඳුරු වේදනා කැටිය ඇයයි

පාලු අඳුරු....

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - මහගම සේකර**
**සංගීතය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**

## බඹරෙකු ආවයි

බඹරෙකු ආවයි නිරිත දිගේයා
හද පෑරූවයි මියුරු රසේයා
මල් පරවූවයි - සෝකෙන් බෝවා
කඳුළු ගැලූවයි එලෝ ගැබේයා

සීත හිමේ ලෙනකට පිවිසුනාදෝ
ඈත එපිට ගිරිකුලකට ගියාදෝ
මෑත මෙපිට මේ හදෙහිම ලගීදෝ
දෑස අඳුරු වී මා තනි වුණාදෝ

බඹරෙකු ආවයි...

සලමින් සුමුදු පොඩි අත්තටු මියුරු සරින්
නලමුඳු සුවඳ විඳගන්නට ගියත් වරෙන්
බල බිඳ දමා හිරු යන විට අවරගිරෙන්
සලමින් පිපුණු මල් පැණි බොනු රිසිව වරෙන්

බඹරෙකු ආවයි...

**ගායනය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**
**ගී පද - මඩවල එස්. රත්නායක**
**සංගීතය - ආචාර්ය පණ්ඩිත් අමරදේව**



LIFE INSURANCE
CRITICAL INSURANCE
AUTO & HOME INSURANCE
DISABILITY INSURANCE
SUPER VISA INSURANCE
CALL ME TODAY
FOR NON OBLIGATION FREE QUOTE
ATHAVAN RATNASINGAM
REGISTERED INSURANCE BROKER OF ONTARIO
DIRECT : 647.770.1818 FAX : 647.484.9997
EMAIL : ATHAVAN@LIONSURANCE.COM
MULTIRISK
INSURANCE BROKERS INC
FINANCIAL GROUP INC
GET THE BEST COVERAGE, FOR A BETTER PRICE.
NO HASSLES, JUST PERSONALIZED SERVICE




Why Pay More?
1%
Are You Planning to Sell a Property?
Listing Commission*
BUY or SELL through us and get an amazing chance to
WIN
1 of 10 GREAT PRIZES INCLUDING 2016 HONDA CIVIC
1st Prize
8 TVs
I will guide you through the process in a professional, friendly and accountable manner
Call for more information
Nishantha 416 417 0763
Century 21
Nishantha Donsiyambalapitiyage Sales Representative Email:nishan.don@gmail.com
Innovative Realty Inc. 2250 Markham Road Unit 3 Toronto ON M1B2W4. Office: 416 417 0763

# මිහිඳුකුලසූරිය සිප්‍රියන් තුෂාර ප්‍රනාන්දු






සෑම වසර හතරකටම වරක් පවත්වනු ලබන සූපවේදීන්ගේ ඔලිම්පික් තරගාවලිය ජර්මනියේ Erfurt හිදී පසුගියදා පවත්වන්නට යෙදුණි. IKA Culinary Olympics ලෙස නම් කර ඇති මෙම තරගාවලිය සඳහා රටවල් 43 ක් සහභාගි වී තිබුණු අතර එහිදී කැනඩාවේ Ontario Culinary Team නියෝජනය කරමින් එම කණ්ඩායමේ නායකත්වය දැරුවේ මිහිඳුකුලසූරිය සිප්‍රියන් තුෂාර ප්‍රනාන්දු විසිනි. Ontario Culinary Team යටතේ ඒකල කාණ්ඩයෙන් (individual category) තරග වැදුණු තුෂාර ප්‍රනාන්දු එහිදී රන් පදක්කම ලබා ගැනීමට සමත් වී ඇත. මෙහිදී ඔහු විසින් පන්විලාජ් (ගම් පේස්ට්‍රි) මගින් කැනඩාවේ හොකී කණ්ඩායමේ ආකෘතියක් නිර්මාණය කර තිබුණි. මෙම රන් පදක්කමට අමතරව ලෝකඩ පදක්කමක්ද තුෂාර නියෝජනය කළ කණ්ඩායමට හිමිවූ අතර එහිදී එම කණ්ඩායම විසින් soup, appetizers, main course, coldcut, dessert, pitipuas වැනි අංශවලින් සිය නිර්මාණ ඉදිරිපත් කොට තිබුණි.

## ආ ගිය කතා ආ ගිය කතා ආ ගිය කතා ආ ගිය කතා ආ ගිය කතා ආ ගිය කතා ආ ගිය

මේ කතාවෙහි කතානායකයා අද කැනඩාවේ අත්ලාන්තික් සාගරයට මායිම්ව පිහිටි සුන්දර සෙන්ට් ජෝන්ස් නගරයෙහි ජීවත් වේ. යුරෝපය කරා යන දීර්ඝ සංචාරය ආරම්භ කරමින් අහම්බයක් ලෙස සෙන්ට් ජෝන්ස් වෙත ගොඩ වූ අප පිරිසට මේ මිතුරාගෙන් ලැබුණු ආගන්තුක සත්කාරයෙන්ද ආ ගිය කතාවලින්ද කිසිදු අඩුවක් නොවුණි. මේ වන විට සෙන්ට් ජෝන්ස්හි වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ රැකියාවක නියුතු අප මිතුරා ශ්‍රී ලංකාවේද වෛද්‍යවරයකු ලෙස රාජකාරි කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේදී වෛද්‍ය වෘත්තියට පිවිසුණු මුල්ම වකවානුවේදී ඔහු විසින් මුහුණ පා ඇති රසවත් අත්දැකීම් කිහිපයකි මේ.

### දොස්තර මහත්තයෝ මෙන්න සතා

සීමාවාසික පුහුණුවෙන් පසු අප හිතවත් වෛද්‍යතුමාට පත්වීම ලැබී තිබුණේ ලංකාවේ දුෂ්කරම ගම්මානයක වූ රෝහලකටයි. පහසුකම් ඉතාමත් අල්ප වුවත් මෙම රෝහලට රෝගීන්ගෙන් නම් අඩුවක් නොවීය. දිනපතා සායන වෙත පැමිණෙන රෝගීනුත් නේවාසිකව පසුවන රෝගීනුත් නිසා අතළොස්සක් වූ වෛද්‍යවරුන්ටත් කාර්යමණ්ඩලයටත් ඉතාමත් භාරදූර සේවාවක් සැපයීමට සිදු වී තිබුණි.

සතා සර්පයා බහුලව ගැවසෙන එම ගම් ඉසව්වේ සර්ප දෂ්ටනයන් නිසා සිදුවන අනතුරු හා මරණවලද අඩුවක් නොවීය. බොහෝ අවස්ථාවල සර්පයකු දෂ්ට කළ විට එම රෝගියාට සර්ප වෙද මහතෙකු ලවා ප්‍රතිකාර කරවීම ගම්වැසියන්ගේ පුරුද්දක් වුවත් ඇතැම් අවස්ථාවල එවැනි රෝගීන් රෝහල් කරා රැගෙන එන අවස්ථාද නැත්තේ නොවෙයි. මෙයද එවැනි අවස්ථාවකි. සුපුරුදු පරිදි ඉතාමත් කාර්යබහුල වූ එදින සර්පයකු දෂ්ට කළ රෝගියකු රෝහලට රැගෙන විත් තිබුණි.

සර්ප විෂ ශරීරගත වූ රෝගීන්ට ප්‍රතිකාර කිරීමට පෙර සැලකිලිමත් විය යුතු කරුණු රාශියකි. විශේෂයෙන්ම රෝගියාගේ ශ්වසන, හෘද හා ස්නායු ක්‍රියාකාරිත්වය නිසි ලෙස පවතින්නේද යන්න පිළිබඳ අවධානය යොමුකිරීම මූලිකවම සිදුවන්නකි. සර්ප විෂ සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා දීමේදී සර්පයා හඳුනාගෙන බෙහෙත් කිරීම දේශීය වෙදකමේ මෙන්ම බටහිර වෙදකමේද ඇති මූලික සිද්ධාන්තයක් නිසා රෝගියා පිළිබඳව සිදුකරන මූලික විමසිලිමත් වීම් අතරතුරම දෂ්ට කළ සර්පයා හඳුනාග ැනීම කෙරෙහිත් වෛද්‍යවරයාගේ අවධානය යොමුවිය යුතුය. එය එසේ වන්නේ සර්ප විෂට ලබාදෙන ප්‍රතිවිෂ ඖෂධයන් ඇතැම් අවස්ථාවල දෂ්ට කළ සර්පයාට අනුව වෙනස් කිරීමට සිදුවන හෙයිනි. මේ නිසා සර්පයා ඉතා නිවැරදිව හඳුනාගැනීම වෛද්‍යවරයාගේ වගකීමකි.

එදින රෝහලට රැගෙන ආ සර්ප විෂ ශරීර ගත වූ රෝගියාට ප්‍රතිකාර කිරීම බාර වී තිබුණේ අප මිතුරාටය. මූලික පරීක්ෂණවලින් පසු ප්‍රතිකාර ලබාදීමට පෙර සර්පයා පිළිබඳ විමසීමේ අවස්ථාව එළඹුනි. වෛද්‍ය තුමා රෝගියා සමග පැමිණ සිටි අයෙකු තමාගේ මේසය අසල වාඩිකරවාගෙන ප්‍රශ්න කිරීම් සිදුකරනු ලැබුණි.

"මෙයාට දෂ්ට කරල තියෙන සර්පයා මොකාද කියල දන්නවද?"

"ඔව් දොස්තර මහත්තයෝ...."

"මොකාද?"

"මෙන්න මේකා මහත්තයෝ...."

එම තැනැත්තා අතේ තබාගෙන සිටි ගෝනියක් බඳු මල්ලක් වෛද්‍යවරයාගේ මේසය මත තැබීය.

"මේ මොකක්ද?"

දැන් අර තැනැත්තා එම මල්ලේ කට බැඳි ලණුව ලෙහයි. මල්ල ලිහූ සැණින් දිස් වූයේ එතුළ දරණ ගසා සිටි නාගයෙකි.

වෛද්‍යවරයාට සිහි එළවාගත නොහැකි වුණි. තමාගේ මේසය මත දිග හැරී මල්ල දෙස තවත් වරක් හෝ නොබැලූ ඔහු කාමරයේ හැර තිබූ ජනේලයෙන් එළියට පැන පසු නොබලා දිව යන්නට විය.

එදා ලංකාවේ දුෂ්කර ගමක වෛද්‍යවරයකු ලෙස කටයුතු කරමින් තම වෘත්තීය ජීවිතය ඇරඹූ අප මිතුරා පැවසුවේ, වෛද්‍යවරයකු ලෙස කටයුතු කිරීම ඇරඹි මුල්ම අවධියේදී මේසය මත තැබූ සර්පයාට බයේ ජනේලයෙන් පැන දිව්වත් පසු කලෙක එවැනි අවස්ථා සාමාන්‍ය සිදුවීම් ලෙස සැලකීමට සිදුවූ බවයි. තම සේවා කාලය තුළ දුෂ්කර ගම්මානවල මෙන්ම යුද බියෙන් තැති ගැනුණුගම්මානවලද සේවය කර ඇති ඔහු| එම කාල සීමාවලදී සිනහව, ත්‍රාසය, දුක පිරුණු අත්දැකීම් රාශියකට මුහුණ පා ඇත.

### ලෙඩා කෝ.....?

මේ කතාවද අප මිතුරු වෛද්‍යතුමාගේම අත්දැකීමකි. එදින රෝහලේ රාත්‍රී සේවාව භාරව තිබී ඇත්තේ අප වෛද්‍ය තුමා වෙතයි. දහවල් කාලයේත් ගමනා ගමන පහසුකම් ඉතාමත් අල්ප වූ ඒ ගමේ වැසියන්ගේ දුකට සැපට නිතරම පිහිට වූයේ ලෑන්ඩ් මාස්ටර් අත්ට්‍රැක්ටරයයි.

ඒ රාත්‍රියේ රෝහල වෙත පැමිණෙන ලෑන්ඩ් මාස්ටරයේ හඬ රෝගියෙකු රැගෙන එන බවට රෝහල් කාර්යමණ්ඩලයට දුන් ගිලන් රථයක නළා හඬක් බඳු විය. වේගයෙන් පිඹගෙන ආ ලෑන්ඩ්මාස්ටරය රෝහල් මිදුලේ නතර විය. ලෑන්ඩ් මාස්ටරය පිරෙන්නට සෙනඟය. එහි සිටි හැමෝම රෝහල් මිදුලට බැස්ස අතර මහා හඬින් "දොස්තර මහත්තයෝ.... දොස්තර මහත්තයෝ... අපේ ලෙඩාව බලන්න" කියාගෙන කිහිප දෙනෙකුම රෝහල තුළට පැමිණෙන්නට විය.

හදිසි රෝගියෙකු රැගෙන ආ බව දැනුණු නිසා

44 වන පිටුව බලන්න

ඔබේ නිවසටම දසත Dasatha

සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම
තැපැල් මගින් ගෙන්වා ගැනීමේ
අවස්ථාව දැන් සලසා ඇත.

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

දසත දායකත්ව ගාස්තු
Subscription Rates
for Dasatha

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada
Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

www.dasatha.com

## දැනුම සමග කටට රසට

# දකුණේ මාලු හොද්ද



■ **තිසරි ශිබා -** Shikifood

මාගේ මතකය තුළ සිත්තියා විශාල භූමිකාවක් රඟ නොපෑවත් විටින් විට මතකයට නැගෙන්නේ එකල ඈ තුළ පැවති ඇතැම් ගතිගුණ නිසාය. වැල්ලේ ගැහැනියක ලෙස කරදියේ ජීවිතය ගැට ගසා ගැනීමට නොමඳ උත්සාහයක් ගත් ඕ දරුවන් පස්දෙනෙකු ගේ මවකි. ඇගේ සැමියා ධීවරයකු ලෙස රැල්ල සමග ඔට්ටු වන විට ඕ ඔහුට අත්වැලක් වූවාය.

සිත්තියා ජීවත් වූයේ මාතර පොල්හේනේ වෙරළ අද්දර පැලකය. ඇයගේ දරුවන් දෙදෙනෙකු එකල මාතර මහා විද්‍යාලයට ගිය බව මා දන්නේ ආත්තම්මා කලක් එම පාසලේ ගුරුවරියක ලෙස සේවය කළ නිසාය. ඇතැම් දිනවල ආත්තම්මා ගමේ මිනිසකු අත සිත්තියාට පණිවුඩ යවා අප නිවසට ගෙන්වා ගන්නේ ඇයගේ දරුවන්ගේ වගතුග ඇසීමටය .

“මොකද සිත්තියා මේ දවස් ටිකේ දරුවො දෙන්නා ඉස්කෝලෙ නොආවෙ...”

“අනේ ඉස්කෝලෙ හාමිනේ, සිරිදාස කටගොන්නක් බීගෙන ඇවිත් හැමදාම අඩවි අල්ලනවා. උන්ට නින්දක් නෑ රෑට. මුහුදු ගියේ නැති නිසා අතමිටත් හිඟයි. අනික උන් ඉස්කෝලෙ එව්වා කියලා මහ ඒජන්තවරු කරන්නෙයි...” ආත්තම්මාගේ බැන වැදීම මත නිහඬ වන සිත්තියා අවසානයේ දරුවන් පාසල් එවීමට පොරොන්දු වන්නීය.

“කුස්සිය පැත්තට ගිහින් මොනවා හරි කාල දරුවන්ටත් අරන් පලයන් සිත්තියා...” ආත්තම්මාගේ අණට කීකරු වන ඕ කුස්සියට යන්නේ තම කුසගිනි නිවා ගැනීමට වඩා අපට වැඩක් පලක් කර දීමටය. එවැනි දිනෙක අප කුස්සියේ සියලු වැඩ කරදෙන ඕ තම නිවසට යන්නේ බොහෝ රෑ බෝ වීමෙන් පසුවය.

සිත්තියාගේ මාලු හොද්ද අප සැම අතර එකල ජනප්‍රියය. “සිත්තියා මාලු හොද්ද ඒදුවත් රසයි...” මද්දු චම්මා නිතර කියනු මට මතකය. දකුණේ ගැහැණුන්ට මාලු සෑදීමට කදිම ඉවක් ඇති බව කියමින් සිත්තියා උදම් අනන්නීය.

ඇතැම් දිනවල අලුත් මාලු රැගෙන අප නිවසට පැමිණෙන සිත්තියා පොල්-හාල් අඹරා හොදි සාදන අතර එය ලිපෙන් බාන්නේ , “ඔන්න චූටි මැණිකෙ මේකත් එක්ක විතර බත් කන්න ඇහැකියි....” පාරම් බාමිනි. එය බොරුවක් නොවන බව මම දනිමි. සිත්තියා මට අසීමිතව ආදරය කළ අතර සෑම සෙනසුරාදාවකම අප නිවසට පැමිණෙන ඕ මගේ කිළිටි ඇදුම් සෝදා දීමටත්, පොත් මේසය අස් කර දීමටත්, කැන්වස් සපත්තු දෙක පිරිසිදු කර දීමටත් ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන්නීය. නොරිස්සුමෙන් ඒ දෙස බලා සිටින චූටි චම්මා ඇතැම්විට මට දොස් පවරන්නේ අහිංසක ගැහැනියක ලවා මා වැඩ කරවා ගන්නා බව පවසමිනි.

“මොනවා කරන්නද චූටි චම්මා, සිත්තියා එපා කිව්වට අහන්නෙ නෑනෙ...”

“චූටි දෝණි දන්නවද සිත්තියා ඇයි ඔයාට ඔච්චර ආදරේ කියලා....”

“ඇයි....?”

“එයා තමයි ඔයාගෙ අම්මා, අපි ඔයාව සිත්තියාගෙන් අරන් හදා ගත්තා....”

මාගේ කෝපය ඉහවහා ගොස් මා චූටි චම්මා පසුපස පන්නන විට සිත්තියා අප දෙස බලමින් සිනාසෙන අයුරු මට කිසි දිනෙක අමතක කළ නොහැක. දසන් විහිදා ඕ සිනාසෙන කල අඟුරු පැහැ ඇගේ මුහුණ ප්‍රීතියෙන් පිරී යන්නීය.

ගමෙන් නගරෙට පැමිණි මට ඉතා කෙටි කලකින් සිත්තියා අමතකව ගියත් ඈ මගේ මතකය නැවත අවුස්සන්නේ 2004 දී අප සැවොම තැති ගත් සුනාමියේදීය. මා ඔලුව ගිනි ගත්තියක සේ සිත්තියා ගැන සොයන විට එකල මාතර ප්‍රාදේශීය වාර්තාකරුවකු මට උදව් කලේය. දින කිහිපයක අසීමිත වෙහෙසකින් පසු ඔහු සිත්තියා ගැන තොරතුරු සොයා ගෙන තිබුණි. ඇයත් ඇගේ පවුලත් ආරක්ෂාකාරීව වෙසෙන බව දැන ගත් විට අප සිත්වල නැඟුන අඳුරු සෙවණැලි ඉවත් විය. ඉන්පසුව නැවත සිත්තියා මට මුණ ගැසෙන්නේ ඉන් තවත් කලකට පසු නිවාඩුවකට මා දරුවන් සමග පොල්හේනේ නෑමට ගිය විටෙකය. අප පැමිණ ඇති ආරංචිය අසා වෙරළට පැමිණි ඕ මා දැක සතුටු කඳුළු වැගුරුවාය. මා දරුවන් සමග පොඩි එකෙකු සේ සෙල්ලම් කළාය. එදා මුළු දවසම අප සමග ගත කළ ඕ පැවසූ ඇතැම් වදන් මා මතකයෙන් කිසිදා බැහැර නොවනු ඇත.

“මම මේ මුහුදට ආදරය කලා චූටි මැණිකෙ. ඒ මම කෙල්ල කාලෙ. කසාද බදින්න කලින්. ඊට පස්සෙ මම මේ මුහුදට ගෞරව කලා. ඒ අපි මුහුද නිසා ජීවත් වුණු නිසා. දැන් නම් මට මේ මුහුද මගෙ දෑහැට පේන්න බෑ....” සිත්තියාගේ බොහෝ මතකයන් සහ ආදරණීයයන්ගේ මතකයන් එදා ආ සුනාමි රැල්ලත් සමග ගසා ගෙන නොපෙනී ගිය කල ඇය ඇගේ ජීවිතයේ කොටසක් වූ මහ මුහුද සමග තරහ වී තිබුණ. ඒ ආදරණීයයන්ගේ පා සටහන් ඇයට කිසි දිනෙක නැවත දැක ගැනීමට නොලැබෙනු ඇත.

thisu.shika@gmail.com

## දකුණේ මාලු හොද්ද සාදමු.

### අවශ්‍ය දේ

- කෑලි කපා ගත් තමන් කැමති මාලු වර්ගයක්
- ගා ගත් පොල් මේස හැන්දක් හෝ දෙකක්
- රතු කැකුළු හාල් මේස හැන්දක් හෝ දෙකක්
- මිරිස් කුඩු (ගලේ අඹරා ගත් වේලුනු මිරිස් නම් වඩා රසයි)
- අඹරා ගත් ඉඟුරු, සුදුලූනු
- ගොරක කැබලි කිහිපයක්
- කරපින්චා, රම්පෙ, සේර
- අමු මිරිස්
- කුඩා තක්කාලි ගෙඩියක් ( අවශ්‍යම නැත )
- උලුහාල් ස්වල්පයක්
- කුරුදු කැබැල්ලක්
- ගම්මිරිස්, තුනපහ ස්වල්පයක්
- කහ ස්වල්පයක්
- රස අනුව ලුණු
- තෙල්

### සාදා ගන්නා ආකාරය

මාලු හොඳින් සෝදා මිරිස්, ගම්මිරිස්, කහ, තුනපහ, ලුණු, ඉඟුරු, සුදුලූනු තලපයෙන් ස්වල්පයක් දමා මාලු කැබලිවල හොඳින් තැවරෙන සේ අත ගා පැයක් පමණ තියන්න. පොල්, හාල් එකට දමා රන්වන් පැහැ වන සේ කබලක බැද ගෙන අඹරා ගන්න. මැටි හට්ටියක් ලිප තබා තෙල් ස්වල්පයක් දමන්න. එය රත් වන විට ඉඟුරු සුදුලූනු, කරපින්චා, රම්පෙ, සේර, හාල්-පොල් තලපය, උලුහාල්, කුරුදු කැබැල්ල දමා තෙම්පරාදු කර ගන්න. එයටම මිරිස් කුඩු, ගම්මිරිස්, තුනපහ එකතු කරන්න. (ගොඩක් දාන්න එපා. මතකනේ මාලුවල මේ හැමදේම අතගාල පැත්තකින් තියලා තියෙන්නෙ ) දැන් මාලු කෑලි තෙම්පරාදුවටම එකතු කරන්න. අවශ්‍ය පමණ වතුර දමන්න. එයටම ගොරක,කපා ගත් තක්කාලි, අමු මිරිස් එකතු කරන්න. රස අනුව ලුණු බලා මදි නම් එකතු කරන්න .මාලු හොද්ද හොඳින් නටන තුරු මද ගින්නේ පිස ගන්න.

### සැලකිය යුතු කරුණු

- මාලු හොද්දට කවදාවත් රටලූනු, රතු ලූනු දාන්න එපා. රස වෙනස් වෙනවා
- මාලූ හොදි හදන විට හැම විටම මැටි හට්ටියක හදා ගන්න
- තක්කාලි, ගොරකාවලින් කරන්නෙ හොද්දට ඇඹුල් රස එකතු කරන එක. කැමති නම් ගොරකා වෙනුවට සියඹලා එකතු කරන්නත් පුළුවන්.
- තෙම්පරාදු නොකර වතුරින් විතරක් පිස ගන්නත් පුළුවන්.
- වතුර වෙනුවට පොල් කිරි එකතු කරන්නත් පුලුවන්.

## පපුවේ කැක්කුම...

28 වන පිටුවෙන්

හයක්වත් පානය කිරීම වැදගත්ය. තැඹිලිද සුදුසු පානයකි. සීනි එකතු කළ විට පලතුරු යුෂවලද ගුණය හීන වෙයි. එහෙයින් පලතුරු යුෂ වෙනුවට පලතුරු ලෙස ආහාරයට ගැනීම වඩා සුදුසුය. සිසිල් බීම, චොක්ලට් හා කොකෝවා බීම සිරුරට හිතකර නොවේ. එවැනි පානවර්ග හැකි තරම් සීමා කළ යුතුය.

■ සමබල ආහාර වේලක් ගැනීම මෙන්ම ක්‍රියාශීලී දිවි පෙවෙතක් ගත කිරීමද හෘදරෝග වළක්වා ගැනීමට මහෝපකාරී වේ. ඒ සඳහා ව්‍යායාම අත්‍යවශ්‍ය වේ. වර්තමාන මිනිසා ඉතා කාර්යබහුලය. එහෙත් නිරෝගී දිවියකට අවශ්‍ය තරම් ව්‍යායාම ඔහුට ලැබෙන්නේ නැත. ඒ සඳහා වැය කිරීමට කාලයක්ද බොහෝ දෙනාට නැත. එහෙයින් කළ යුත්තේ තම දෛනික කටයුතු අතරේම සිරුර වෙහෙසා කටයුතු කිරීමයි. නිදසුනක් ලෙස රැකියාවට යන පුද්ගලයකු මෝටර් රථයෙන් හෝ වාහනයෙන් යා යුතු ස්ථානයට මඳක් පෙර වාහනයෙන් බැස ඇවිද යාම. විදුලි සෝපානය වෙනුවට පියගැට පෙළ නැඟීම, කාර්යාලයීය කටයුතුවලදී තම කාර්යයන් සඳහා සහායකයකුගේ සහාය නොගෙන තමාම හිඳ සිටි තැනින් නැඟිට ගොස් එම කාර්යය කරගැනීම වැනි කටයුතුවලට හුරු වීම වටී.

■ ව්‍යායාම වෙනුවට නැටුම් හෝ ක්‍රීඩාවල යෙදීම වැඩි දෙනා ප්‍රිය කරනු ඇත. පාසල් වියෙහි පටන්ම ක්‍රීඩාවලට යොමු කිරීමද, නැටුම් වැනි විනෝදාංශ වෙත යොමු කිරීමද කළ යුතුය. සංගීතයට සවන්දීම මනසට මෙන්ම හදවතද සුවපත් කරයි. සංගීතයට අනුව නැටීම ශරීරයට ව්‍යායාමයද හිතට සතුටද ගෙන දෙයි. රෝගීනට මෙන්ම නිරෝගී පුද්ගලයනටද ව්‍යායාම කරන්නට විධානය කරනු වෙනුවට රිද්මයානුකූල නර්ථනයට යොමු කිරීම වඩාත් ඵලදායී වෙනු ඇත.

වර්තමානයේ හදවත් රෝග සඳහා බලපාන ප්‍රධාන සාධකයක් ලෙස ‘මානසික ආතතිය’ හඳුනා ගෙන තිබේ. දෛනික ජීවිතයේදී, පාසලේදී මෙන්ම කාර්යාලයේදීද මානසික ආතතියෙන් තොරව කටයුතු කළ හැකි පරිසරයක් සකසා ගත යුතුය. ඒ සඳහා පවුලේ සැමද රැකියා ස්ථානවල බලධාරීන්ද එකසේ උනන්දු විය යුතුය. ඉහත කරුණු සියල්ල එක්තැන් වූ කල හදවත් රෝගවලින් වළකින්නට විශේෂ ව්‍යායාමයක් අවශ්‍ය නොවනු නිසැකය.

**සැකසුම - සාගරිකා දිසානායක ජයසිංහ**

# නිහඬවම සමුගත් සිනමාවේ දැවැන්තයින් දෙදෙනා

වසර 70 කට ආසන්න කාලයකට ළඟා වෙමින් පවතින සිංහල සිනමාවේ, රුළී සිටිමින් ජන හදවත් ස්පර්ශ කිරීමට සමත් වූ ප්‍රතිභා පූර්ණ සිනමා ශිල්පීන් දෙදෙනෙකු සදහටම නික්ම යෑමේ කණගාටුදායක පුවත් පසුගියදා අපට අසන්නට ලැබුණි.

## සිරි ගුණරත්න

වස්තුව, සිකුරු දසාව, නිළියකට පෙම් කළෙමි, සුබෝධා, රිදී තැල්ල, පෙති ගෝමර, බඹර පහස, පොඩි රාලහාමි ඇතුළු චිත්‍රපට රැසක් නිර්මාණය කළ කෘතහස්ත සිනමා අධ්‍යක්ෂ සිරි ගුණරත්න මහතා පසුගිය නොවැම්බර් 16 වැනි දින ජීවිතයෙන් සමුගෙන තිබුණි. කලක් ලේක්හවුස් කාර්ය මණ්ඩලයේද මාධ්‍යවේදියෙකු ලෙස ඔහු සේවය කර ඇත.

හුලවාලි, මාතර ආච්චි වැනි චිත්‍රපටවල සහාය අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇති සිරි කුලරත්න මහතා හරිම හපන්නු, හතුරෝ, පෙර නිමිති, භූත වස්තුව ඇතුළු ටෙලි නාට්‍ය කීපයක් නිර්මාණය කර ඇත. සිරි කුලරත්නයන් විසින් ගීත රැසක්ද රචනා කර ඇති අතර මිල්ටන් මල්ලවාරච්චි ගායනා කරන 'පියාපත් සලා මම ඔබ' ගීතය ඒ අතරින් අතිශයින් ජනප්‍රිය විය.

සිනමාට පිවිසෙන නවකයින්ට නිතරම අත දුන් පුද්ගලයෙකු ලෙස ප්‍රකට සිරි කුලරත්නයන්ගේ මග පෙන්වීම යටතේ නළු නිළියන්, කාර්මික ශිල්පීන් රැසක් සිය දක්ෂතා ඔප නංවා ගනු ලැබුණි.

කලක සිට රෝගාතුර තත්ත්වයෙන් පසුවූ සිරි ගුණරත්න මහතා මිය යන විට 73 හැවිරිදි වියේ පසු විය. ඒ මහතාගේ අවසන් කටයුතු පසුගියදා ඉතාමත් නිහඬව ඔහු ජීවත්ව සිටි කුරුණෑගල වැල්ලව ග්‍රාමයේදී සිදුකර තිබුණි.

## විමල් කුමාර ද කොස්තා

සිංහල සිනමාවේ නොමැකෙන මතක සටහන් තැබූ තවත් ප්‍රතිභාපූර්ණ සිනමා නළුවකු වන විමල් කුමාර ද කොස්තා මහතා පසුගිය නොවැම්බර් 20 වන දින අභාවප්‍රාප්ත වී ඇත. හදිසියේ ඇති වූ රෝගී තත්ත්වයක් මත රෝහල් ගත කර ඇති ඒ මහතා මිය යන විට 68 හැවිරිදි වියේ පසු විය.

විමල් කුමාර ද කොස්තා මහතා මුලින්ම වේදිකාවට ගොඩ වන්නේ අභිරූපණ රංගන ශිල්පියෙකු ලෙසිනි. සැබවින්ම ශ්‍රී ලංකාව තුළ අභිරූපණ රංග කලාව ඇති කිරීමට පුරෝගාමී වූ පුද්ගලයා ලෙසද කොස්තා මහතා හැඳින්විය හැක.

ඉන්පසු 'ගෝඩෝ උන්නැහෙ එනකං, දුන්න දුනු ගමුවේ, හිත හොඳ අම්මණ්ඩි, පුට්ටු, කවුරුත් එන්නෙ නැහැ, කොරා සහ අන්ධයා, නැට්ටුක්කාරයෝ' වැනි වේදිකා නාට්‍ය රැසකට ඔහු සම්බන්ධ වී ඇති අතර මේ සියලුම නාට්‍ය ශ්‍රී ලංකාවේ සිටි අග්‍රගණ්‍ය වේදිකා නාට්‍යකරුවන්ගේ නිර්මාණ වීම ඔහු ලැබූ භාග්‍යයක් විය. 1963 වසරේදී රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවාට හිමි සම්මානය කොස්තා මහතාට හිමි වූයේ සුගතපාල ද සිල්වාගේ 'දුන්න දුනුගොමුවේ' වේදිකා නාට්‍යයේ රඟපෑම වෙනුවෙනි.

1969 වසරේදී ධර්මසේන පතිරාජයන්ගේ 'සතුරෝ' කෙටි චිත්‍රපටයෙන් සිනමාවට එක්වන ඔහුගේ පළමු වෘත්තාන්ත චිත්‍රපටය ධර්මසේන පතිරාජයන්ගේම 'වෙස්ගත්තෝ' ය. අහස් ගව්ව, පාර දිගේ, එක්ටැම් ගේ, එයා දැන් ලොකු ළමයෙක්, සොල්දාදු උන්නැහේ, රක්තා, අධිෂ්ඨානය, බඹරු ඇවිත්, සරුංගලේ, සාගරයක් මැද, බයිසිකලේ, චංචල රේඛා, පෙරළිකාරයෝ ඇතුළු චිත්‍රපට 100 කට අධික සංඛ්‍යාවක් ඔහුගේ රංගනයෙන් ඔපවත් වී ඇත.

ශ්‍රී ලංකා සිනමාව තුළ එක් යුගයක් නියෝජනය කළ ප්‍රතිභාසම්පන්න ජ්‍යෙෂ්ඨ රංග ශිල්පියෙකු වූ විමල් කුමාර ද කොස්තා මහතා පසුගිය ඔක්තෝබර් මස පුවත්පතකට පවසා තිබූ මේ වදන් පෙළත් සමගම මේ කෙටි සටහන හමාර කරමු.

"අපි මිනිසුන්ට ආදරය කරන්න ඕනෑ. එච්චර තරහ කාරයො වෛරක්කාරයො නැහැ. අද අඩු මට්ටමක තියන්නෙත් ඒකමයි. ජීවිතය නිතර අධ්‍යයනය කළ යුතුයි. උඩඟු නොවූ නළුවකු වීම සැබෑ මනුස්සකම. කාටවත් ඊරිසියා වෛර කරන්න හොඳ නැහැ. අලුත් පරපුරට මං කියන්නෙත් අනුන් බසට කන්දෙන්න. අනුන් අගය කරන්න. එච්චර තමන්ට හරියනව කියලයි"



## ඇමරිකා එක්සත් ජනපදයේ නද දෙන සරත් කුමාරසිංහයන්ගේ 'සත්සර' ප්‍රසංගය

ප්‍රවීණ සංගීතඥ එස්රාජ් වාද්‍ය ශිල්පී සරත් කුමාරසිංහයන්ගේ නවතම ප්‍රසංගය ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් ප්‍රාන්තයේදී දෙසැම්බර් 03 වෙනිදා පැවැත්වීමට නියමිතව ඇත.

උතුරු ඇමරිකාවේ ප්‍රමුඛතම ශාස්ත්‍රීය එස්රාජ් ප්‍රාසංගික ශිල්පියෙකු ලෙස පිළිගැනෙන සරත් කුමාරසිංහ, ඇමරිකාවේ පැවැත්වෙන ඔහුගේ ප්‍රසංගය පිළිබඳ 'දසත' වෙත මෙසේ අදහස් දක්වනු ලැබුණි.

'මගේ මේ ප්‍රසංගය කරුණු කීපයක් නිසා වැදගත් වනවා. පළමුකොටම, මෙය මා විසින් ඇමරිකාවේ පවත්වන මුල්ම පූර්ණ ඒකපුද්ගල ප්‍රසංගය බව කිව යුතුයි. මින් පෙර වරින් වර ඇමරිකාවේ විවිධ ස්ථානවල මගේ එස්රාජ් වාදන සහිත ප්‍රාසාංගික අංග ඉදිරිපත් කර තිබුණත් 'සත්සර' වැනි පූර්ණ සංදර්ශනයක් මේ වන තෙක් මා එරට තුළ පවත්වා නෑ. එහෙත් කැනඩාවේ සහ ශ්‍රී ලංකාවේ මා පූර්ණ ප්‍රසංග කීපයක්ම පවත්වා තිබෙනවා. ඒ නිසා මිචිගන්හි පවත්වන මේ ප්‍රසංගය මට අලුත්ම අත්දැකීමක්. විශේෂයෙන්ම මෙම ප්‍රසංගය සඳහා ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයින්ට අමතරව දකුණු ආසියානු සහ එක්සත් ජනපදික ප්‍රේක්ෂකයිනුත් සහභාගී වනු ඇතැයි සංවිධායකයින් අපේක්ෂා කරනවා'

'දෙවැනි කරුණ ලෙසින් මා දකින්නේ, ප්‍රසංගයේ පෙළ ගැස්මේ වෙනසයි. මෙතෙක් පැවැත්වූ මගේ 'සත්සර' ප්‍රසංගයන් සම්පූර්ණයෙන්ම එස්රාජ් වාදන ඇතුළත් ඒවායි. මෙවර හඬ වාද්‍ය සහ ගායන ප්‍රසංගයක් ලෙසින් දොරට වඩිනවා. මේ වෙනසට මුල් වූයේ ගායනා අංගයන් කිහිපයක්ද ඊට ඇතුළත් කරන මෙන් මගේ රසිකයන් සහ මිතුරු මිතුරියන් කලක සිට කරනු ලබන ඉල්ලීමයි'

'මෙතෙක් මගේ ඒකායන ප්‍රයත්නය වුණේ එස්රාජය තුළින් උසස් සංගීතමය අංගයන් ඉදිරිපත් කිරීමයි. නමුත් වසර ගණනාවක ආභාෂය මත මගේ ගායන විලාශයේ පිළිගත හැකි වර්ධනයක් සිදුවී ඇතැයි මටත් සිතෙනවා. ඒ නිසා සියල්ලන්ගේම ඉල්ලීමත් සැලකිල්ලට ගෙන ගායනයත් ඉදිරිපත් කිරීමට එකඟ වුණා'

සරත් සිය මිචිගන් සංගීත සංචාරය පිළිබඳව අප වෙත අදහස් දක්වමින් එම කරුණු පවසා සිටියා. ඔහුගේ මිචිගන් සංචාරයේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන අංගයන් පිළිබඳව අප කළ විමසුමට ඔහු දුන් පිළිතුර මෙසේය.

'මිචිගන්හි පැවැත්වෙන 'සත්සර' ප්‍රසංගයේදී අපේ හදවත්වලට ඉතා සමීප ශ්‍රී ලාංකික, ඉන්දියානු සහ බටහිර සංගීත වාද්‍යයන් රැසක් එස්රාජය මගින් රසික ප්‍රජාවට තිළිණ කිරීමට මා අදහස් කර සිටිනවා. ඉන්දියානු ගසල් ගායනයක්, ශ්‍රී ලාංකීය සරල ශාස්ත්‍රීය ගායනා සහ මගේ නව නිර්මාණ කීපයක්ද මේ සංදර්ශනයේදී ගායන අංගයන් ලෙසින් ඉදිරිපත් වනවා'

'සත්සර' ප්‍රසංගය මිචිගන්හිදී හැඩ ගැන්වෙන ආකාරය පිළිබඳවත් සරත් කුමාරසිංහයන් අප වෙත අදහස් දැක්වුවා.

'මිචිගන්හි ඉප්සිලාන්ටෙ (Ypsilanti) නගරයේ පැවැත්වෙන මේ සංදර්ශනයට තවත් ප්‍රාන්ත කිහිපයකින් රසිකයින් පැමිණෙන බව සංවිධායකවරින් මට දන්වා තිබෙනවා. මෙය එක් අතකින් අපගේ ප්‍රජාවට සුහද ලෙසින් මුණ ගැසීමේ අවස්ථාවක් වීමට බොහෝ දුරට ඉඩ තිබෙනවා. එය මට විශේෂ සතුටක් ගෙන දෙන කාරණයක්. මෙහිදී මට ගායනයෙන් සහාය වීම සඳහා මිචිගන්හි සිටින ශ්‍රී ලාංකික ප්‍රජාවේ කලාකරුවන් සහ කලාකාරිනියන් පිරිසක් ඉදිරිපත් වී සිටින අතර ඒ වෙනුවෙන් වූ පුහුණුවීම් කටයුතුවල ඔවුන් මේ දිනවල යෙදී සිටිනවා. ප්‍රසංගය තවත් වර්ණවත් කිරීමට නර්තන අංග කිහිපයකුත් ඇතුළත් කිරීමට අදහස් කර තිබෙනවා. අයිරා ඇඹුල්දෙණිය සහ කාවින්ද වීරසේකර මෙම ප්‍රසංගයේදී ගායනයෙන් සහ තාල තරංග වාදනයෙන් සහාය වීම සඳහා මා සමග මිචිගන් බලා යාමට එක් වනවා. සුප්‍රසිද්ධ සැක්සෆෝන් වාදක ක්ලයින් වැල්ඩෝරාසෝ ද මා සමග මෙම සංගීත චාරිකාවට සම්බන්ධ වනවා'

ශ්‍රී ලංකාවේ නිකුත් වූ පළමු එස්රාජ් සංයුක්ත තැටිය ඇතුළු සංයුක්ත තැටි 4 ක් සරත් කුමාරසිංහ මේ වන විට එළිදක්වා ඇත. ඔහුගේ නවතම සංයුක්ත තැටිය එළිදැක්වීමේ කටයුතු මේ දිනවලදී සැලසුම් කරමින් සිටින බවද මේ අවස්ථාවේදී ඔහු අප වෙත දන්වා සිටියා.

සිය සංගීත දැනුම තුළින් ශ්‍රාවක සිත් සතන් පිනවීම තුළින් සරත් කුමාරසිංහයන් ඔන්ටාරියෝ ශ්‍රී ලාංකිකයන් අතර විශාල පිළිගැනීමක් හිමිකරගෙන සිටින සංගීතඥයකු වන අතර සංගීතය සහ එයින් සිය ප්‍රජාව වෙත ලබාදෙන සේවාව පිළිබඳව විශේෂ ඇගයීමකින්ද පසුගියදා ඔහු පිදුම් ලැබුවා. ඔන්ටාරියෝ ආණ්ඩුකාර තැන්පත් එලිසබෙත් ඩව්ඩ්ස්වෙල් මැතිණිය අතින් ඔහු ඒ සඳහා ගෞරව සම්මාන හිමිකර ගනු ලැබුණි.

ඔහු හිමිකරගත් එම ගෞරවනීය සම්මාන පිළිබඳව 'දසත' වෙත අදහස් දැක්වූ සරත් කුමාරසිංහයන්,

'මේ සම්මානය ප්‍රධානය කරන්නේ කැනඩාවේ ජාතික ජනවාර්ගික මාධ්‍යයන් පිළිබඳ සංවිධානය (National Ethnic Press and Media Council of Canada) විසින්. කැනඩාව පුරා පවතින මාධ්‍ය ආයතන 750 ක් පමණ මෙම සංවිධානය සමග කටයුතු කරනවා. මොවුන් විසින් වාර්ෂිකව විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් කිහිප දෙනෙකු සම්මාන සඳහා නිර්දේශ කරනවා. එම නිර්දේශයන්ට අනුව තෝරාගන්නා සම්මානලාභීන්ට සම්මාන ප්‍රධානය සිදුකරන්නේ ආණ්ඩුකාර මැතිණියගේ නිල නිවසේදීයි. එහිදී මෙවර මා වෙත මෙම සම්මානය හිමි වූයේ සංගීත කටයුතු සහ ප්‍රජා සේවාව වෙනුවෙනුයි'

'මේ සම්මානය ගැන මම ආඩම්බර වෙනවා. එය එස්රාජයට සහ අපේ ප්‍රජාවට ලැබුණු අගය කිරීමක් ලෙසයි මා දකින්නේ'

'දසත' සමග පැවති කෙටි පිළිසඳර නිමා කරමින් සරත් කුමාරසිංහයන් එසේ පවසා සිටියා. ප්‍රවීණ සංගීතඥ සරත් කුමාරසිංහ මහතා වෙත 'දසත' සැමගේ සුභාසිංශනයද අප මෙසේ පළ කොට සිටිනවා.



# රේඛාවට 60 පිරෙන සමයේ ලෙස්ටර් ගැන කතා කරමු.

**සිංහල සිනමාවේ හැරවුම් ලක්ෂය ලෙස සැලකෙන 'රේඛාව' චිත්‍රපටය තිරගත වූයේ 1956 දෙසැම්බර් 28 වෙනිදා කොළඹ රීගල් සිනමාහලේදීය. එකල, චිත්‍රාගාරවලින් බැහැරව චිත්‍රපටයක් රූගත කිරීම කළ නොහැකිය යන අදහස මුල් බැසගෙන තිබුණු සමයකි. එවන් අවදියකදී සිනමා කැමරාව චිත්‍රාගාරෙයෙන් එළියට ගෙන ගොස් සම්පූර්ණයෙන්ම එළිමහනේ රූ ගත කළ පළමු චිත්‍රපටය ලෙස 'රේඛාව' හැඳින්විය හැක.**

**ශ්‍රී ලාංකේය සිනමාවේ අග්‍රගන්‍ය සිනමාවේදියාණන් වන ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් විසින් අධ්‍යක්ෂණය කරන ලද රේඛාව චිත්‍රපටය සඳහා විලී බ්ලේක් කැමරා අධ්‍යක්ෂණයෙනුත්, ටයිටස් තොටවත්ත කලා අධ්‍යක්ෂණයෙනුත්, මර්සිලීනු ජයකොඩි පියතුමා ගේය පද රචනයෙනුත්, සුනිල් බී.එස්. පෙරේරා සංගීත අධ්‍යක්ෂණයෙනුත් දායක වී ඇත. ශාන්තයන් තනු සම්පාදනයෙනුත් දායක වී ඇත.**

■ පියසේන වික්‍රමගේ

('සිනමාවේ 50 වසරක් ලෙස්ටර් ජේම්ස් පීරිස්' කෘතිය සඳහා පියසේන වික්‍රමගේ විසින් මෙම සාකච්ඡාව ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් සූරීන් සමග පවත්වා තිබේ.)

## මගේ සීමාවන් තුළ හිඳිමින් හැකි උපරිමය සිනමාව වෙනුවෙන් ඉටු කළා

**- ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්**

ජපානයේ අකිර කුරසෝවා, ඉන්දියාවේ සත්‍යජිත් රායි ආදි වශයෙන් ගත් කළ ශ්‍රී ලංකාවේ ආචාර්ය ලෙස්ටර් ජෙම්ස් පීරිස් නම් වූ සුවිශේෂී නාමය අපට ගෞරවයෙන් යුතුව සිහිපත් වෙයි. මේ වන විට 97 හැවිරිදි වියේ පසුවන මේ අග්‍රගන්‍ය සිනමාකරුවාට චිරජීවනය පතමින් පහත සංවාද සටහන මෙසේ පළ කොට සිටිමු.

**Q සිනමාකරුවකු හැටියට ඔබගේ සිනමා නිර්මාණ කාර්යයෙන් ඔබ අත්කර ගත් දේ හා නොගත් දේ කුමක් ද?**

සිනමාකරුවකු හැටියට සිනමාවෙන් මා ප්‍රකාශ කළ දේවලට අමතරව, සිනමාවෙහි කුතුහලය දනවන විවිධ ඉසව් යන ආදියට අමතරව, සිනමාවෙන් මට අත්කර දුන් සුවිශේෂම මෙහෙවර නම්, සිනමාව හරහා යළි මා මගේ මවුබිමට සමීප කිරීමයි. එය සිනමාවෙන් මා අත් කරගත් සුවිශාලතම සේවාවක්. වෙනත් ආකාරයකට කියතොත්, මා සිනමාවට, සිනමාකරුවකු හැටියට කළ මෙහෙවරට වඩා ලද ප්‍රතිලාභයක් එය. ඒ කියන්නේ සිනමාව හේතුවෙන් මා ලක්දිවට යළි පැමිණුනා. එසේ නොවුණේ නම් මා එංගලන්තයෙහි රැඳෙන්නට ඉඩ තිබුණා. කුමක්දෝ දෛවෝපගත සිද්ධියක් හේතුවෙන්, අද ඔබ හා මම කරන මෙම සංවාදය වැන්නකට මම එදා පුවත්පත් කලාවේදියකු ලෙස එක්තරා පුද්ගලයකු හමුවීමට ගියා. ඔහු තමයි මගෙන් ඉල්ලා සිටියේ, යළි ලංකාවට එන්නැයි කියා. එසේ ලක්බිමට පැමිණීම හේතුවෙන් මම මගේ අක්මුල් පාදා ගත්තා. එතැන් පටන් සිනමාව හරහා මම බොහෝ දේ අත්කර ගත්තා. එය ලක්බිමේ මගේම ජනතාව කරා මා සමීපස්ථ කළා. මම යළි මගේ මවුබිමට පැමිණියා. සිනමාව නිසා නොවේ නම්, මා යළි ලක්බිමට පැමිණීමක් සිදුවෙතැයි සිතීම අසීරුයි. බටහිරට නැඹුරු සංස්කෘතියෙන් මා ඉවත් කළේ, මා වියෝ වී සිටි ලාංකීය සංස්කෘතියට මගේ ජාතිකත්වයට මා සමීප කරවූයේ සිනමාවයි.

**Q ශ්‍රී ලාංකේය සිනමාකරුවෙකු ලෙස ඔබ අත්කර ගත් සුවිශේෂී තත්ත්වය මෙතෙක් කියූ දේ අනුව විග්‍රහ කළොත්?**

ඇත්ත වශයෙන්ම අප 'රේඛාව' චිත්‍රපටය නිර්මාණයට විලී බ්ලේක්, ටයිටස් තොටවත්ත සහ මම, අපි තුන්දෙනා ප්‍රයන්ත දැරුවේ හොඳ චිත්‍රපටයක් හදන්නටයි. අපට මේ චිත්‍රපට ලංකාවෙන් බැහැර විදේශයකට යවන්නට කිසිදු අදහසක් වුවමනාවක් තිබුණේ නැහැ. සම්මාන දිනාගැනීම වගේ අදහසක් වූයේද නැහැ. අපට වුවමනා වූයේ හොඳ චිත්‍රපටයක් හදන්නටයි. සිංහල චිත්‍රපටයක් යැයි කට පුරා කිව හැකි චිත්‍රපට මාධ්‍යයද භාවිතයෙන් අප දන්නා සිනමාවද භාවිතයෙන් (දැන් තමා අප දන්නේ එවක අපේ දැනුම කොයි තරම් සීමා සහිත වූවක්ද කියා) චිත්‍රපටයක්, හොඳ සිංහල චිත්‍රපටයක් නිර්මාණයයි. ඉන් පරිබාහිර දේ සෙවීම්, බැලීම් කළේ අපි කවදාවත් නොසිතූ විරූ අයයි. මරියා ෂ්වෙක් නමැති නිළිය රේඛාව චිත්‍රපටය නැරඹීමෙන් අනතුරුව ප්‍රංශයේ කාන් අන්තර් ජාතික චිත්‍රපට උළෙලට (Cannes International Film Festiveal) සහභාගී වන්නැයි මගෙන් ඉල්ලා සිටියා. ප්‍රංශයේදී රේඛාව චිත්‍රපටයට කිසියම් පිළිගැනීමත් ලැබුණා. මේවා අප විසින් අපේක්ෂා නොකළ දේ. පසුකාලීනව ඉන්දියාවෙන් සහ ප්‍රංශයෙන් ජීවිත කාලය පුරා සිනමාවට කළ මෙහෙයට ඇගයුම්, උසස්ම සම්මාන (Lifetime Achievement Award) පුදනු ලැබුවා. චිත්‍රපටකරණය ආරම්භ කළ අවස්ථාවේ සම්මාන හිමිකර ගැනීමක් පිළිබඳව අප සිතුවේ නැහැ. එවැන්නක් උදෙසා සැලසුම් කළේත් නැහැ. මගේ අදහසේ හැටියට, මේ සියල්ල පසුපස ඇත්තේ සිනමාව වෙනුවෙන් අප කළ කැප කිරීමයි. මා සිතන්නේ ඕනෑම දෙයක් සාර්ථක වීමට සිනමාව වේවා, නාට්‍යය, සංගීතය වේවා, එහි නිර්මාතෘන්ට දර්ශනයක් (vision) තිබිය යුතුයි. මුදල් ඉපයීමට අරමුණු කරගත් අය පවා, එහි ලා සාර්ථක වන්නේ එවන් දැක්මක් දර්ශනයක් ඇති විටයි. සිනමාව විෂයෙහිදී ඔබේ දේශය (රට), එහි භූ දර්ශන, එහි භෞතික ස්වරූපය ඔබ උකහා ගත යුතුයි. මේ මා විසින් නිර්මාණය කරන ලද සිනමාවෙහි ස්වරූපයයි. එමගින් මනුෂ්‍යත්වය ඉදිරිපත් කරන්නයි හැඩ ගැසුණේ. ඒ සිනමා වෘත්තාන්තවලින්I චිත්‍රපටවලින් පිටස්තර වූ විෂය සඳහා මා යොමු වූයේ අවස්ථා කිහිපයකදී පමණයි. සංදේශය, වීර පුරන්අප්පු, ගෝඩ් කිං වැනි චිත්‍රපට උදෙසා මාගේ කොපමණ කැපවීමක් තිබුණත්, මහන්සියක් දැරුවත්, ඒ චිත්‍රපට අර දර්ශනයෙන් පිටස්තරයි. ඒ රාමුවෙන් පිටස්තරයි.

**Q ශ්‍රී ලාංකීය සිනමාකරුවකු හැටියට ඔබ අත්කර ගත් තෘප්තිය, කාර්ය සාධනය ගැන විමසීමක් කළොත් ?**

සිනමාකරුවකු ලෙස මා මෙයට වැඩි යමක් කළ යුතුව තිබිණැයි මට සිතෙනවා. මූල්‍යමය අනුග්‍රහය පක්ෂයෙන් බොහෝ පසුගාමී තත්ත්ව තිබුණා. සමකාලීන වෙනත් සිනමාකරුවකු හා සසඳන විට අසල්වාසී ඉන්දීය සිනමාකරු සත්‍යජිත් රේ හට හැම අවුරුද්දකම වාගේ කෙසේ හෝ චිත්‍රපට නිෂ්පාදනයට අවශ්‍ය අරමුදලක් තිබූ තත්ත්වය දැක්විය හැකියි. අරමුදල් නැතිව කිසිවක් කළ නොහැකියි. සත්‍යජිත් රේ චිත්‍රපට තිස්පහක් නිර්මාණය කළා. ඒ අතින් විමසන විට, චිත්‍රපට විස්සක් නිර්මාණයෙන් අනතුරුව මට සිතෙන්නේ. ඒවා පිළිබඳ විමසිය යුත්තේ මා නොවෙයි.

**Q 1959-සංදේශය, 1964-ගම් පෙරළිය මෙවැනි කාල පරාස තුළ ඔබගේ සිනමා කාරියේ හිස් අවකාශ දැකිය හැකියි. මේ පිළිබඳ යමක් කීවොත්?**

එය අප කළ කැප කිරීම සිහිපත් කරන්නක්. ආරම්භක යුගයේ මම වාර්තා චිත්‍රපට නිර්මාණය කළා. එහි වාණිජමය අරමුණක් වූයේ නැහැ. ඇත්ත වශයෙන් එය වගකීමක් වූවා. සිනමා මාධ්‍යය මූලිකම වාණිජ පදනමක පිහිටි කර්මාන්තයක්. මේ මාධ්‍යය උදෙසා යම්කිසි පරිත්‍යාගයක් කරන්නට කැපවීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා ආත්ම ශක්තියක්ද අවශ්‍යයි. (strength of spirit) ඒ සඳහා මා හට විශාල ශක්තියක් වූයේ මගේ බිරිඳ වූ සුමිත්‍රා පීරිස්. ඇගේ සහයෝගිත්වයට, කාන්තාවක් වශයෙන් සිනමාවෙහි නිරත සිනමාකාරියක් හැටියට ඇගේ තිබූ ශක්තිය මට ඉවහල් වූ ආකාරය සඳහන් කළ යුතුයි. ඇගෙන් ඉතා විශාල ප්‍රමාණයක සහයෝගිත්වයක්, උපකාරයක් මට ලැබුණා. ඒ වගේම ඒ සහයෝගිත්වය ඉතා ක්‍රමානුකූල, විධිමත් ආකාරයෙන් පළ වුණේ. එවැන්නක් නොවූවා නම්, මමත් මුදල්මය අරමුණුම සලකාම සිනමාවෙහි නිරත වන්නට ඉඩ තිබුණා. නැත්නම් මේ සියල්ල අතහැර දමන්නට ඉඩ තිබුණා.

**Q ඔබේ සිනමාව සම්බන්ධ විවිධ විචාරක මතවාද ගම් පෙරළිය චිත්‍රපටය පටන්ම තිබුණා. විවිධ මතවාද - මේවා ගැන ඔබ මොකද කියන්නේ? (විශේෂයෙන් සිංහල ජන ජීවිතයට ආගන්තුක බව පිළිබඳව)**

මට ප්‍රශ්න තුනක් තිබුණානේ? අපේ යුගයේ අධ්‍යාපනය දුන්නේ ඉංගිරිසි මාධ්‍යයෙන්. අනෙක කතෝලික ආගම. ඔය දෙකෙන්ම කැපෙනවනේ? කිසි කතාවක් නෑනේ. බටහිර අධ්‍යාපනය හරහා අක් මුල් කැපීම සිදු වූ බව සත්‍යයක්. ඉතින් මගේ වෘත්තාන්ත සිනමාව හැමවිටම පදනම් කර ගත්තේ සිංහල බෞද්ධ පවුල් ජීවිතයයි. ඒ කුටුම්බයයි. ලෙස්ටර් ජේම්ස් පීරිස් චිත්‍රපට නිර්මාණය කරන්නේ සිනමා බසින් බව කිව යුතුයි. එය වෙනම බසක්. සිනමා බස, සිංහල බස නොවේ. සිංහල දෙබසින් චරිත කතා කරන විට, චරිත කතා කරන බස සිංහලයි. එනමුදු සිනමා බසට සිංහල බස සම්මිශ්‍ර වුවත්, චිත්‍රපට නිර්මාණය කළ යුත්තේ සිනමා භාෂාවෙනුයි. මුල් යුගයේ සිනමා විචාරකයන් ලෙස හඳුන්වනු ලැබූ බොහෝ දෙනාට සිනමාව පිළිබඳ තිබුණේ අල්ප අවබෝධයක් බව දැන් ප්‍රකට කරුණක්. ඔවුන්ගෙන් ඇතමෙක් රේඛාව, සන්දේශය ආදි මගේ මුල් කාලීන චිත්‍රපට පිළිබඳ කිසිවක් ලිවීමෙන් වැළකී සිටියා. ගම් පෙරළිය සම්බන්ධව වූවත්, ඔවුන් ප්‍රතික්‍රියා දැක් වූයේ එලෙසයි. ඔවුන් ගම්පෙරළිය චිත්‍රපටය ජාත්‍යන්තර සම්මානය ලද පසුයි ඒ පිළිබඳ ලියන්නට උත්සුක වූවේ. මේ මුල් යුගයේ විචාරකයන් කියූ අය බොහෝ කොට නැරඹුවේ ඉන්දීය දෙමළ හා හින්දි චිත්‍රපටයි. කෙසේ වූවත් සිනමාවේදී මුඛ්‍ය වන්නේ සිනමා බසයි.

**Q සිනමාවේ අනාගතය සහ අනාගත සිනමාව ඔබ දකින්නේ කෙලෙසක ද?**

අනාගතයේ සෙකපි නැත්නම් දළ සේයා පට නැතිවේවි. එනමුදු සිනමාව නම් පවතීවි. වෙනත් ස්වරූපයකින් සිනමා ක්‍රමවේදය වෙනස් වේවි. විශේෂයෙන්ම සිනමා තාක්ෂණවේදය. එසේ වූවත් සිනමාවෙන් කතාන්තර කීමේ කලාව අපට දක්නට ලැබෙයි. කතාන්තර ස්වරූපය එසේම පවතීවි. සිනමා තාක්ෂණවේදය පමණක් වෙනස් වේවි. එසේ වූවත් සිනමාව කෙදිනකවත් මිය යන්නේ නැතැයි මා කියනවා. අනාගතය සලකන විට, සිනමාවෙන් අප අත්කර ගත් දේ පිළිබඳ සෑහීමට පත්විය හැකියි. සිනමා තාක්ෂණය පක්ෂයෙන් නම්, අප අත්‍යන්තයෙන්ම වසර තිහක් පිටුපසින් සිටින්නේ. කෙසේ වූවත් මූල්‍යමය පක්ෂය සැලකිය යුතුයි. අරමුදල් ශක්තිය නිසි පරිදි සැලසේ නම්, අපට සිනමාවේ නව පරපුරක්, ඉතාමත් ප්‍රතිභාන්විත නව පරපුරක් සිටිනවා. ඔවුන් කෙමෙන් නැගී එනවා. ඒ සම්බන්ධයෙන් මගේ කිසිදු සැක සංකාවක් නොමැති බව කිව යුතුයි. අනාගතය ඉතාම සුබදායී ලෙස ඔවුන් අත රැඳී ඇත්තක්. එහිලා අවශ්‍ය වන්නේ ඔවුනට අත්‍යවශ්‍ය පිටුබලය ලැබීම පමණයි. සිනමාව ආරක්ෂා කළ යුතුයි. එසේ අමාත්‍යාංශ වෙනස් වීම හොඳයි. මෙයට පෙරාතුව 1970-77 ආණ්ඩුව කාලයේ ප්‍රවෘත්ති අමාත්‍ය ලෙස ආර්. එස්. පෙරේරා කටයුතු කළ සමයෙහි, බණ්ඩාරනායක අගමැතිනිය ජාතික චිත්‍රපට සංස්ථාව එතුමිය යටතේ තබා ගත්තා. ඒ අප සිනමාකරුවන් ලෙස කළ කරුණු දැක්වීම්වලින් අනතුරුවයි. පසුගිය කාලයේ ජාතික චිත්‍රපට සංස්ථාව, වාරිමාර්ග අමාත්‍යාංශය යටතේත් පාලනය වූවා. එය වෙනම කරුණක්. ඒත් අප තවම ශබ්ද පටිගත කරන්නේ ආදිවාසී යුගයේ උපකරණවලින්. එය ස්ටීරියෝ ක්‍රමයවත් නොවේ. God King චිත්‍රපටයට ශබ්ද නිර්මාණය කළේ ඩෝල්බි ක්‍රමයටයි. God King චිත්‍රපටය ඒ හඬ පටය සමග පෙන්වන්නට සිනමා හලක් මෙරටේ තිබුණෙ නැහැ. අද වනවිට පුවත්පත් පවා නූතන තාක්ෂණය බහුලව භාවිත කරනවා. අද මම චිත්‍රපට යැයි අදහස් කරන්නේ සෙලියුලොයිඩ් පට සිනමාවයි. එය අභාවයට යෑම සිදුවේවි. එතැන හිමිකර ගන්නේ තැටි හෝ පට විසින්. සංයුක්ත තැටි බොහෝ කොට එතැන හිමිකර ගනීවි. සමාප්ත සටහනක් ලෙස මට කිව හැක්කේ මගේ සීමාවන් තුළ හිඳිමින් වුව, මා, මට කළ හැකි උපරිමය සිනමාව තුළින් ඉටු කළ බවයි.





# කොළඹ වහල් දූපත

■ සටහන - පුෂ්පා වීරසේකර

වහල් දූපත ලෙස සිංහල වහරට ගැණුන ස්ලේව් අයිලන්ඩ් - Slave Island මෙයට සියවස් තුන හතරකට පෙර කාපිරින් රඳවා සිටි පෙදෙසකි. වර්තමාන කොළඹ - 02 ලෙස හඳුන්වන කොම්පඤ්ඤවීදියට අයත් ප්‍රදේශයේ මෙම වහල් දූපත තිබුණා යැයි සැලකේ.

ආචාර්ය කේ. ඩී. පරණවිතාන මහතා පවසන පරිදි කොළඹ ජනප්‍රියම නම හා ස්ථානයත් මේ කොම්පඤ්ඤ වීදියයි. පසු කලෙකදී රෝහල් සමූපකාර, කාර්යාලය, කුරුඳු වගා, ආගමික ස්ථාන, ගුවන් හා යුද හමුදා කඳවුරු, වෙළෙඳ ව්‍යාපාරික ආයතන රාශියක් කොම්පඤ්ඤවීදියේ පිහිටුවනු ලැබ ඇත.

ඇෆ්ගන් ජාතිකයන් බහුලව සිටි නිසා 'ඇෆ්ගන් ටවුම' ලෙසත්, කාපිරි ජාතිකයන් සිටි නිසා 'කාපිරි නගරය' ලෙසත්, මැලේ ජාතිකයන් සිටි නිසා 'මැලේ නගරය' ලෙසත් විටින් විට හැඳින්වූ කොම්පඤ්ඤවීදිය ඇතැම් විටදී 'බේරේ ටවුන්' ලෙසද ඇතැම් ඉංග්‍රීසි හා සිංහල ලේඛනවල දක්වා ඇත.

කොම්පඤ්ඤවීදියට 'වහල් දූපත' යන නම හැදුණු ආකාරය ගැන ඇත්තේ මෙවන් කතාවකි.

1630 දී පමණ පෘතුගීසින් විසින් ඉන්දියාවේ සිට මෙරටට රැගෙන එන ලද කාපිරි ජාතිකයන් සිටි නිසා වහල් දූපත ලෙස නම් වූ බව කියැවේ. ඉන්දියාවේ ගෝව ප්‍රදේශයේ සිට මලබාර් වරායෙන් මෙම කාපිරි පිරිස් මෙරටට ගෙන්වා ඇත්තේ වහල් සේවයේ යෙදවීමටය. ලෝකයේ බොහෝ පෘතුගීසි යටත් විජිත වල මෙම අප්‍රිකානු කාපිරි ජාතිකයන් වහල් සේවයට ගෙන සේවයේ යොදවා ඇත.

ඇතැම් විට වෙළෙඳ භාණ්ඩ ලෙසත්, සොල්දාදුවන් ලෙසත්, කඳවුරු සහායකයන් ලෙසත්, ද්‍රව්‍ය ප්‍රවාහකයන් ලෙසත්, මෙම අප්‍රිකානුවන්ව සුදු ජාතිකයන් විසින් යොදවා ගත් බව සඳහන්ය. මෙලෙස යොදා ගත්තේ මෙම පිරිස් අයිතිව සිටි ස්වාමිවරුන්ට මුදල් ගෙවා බවද පැවසේ.

ස්වභාවයෙන්ම සැහැසි ජාතියක් වූ නිසා මොවුන්ගේ විශාල තොල් යා වන පරිදි යකඩ ඉබ්බන් දමා අත්වලට මාංචු සහිත යකඩ දම්වැල් දමා ඇතැම් විට මෙරට සේවයේ යොදවා තිබී ඇත. ඒ ඔවුන් ඇතැම්විට මිනිසුන් සපා මරා දමනු ඇතැයි යන බිය නිසාය. මන්ද යත්, මෙම කාපිරි ජාතිකයන් මිනී මස් බුදින්නන් ලෙස ඇතැම් රටවල ප්‍රචලිතව තිබූ නිසාය.

කෙසේ හෝ මෙරටට ගෙනා කාපිරි පිරිස් පෘතුගීසීන්ගේ නොයෙක් වගා බිම්වල හා ගෘහ සේවයේ යොදවා තිබුණි. පෘතුගීසීන් පමණක් නොව ලන්දේසීන්ද මෙම පිරිස් වගා බිම්වල යොදවා ආහාර ද්‍රව්‍ය වගාව මෙන්ම වී වගාවද කරවූ බවත් සඳහන්ය. ඇතැම් යහපත් චර්යා දැක්වූ පිරිස් කොළඹ රෝහලේ සාත්තු සේවයටද යෙදවිණි.

18 වැනි ශතවර්ෂයේදී පමණ මෙම කාපිරින්ගේ කැරැල්ලක් හටගෙන ඇත. එහිදී පාරවල් දෙපස ගොඩනැගිලිවලට හානි පමුණුවමින් මෙම කැරැල්ල පැතිර ගොස් තිබේ. මොවුන් ඉතා ප්‍රචණ්ඩ අයුරින් එහිදී හැසිරී ඇති බවද සඳහන්ය. එම කැරැල්ලේදී බැරැන්ට් වැන්ඩර් ස්ටොන්ස් නම් පිස්කල්වරයා හා ඔහුගේ බිරිඳ නිදි යහනේදීම කිරිච්චියකින් ඇණ මරා දමා ඇත.

කෙසේ හෝ වැන්ඩර් පිස්කල්ගේ නිවසේ සේවය කළ එම කාපිරි ජාතිකයා මිනීමැරුමට පෙර ඔවුන්ගේ නිදි යහන යට සැඟවී සිට ඔවුන් නින්දට යනතුරු බලා සිටි බවත් එවක මූලාශ්‍රවල ලියැවී ඇත.

එවකට ආණ්ඩුකාර අයිසැක් මේෆ් විසින් මෙම කැරැල්ල දැඩිව මර්දනය කිරීමට පියවර ගෙන ඇත.

කැරැල්ල මැඩ පැවැත්වූ පසු සෑම දිනකම ඒ ඒ ආයතනවල, නිවාසවල වැඩ කළ කාපිරි ජනයා සියලු දෙනාම 'කාපිරි තැන්න' නම් ස්ථානයට කැඳවා ඇත. එහිදී සියලුම දෙනාගේ නම් අඬගසා අඩු අය කවුරුන්දැයි සොයා බැලිණි. ඉන් පසුව කොටුවේ කොටු බැමි අතර පටු පාරක් දිගේ කැඳවාගෙන සැලිපෝර්ට් යන ස්ථානයට ගෙනගොස් ඇත. සැලිපෝර්ට් යනු එවකට වැවේ තිබූ තොටුපළක් විය.

එහිදී තිබූ බෝට්ටුවලට මෙම කාපිරින් පටවාගෙන ලන්දේසි බසින් අයිජේ නමින් හැඳින්වූ කඩතොළු සහිත දිවයිනකට රැගෙන ගොස් ඇත. එම දිවයින අර්ධද්වීපයක් ලෙස තිබූ එකකි. එම අර්ධද්වීපයට කැඳවාගෙන ගිය මෙම පිරිස ලැයිම් හා මුඩුක්කුවල පදිංචි කරවා ඇත.

ඒ නිසාම සියවස් තුනක් තිස්සේම 'වහලුන්ගේ දූපත' ලෙස මෙය හඳුන්වා ඇත. එය 'වහලුන්ගේ දූපත' ලෙස හංවඩු ගැසීම නිසා පසු කලෙක බොහෝ විචාරක දෝෂ දර්ශනයටද ලක්ව ඇත. මෙයට වහල් දූපත ලෙස බ්‍රිතාන්‍යයන් නම් කෙරූ බවද ඇතැම්හු සළකති.

එහෙත් වර්ෂ 1845 දී පමණ බ්‍රිතාන්‍යයන්ම මෙරට වහල් සේවය තහනම් කර ඇති අතර එය නීතිගත කර ඇත. ලංකාවේ වහල් සේවය තහනම් කර දිගු කලකට පසු ලෝකයේ වහල් සේවය තහනම් කිරීමද විශේෂත්වයකි.

මුල්ම අවධියේදී රෝගී හා මහලු අය මෙම දූපතේ රදවා තිබූ බව ඉංග්‍රීසි මූලාශ්‍රවල සඳහන්ය.

1807 දී පමණ කාපිරි ජාතිකයන් හත්සියයක් පමණ මෙරට සිටි බව කෝඩිනර්ගේ වාර්තාවල සඳහන්ය. පුත්තලම, මඩකළපුව, ත්‍රිකුණාමලය ආදි ප්‍රදේශවල පසුකාලයක මෙම ජාතීන් සුළු වශයෙන් පැතිරී ගොස් ඇත.

ස්ලුයිස්කින් නම් කපිතාන්වරයකුගේ මන්දිරයක කාපිරි තූර්ය වාදක කණ්ඩායමක් සිටි බවද ඉතිහාස මූලාශ්‍රවල සඳහන්ය. 'කපිර් වෙල්ඩට්' නම් විවෘත බිමක මෙම කාපිරි වෙනුවෙන් 1875 දී පමණ බ්‍රිතාන්‍ය සොල්දාදුවන් බැරැක්ක ඉදි කරනු ලැබූ බවද සඳහන්ය. එහිදී එක් මායිමක් ලෙස වත්මන් බේරේ වැවත් අනෙක් පස ඇතුළු නගරයේ කොටු බැම්මත් තිබූ බවද සඳහන්ය.

කෙසේ හෝ ලන්දේසි යුගයේ කොළඹ කොටුව නිර්මාණයට කාපිරි ජාතිකයන් යොදවා ගත් බවත් එකල කාපිරින් හාර දහසක් පමණ මෙරට සිටි බවත් ආණ්ඩුකාර ගොයන්ස්ගේ වාර්තාවක සඳහන්ය.

මුවෙන් චිකෝ නි සංගීත රාවයත් චතුරංග හෙවත් ක්වෝඩ්‍රිල් නැටුමත් මෙම කාපිරින්ට ආවේණික වටිනා සංස්කෘතික දායාද බවද සැලකේ.

කාපිරියකු විසින් මරා දැමුණු වෙරන්ට් වැන්ඩර් වරයාගේ නිවස පසු කලෙක භූතයන් හොල්මන් කළ නිවසක් බවද කට කතා පැතිරී ඇත. එම නිවසේ පසු කලෙක පදිංචි වූවන්ට වැඩිකලක් ගතකිරීමට තරම් හැකියාවක් නුවූ නිසා පසු කලෙක බ්‍රිතාන්‍යයන් කෝපි ගබඩාවක් ඉදිකර ඇත. පසු කලෙක එම කෝපි ගබඩාව කඩා ඉවත් කර ඇති අතර අද එය තිබූ තැනක්වත් සොයාගත නොහැකිය.

කොළඹ කොටුවේ ලංකා බැංකු ගොඩනැගිල්ල අසල ඇචිලන් බැරැක්ක වලට යාබදව 'කපිර් වෙල්ඩට්' හෙවත් 'කාපිරි තැන්න' තිබී ඇත. ඕලන්ද බසින් කපිර් වෙල්ඩට් යනු කාපිරින් පෙරට්ටුව සඳහා කැඳවූ ස්ථානය යැයි සැළකේ. එය පසුව 'කාපිරි මුඩුක්කුව' ලෙස හඳුන්වා මෑත දශක දෙකකට පමණ පෙර 'කෝසල පටුමග' ලෙස හඳුන්වා ඇත.

කාපිරින් ලංකාවට ගෙනෙනා විට ලංකාවේ වහල් සේවය නොතිබුණි. එය ලංකාවාසීන්ට ආධුනික දෙයක් විය. හත්ති කුච්චි සෙල් ලිපියේද, අරාබි වාර්තාවලද ක්‍රි.ව. අටවැනි හා නවවැනි සියවස්වල මහා තිත්ථවල කාපිරි මිනිසුන් සිටි බව සඳහන් ව ඇත. ඇතැම් කාපිරින් විහාරස්ථානවල ඇබිත්ත තනතුරේද සිට ඇත.

1815 දී සිංහල මුස්ලිම් කෝලහල වලටද සම්බන්ධ වූ මොවුන් ප්‍රථම හා දෙවන ලෝක යුද සමයේදී යුද සේනාංකවලටද අපේ රට වෙනුවෙන් යුද්ධයට සහභාගි වී ඇත. එපමණක්ද නොව රොබට් නොක්ස්ගේ වාර්තාවලට අනුව දෙවැනි රාජසිංහ රජු තම ශ්‍රී විභූතිය වර්ණවත් කිරීමට කාපිරි යුද සේනාංකයක්ද භාවිතා කර ඇත.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඉංග්‍රීසීන් විසින් අත් අඩංගුවට ගන්නා විට රජුගේ සේනාවේ කාපිරින් දෙසීයක් සේවය කළ බව ජෝන් ඩොයිලිගේ වාර්තාවල සඳහන්ය. පිරිමි අය මෙලෙස යුද කටයුතුවල නිරත වූ අතර කාන්තාවන් ගෘහ සේවයේ ඉවුම් පිහුම් කටයුතුවලට සහභාගි වී ඇත.

කෙසේ වෙතත් විසිවන සියවසේදී පමණ ලංකාවේ පුවත්පත්වලින් මෙම කාපිරි ජනතාව සිටි ප්‍රදේශය හැඳින්වූ 'වහල් දූපත' යන්නට එරෙහිව ප්‍රබල හඬක් නංවා ඇත. ලන්දේසි ඉංජිනේරුවරයකු වූ 'ද බියර්' සිහිවීමට කාපිරි ජනයා සිටි මෙම ප්‍රදේශයේ වැව 'බේරේ වැව' ලෙස නම් කළ බැව් ඇතැම්හු පවසති. එලෙස බේරේ වැව කියා නම් කළා නම් වහල් දූපත යන නම නොදා 'බේරේ නගරය' ලෙස නම් නොකළේ ඇයිදැයි ඇතැම්හු ප්‍රශ්න කරති.

එහෙත් ද බියර් සිහිවීමට බේරේ වැව කියා නම් කිරීම පිළිගත නොහැකි බවද තවත් අය කියති. 1659 දී ලන්දේසි ජාතික මිනින්දෝරු ඒඩ්‍රියන් ද ලීව් නම් නගර නිර්මාණකරු හා මිනින්දෝරුවා කොළඹ කොටුව නිර්මාණය කරන විට වත්මන් බේරේ වැවට කිසිදු නමක් නොතබා ජලාශය යැයි නම් කර ඇත. 1796 දී සිතියමක 'කොළඹ විල' ලෙස නම් කර තිබුණද බේරේ වැව යන නම නිල වශයෙන් ලැබී ඇත්තේ 1927 වර්ෂයේදීය.

කෙසේ හෝ වහල් දූපත ලෙස හැඳින්වූවද මෙම ස්ලේව් අයිලන්ඩ් නම් ප්‍රදේශයේ කිසිදු දූපතක් මේතාක් හමුවී නොමැති බව ඉතිහාසඥයෝ මත පළකරති.

සියවස් දෙක තුනක් තිස්සේ කොළඹ නගරයේ ඉතාම මනස්කාන්ත නිසංසල දර්ශනයක් වූ බේරේ වැව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසින්ගේ අපමණ වර්ණනාවන්ට ලක්ව ඇත. කලක් එහි ඔරු පැදීම්. බිලී බෑම් වැනි තරග පැවැත්වූ බවද සඳහන්ය. එවන් සුන්දර දර්ශනවලට හිමිකම් කියූ බේරේ ජලාශය අද වන විට බොහෝ දෙනාගේ නාසය දුගඳින් හකුළුවන ස්ථානයක් බවට පත්ව ඇති බවද කිව යුතුමය.

# මිණිබිරිය



## කෙටි කතාව

■ **අමරවීර කොළඹගේ**

ජිනදාස මහත්තයා දැන් සීයා කෙනෙක්. ආණ්ඩුවේ සේවයෙන් විශ්‍රාම ගිහිල්ලා දැනට වයස අවුරුදු හැටතුනක් වෙන නිසා කොහොමටත් සීයා කෙනෙක් තමයි. ඒත් ලොකු දියණියට දුවෙක් ලැබුණු නිසා 'සීයා' වීම හොඳටම අර්ථවත් වුණා.

"මයි කොන්ග්‍රැජ්‍යුලේෂන්, සීයා කෙනෙක් වුණාය කියලා ආරංචියි..." කියලා මේ ආරංචිය අහපු මිතුරෙක් සුබ පැතුවා.

"ඔව්. ඔව්. බොහොම ස්තූතියි...." කියමින් ජිනදාස ස්තූතිය පළ කළේ මහත් ආඩම්බරෙන්.

"මිණිබිරියක්ලු නේද?" මිතුරා ඇහුවා.

"ඔව්"

"පවුලකට ගෑනු ළමයෙක් ඉස්සෙල්ලා ලැබෙන එක හොඳයි" මිතුරා කිව්වා.

"මමත් හිතුවෙ එහෙමයි" ජිනදාස කිව්වා.

ඉපදෙන්න ඉන්න දරුවා දුවෙක්දැයි පුතෙක්දැයි දැනගනු පිණිස දියණියගේ ගැබ ස්කෑන් පරීක්ෂණයට යොමු කරලා තිබුණා. ලැබෙන්න ඉන්නේ ගැහැනු දරුවෙකු බව දැනගත් දියණිය නිවසට ඇවිත් හොඳටම හඬා තිබුණා.

ජිනදාස නම් බලාපොරොත්තු වුණේ දුවගේ හැඩරුවම තියෙන මිණිබිරියකුයි. ඒත් ජිනදාසගේ ඒ ආශාව ඉටු වුණේ නැහැ. සාමාන්‍යයෙන් ගෑනු දරුවෙක් බොහෝ වෙලාවට අම්මාගේ හැඩ රුව ගන්නවා. ඒත් මිණිබිරිය හරියටම ඇගේ පියා වගේ. ඒ මූණුවරමයි. පියා තරමක් කළු නිසා මිණිබිරියටත් එයින් ටිකක් ලැබී තිබුණා. මවයි පියයි දෙන්නම තරහ නොවෙන විදියට පුංචි මිණිබිරී පියාගේ මුණුවරත්, ඔහුගේ පාටින් ටිකකුත් අරගෙන ඇගේ මවගේ කුසින් බිහි වෙලා තියෙනවාය කියා ජිනදාසට හිතුණා.

දරුවා ලැබෙන්න ඉන්දැද්දී දියණියට සෑම වෛද්‍ය උපදේශයක්ම ලැබුණා. සායනවලට නොවරදවාම ගියා. දරුවා බිහි වුණෙත් අගනුවර හොඳම රෝහලේ.

ජිනදාසට පුංචි කාලේ මතක් වුණා. කුසේ ඉන්නේ ගෑනු දරුවෙක්දැයි පිරිමි දරුවෙක්දැයි කියලා දැන් කාලේ ලේසියෙන් දැන ගන්න පුළුවන් වුණාට ජිනදාසලා පොඩි කාලේ ගැබිනි අම්මාගේ පෙනීමෙන් තමයි හම්බ වෙන්න ඉන්න දරුවා ගෑනු දරුවෙක්ද පිරිමි දරුවෙක්ද කියන එක නිශ්චය කළේ. ගෑනු උදවිය නොයෙක් අදහස් පළ කෙරුවා. ගැබ ලොකු නම් අනිවාර්යයෙන්ම ගෑනු දරුවෙක්ලු. අම්මා පාට වැටෙනවානම් ගෑනු දරුවෙක්ලු. ගැබ කුඩා නම් පිරිමි දරුවෙක්ලු. ඇතැම් විට ඒවා හරි ගියා.

මිණිබිරියට මාස තුන හතරක් ගත වුණා. සිංහල අවුරුද්දට දෙමාපියන් සමග මිණිබිරිය සීයලා බලන්න එන බව ආරංචි වුණා.

"අක්කලා එන්නේ හයි වේ එකේලු. දවල්ට කෑමට මෙහේ එන්න ඇහැක්වෙයිලු" පොඩි දුව කිව්වා.

පොඩි දූ කිව්වා වගේම ජිනදාසගේ දුවයි, බෑණයි, මිණිබිරියි 'හයි වේ' එකෙන් නැත්නම් අධිවේගී පාරෙන් ඔවුන්ගේම කාර් එකෙන් ආවා. කොළඹිනුත් එහා ඉඳලා එන්න ගත වෙලා තිබුණේ පැය දෙකහමාරක් වගේ වෙලාවක්.

ජිනදාසගේ බිරිඳගෙ මූණ හරි සිරියාවයි. උදේ ඉඳලා කෑම උයලා, බෙදලා, ඉවර වෙලා නාලා කාරිය මග බලාගෙන හිටියෙ මිණිබිරී පිළිගන්නයි.

වාහනෙන් බැස්ස විතරයි අත්තම්මා කාර් එක ළඟට ගියේ දුවගෙන. වාහනේ දොර ඇරියා. අත්තම්මා මිණිබිරිය වඩා ගත්තේ බොහොම ප්‍රවේශමෙන්. තදින් ඇල්ලුවොත් හැඩේ වෙනස් වෙන වස්තුවක් එසේ නොවීමට දෑතට ගන්නවා වගේ හරිම ප්‍රවේශමෙන්, ඒ වෙලාවෙ වැස්සක් තිබුණෙ නැතත් අත්තම්මගෙ හිසෙන් මිණිබිරී මුවා කරගෙන මිණිබිරීගේ හිසට අතකුත් තියාගෙන, තුරුලු කරගෙන, හංගාගෙන වගේ ගෙට ගියේ වැස්සකින් බේරගන්න වගේ. ගියා නොවෙයි දිව්වා.

මිණිබිරී ගෙදර හැමෝගෙම මුහුණු බැලුවේ නුපුරුදු විලාසෙකින්. ඇයට අමුත්තන් නුහුරුයි. නිවසේ අය ඇය වඩාගත්තු ගමන් හැඬුවා. ඒකට හේතුවක් තිබුනා. මිණිබිරී මුළු දවස තිස්සෙම දකින්න පුරුදු වෙලා තිබුණේ එයාගේ අම්මයි තාත්තයි විතරයි. වැඩියෙන්ම අම්මා. අම්මා මේ දිනවල ඉන්නේ ප්‍රසූත නිවාඩු පිට. නිවසේ වෙන කවුරුවත් නෑ. දූගෙ මහත්තයාට හම්බ වුණු නිල නිවාසෙ තමයි ගෙදර කිව්වෙ. ඒක තට්ටු නිවාසයක්. ඒකෙත් උඩ තට්ටුව. මිදුලක් නෑ. නිල නිවාසෙ තිබුණෙත් ප්‍රධාන පාරෙන් ඈත නිසා වාහන, මිනිස්සු ගියේ කලාතුරකින්. පොඩි එකාට බලන්නය කියලා දෙයක් තිබුණෙ නැති තරම්.

උදෑසන හිරු එළියට දුව රැගෙන යා යුතු යැයි ඇගේ පියා නියමයක් කර තිබුණා. ළදැරිය ජිනදාසට හුරු වුණාට පස්සෙ දවසක ජිනදාස මිණිබිරිත් එක්ක ගෙවත්තට ගියා. මල් පඳුරක කහපාට මල් පිපී තිබුණා. එයින් එක කහ පාට මලක් මිණිබිරීට කඩලා දුන්නා. තවම ඇයට ඒ වගේ සියුම් දෙයක් හරියට ඇඟිලි ක්‍රියාත්මක කරලා ග්‍රහණය කර ගන්න අමාරුයි. ජිනදාස මල අරගෙන දබර ඇඟිල්ලත් මාපටැඟිල්ලත් අතරට තියලා මල කරකැව්වා. මල රෑං පෙත්තක් වගේ කැරකුණා. මිණිබිරිය ඒ දිහා බලා හිටියෙ හරි පුදුමෙන්. ආශාවෙන්. සන්තෝසෙන්. ඒ වගේම වත්තෙ තියෙන හැම මලක්ම සීයා මිණිබිරීට කඩා පෙන්නුවා. වතුසුදු මලක් අරගෙන කන් පෙත්තේ ඉහළත් හිසත් අතර රැඳෙව්වා. ඈට තේරුණා සීයා කරන්නේ එක්තරා අලංකාර වැඩක් කියලා. එයා හිනා වුණා. වට්ටක්කා වැලේ මල් පිපී තිබුණා. ඒ මල් ඇතුළේ මී මැස්සො හිටියා. මිණිබිරී උන් දිහා බැලුවෙ පුදුමෙන්. මී මැස්සා අල්ලන්න තැත් කළා. ඇල්ලුවොත් වෙන ප්‍රතිඵලය ගැන මීමැස්සට තේරුණා. මී මැස්සා පියඹලා වෙනත් දිහාවකට ගියා.

සීයා ඇළ පැත්තට ගියා. ඉර අව්ව වැටිලා. ළා හිරු එළිය. ඒ හිරු එළිය පුංචි මිණිබිරියට අගෙයි කියා සීයාට හිතුණා. සත පහක කාසියක් තරම් පුංචි සුදු සමනලයෙක් උගේ කලබල, ඉහළට පහළට, ඒ පැත්තට මේ පැත්තට, පිළිවෙළක් නැති කඩිසර ගමනින් අඩි පාර දෙපැත්තෙ පඳුරු වල පිපී තිබෙන පුංචි මල් එකින් එකට ගියා. මේ හෙළවෙන, එහා මෙහා පනින සුදු පාට පුංචි වස්තුව කුමක්දැයි පොඩි එකාට ප්‍රහේළිකාවක්. ඇය ඒ දිහා බැලුවේ පුදුමෙන්. සමනලයා උගේ කලබල ගමනෙන් ඈත පඳුරක් තුළ අතුරුදන් වන තෙක් ඇය උෟ දිහා බලා හිටියා. සීයා සමනලයාට 'මයියා' කියලා නමක් තැබුවා. 'මයියා' කියමින් සමනලයාව පෙන්නුවා. පස්සේ පස්සේ 'මයියා' කීවාම සමනලයා වහන පඳුරු දිහා බලන්න ඈ පුරුදු වුණා. ඇළේ මේ වෙලාවට හැම තිස්සෙම කොකෙක් ඉන්නවා. උෟ හැබැයි කන කොකෙක්. සීයත් මිණිබිරිත් එන බව දැනුණු කොකා ඉගිලිලා ගියේ හරියට උගේ සුදු මිණිබිරියට පෙන්නන්න වගේ. පොඩ්ඩි ඒ දිහා බලා හිටියේ ආශාවෙන්. ඇළ දෙපැත්තේ හබරල ගාලක්. වියත් බාගයක විතර වතුර. කොරවක්කෙක් 'කොකරෝක් කොකර කොකර කොකරෝක්' කියලා හඬ නැගුවා. මිණිබිරී බැලුවා ඒ හඬ ආපු දිහා. හඬ ආවේ හබරල ගාලෙන්. ඒත් මිණිබිරීට හඬ ආපු දිහාව නිච්චියක් නෑ. සීයා අඟිල්ල දික් කරලා පෙන්නුවා. දැන් එයා දන්නවා අඟිල්ල දික් කරාම ඒ පැත්ත බලන්න. කොරවක්කා උගේ දික් පා තබමින් වියත් බාගයක් පමණ වතුරේ හබරල ගාල මැදින් පැටව් තුන් දෙනෙක් එක්ක ඉක්මන් ගමනින් ගියා. 'ඔයා වගේම පුංචි දරුවෝ මටත් ඉන්නවා' කියලා කොරවක් හාමිනේ කියන්න ඇති. හබරල ගාලේ කොහේ හෝ තැනක උන්ගේ කූඩු ඇති. සීයත් මිණිබිරිත් එන බව දැනී කබරගෙ යෙක් බෝක්කුව අස්සට රිංගුවා. බොහෝ වෙලාවක් එතන හිටියත් උෟ එළියට ආවෙම නෑ. 'මං කැතයි. එහෙව් මං මොකටද පුංචි ළමයින්ට පේන්න එන්නේ. බය වේවි' කියා කබර ගොයා හිතන්න ඇති. කොණ්ඩ කුරුලු ජෝඩුවක් ලෝකපාලු වැල් ගොන්නක කූඩුවක් තැනුවා. ඒ කූඩුව තියෙන තැන දන්නේ උන් විතරයි. මේ හැම දෙයක්ම සීයා මිණිබිරීට පෙන්නුවා. කිව්වා වගේම මිණිබිරීට බලන්න විශ්වයක් තරම් දේවල් අවට තිබුණා. දෙමළිච්චන්ගේ, මයිනන්ගේ, බට්ටිච්චන්ගේ, පොල්කිච්චන්ගේ හඬවල් හැම පැත්තෙන්ම ඇහෙන්න ගත්තා. තව කොච්චර දේවල් බලන්න අහන්න තියෙනවාද කියා මිණිබිරීට හිතෙන්න ඇති. සෙලවෙන හැම දෙයක්ම බලන්න මිණිබිරීට තිබුණේ පුදුමාකාර උනන්දුවක්. ඈ ඇගේ භාෂාවෙන් විශ්මය පළ කළා. මුහුණෙන් හැඟීම් පළ කළා. විශ්මය, සතුට, දුක, බලාපොරොත්තුව ආදි විවිධ හැඟීම් මුහුණෙන් පළ කරනවානම් එය නළුවන්ටත් වඩා හොඳින් කළ හැක්කේ ළදරුවන්ටය කියා ජිනදාසට හිතුණා. තට්ටු නිවාසේ තිබුණෙ ලී බඩුත් ටයිල් අල්ලපු පොළවත් විතරයි. මෙහේ කොච්චර දේවල් තිබෙනවාද බලන්න කියා මිණිබිරීට හිතෙන්න ඇති. මේ හැම දෙයක්ම පෙන්නන සීයත් එක්ක උදෑසන චාරිකාවේ යෙදෙන්න මිණිබිරී හරිම කැමැත්තක් පෙන්නුවා. මිණිබිරීගෙ අම්මටයි තාත්තටයි ඒවා කර කර ඉන්න වෙලාවක් තිබුනෙ නෑ ඇත්තටම. උදෑසන අවදිවෙලා සීයා එන තෙක් මිණිබිරී බලා හිටියෙ හරිම ආශාවෙන්. අනික් හැමෝටම වඩා සීයා කෙරේ මිණිබිරී තදින්ම බැඳුණා.

සීයගෙයි මිණිබිරීගෙයි සංචාරය තවම ඉවර නෑ. කළු නිසාත්, හැම තැනම ඉන්න නිසාත් කපුටා වැඩිහිටියන්ට එතරම් අගයක් නැතත් මිණිබිරීට නම් අගෙයි. වහළ උඩ, ගස් උඩ කොතෙකුත් ඉන්නා කපුටන් දුටු වහාම ඇයගේ උනන්දුව උන් දෙසට යොමු වුණා. උන් සමග කතා කෙරුවා. ඇඟ පද්දමින් ඒ දෙසට යෑමට උවමනා බව කිව්වා. සීයා මේ සංඥාවල් තේරුම් ගත්තා. කපුටන් ගැන උනන්දුවක් පෙන්නුවත් උන්ගෙ හඬට නම් කැමැත්තක් පෙන්නුවේ නැහැ. උන් හඬ නඟන කොට බයෙන් වගේ ඇය සීයගේ උරහිසට මූණ තබා ගත්තා. කපුටොයි කොක්කුයි විතරක් නම් මදෑ. තව කොච්චර පිරිසක් මිණිබිරී එන තෙක් බලා ඉන්නවාද. ලේන්නු ජෝඩුවක් ඇකේසියා ගහේ උඩ සිට පහළටත් නැවත උඩටත් එකා පසුපස එකා දිව්වා. රවුම් කීපයක් දිව්වා. නැවතත් නතර වෙලා බලා හිටියා. ඒ පොඩ්ඩි දැකලා උන් ප්‍රතිචාර දක්වපු හැටියි. අලුත් පාර දෙපැත්තේ විශාල මාර ගස් කියන්නේ කුරුලු ප්‍රජාවගේ රජ දහනක්. ඉහළම ඉන්නේ වැහි ලිහිණියෝ. ඒ ගොල්ල ඉහළ අතුවල වහලා ඉන්නවා මිණිබිරීට පේන්නෙ නෑ. උන් ටික වෙලාවක් ගියාම රොත්ත පිටින් මල් අහුරක් විසි කරනවා වගේ රවුමක් පියාඹා නැවත ගහේ වැහුවා. ඒ එක රංචුවක කුරුල්ලෝ සියයකට වැඩියෙන් හිටියා. ඒ පියැඹුම් සංදර්ශනය මිණිබිරීට පේන්න ඇය වෙනුවෙනුයි කියලා ජිනදාසට හිතුනා.

හිටපු ගමන් කොහෙන්දෝ ගිරා රංචුවක් පියාඹා ආවා. ආපු වෙලාවේ ඉඳලා උන්ගේ කච කෙචේ. චිරි බිරිය. ඈත කුඹුරක වපුරපු වී අහුලන්න ගියාම අයිතිකාරයා පත්තු කරපු රතිඤ්ඤ හඬට බය වෙලයි උන් ඇවිල්ලා තියෙන්නේ. ගිරවුන්ගේ 'කච කචෙන්' ඒ බව උන් මිණිබිරීට පැමිණිලි කළාය කියලයි ජිනදාසට හිතුණේ. කපුටන්, කොකුන් විතරක් නෙවී තවත් නොයෙක් පාට කුරුල්ලන් ඉන්න බව මිණිබිරී දැනගත්තා. අතු අස්සේ හැංගිලා වගේ කොහෙක් ඉඳගෙන 'කු හූ කු හූ' යනුවෙන් හඬ නැගුවා. උගේ හඬ තියුණුයි. එක් වරක් 'කු හූ' යනුවෙන් නාද කර සුළු විරාමයකින් පසු නැවතත් 'කු හූ' හඬ නැගුවා. ක්‍රමයෙන් උගේ හඬ උච්ඡ ස්වරයක් දක්වා වෙනස් වෙලා අන්තිමට නතර වුණා. කොහා කොහොමත් හැංගිලා වගෙයි ඉන්නේ. පෙනෙන්න විදියක් නෑ. ඒත් උෟට ඕනකම තිබුණා වගේ මිණිබිරීට කියන්න 'කොහා කියන්නේ මටය මමත් කුරුල්ලෙක්ය, මගේ නාදය මිහිරිය. ඒ හඬ ඔයා රසවිඳින්න ඕනය' කියලා. මිණිබිරීත් කොහාගේ නාදය මහත් ඕනෑකමෙන් අහගෙන හිටිය. බට්ටිච්චෙක් කතුරුමුරුංගා ගහේ ඉඳගෙන පුංචි පෙඳ රිද්මයකට ගස්සමින් 'ටිවිටි, ටිවිටි, ටිවිටි, ටිවිටි,' කියලා හඬ නැගුවා. ඒ 'ටිවිටි' හඬ දහ වතාවක් විතර එක දිගට නැගීම උගේ පුරුද්දයි. ලොකු කළු කපුටන් වගේම සුදු පාට චූටි බට්ටිච්චන්ද සිටින බව මිණිබිරී දැක්කා. මේ පරිසරයේ මෙපමණ කුරුල්ලෝ සංඛ්‍යාවක් හිටි බවක් මීට පෙර සීයාටත් දැනිලා තිබුණෙ නැහැ. සීයත් එක්ක කරන මේ පරිසර චාරිකාව නම් සිඟිත්තියට හරිම සතුටක් වුණා. මිණිබිරී මේ නිසාම සීයට හරියට ඇලුම් කළා. සීයගේ වයසක මූණ එතරම් පියකරු නොවුණත් ළදරුවකුගේ ආදරය ලබන්න කෙනෙකු ලස්සන විය යුතුම නැහැ.

දැරිවිය නවත්වන්නෙ නැතිව හඬන හැම වෙලාවකම "තාත්තේ මෙයා පරක් කරලා දෙන්න" කියමින් සිඟිත්තිය සීයාට දෙනු ලැබුවා. දරුවකු නිදි කරවන්න තරම් මෝරපු දැනුමක් දුවට තිබුණේ නැහැ. "දොයි දොයි බබෝ" යි කියූ පලියටම දරුවකූ නිදා ගන්නේ නැහැ. මිණිබිරියට නිදිමත දැනුණ හැම වෙලාවකම හඬන පුරුද්දකුත් ඇයට තිබුණා. මේ වෙලාවටත් දියණිය "තාත්තේ මෙයා නිදි කරලා

**44 වන පිටුව බලන්න**

# කෝකිල සන්දේශය...

22 වන පිටුවෙන්

සරිලන වස්තූන් කෝකිල කවියාගේ වනයෙහිද තිබේ. ඒ මී මැස්සන්, ළා දළු, කුමුදු මල්, වනගහනය යන මේවායි. වැස්සට කැමති මොණරා වැහි වළාකුළැයි වනගහනයට රැවටී හැමදාම නටන බව කීමෙන් පද්‍යයෙහි ප්‍රභාව වැඩි දියුණු වී ඇත. මෙබඳු පද්‍ය රැසක්ම කෝකිලයෙහි ඇත්තේය.

මෙහි ඇති දිගු වර්ණනයක් වශයෙන් සොබා සොඳුරු අසිරිය හසු කරගන්නා එකම වැනුම වන වැනුමයි. පද්‍ය දහතුනකින් යුත් මෙම වර්ණනය විරිත් අතිනුත් අදහස් අතිනුත් වෙනත් සඳෙස් සිහිගන්වන්නකි. වනතුරු ළතඹ පලු, වනකල් බිළිඳුන් කෙළි, රජහස පෙළ, වඳුරන්, දියඇළි, අශෝක මල්, සුදු වැලිතලා, වනවිල්, දෝතලු ඉඳි තල් ආදිය, ඇල්ගෙවිලියන්, සුවඳැල් උපුල් විල් ආදිය, මල් රොන්බර තුර සිර, පරපුටු රැව්, මොණරුන්, වැදි අඟනුන්, පුවක් ගස් ආදියෙන් මේ වනය සමලංකෘත කොට ඇත. ඒ ඒ දෑ පිළිබඳ විශේෂණ සහිතව කළ ලේඛනයක් මිස කාව්‍යමය ප්‍රකාශනයන්ගෙන් විරල වැනුමක් ලෙස මෙය හැඳින්විය හැකිය.

ගිරි මුදුනත හැලීය ඇද හැලීය
පිපි වන පෙත සලීය සලි මලීය
හෝතුරු පලු එලීය රත දිලීය
නැග නැග සිවුමැලීය සුදු වැලීය

ගිරි මුදුනෙන් ඇද හැලෙන හැළි, වනපෙතෙහි පිපුණු සල්ගස්, රතු පැහැයෙන් බබළන දළු සහිත අශෝක ගස්, තැනින් තැන දක්නට ලැබෙන සියුමැලි වැළිතලා වනයෙහි තිබුණු බව කියන වාර්තාවක් මිස කාව්‍යමය අගයක් මෙහි නොදිස්වේ.ඒ අතර වට්ටෝරු ගණයට වැටෙන පද්‍යද මෙහි දක්නට ලැබේ. මේ එවැන්නකි.

දෝතලු ඉඳීතලීය කොබල ලීය
මී අඹ දොඹසලීය පලු දෙ ලීය
මුව ලඹ සුවඳැලීය රස බ ලීය
දුටු දන සිතිවිලීය නිති ඇ ලීය

වනයෙහි වූ දෝතලු, ඉඳි, තල්, කොබලීල, මී අඹ, දොඹ, සල්පලු, දෙල්, සුවඳැල් කෙසෙල් දුටු දනන්ගේ සිත් ඇදගන්නා බව මින් කියවේ.

මේ වර්ණනයෙහි ස්වාභාව සෞන්දර්යය මතු කරලන කාව්‍යමය අගයෙන් යුත් එක් පද්‍යයක් මම දකිමි. ඒ මෙහි අවසාන පද්‍යයයි.

මලින් නොවිළි සැදි තුඟු කුමුකු තුරුදු ල
වලින් නැඟෙයි සපුනැයි පෙණ කොට තුමු ල
ලොලින් සැලෙති ගසනුව මත් මියුරු කැ ල
වලින් එසිරි දැක යා ගන්න මන ක ල

මෙහි කියැවෙන්නේ කුමුකු (පුවක්) ගස් පිළිබඳවය. පුවක් ගස වාලධියෙන් නැඟී සිටින නයෙකුට සම කරමින් උපදවා ලූ කවි සිතිවිල්ල අගය කටයුතුය. නොපිපුණු මලින් සැදුනු උස් වූ පුවක් ගස මහත් වූ පෙණ මඬුල්ල විදහා වලඟින් නැඟී සිටින සර්පයන් යයි සිතා මොණරු ආශාවෙන් සැලෙතියි කවියා කියයි. එය පුවක් ගසට සමාන කොට සැලකීම සෞන්දර්යාත්මක සිතිවිල්ලකි. මොණරු නයාගේ පෙණයට ආශා කරන බව ප්‍රකටය. එය මෙතැනට ගළපාලීමද පෙර කී සෞන්දර්යාත්මක සිතිවිල්ලෙහි අගය වැඩි කරලයි.

කෝකිල සන්දේශ කාව්‍යය අරබයා මහාචාර්ය සී. ඊ. ගොඩකුඹුර තබා ඇති මේ සටහන මෙම විවරණය නිමවන්නට ඉතා සුදුසු යයි හඟිමි.

'මෙම කාව්‍යය උපහාස රසයෙන් අනූනය. එසේම ශෘඞ්ගාරත්මක වර්ණනාද බහුලය. නොයෙක් අලංකාර වර්ග යොදා ඇති අතර ශ්ලේෂ බන්ධනය කෙරෙහි කවියා ඇල්මක් දක්වා තිබේ. ඔහු ප්‍රහේළිකා පවා යොදයි. එහෙත් පද්‍යවලින් වැඩි කොටසක් ඍජු ප්‍රකාශයෝය. කෝකිල කතුවරයා සාහිත්‍ය විවේචකයෙක්ද වේ. ඔහු පැරණි සන්දේශවල පද්‍ය උපුටා ඒවා වැඩි දියුණු කරයි'

**ලබන කලාපයෙන් 'සැවුල් සන්දේශ' කාව්‍යය පිළිබඳ විමසා බලමු.**

# මිණිබිරිය...

43 වන පිටුවෙන්

දෙන්නකෝ" කියලා ජිනදාසට දීම පුරුද්දක් වුණා.

දොයි දොයි දොයියම්මා.....
අතට වෙරළු ඇහිඳ ගෙනේ....
ඔන්න බබෝ ඇතින්නියා..........
ඔන්න බබෝ බිලු එන්වා..........
උඹෙ අම්මා කිරට ගියා.....

ආදි කවි ගායනා කළා. රවුම් දෙක තුනක් ඒ විදියට ඇවිදින විට මිණිබිරිය හෙමින් හෙමින් නින්දට වැටුණා.

"දුවේ... මෙන්න.. දරුවා නිදි...." ජිනදාස ඒ ටිකත් කිව්වේ නැළවිලි ගීතයක් වගේ.

දියණියගේ ප්‍රසූත නිවාඩුව ඉවර වෙන්න සතියකට කලින් මිණිබිරිත් සමග ඔවුන් ඔවුන්ගේ නිවසට ගියා. නිවසේ මිණිබිරිය නැති පාළුව ජිනදාසට දරාගන්න අපහසු වුණා. පසුදා උදේ අවදි වුණු ගමන්ම ජිනදාසට කල්පනා වුණේ අද මිණිබිරී ගෙදර නොමැති බවයි. ඒත් ජිනදාස මිණිබිරී සිටි කාමරයට ගියා. ඈ නිදා සිටි ඇඳ හිස් වෙලා තිබුණා. ජිනදාස බොහොම දුකෙන් ඒ දිහා බලලා සුසුමක් හෙළුවා. ඇගේ නැපීස්, චූ රෙදි දමා තිබුණු සිලින්ඩරාකාර තැඹිලි පාට පැස කාමරයේ තිබුණේ නැහැ. ඇගේ ඇඳුම් සහ සේදූ නැපි ආදිය බහා තිබුණු බෑගයද නැත. ඇගේ කිරි පිටි ටින් එක නැත. සබන්, පුයර, වෙනත් ආලේපන වර්ග, කිරි පිළියෙල කිරීමට උණු වතුර ගන්නා ප්ලාස්කුව නැත. කාමරයම පාළු වී තිබුණා.

ළිඳ දෙස බැලුවද ඇගේ රෙදි සේදූ බේසම නැත. ඇය නෑවූ රෝස පැහැති දිග බේසමද නැත. ළිඳ ළඟද පාළුය. ඈ නිදා ගත් ඇඳ සකස් කරන විට අමතක වීමකින් දමා ගිය නැපියක් ජිනදාසගේ නෙත ගැටුණා. ඔහු එය අතට අරගෙන සිප ගත්තා. මිණිබිරීගේ සුවඳ එහි තැවරී තිබුණා. මිණිබිරිය පුංචි ප්‍රාණියෙක් වුණාත් ඒ ළදරුවා නිසා මුළු ගෙයම පිරී තිබුණා.

කෙතරම් ඈතක සිටියත් මිණිබිරියත්, සීයාත් තදින් බැඳ තබන කුමක්දෝ දැඩි හුයක් තිබෙන වග ජිනදාසට දැනුණා.

තවත් අවුරුදු පහළොවක් විස්සක් විතර ගත වෙන විට මිණිබිරී හැඩකාර තරුණියක් වේවි. ඉගෙන ගෙන ඉහළ තනතුරක් දරාවි. ඉහළ නිලධාරියෙක් කසාද බඳීවි. දරුවෙකුත් ලැබේවි. ප්‍රසූත නිවාඩු ඉවර වේවි. ඇගේ අම්මට ඒ දරුවා බලා ගන්න යන්න වේවි. හැමෝටම විශ්‍රාම කාලයක් තිබුණත් අම්මා කෙනෙකුට ඒක නැහැ නොවේදැයි ජිනදාසට හිතුණා.

"තව අවුරුදු විස්සකින් විතර පස්සේ අපි බොහොම වයසට යනවා. ඒ පරිසරය වෙනස් වෙනවා. මිණිබිරී පුංචි කාලේ ඇවිද්ද පරිසරය තට්ටු ගොඩනැගිලිවලින් පිරී තිබේවි" ජිනදාසට එහෙම හිතුණා.

කවදා හරි මිණිබිරී ඇගේ දරුවෙකුත් අරගෙන අධිවේගී පාරෙන් පැය එකහමාරෙන් සීයලා බලන්න එන හැටි දැක ගන්න ජිනදාසට ආශාවක් ඇති වුණා. ඒකට තව බොහෝ කල් තිබෙන බවත් එතෙක් තමන්ට ජීවත් වීමට ඉඩ ලැබේද නොලැබේද කියාත් ජිනදාසට හිතුණා. එතෙක් කල් ජීවත් වෙන්න ඇත්නම් හොඳයි කියා ජීවිතය ගැන පෙර නොතිබුණු ලෝබකමක් ජිනදාසට දැනුණා.

# වැස්ස ගැන...

34 වන පිටුවෙන්

වහින්නෑ - බිම බැලුවොත් ගංවතුර ගලලා තමයි පස්ස බලන්නේ' යැයි ගැමියෝ පවසන්නේ 'වැදූ මවටත් අහසටත් නිවනක් නැත' යි යන ප්‍රකට කියමන සිහිපත් කරවමිනි. මේ වන විට බොහෝ ගැමි ගෙවල්හි ගෙදර දොරේ දර ඉපළක්, හාට ගෙඩියක් (හාල් ඇටයක්) හෝ වියැට ගෙඩියක් (වී ඇටයක්) නොමැති තත්ත්වයට පත්වන අතර ඉඳහිට පැය කිහිපයකට 'අව් රැල්ලක් දෙකක්' වැටේ. මෙම ඉස්පාසුව ගැමියන් හඳුන්වන්නේ 'දරදිය ඉඩහැල්ල' වශයෙනි. 'හත් දා වැස්ස' නැතහොත් 'හත් දා මාරිය' නමින්ද හැඳින්වෙන මෙම 'චුරු චුරු වැස්ස' දින හතක් පමණ නොකඩවා ඇද වැටේ යැයි ඔවුහු විශ්වාස කරති. මෙම වැස්ස 'පට්ටි ගොහොරුව' නමින් හා 'නත්තල් කුණාටුව' යනුවෙන්ද හැඳින්වෙන අතර ගවගාලවල ගොම කුණු වී ඒවා එකම මඩ ගොහොරුවක් වී දුර්ගන්ධය හැමීමට පටන් ගනී. පට්ටිගොහොරුව නම ලැබී ඇත්තේ එම තත්ත්වය නිසාය.

## නියඟය වාසනාවන්

මහ කන්නයේදී හොඳින් වැසි ලැබුණහොත් නුවරකලාවියේ සියලුම වැව් ජලයෙන් පිරී ගොස් ඇතැම් විට වැව දෙතුන් වර වාං දැමීම සිදුවේ. ජලයෙන් පිරී ගිය වැව දකින ගැමියා පවසන්නේ 'වැව මික් ගෙඩිය වගේ' (මී ගෙඩිය) පිරී ඇති බවයි. මෙවිට වැව පහළ පිහිටි ගම්මැදිවල 'උල්දිය දැමීම' සාමාන්‍ය සිද්ධියකි. උල්දිය දානවා, උල් හොල්ලලා වැනි පදවලින් කියැවෙන්නේ පොළොවේ උල්පත් මතු වී ඇති බවයි. මෙම කාලයට ගම්මැද්දට අඩියක්වත් තැබීමට තරම් නොහැකි තරමට අපුළ තත්ත්වයක් හටගනී. එම අවස්ථාවේදී 'සිරිප්පානියේ බෑ' නැතහොත් 'හිරිකිතේ බෑ' යි ගැමි ගැහැනු පවසන්නේ සැබවින්ම 'ගෙම්දුල් මෙන්ම පාරවල්ද උල් හොල්ල, දියමළං කා' ඇති නිසාය. එම නිසා 'කොළ පතට හිඟා කෑවත් නියඟය වාසනාවක්' යැයි කියන්නට ගැමියෝ පෙළඹෙති.

## උඳුකුඩු වර්ෂාව

ඉන්පසුව ක්‍රමයෙන් වැස්ස තුරල් වී සියුම් පොද වැස්සක් බවට පත්වන අතර එම වැස්ස හඳුන්වන්නේ 'උඳුකුඩු වර්ෂාව' නමින් හඳුන්වයි. වසරක් පුරා වරින් වර විවිධ නම්වලින් හඳුන්වන නුවරකලාවියේ වැස්ස අවසන් වන්නේ මෙම උඳුකුඩු වර්ෂාවෙනි.

මේ අන්දමින් දුරුතු වැරහැල්ලෙන් ඇරඹෙන නුවරකලාවියේ වැස්ස උඳුවප් මහේ උඳු කුඩු වර්ෂාව දක්වා විවිධ අවස්ථාවන්හිදී විවිධ නම්වලින් හැඳින්වීමට නුවරකලාවියේ ගැමියෝ දෑරූ උත්සාහය නුවරකලාවියේ ජනවහරේ සුවිශේෂත්වයකි. එමගින් වැස්ස කෙතරම් තමන්ගේ පැවැත්ම කෙරේ බලපා තිබේද යන්න අවබෝධ කර ගත හැකි වනු ඇත.

# ආ ගිය කතා...

38 වන පිටුවෙන්

රෝගීන් පරීක්ෂා කරන කාමරය වෙත ගිය වෛද්‍යවරයා ඊට සූදානමින් පසුවිය. මඳ වේලාවක් ඉක්ම ගියද රෝගියකු රැගෙන එන බවක් නොපෙනුණි. රෝහලේ සේවකයකුට කතා කළ වෛද්‍යවරයා "මොකක්ද ඒ කලබලය. ලෙඩෙක් ගෙනල්ල නේද? ලෙඩාව මෙහාට එක්ක එන්න උදව් කරන්න" යැයි පැවසීය.

රෝහල් සේවකයා ලෑන්ඩ් මාස්ටරය අසළට යනවිට එතැන එකම කසුකුසුවකි.

"කෝ කෝ කලබල නොකර එහාට වෙනවා. ලෙඩාව ගන්නවත් බෑනෙ තමුසෙල පිරිල නිසා"

ලෙඩාව ගැනීම සඳහා රෝද පුටුවක්ද රැගෙන පැමිණි රෝහල් සේවකයා පැමිණි පිරිසට සැර දැමීය.

"මහත්තයෝ ලෙඩා නෑනෙ..."

"මොනවා ලෙඩා නැති වෙලාද? එහාට වෙනවලකො පොඩ්ඩක්... කෝකටත් ඇතුළට අරන් දොස්තර මහත්තයට පෙන්නමු"

"නෑ නෑ මහත්තයෝ ලෙඩාව ගෙනල්ලා නෑනේ..."

"මොනවා.... ලෙඩාව ගේන්නෙ නැතිව මොන මගුලටද ඕයි තමුසෙල කඩාගෙන බිඳගෙන ඉස්පිරිතාලෙට ආවෙ..."

"අනේ මහත්තයෝ කලබලේට අපි ඔක්කොම ලෑන්ඩ් මාස්ටරේට නැග්ගට ලෙඩාව ලෑන්ඩ් මාස්ටරේට දාගෙන නෑනෙ"

ගම්බද නිවසක කිසිවකුට ලෙඩක් දුකක් වුණු විට මුළු ගමම එතැනට එක් වීම සාමාන්‍ය සිරිතකි. මෙහිදී සිදුවී ඇත්තේද එයයි. වැඩි හිතේෂිවන්ත කම පෙන්වීම සඳහා එදින නිවසට එක් වූවන් ලෑන්ඩ් මාස්ටරයට ගොඩ වී ඇතත් රෝගියාව එහි දමාගෙන නැත.

ලෙඩා රැගෙන එනතුරු කාමරයට වී බලා සිටි වෛද්‍යතුමාට මේ පමාව තවත් ඉවසිය නොහැකි විය. එළියේ කිසියම් අවුලක් සිදුවී ඇති බව පැහැදිලිය. එය සොයා බැලීම ඔහුගේ වගකීමකි. කාමරයෙන් එළියට පැමිණි වෛද්‍යවරයා පිරිස වෙත ගොස්, "කෝ ලෙඩා..." යැයි විමසනු ලැබුණි. පිළිතුරු ලැබුණේ රෝහල් සේවකයාගෙනි.

"අම්මප සර්... මුන් නම් පුදුම මිනිස්සු. ලෙඩාව ගේන්නෙ නැතිව මුළු ගමම මේකට නැගගෙන ඉස්පිරිතාලෙට ඇවිත්නෙ"

නැගීගෙන ආ සිනහව අමාරුවෙන් පාලනය කර ගත් වෛද්‍යවරයා මෙසේ කීය.

"දැන් එහෙනම් ආයෙ ගිහින් ලෙඩාව ගේන්න. ඔච්චර පිරිසක් එන්න ඕන නෑ. දෙතුන් දෙනෙක් ලෙඩා එක්ක ආවම ඇති..."

දඩ බිඩ හඬින් හැමෝම ලෑන්ඩ් මාස්ටරයට ගොඩ වෙන අතර වෛද්‍යවරයා රෝහල ඉදිරිපසින් දිස්වන අඳුරේ ගිලුණු මාර්ගය දෙස බැලීය. මාර්ගයේ ඈත කෙළවර උඩ-යට යන ලයිට් එළියකි. අසල සිටි රෝහල් සේවකයාද එදෙස බලා "බයිසිකලයක් මේ පැත්තට එනවා වගේ සර්" යයි කීය. උඩ-යට යන ලයිට් එළිය ක්‍රමයෙන් ළං වන විට රෝහල් සේවකයා පැවසූ ලෙසම එය බයිසිකලයක් බව පැහැදිලි වූ අතර බයිසිකලය පදින තැනැත්තාට පිටුපසින් ඇති ලගේජයේද අයෙකු සිටින බව පෙනුණි. බයිසිකලය රෝහල් ගේට්ටුවෙන් ගන්නවාත් සමගම ලෑන්ඩ් මාස්ටරයේ සිටි පිරිස මහ හඬ නගමින් ඉන් බැස ගති. වහාම බයිසිකලය පිටුපස සිටි තැනැත්තා වත්තන් කරගත් අයෙක් ඔහුව රෝහල තුළට රැගෙන විත්,

"අනේ දොස්තර මහත්තයෝ මෙන්න අපේ ලෙඩා... මෙයාට බේත් කරන්න...." යැයි කීය.

තවදුරටත් සිනහව පාලනය කරගෙන සිටීම අසීරු වූ දොස්තර මහතා "පුදුම මිනිස්සු තමයි...." යැයි කියමින් සිනා වතින්ම රෝගියා පරීක්ෂා කිරීම ඇරඹීය.

# WANT TO BE A DOCTOR?

*THEN CONSIDER*

## ALL SAINTS UNIVERSITY
## SCHOOL OF MEDICINE

**416-839-6461**




LAST 2 YEARS **(CLINICAL ROTATIONS)** OF EDUCATION COMPLETED AT TEACHING HOSPITALS IN **USA & CANADA**

2 CAMPUSES TO CHOOSE: **DOMINICA ST. VINCENT**

PROVISIONAL ADMISSION WITH MIDTERM MARKS






## NOW ENTER DIRECTLY FROM HIGH SCHOOL TO MEDICAL SCHOOL



## STUDY MEDICINE AT ALL SAINTS UNIVERSITY

**CALL TO REGISTER:**
**1-866-602-9555 or 416-743-9222**

**For our 10th Anniversary in operation, All Saints University will offer 50% tuition fee scholarship plus an additional 25% interest free loan, which is payable at the end of the program. MCAT preparatory classes in Toronto will be of one year duration only (three semesters)**

## Saliroo Creations

All Your Publishing Needs
under one roof

### Graphics
Illustrations, Logos,
Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

### Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

### Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**

**Tel : 416 201 0628**

## French Tutoring

Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

**Kumudu Abeywardena,** B.A
(Modern Languages), Dip (AFC)

**T.P - 647 824 1897**

## MARRIAGE PROPOSALS

සිංහල බෞද්ධ වයස 23 යි. දැනට කැනඩාවේ ඉංජිනේරු වෘත්තියේ යෙදී සිටින පුතාට යෝජනා කර තැබීම සඳහා දියණියක් සොයයි. ශ්‍රී ලංකාවේ නවීන නිවසක්, වානිජ දේපළ ඇතුළු ලක්ෂ 400 ක පමණ දේපළ හිමියා. කොළඹ ආනන්දයේ ආදි සිසුවෙකි.

diasgunasekare.58@gmail.com 0722-803158 (Sri Lanka)


**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි**

# තැඹිලි රහස

■ **කේ. ඩබ්ලිව්. ගුණවර්ධන**

මා අනුවේ දශකයේ සේවය කළේ බද්දේගම මැතිවරණ කොට්ඨාසයේ සුප්‍රකට පර්ෂද මූලස්ථ මහ විදුහලකය. විවිධාකාරයේ ගුරුවර ගුරුවරියන්ගෙන් සැදුම් ලත් එම ඇදුරු මඬුල්ලේ මා සිත් බෙහෙවින්ම ගත් එක්තරා සුවිශේෂී චරිතයක් විය. ඒ ඩග්ලස් මහත්තයාය.

කීමෙහි බිණීමෙහි අති සමතෙක් වූ ඩගීගේ ජීවිතයේ රහස් කියා දෙයක් නොවීය. තමා මුහුණපාන ප්‍රශ්න, ගැටලු, එදිනෙදා සිදුවෙන හොඳ හෝ නරක හෝ සිද්ධීන් හැම එකක්ම එපරිද්දෙන්ම කියාපාමින් අසා සිටින්නන්ට කදිම විනෝදයක් සැපයීය.

ඩගීගේ බිරිය මැද පෙරදිග රටක රාජකීය රෝහලක හෙද සොහොයුරියක් ලෙසින් දිගු කලක් සේවය කරමින් සිටි අතර තවමත් පාසල් වියේ පසුවන දූවරුන් සිව්දෙනකුගේ බරපතල වගකීම ඔහු වෙත පැවරී තිබිණි.

එය සදහම් දිවයින විසාලා මහනුවරක්ව පැවැති 88-89 මහා භීෂණ සමයයි. උසස් පෙළ විභාගයට සූදානමින් සිටි වැඩිමහල් දියණියත් සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙමින් සිටි කනිටු දියණියත් සිරිතක් වශයෙන් මැදියම් රැය පසුවෙනතුරු පාඩම් කරමින් සිටියදී ඩගී සාලයේ හාන්සි පුටුවට වී වැනිල සුරුට්ටුවක් උරමින් සිටියේය.

මැදියම් රැය පසු විය. පාඩම් කිරීමේ කටයුත්ත එදිනට නිම කළ දියණියන් දෙදෙනා සාලයට පැමිණ සිය පියාට දණ ගසා වැඳ නින්දට ගියහ. ඩගීද විදුලි පහන් නිවා දමා නින්දට වැටුණේය.

රාත්‍රි තුනට පමණ සිය නිවෙස අසළ පාරේ තුන් හතර දෙනෙක් පහත් හඬින් කතා කරනු ඇසී ඩගීට ඇහැ ඇරුණි. හේ නොනැගිට යහනේ සිටම කන් යොමාගෙන සිටියේය. යුගයේ පැවැති අති බිහිසුණු ස්වභාවය ඩගී බොහෝ සේ බිය ගැන්වීය.

'එක්කෝ හමුදාවෙන් නැත්නම් පොලිසියෙන් එහෙමත් නැත්නම් අර හාදයෝ' ඩගීගේ සිත ඩගීට කීවේය.

'පරයා තෝ ඇත්ත කියනවද නැත්නම් මැරුම් කනවද?' උස් හඬින් ඇසුණු එම වදන් පෙළින් ඩගී ඉබේම නැගිට්ටුවේය.

තමාට අකීකරු තම දෙපා දඩ දඩ ගා වෙව්ලද්දී ඩගී ඇඳ මත වාඩි විය. හේ වඩාත් බිය වූයේ දියණියන්ට ඒ හඬ ඇසී ඔවුන් අවදි වුවහොත් ඔවුන් බිය වී කුමක් සිදුවේදැයි සිතමිනි.

'පරයා තෝ දන්නවනේ අපේ හැටි, තෝ ඇත්ත කියනවද නැත්නම්, දස වද විඳලා මැරුම් කනවද?'

දඩාං බඩාං...

'බුදු අම්මෝ වදින්නම් සර් ගහන්න එපා. බුදු සර් මම අහිංසකයෙක්. බුදු සර් මට යන්න දෙන්න බුදු සර්' වේදනාවෙන් කෙඳිරි ගාන තරුණ හඬක්ද ඒ සමගින් ඩගීට පැහැදිලිවම ඇසිනි.

'අපිට බොරු බෑ ඩෝ. ඇත්ත කීවොත් යන්න දෙනවා. නැත්නම් පණපිටින් පුච්චනවා'

දඩාං බඩාං...

'අනේ බුදු සර් ගහන්න එපා සර් මම අහිංසකයි' ඒ වේදනාකාරී කෙඳිරිය සුපුරුදු එකක් වුව හඳුනා ගැනීමේ ශක්තියක් එවේලේ ඔහුට නොවීය.

'එහෙනම් තෝ ඇත්ත කියන්නෙ නෑ පරයා?'

'අනේ බුදු සර් මම ඇත්ත තමයි කියන්නෙ....'

දඩාං බඩාං...

'බුදු අම්මේ මාව මරන්න එපා බුදු සර්....' බොහෝ සේ ත්‍රාසයට පත් ඩගී උළුවස්සට ඉහළින් ඇති වා කවුළුවෙන් එබී බැලීමේ අදහසින් නැගී සිටින්නට තැත් කළද දඩ දඩ ගා වෙව්ලන ඔහුගේ දෙපා ඔහුට කීකරු නොවූයෙන් හේ යළි ඇඳ මත වාඩි විය.

'මූ මරන්න ඕන. මූ ඇත්ත කියන්නෙ නෑ'

අනේ බුදු සර් මම ඇත්ත තමයි කිව්වෙ මම මේ ගැන කිසිම දෙයක් දන්නෙ නෑ බුදු සර්'

දඩාං බඩාං...

'බුදු අම්මෝ උස්සපිය පරයා අත් දෙක'

ඩෝං ඩෝං...

ඒ සමගම තම සරමද තෙමී ගිය බව ඩගී කීවේය.

මෙතරම් කලබලයක් නිවෙස අබියස සිදු වෙත්දීත් ඒ වගක් නැතිව තම දියණියෝ සුවසේ නිද්‍රාගතව සිටීමම පමණි ඩගීට තිබූ එකම සතුට. ඩගීට එතැන් පටන් නින්ද ගියේම නැත.

වටින් ගොඩින් එළිය වැටෙද්දී පෑල දොර විවෘත කළ ඩගී එළියට බැස්සේය. යළි එය වැසූ හෙතෙම හීං සීරුවේ පාර දෙසට ගියේය. එකවරම පාරට බැසීමට බිය වූ හේ මල් වැට අස්සෙන් එබී බැලුවේ තවමත් ලේ ගලන තරුණ මළ සිරුරක් බලවත් අකැමැත්තෙන් හෝ දකින අදහසිනි. බලාපොරොත්තු වූ පරිදි එය එහි නොවීය. හමුදා භටයන් විසින් මළ සිරුර රැගෙන යන්නට ඇතැයිද ඔහුට සිතුනි. එහෙත් එවේලේ එවන් සේයාවක් නොවූයෙන් ඩගී විමසිලිමත්ව හීංසීරුවේ ගේට්ටුව ඇරගෙන පාරට පියවර තැබීය. බලාපොරොත්තු වූ දේ පාරේ නොවීය. ඔහු ඒ පැත්තට ටික දුරකුත් මේ පැත්තට ටික දුරකුත් ගියේය. නැත. මළ සිරුරක් තබා පාරේ ලේ බිඳකුදු නැත. රතිඤ්ඤා කරල් දෙක තුනක් පුපුරා ගිය සුන්බුන් තම නිවෙස අබියස පාරේ හේ දිටීය.

'මොනවද ඉස්කෝලෙ මහත්තය මේ පාන්දර හොයන්නෙ?' පාරේ පාපැදියකින් ගිය අයෙක් තම ගමනේ වේගය බාල කරමින් ඇසීය.

'ඔය පැත්තෙ මොකවත් තිබුණද?' ඩගී පහත් හඬින් ඇසීය.

'නෑ. ඇයි ඉස්කෝලෙ මහත්තයා?' ඔහු පාපැදිය නතර කරමින් ඇසීය.

'නෑ ඊයේ මේ හරියෙ වෙඩි පාරවල් දෙක තුනක් ඇහුණා...' ඩගී කීවේය.

'මේ දවස්වල ඒවා සාමාන්‍ය දේවල්නෙ ඉස්කෝලෙ මහත්තයා' කී ඔහු යන්නට ගියේය.

ඩගී ගේට්ටුව වසා ආපසු ආවේය. වත්ත පහල ළිඳ අසල තැඹිලි ගසට හේත්තු කැර ඇති තම ඉණිමග හා ගසෙන් එල්ලෙන නයිලෝන් කඹයක් දුටු ඩගී එදෙසට ගියේය. එය තම ළිඳේ කඹය බවට හේ හඳුනා ගත්තේය. ගසේ තිබූ දැවැන්ත තැඹිලි වල්ල නැත. ඩගීට හීන් හිනාවක් ගියේය.

'මඩකලපුවේදී එල්. ටී. ටී. ඊ. බෝම්බෙකින් මැරිච්ච නංගිගෙ බාල පුතාගෙ තුන් මාසෙ දානෙට දෙන්න පොරොන්දු වෙලා හිටපු ඇවරි අටක විශාල කෝලිකුට්ටු කැනත් නෑ. ඒකත් උන් කපාගෙන ගිහින්. ඒත් කාරි නෑ මචං. වද වේදනා විඳලා විඳලා මැරුම් කාපු කොල්ලෙකුගෙ මිනියක් දකිනා බලාපොරොත්තුවෙන් පාන්දර එළියට බැහැපු මට ඒ පෙනුණ දර්ශනයත් හරිම සුන්දරයි මචං' ඩගී තම කථාව නිම කරමින් කීවේය.

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි**




**1000 HD TV CHANNELS**
**ONLY $ 15.00 PER MONTH**
**CONTACT DILRUCK @ 416 893 3785**

**If you are Buying or Selling**
**For a Reliable Inspection**

# Yohan De Mel
Certified Home Inspector



**TEL:**
**416 885 4625**

E-Mail
nirhanhomeinspections@gmail.com

**Nirhan Property Inspection Services**

# BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers

Any Document Shipping worldwide
DHL EXPRESS

AIR-SEA-LAND

**Household Goods & Commercial Cargo**
**Packing / Relocation / Transport / Express delivery**
**DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)**

| Warehouse In Colombo | Kurunegala Warehouse | Warehouse In Batticaloa |
|---|---|---|
| LAKSIRI SEVA (PVT) Lid<br>66 New Nuge Road,Peliyagoda<br>Kelaniya<br>Tel: 11-257-4180 | Laksiri Seva (PVT)Lid<br>118/96 Negombo Road<br>Malkaduwawa<br>Kurunegala<br>Tel : 037-2052-810 | LAKSIRI SEVA (PVT)Lid<br>26,Hmyl Lane<br>Main Street,Addapalam<br>Ninthavur<br>Tel : 0672051050 |

**Toronto: - 416-321-0400**

Proud member of
IAM International Association Of Movers
Canadian International Movers Club

**Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288**
Ottawa : Kannan -1-613-828-2221  Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com  Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7



# 'අත් අකුරු' ලෝකයෙන් වඳවී යයිද?

■උදානි විජේසුන්දර

අනාදිමත් කලෙක අක්ෂර භාවිත කිරීමේ වික්‍රමය මිනිසුන් විසින් හැඳින ගන්නා තැන් සිට ලිවීමේ කාර්යය සිදුකර තිබුණේ අත් අකුරිනි.

දැන් දැන් තාක්ෂණය භාවිත කරන සමාජයේ එස්.එම්.එස්. මිස පෞද්ගලික ලියුමක් හෝ නොලියැවෙන වටපිටාවක අත් අකුරු ගණන් ගැනෙන්නේ වේගයෙන් භාවිතයෙන් ඉවත් වන්නක් ලෙසටය.

මේ වන විට සාක්ෂරතාවයෙන් අපටත් වඩා ඉහළින් තිබෙන රටවල වැඩිදෙනෙකුට අත් අකුරු ලිවීමට බැරිය. ඒ ඔවුන් ලිවීම වෙනුවට පරිගණක යතුරු පුවරුවට හුරු වීම නිසාය. මේ හේතුවෙන් අනාදිමත් කලෙක පටන් සාක්ෂරතාවය පිළිබඳ කියැවෙන නිර්වචනද ඉදිරියේදී වෙනස් කරන්නට සිදුව තිබේ.

මෑත අතීතයේ පටන් අපේ රටේද අත් අකුරු ශීඝ්‍ර සෝදාපාළුවකට හසු වෙමින් තිබෙන්නේ නුදුරු අනාගතයේදීම එය අපේ සමාජයෙන් පිටමං වීමේ අන්තරාව අපට සිහිපත් කරමිනි.

අත් අකුරින් බහුලව වැඩගන්නා කොට්ඨාසය වන ලේඛකයන්ගෙන්ද කොටසක් අද ලිවීමේදී අත් අකුරු අමතකර කර දමමින් සිටිනු දක්නට ලැබේ. ඔවුනට නැතුවම බැරි අත්අකුරුවල කාර්යය දැන් සිදුකරන්නේ පරිගණක යතුරු පුවරුවය.

අද වන විට ලංකාවේ ඇතැම් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල රාජකාරියේදී අත් අකුරු භාවිත කිරීම සිදුවන්නේ කලාතුරකිනි. පසුගිය කාලයේ රට පුරා විදුලි පණිවුඩ සේවාව අක්‍රිය කෙරුණු අතර 2014 මාර්තු මාසයේ සිට ජාතික හැඳුනුම්පතෙන්ද අත්අකුරු ඉවත් කෙරුණේ ඉදිරියේදී අප මුහුණ දිය යුත්තේ මුළුමනින්ම පාහේ පරිගණක ලෝකයකට බව සිහි කැඳවමිනි. පරිගණක ලෝකයේ අත් අකුරුවලට ඇත්තේ පුරාතන වටිනාකම පමණි.

මුළුමනින්ම පරිගණක සමාජයක, එනම් බටහිර රටක, අත් අකුරට ලැබෙන පුරාතන වටිනාකම පිළිබඳ අත්දැකීමක් මගේ එක්තරා මිතුරකු සතු වෙයි.

ඔහු ශිෂ්‍යත්වයක් ලැබ කලක් ඇමරිකාවේ විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලැබීය. එහි ඉගෙන ගන්නා කාලයේ සිදුවූ මේ සිද්ධිය අත් අකුරු ගැන කතාබහ කරන ඕනෑම තැනක හේ කියයි. ඔහුගෙන් අසා දැනගත් පරිදි ඒ සිදුවීම මෙසේයි.

මේ මිතුරා පිටරට ගත කරන කාලයේ ඔහුගේ මව දිගින් දිගටම ඔහුගේ සුවදුක් විමසා තිබුණේ ඊමේල් පණිවුඩ මාර්ගයෙනි. එහෙත් එක්තරා විශේෂ අවස්ථාවක ඕ සිය පුත්‍රයාගේ සුවදුක් විමසා ස්වකීය අත් අකුරින් ලිපියක් යවා තිබුණි. මගේ මිතුරා කලෙකින් නොදුටු මවගේ අත් අකුරු කියවද්දී, කලාතුරකින්වත් අත් අකුරු නොදකින ඔහුගේ විශ්වවිද්‍යාල සගයෝ අත් අකුරු ඇස ගැසුණු සැණින් එකී ලිපිය උදුරා ගත්හ. ඊළඟට, පුරාතන ලියවිල්ලක් පරිශීලනය කරන්නට ඉඩ ලැබුණු සිසු කැළක් මෙන් ඔවුහු එය හදාරන්නට පටන් ගත්හ. මවගේ ලිපිය සිංහල අකුරක්වත් නොදන්නා නොරට මිතුරන් අතර අතින් අතට මාරු වී ගියේ එය තනිකරම අත් අකුරින් ලියවී තිබීම නිසාය. මිතුරන් පිරිස මහත් උනන්දුවකින් මවගේ අත් අකුරු හදාරන්නට පටන් ගත් නිසා ලිපිය අතින් අත ගොස් එය යළි ලැබී තිබුණේ කැබලිවලට ඉරී ගිය ලිපියක් ලෙසින් වග මගේ මිත්‍රයා කීවේය.

මේ වන විට අපේ රටේද ග්‍රාමීය පෙදෙස්වල කෙසේ වෙතත් නාගරික පෙදෙස්වල පෞද්ගලික ලිපි භාවිතය විරල වෙමින් ඇත. කලකට ඉහත පාසල් සිසුන්ගේ පෙම් සබඳතා ගුරුවරුන්ට හෙළි වූයේ අත් අකුරින් ලියන ලද පෙම් හසුන් නිසාය. අනන්‍යතාව සඟවා වුව එසේ ලියන ලද පෙම් හසුන් කියවා ගුරුවරුන්ට එහි අයිතිකාරයා සොයා ගැනීම පහසු වන්නේ ලියුම ලියා ඇති අත් අකුරුම අනන්‍යතාව කියා පාන එක් සාධකයක් වන නිසාය.

එකම පාසලක එකම පන්තියක ළමයින් හතළිස් දෙනෙකුගේ අත් අකුරු හතළිස් ආකාරය. වැඩි දෙනාගේ අත් අකුරු රවුම් හැඩයක් ගන්නා අතර ඇතැමෙකුගේ අත් අකුරු දිගටි හෝ හතරැස් හැඩයක් ගනී. මේවායින් දිගැටි හැඩයේ අත් අකුරු කෙසේ වෙතත් හතරැස් හැඩයේ අත් අකුරුවල හිමිකරුවන් නම් අත් අකුරු සම්බන්ධයෙන් කිසි දින හොඳක් අසන්නේ නැත. ඒ හතරැස් හැඩයේ අත් අකුරු මහත් ආයාසයෙන් යුතුව ලියන ඒවා ලෙසින් පෙනෙන නිසාය. එමෙන්ම හතරැස් හැඩයේ අත් අකුරු කිසි දින සාමාන්‍ය වේගයකින් ලියන්නට බැරිය.

මෙසේ අත් අකුරුවල ඇති වන වෙනස් වෙනස් හැඩරුව පුද්ගලයකුගේ අනන්‍යතාව කියා පාන එක්තරා සාධකයක් වද්දී අත් අකුරු යම්තාක් දුරකට සාම්‍යතාවක් දක්වන්නේ මව හෝ පියාගේ අත් අකුරු සමග පමණි. ඒවාද ජාන මෙන්ම අනන්‍යතාව සොයාගත හැකි සාක්ෂියක් වන්නේ එසේ පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන බැවිනි. එහෙත් එය කෙනෙකුට වුවමනා නම් බරපතළ වෙනස්කම් ඇති වන සේ වෙනස් කරගත හැකි නිසාම ඇතැම් තැන්හි එම සාක්ෂිය බොඳ කළ හැකි අවස්ථා නැතුවාද නොවේ. කැත, අවලක්ෂණ හා අසෝබන මෙන්ම ව්‍යාකූල අත් අකුරු ඇති සිසුන්ට අත් අකුරු හොඳ කර ගන්නා මෙන් ගුරුවරුන් දිගින් දිගටම අවවාද කරන්නේ අත් අකුරු එසේ දැඩි හිතුමනාපයෙන් වෙනස් කරගත හැකි දෙයක් නිසාය.

පුද්ගලයින්ගේ අත් අකුරුවලින් හෙළිවන ලේ නෑදෑකම සෙවිය හැක්කේ යමෙකුගේ අත් අකුරු යම් පරිණත හැඩරුවක් ගත් පසුය. වයස සමගින් ඉබේම ඇතිවන මේ පරිණත හැඩරුව ඉඳහිට අඩු වයස් පුද්ගලයකුගේ අත් අකුරින්ද දැකිය හැකි වෙයි. එසේ වන්නේ අත් අකුරු දිගින් දිගටම භාවිත කිරීම නිසාය. සිය පෙම්වතියට නිතර නිතර අත් අකුරින් පෙම් හසුන් ලියන නව යොවුන් තරුණයකුට වුව ඒ වයසේ නිරායාසයෙන් හිමි වන ළපැටි අත් අකුරින් මිදී පරිණත අත් අකුරු හිමි කරගන්නට පුළුවන. එහෙත් පෙම් හසුන් වෙනුවට එස්.එම්.එස් පමණක් පෙම්වතියට යවන අද කාලයේ කොල්ලන් කුරුට්ටන්ට අත් අකුරෙහි සිදුවන මේ වෙනස්කම් ගැන හිතන්නට වේලාවක් ඇත්තේම නැත.

කුඩා වියේදීම අත් අකුරු ලස්සන කර ගන්නට හොඳම උපක්‍රමය අපද මුල් කාලයේ ලියූ පරිදි පැන්සලෙන් ලියා ඊළඟට අත් අකුරු ගැන ඉහළම උනන්දුව ඇතිවන හතරවැනි පස්වැනි හෝ හයවැනි ශ්‍රේණිවල පටන් තීන්ත පෑනෙන් ලිවීමට යොමු වීමයි. එහෙත් දැන් දැන් ළමයි පැන්සලේ සිට කෙළින්ම ලිවීමේදී කිසිම සංයමයක් නොපෙන්වන බෝල්පොයින්ට් පෑනට හුරු වී සිටිති. පස්වැනි හයවැනි පන්තිවල තීන්ත පෑන් භාවිත කළ කාලයේ තීන්ත නාගෙන ගෙදර ආ ළමයින්ගේ දෙමව්පියන්ට නම් ළමයින් එසේ බෝල්පොයින්ට් පෑන්වලට යොමු වීම මහත් අස්වැසිල්ලක් වූවාට දැන් දැන් අධ්‍යාපනඥයින්ද කියනා හැටියට අත් අකුරුට වැඩිම හානිය කරන්නේ බෝල්පොයින්ට් පෑනය. පෑන් තුඩ කරකැවෙන බෝල් පොයින්ට් පෑනකින් ලිවීම බැලූ බැල්මට පහසු කටයුත්තක් වුවත් බෝල්පොයින්ට් පෑනෙන් ලියැවෙන අකුරු තීන්ත පෑනකින් ලියවෙන තරම් හැඩැති අකුරු නොවීමේ දුර්විපාකයද ඒ සමගම වෙයි. එහෙත් පනස් ගණන්වල කටු පෑනෙන් ලියූ වැඩි දෙනා තවමත් කියන්නේ අත් අකුරු සම්බන්ධයෙන් හොඳම පෑන කටුපෑන බවය. ඔරුමාන්කුලමේ චන්දන හිමියන් වරක් පාසල් සිසුන්ට කටුපෑන් හඳුන්වා දී ඒවායින් ලිවීම පුරුදු කළේද කටුපෑනෙන් ලිවීමේ අසිරිය කිසිදා අමතක කළ නොහැකි අත්දැකීමක් නිසාය.

තරුණ වියේදී අත් අකුරු නිශ්චිත හැඩයක් හා වේගයක් ගන්නේ වැඩි වැඩියෙන් අත් අකුරින් සටහන් ලියැවෙන උසස් පෙළ හදාරන කාලය වද්දීය. මේ කාලයට සිසුන් සටහන් ලිවීම මහා කරදරයක් සේ සැලකුවක් විභාගය අවසන් වද්දී අත් අකුරුවලට නිශ්චිත වේගයක් හැඩයක් ලැබී තිබේ. මේ නිශ්චිත වේගය, හැඩට එන්නට පෙර අත් අකුරු සුමට කර ගන්නා මෙන් ගුරුවරුන් අවවාද කරන්නේ කැත අත් අකුරු වේගයෙන් ලියවෙද්දී ඒවා බොහෝ කැත අත් අකුරු වීමේ අවදානම ඇති බැවිනි.

අත් අකුරු කැත වීමේ හෝ ව්‍යාකූල වීමේ අවදානම තමන් කෙරෙහි පමණක් නොව, අනුන් කෙරෙහිද බලපාන කාරණයක් වග වැඩි දෙනා සිතන්නේ නැත. ව්‍යාකූල අත් අකුරු අන්‍යයන්ට බලපෑමෙන් කරන අනර්ථය වැඩිපුරම සිදුකරන්නේ වෛද්‍යවරුන්ය. ටයිම් සඟරාව හෙළි කරන හැටියට වෛද්‍යවරුන්ගේ ව්‍යාකූල අත් අකුරු හේතුවෙන් වාර්ෂිකව රෝගීන් හත් දහසක් පමණ මරණයට පත් වෙති. ඒ රෝග නිශ්චය මෙන්ම ඖෂධ නිකුත් කිරීමේ සටහන් ආදිය බොහෝ විට ඇත්තේ වෛද්‍යවරුන්ගේ ව්‍යාකූල අත් අකුරින් නිසාය. ඇතැම් විට වෛද්‍යවරුන්ගේ සටහන්වල ඇත්තේ කිසිවකුට කිසිදිනක කියවා ගත නොහැකි අත් අකුරු කොටස් පමණි. මේවා නියමිත පරිදි කියවා ගත නොහැකි ඇතැම් ඖෂධවේදීන් තමන්ට ඒවා කියවා ගත නොහැකි බව හෙළි නොකර ඖෂධය ලබාගන්නා තැනැත්තාගෙන් රෝගය විමසා ඖෂධ ලබා දෙන අවස්ථා තිබේ. මේ හේතුවෙන් අද වන විට ඖෂධ වැරදීමෙන් ළඟා කර ගන්නා ජීවිත අවදානමට සේම තමන් ප්‍රතිකාර ලබන්නේ කුමන රෝගයටද යන්න ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීමේ අභාග්‍යයටද රෝගීහු මුහුණ පා සිටිති.

වෛද්‍යවරුන් අත් අකුරු පිළිබඳ දක්වන සැලකිල්ල කෙසේ වෙතත් අත් අකුරුවල ව්‍යාකූල හැඩරුව මිනිසකුගේ චරිත ස්වභාවය නිසාද වෙනස් වන බව කියන්නෝ පත්තර පිටු අතර සිට ඉඳහිට අපට මුණ ගැසෙති. එහෙත් අත් අකුරුවල මේ ව්‍යාකූල හැඩරුව චරිත ස්වභාවය නිසා කෙසේ වෙතත් සැලකිය යුතු රෝගී තත්ත්වයන් නිසාද වෙනස් වන්නට පුළුවන් බව වෛද්‍යවරුන් කියති. ඒ අත් අකුරුවල හැඩරුව වෙනස් වීම ස්නායු පද්ධතියේ බලපෑමෙන් සිදුවන්නක් නිසාය. වැඩිහිටි පරපුර අතරෙහි වැඩිපුර පවතින රෝගී තත්ත්වයක් වන පාකින්සන් හෝ කුඩා දරුවන් අතරෙහි සැඟවී පවතින තවමත් වැඩිපුර වැඩිහිටියන්ගේ අවධානයට යොමුව නැති 'ඩිස්ලෙක්සියා' නම් රෝග යද අත් අකුරුවලට බලපායි. ඩිස්ලෙක්සියා තත්ත්වයට මුහුණ පාන දරුවකු ඇඳින ගන්නට ඇති එක් සාධකයක් ලෙසින්ද අත් අකුරු ගණන් ගැනේ. ඩිස්ලෙක්සියා තත්ත්වයේදී අත් අකුරු හැඩ දමා ලිවීම කෙසේ වෙතත් ඇතැම් අත් අකුරු නිවැරදිව හඳුනාගන්නටද දරුවකුට නොහැකිය.

අප ඉගෙන ගන්නා කාලයේ ගුරුවරුන් විසින් ළමයින්ට පනවන ලද අද දක්වාම ක්‍රියාත්මක වන එක්තරා දඬුවමක් ඉහත කී අවස්ථා දෙකෙහිදී හැරුණු විට ව්‍යාකූල අත් අකුරින් මිදෙන්නට ළමුන්ට මහත් පිටුබලයක් සපයයි. මා ද පාසල් ජීවිතයේදී කිහිප වරක් විඳ ඇති මේ දඬුවම තමන්ගේ කුඩා දියණිය ඊයේ පෙරේදා දිනක විඳි බව මගේ මිතුරියක් මට කීවාය. ඇය කීවේ තමන්ගේ දියණිය පාසල් නොපැමිණි දින දෙකකට පසු ගුරුවරිය 'මම මින්පසු නොවරදවා පාසල් එමි' යන වැකිය දහස් වතාවක් ලිවීමට දුන් බවයි.

දියණිය නාහෙන් අඬමින් මේ වැකිය දහස් වතාවක් ලියද්දී ඇගේ අම්මා වන මගේ මිතුරිය එය සතුටින් භාරගෙන තිබුණේ එය දියණියට අත් අකුරු හැඩ කරගන්නට ලැබුණු එක්තරා පෙරහුරුවක් ලෙස කියමිනි. මේ දඬුවම අප විඳි කාලයේ අත් අකුරු ගැන කියන්නට කිසිවකු නොසිටි නිසා අප බොහෝ අවස්ථාවල එබඳු දහසක් වැකි ලියුවේ පන්තියේ කිහිප පොළක් අතරේ දඬුවම සම සේ බෙදා ගනිමිනි.

එහෙත් මේ වන විට අපද ඇතුළත් වෘත්තීය සමාජය තුළ අත් අකුරු සම්බන්ධයෙන් පවතින අඩු වැදගත්කම කියාපාන්නේ එවැනි දඬුවම්වල කිසිදු අනාගත වැදගත් කමක් නොමැති බවයි. ඒ තාක්ෂණය හමුවේ අත් අකුරෙහි මහිමය බොඳ වී යමින් පවතින නිසාය.

අත් අකුරු කොමැතිව බැරි යැයි සිතූ එකම වෘත්තිය වන ලේඛන කලාවෙන්ද අත් අකුරු හැලී යාම තාක්ෂණයේ මහිමයෙන් සිදු වූවකි. මේ වන විට තාක්ෂණ්‍ය හා හරි හරියට මුසු වූ ලේඛකයන්ගෙන් අත් අකුරු ගිලිහී ගොසිනි. ඒ පරිගණක යතුරු පුවරුව අත් අකුරුවලට වඩා කඩිනම් වීමේ, යළි නිවැරදි කරමින් ලිවිය හැකි වීමේ හා පරිගණකයෙන් කෙළින්ම මුද්‍රණයට යැවීමේ වාසිය තකාය.

දැන් දැන් අත් අකුරු සම්බන්ධයෙන් වන මේ වෘත්තීය මට්ටමේ අඩු සැලකිල්ල කියා පාන්නේ නුදුරු අනාගතයේදී අත් අකුරු පුරාතන ලියවිල්ලක් බඳුව සුරක්ෂිත කෙරෙන ලොවකට අප පය තබා සිටින බවයි.


Aria Emporium
Caribbean, West Indian,
Sri Lankan Grocery
Free coffee for every customer
KIDS Apparels & Saris for Low price
Jack fruit Can $ 1.99
Ginger beer 2-cans $ 2.00
Anchor (powder) $ 6.99
CeyCan Tostered Urad flour $ 3.99
Lemon puff $ 1.29
Milk Biscuits $ 1.29
Idhayam (2L) $ 13.99
Idhayam (1L) $ 7.99
Sea salt $ 1.25
Waadiya Fish (425g) $ 2.99
5kg / 11lb $ 9.99
Waadiya Coconut milk $ 1.99
Real Coconut milk 2 for $ 1.49
Yellow Split Peas 2Kg $ 3.29
Famous gold dates $ 5.99
U-HAUL SUB - DEALER
8kg $ 9.99
Fish & Meat Market Now Open
Kingston Rd
Shoppers Drug Mart
Food Basic
Aria
Morningside Ave
Lawrence Ave E
416 287 ARIA (2742)
4234 Lawrence Avenue East Toronto ON M1E 2S5

# TAX, ACCOUNTING AND BOOKKEEPING SERVICE

**We provide Personal and Corporate Tax Services**

- Friendly Personalized Service
- Fast Refund
- Provide tax planning advices to minimize your taxes

## OUR SERVICES

**Tax Services**

- Personal Tax Services
- Corporate Tax Services
- HST Filling

**Web Design**

- We can help you to design a website.

**Accounting and Bookkeeping Services**

- Annual Financial Statements
- Payroll Service
- Complete Accounting Outsource
- Day to day bookkeeping/ Processing
- Audit assistance

**Accounting and Bookkeeping Services**

- Annual Financial Statements
- Payroll Service
- Complete Accounting Outsource
- Day to day bookkeeping/ Processing
- Audit assistance

**Please contact Anura or Yacintha**

**PYNAX ACCOUNTING AND BUSINESS SOLUTIONS**

**Phone : 416-264-6850 | 647-789-7990**

18 Bedle Avenue, Toronto M2H 1K8

www.pynax.com



# BEYOND YOUR EXPECTATIONS !

**Residential & Commercial**
# Real Estate

proud sponsor of Children's Miracle Network®



**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.

A member of CanLanka BUSINESS ASSOCIATION

ABR® ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

# Gamini Abeysinghe. ABR, CNE
## Real Estate Sales Representative

RE/MAX 100% Club Award
2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award
2015, 2012

RE/MAX® Diamond Realty Inc., Brokerage

RE/MAX® HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

**Call me Today !**

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.
Join the many happy home owners I've helped and find the perfect home for you!

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828
1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements



ඔබ සැමට
සාමය සතුට පිරි
සුභ නත්තලක් වේවා....!
ගාමිණී අබේසිංහ
දසත
Dasatha
RE/MAX
Diamond
Realty Inc., Brokerage




Field Fresh
Supermarket
好世界 大型超市
OPENING
SOON
Field Fresh
Supermarket
5661 Steeles Ave East
Toronto ON M1V 5P6